# දිවයින
## ඉරිදා සංග්‍රහය

www.divaina.lk 2022 මැයි මස 15 වැනිදා ඉරිදා කාණ්ඩය 41 - 33 වැනි පත්‍රය මිල රු.130යි


## රනිල්ගේ සහායට ඒජාපයෙන් පස්කට්ටුවක්



සාගල-ඉන්ධන හා ගෑස්, රුවන්-බෙහෙත්, වජිර හා රංගෙ-ආහාර, අකිල-පොහොර

හේමන්ත රන්දුණු, නෝමන් පලිහවඩන 16-පිටුවට

## රනිල්ගේ ආණ්ඩුවට සජබ සහාය දෙන්නේ නෑ



- සජබ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර

චමින්ද සිල්වා 16-පිටුවට



## රනිල්ට පොහොට්ටුවේ උපරිම සහය

සාගර කාරියවසම් කියයි

අනුර බාලසූරිය, චමින්ද සිල්වා 16-පිටුවට



## මෛත්‍රීලා-විමල්ලා ඇමැති ධුර එපා කියති

හොඳ දේට සහාය

අනුර බාලසූරිය, චමින්ද සිල්වා 16-පිටුවට

# අභියෝගයට මම ලෑස්තියි

## අගමැති රනිල් වික්‍රමසිංහ

## පළමු සංචාරය ඉන්දියාවට



චමින්ද සිල්වා, අකිත පෙරේරා

රටේ ජනතාව සාගින්නේ පෙළෙන හා පෝලිම්වල පීඩා විඳින අවස්ථාවක ඉන් රට බේරා ගැනීම සඳහා වූ අභියෝගයට තමා මුහුණ දෙන බව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා 'දිවයින ඉරිදා සංග්‍රහය'ට පැවසීය. 16-පිටුවට

## අගමැති රනිල්ට ලොව වටෙන්ම සුබ පැතුම්

ශ්‍රී ලංකාව වෙනුවෙන් තවදුරටත් කැපවෙනවා

ඉන්දීය මහකොමසාරිස්

අවුල ලිහන්න සුදුස්සා රනිල්

යුරෝපා සංගමයේ නියෝජිත

අගමැති එක්ක කටයුතු කරනවා

ඇමරිකානු තානාපති

චමින්ද සිල්වා 16-පිටුවට

## උතුම් සම්බුදු තෙමගුල අද



චිත්‍රය - ආර්. සාර්ලිස් මාස්ටර්

ලෝකවාසී බෞද්ධ සැදැහැවතුන් අතිමහත් බැතියෙන් යුතුව සමරන වෙසක් පුන් පොහෝ දිනය අදට (15 දා) යෙදී ඇත. බෝසත් කුමරුගේ ඉපදීම, සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීම සහ... 16-පිටුවට

අටලෝදහම දිවි කෙත් බිමට හුරුකර
අනියත පසක් කර දුනි දහම් මුතුහර
තුන්ලෝ සතට පැහැදුව නිවන් පුර දොර
සම්බුදු පියා සමරමු සිතින් බැතිබර

- අනුරාධ හිරිපිටියගේ



## සජබ ඇමැති ධුර ගන්නවා නම් ඉක්මනට නම් එවන්න

ජනපති සජිත්ට ලියයි

16-පිටුවට

## අරගලයට දින 37 යි

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන් 16-පිටුවට



ඡායාරූපය - නිශාන් එස්. ප්‍රියන්ත

## ජන දුක නිවන්න හරීන් - හර්ෂ දැඩි ස්ථාවරයක

චමින්ද සිල්වා 16-පිටුවට

## වෙසක් සැරසිලි මිල අහස උසට

බී.ටී.කේ. 16-පිටුවට

## ඩොලරය පහතට

ශයාම් නුවන් ගනේවත්ත 16-පිටුවට

## මන්ත්‍රී ආරක්ෂාව තර කෙරේ

10 6ක් ටී. 56 2ක්

හේමන්ත රන්දුණු 16-පිටුවට



## ඉන්දියානු වීසා අත්හිටුවූ කතාව බොරුවක්

16-පිටුවට

## මහින්ද ඇතුළු පිරිස අත්අඩංගුවට ගන්න ඉල්ලන නඩුව සලකා බැලීම 17 වැනිදා

ඒ. ජේ. ඒ. අබේනායක 16-පිටුවට



## ප්‍රචණ්ඩක්‍රියා ගැන තොරතුරු දෙන්න දුරකථන අංක 5 ක්

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන් 16-පිටුවට



## ජූනි මාසයට ඉන්ධන නැවක් ඇනවුම් කර නෑ

චමින්ද සිල්වා 16-පිටුවට







# සිංහරාජයේ ගිනි තැබූ හෝටලය අයිති කාටද?


ගිනි ගන්නා හෝටලය


හෝටලයේ ප්‍රවේශ මාර්ගය වැටී ඇත්තේ සිංහරාජය මැදින්




ගිනි ගැනීමට ප්‍රථම හෝටලයේ කබානා


හෝටලයේ පිහිටි භූමිය දක්වෙන චන්ද්‍රිකා ඡායාරූපයක්

*** සිංහරාජයට දැඩි හානි**

*** හෝටලය බලෙන් පවරගෙන**

*** ආරක්ෂාවට නාවික සෙබළුන්**

රටේ මිනිස්සු හිඳින්නේ තම වටපිටාව පිළිබඳව සැකයකිනි. බියකිනි. ඒ අතරම තම පැවැත්මට හානිකර දේ ගැන විමසිල්ලකිනි. විමසිල්ල හොඳය. එහෙත් වර්තමාන දේශපාලනය විසින් ඇතිකර ඇති විකෘතිය නිසා හට ගන්නා විමසිල්ල, සැකය තරමක් නරක අතට හැරෙමින් පවතී.

පසුගිය දිනක සිංහරාජ කඳු පන්තියේ ගෝනිගල හේයස්වත්ත ආසන්නයේ පිහිටි හිටපු අග මැතිවරයාගේ පුත් යෝෂිත රාජපක්ෂට අයත් යැයි කියන හෝටල් සංකීර්ණයක් ගිනි තබා සම්පූර්ණයෙන්ම විනාශ කර තිබිණි.

මේ හෝටලය ගැන පසුගිය කාලයේ විශාල වශයෙන් කථාබහට ලක්විණි. හෝටලයත් ඊට ප්‍රවේශ වන මාර්ග සංවර්ධනයත් නිසා සිංහරාජය ට සිදුවන හානිය පිළිබඳ පරිසර සංවිධාන ගණනාවක් අනතුරු අඟවා තිබිණි.

එම ව්‍යාපෘතිය සිදු කෙරෙමින් පවතින්නේ දෙනියාය - රක්වාන මාර්ග යේ හේයස්වත්ත හන්දියේ සිට ගොංගල කඳුමුදුන දක්වාය. මෙම මාර්ගය සංවර්ධනය කිරීමේ ප්‍රධාන අරමුණ යෝෂිත රාජපක්ෂට අයත් යැයි කියන නමුත් ඔහුගේ නමට නොමැති හෝටලයට පිවිසීමටය. කාපට් අතුරා සකස් කරන කිලෝමීටර් 7 ක් පමණ දිග මෙම මාර්ගයෙන් ගමන් කිරීමට ඇත්තේ ගොංගාල කඳු මුදුනේ පිහිටි විවිධ මාධ්‍ය ආයතනවලට අයත් රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන කුලුනුවලට හා ආරක්ෂක අංශවල සංඥා කුලුනුවලට පමණි. මෙම මාර්ගයේ පහළ හේයස් වත්තේ කම්කරු ජනතාව පදිංචිව සිටින වතු නිවාස සංකීර්ණයක් පමණක් පිහිටා තිබේ. ඊට අමතරව මෙම මාර්ගයේ පිවිසිය හැකි වන්නේ මෙම හෝටලයට පමණි.

මෙම මාර්ගය සංවර්ධනය කරන බොහෝ ප්‍රදේශ සිංහරාජ වන රක්ෂිතයට අයත් වන අතර කිසිදු සංරක්ෂණ ක්‍රමවේදයක් හෝ පාරිසරික අනුමැතිය ලබා ගැනීමක් හෝ සිදු නොකර මෙම මාර්ගයේ ඉදිකෙරමින් පැවති බව කියති.

මෙම මාර්ගයේ ඉදිවන හෝටලය පිහිටි සිංහරාජ අඩවියේ නැඟෙනහිර කලාපය මුළු ලොවෙන්ම සිංහරාජ අඩවියට පමණක් ආවේණික සත්ත්ව විශේෂ අතුරෙන් වැඩිම ප්‍රමාණයක් වාර්තා වන කලපයයි. එම කලාපය හඳපාන්ඇල්ල, මෝර්නිග් සයිඩ්, ගොංගාල හා එන්සල්වත්ත යන ප්‍රදේශවලින් සමන්විත වේ. මෙම කලාපයේ ජීවීන් වසර මිලියන ගණනක් හුදෙකලාව පරිණාමය වී තිබේ.

හෝටලය පිහිටා ඇත්තේ ගොංගාල කන්දේ නැඟෙනහිර බෑවුමේ සිංහරාජ වන රක්ෂිතයට ආසන්නයේය. රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් බොරළුවාගේ අයින ග්‍රාම නිලධාරි වසමේ මෙය පිහිටා තිබේ. අක්කර 12 ක පමණ භූමි ප්‍රදේශයක පිහිටා ඇති මෙම හෝටලයේ මුල් හිමිකරු වන්නේ දෙනියායේ, ආසිරි කේක් ව්‍යාපාරයේ හිමිකරු වන රොෂාන් විජේසිංහය. ඔහුගෙන් බලහත්කාරයෙන් රුපියල් කෝටි 4 කට එම හෝටලය මිලදී ගෙන තිබෙන බව කියවේ. එය මිලදී ගෙන ඇත්තේ රාජපක්ෂ පවුලේ සේවකයකු ලෙස කටයුතු කරන පුද්ගලයකුගේ නමට බව වාර්තාවේ. දැනට එම හෝටලයේ පාලන කටයුතු සිදුකරනු ලබන්නේ ද ඔහු විසිනි. හෝටලය අක්කර 12 ක භූමිභාගයක පැතිර පවතී.

පසුගිය කාලය තුළ මෙම හෝටලයේ සිදු කළ සියලු අලුත්වැඩියා කටයුතු හා නව ඉදිකිරීම් සියල්ල හා හෝටලයට ආරක්ෂාව සැපයීම සිදු කළේ නාවික හමුදාවේ සෙබළුන් විසිනි. එපමණක් නොව යෝෂිත රාජපක්ෂ හා අගමැති මහින්ද රාජපක්ෂ මෙම හෝටලයට පැමිණෙන විට නාවික හමුදාවේ නිලධාරීන් හා සෙබළුන් යොදවා විශේෂ ආරක්ෂාවක් ද ලබා දේ. මෙම හෝටලයේ හෙලිකොප්ටර් ගොඩබෑම සඳහා විශේෂ හෙලිකොප්ටර් අංගනයක් ද ඉදිකර තිබේ. එය ඉදිකර ඇත්තේ ප්ලාස්ටික් කාපට් ඇතිරූ පාපන්දු පිටියක ස්වරූපයෙනි.

මෙම හෝටලය මෑතක් වනතුරුම පළමු හිමිකරු සඳහන් කර තිබූ සිංහරාජ ග්‍රීන් ඉකෝ ලොජ් (Sinharaja Green Eco Lodge) නාමයෙන් පවත්වාගෙන ගිය නමුත් අද වනවිට එම නාමය සඳහන් පුවරුව ඉවත් කර හෝටලය දක්වා පිවිසීමට ඇති කිලෝමීටරයක් පමණ වන අතුරු මාර්ගය අලුත්වැඩියා කරමින් තිබිණි.

මෙම හෝටලයෙන් ඇති වෙමින් තිබෙන ප්‍රධාන අවදානම් තත්ත්වය වන්නේ ගොංගල කඳුවැටියට අයත් අක්කර 1000 ක වනාන්තර ප්‍රමාණයක් අත්පත් කර ගෙන මෙම හෝටලය හා සම්බන්ධ සමස්ත සංචාරක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැළසුම් සකස් කිරීමයි. ඒ යටතේ ගොල්ෆ් ක්‍රීඩාංගනයක් හා කේබල් කාර් ව්‍යාපෘතියක් ඇතුළත් වේ. 2011 මාර්තු 01 වන දින අංක 1695/16 දරන ගැසට් නිවේදනය මගින් එවකට මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් ඔහුට ඇති බලතල භාවිතා කර ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ (4) උප වගන්තියට අනුව හේයස් වත්තට පවරා තිබූ අක්කර 2210 ක භූමි ප්‍රමාණයෙන් අක්කර 1000 ක් නැවත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පවරා ගෙන තිබේ. මෙම සමස්ත වනාන්තර ප්‍රදේශය දැනට සිංහරාජ වන රක්ෂිතයට අයත් වේ.

වැඩි කොටසක් සිංහරාජ වන රක්ෂිතය තුළින් විහිදී ඇති ගොංගල මාර්ගයේ සංවර්ධන කටයුතු හේතුවෙන් වනාන්තර පද්ධතියට හා ජෛව ප්‍රජාවට දැඩි බලපෑම් එල්ලවී තිබේ. මාර්ගය පුළුල් කිරීම හා පස් ලබා ගැනීම සඳහා කැණීම් කිරීම හේතුවෙන් වනාන්තර පද්ධතියට දැඩි හානි සිදුකර තිබේ.

මෙවන් තත්ත්වයක් තුළ අනාගතයේදී ගොංගල කඳුවැටිය ඛේදජනක ඉරණමකට ගොදුරුවීම වළකාලිය නොහැක. බෙවර්ලි වත්තේ සිට සූරියකන්ද දක්වා පැතිරුණු මෙම කඳුවැටිය මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කන්දිල්පාන හා විහාරහේන යන ග්‍රාම නිලධාරී වසම් දෙකට හා රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් උල්ලිදුවාව හා බොරළුවාගේ අයින යන ග්‍රාම නිලධාරී වසම් දෙකට අයත් වේ. පතිල්කන්ද හා සම්බන්ධව ඇති මෙම කඳුවැටි පද්ධතියෙන් ගිං, නිල්වලා, වලවේ හා කළු ගංගා පෝෂණය වෙයි. මේ නිසා මෙම ප්‍රදේශයේ සමස්ත ආර්ථිකය රැඳී ඇත්තේ තේ වගාව සුරක්ෂිත වී ඇත්තේ මෙම ජල පෝෂක වනාන්තර පද්ධතිය මතය.

හෝටලයට ගිනි තැබීමට හේතු වී ඇත්තේ මෙච්චර කරුණු කාරණා ගැන ඉතා හොඳින් දැන සිටි පිරිසක් බව පැහැදිලිය. එහෙත් මෙවැනි තත්ත්වයකදී ආවේගශීලී නොවී, පරිසර පද්ධතියට හානියක් නොවන සේ එය සංචාරක ව්‍යාපාරය නැංවීම සඳහා යොදා ගැනීමට ක්‍රමවේදයක් වුව සකස් කිරීමට හැකිව තිබේනම් යහපත්ය. එහෙත් ව්‍යාපාරික තත්ත්වය තුළ සමස්ත දේශපාලනඥයින් 'තක්කඩිකම්' නොඉවසනසුලු ප්‍රජාවක් බිහිව තිබීම අවධානය යොමුවිය යුතු කාරණයකි. පරිසරය පමණක් නොව සමස්ත සමාජයම විනාශ කරමින් දේශපාලනඥයන් තම සුඛවිහරණය හේතුවෙන් කරන 'අමනකම්' තවදුරටත් ජනතාව ඉවසන්නේ නැති බව පෙන්වීමට හොඳම නිදසුනද මෙවැනි සිදුවීම්ය.

**(සජීව චාමිකර මහතාට ස්තුතිය.)**

**● ටයිරසි බණ්ඩාර**

# වෛද්‍ය සදාචාරයත් ප්‍රශ්න කළ වෛද්‍ය දේශපාලන ගැටුම




විශේෂඥ වෛද්‍ය රනිල් ජයවර්ධන

පෝෂණය සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරයකු වන මහාචාර්ය රනිල් ජයවර්ධන මහතා විසින් හිටපු ඇමැතිවරයකු වන ප්‍රසන්න රණතුංග මහතාට ප්‍රතිකාර කිරීම ප්‍රතික්ෂේප කිරීමේ සිද්ධියක් පසුගියදා වාර්තා වීම බොහෝ දෙනාගේ කථා බහට ලක්වූ පුවතක් බවට පත්විය.

මෙයට පාදක වූයේ මේ වන විට රට තුළ පවතින දේශපාලනඥයින් කෙරෙහි ඇති විරෝධයයි. දේශපාලනඥයින් රටේ ජනතාව ගැන සැලකිල්ලක් දක්වන්නේ නැතිව තම දේශපාලන පක්ෂය සහ නායකයන් ගැන පමණක් සිතමින් කටයුතු කරන නිසා රට දැඩි ආර්ථික අර්බුදයකට ලක්ව ඇතැයි ජනතාව චෝදනා කරති. ඇත්තෙන්ම මෙය සත්‍යයකි. වර්තමානයේ පමණක් නොව මේ දක්වා බහුතරයක් දේශපාලනඥයන් සහ දේශපාලන පක්ෂ සිදු කළේ රට ගැන නොව තම පක්ෂය සහ තමුන් ගැනය. එහි ප්‍රතිවිපාක මේ වන විට අපි අත්විඳින්නෙමු. ඒ සඳහා ජනතාව ප්‍රතිචාර දැක්විය යුත්තේ බුද්ධිමත්වය.

විශේෂඥ වෛද්‍ය රනිල් ජයවර්ධන මහතා විසින් ද ප්‍රසන්න රණතුංග මහතාට ප්‍රතිකාර කිරීම ප්‍රතික්ෂේප කරන්නට හේතු වූයේ මෙම දේශපාලන පරිහානියයි. නමුත් ඒ සඳහා වෛද්‍යවරයා භාවිත කළ ක්‍රියාමාර්ගය තම වෘත්තියේ සදාචාරාත්මක බවට පටහැනි වී තිබේ. වෛද්‍යවරයකු ලෙස සේවයට එක්වන විට ප්‍රතිඥා දෙන්නේ තමා පුද්ගලයාගේ තරාතිරම නොබලා රෝගියකු ලෙස සිතා ප්‍රතිකාර ලබා දෙන බවයි.

මෙහි තවත් බරපතල ගැටලුවක් වන්නේ ප්‍රසන්න රණතුංග මහතා මෙම වෛද්‍යවරයාගෙන් මීට පෙර අවස්ථා දෙකකදී ද ප්‍රතිකාර ගෙන තිබීම ය. එනිසා ඔහුගේ රෝග තත්ත්වය ගැන වෛද්‍යවරයාට පූර්ව අවබෝධයක් ද තිබේ. එම තත්ත්වය මත පොදුවේ අප කවුරුත් හඳුනනවාට වඩා ප්‍රසන්න රණතුංග මහතා සම්බන්ධව වෛද්‍යවරයාට විශේෂ අවබෝධයකුත් පවතී.

මෙම සිද්ධිය ගැන ප්‍රසන්න රණතුංග මහතා මාධ්‍ය වෙත පවසා තිබුණේ මෙලෙසිනි. "මම වෛද්‍ය රනිල් ජයවර්ධන මහතාගෙන් මීට පෙර අවස්ථා දෙකකදී ප්‍රතිකාර ලබාගෙන තිබෙනවා. මගේ සිරුරේ පවතින අධික ස්ථූලභාවය නිසා විටමින් සම්බන්ධ ගැටලුවලට ප්‍රතිකාර ලබා ගැනීමට වෛද්‍යවරයා හමුවෙනවා. ඒ අනුව නැවත හමුවිය යුතු බවට පැවසූ කාලසීමාවට අනුව දිනයක් වෙන්කරවා ගත්තා. එම දිනය වෙන්කර ගත්තේ අදාළ දිනයට පෙර දින දෙකකට කලින්. මට ලැබී තිබුණේ අංක දෙක. ඒ අනුව මමත් බිරිඳත් නියමිත වේලාවට පෙර ලංකා රෝහලට පැමිණියා. වෛද්‍යවරයා රෝගීන් බැලීම ආරම්භ කළ පසු හෙදියක් මගේ බිරිඳට කථා කර පවසා ඇත්තේ වෛද්‍යවරයා දේශපාලනඥයන්ට ප්‍රතිකාර කිරීම ප්‍රතික්ෂේප කරන බවය. මම මීට පෙරත් වෛද්‍යවරයාගෙන් ප්‍රතිකාර ලබාගෙන ඇති නිසා මෙවර මට මෙවැනි තීරණයක් ගත්තේ ඇයි කියා විමසුවා. නමුත් වෛද්‍යවරයා ඊට පිළිතුරක් දුන්නේ නැහැ."

මේ සම්බන්ධව කිසිවක් ප්‍රකාශ නොකරන බව වෛද්‍ය රනිල් ජයවර්ධන මහතාද සමාජ මාධ්‍ය ඔස්සේ පණිවුඩයක් නිකුත් කර ඇත.

මෙලෙස වෛද්‍යවරයා හදිසියේම වෙනස්වන්නට ඇත්තේ ගෝල්ෆේස් පිටියේ පැවැත්වෙන තරුණ අරගලයට සහාය දීමක් ලෙස විය හැකි යැයි සමාජය තුළ විවිධ මත පළවේ.

මෙවැනි වැරදි පූර්වාදර්ශ සමාජයේ පිළිගත් වෘත්තිකයින් අතින් සිදුවන විට එය සමාජයේ පහළට ගමන් කරන්නේ ඉතා වේගයෙනි. එවැනි සිදුවීමක් ඉකුත් 09 වැනිදා කොළඹ ජාතික රෝහල ඉදිරිපිටදී දැකගත හැකි විය. ගාලු මුවදොර අරගල භූමියට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ දේශපාලනඥයින් පිරිසක් සහ ඔවුනගේ පාක්ෂිකයන් පිරිසක් පහරදීමත් සමග ඇතිවූ ගැටුමින් තුවාල ලැබූ ආරක්ෂක අංශ සාමාජිකයන් ප්‍රතිකාර සඳහා ජාතික රෝහලේ හදිසි ප්‍රතිකාර අංශයට රැගෙන ආ විට ඔවුන් රෝහලට ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කරමින් රෝහලේ සෞඛ්‍ය සේවකයන් පිරිසක් විරෝධය පාන්නට වූහ.

තවත් පිරිසක් ප්‍රතිකාර සඳහා ඇතුළත් කර ගන්නා රෝගීන්ට පහර දෙන්නට වූහ. මෙහිදී වෛද්‍යවරු පිරිසක් ඉදිරිපත්ව ඊට විරෝධය දක්වමින් පැවසුවේ රෝගීන්ට ප්‍රතිකාර කිරීම වෛද්‍යවරු සතු වගකීමක් බැවින් ඊට විරෝධය පෑම සිදු නොකරන ලෙසය. මෙලෙස තම වෘත්තීය ගැන නිසි අවබෝධයෙන් යුතුව කටයුතු කරන අති බහුතරයක් පිරිස අතර සුළුතරයක් අතින් සිදුවන වැරදි ඉතා වේගයෙන් සමාජයේ ප්‍රචලිතවීමට තරම් මේ වනවිට සමාජ මාධ්‍ය ජාලා ප්‍රබල වී ඇත. මීට පෙර මෙවැනි සිද්ධීන් ඇති වූ විට එය සමාජය අතරට යන්නේ ඉතා සෙමිනි. නමුත් වර්තමානයේ එය සජීවීව සමාජය අතරට යෑමට තරම් තාක්ෂණය දියුණු වී ඇත. එනිසා අප කොයි කවුරුත් අපගේ වෘත්තීය නිවැරදි අයුරින් ඉටු කිරීමට දැන්වත් පියවර ගත යුතුය. විශේෂයෙන්ම දේශපාලනඥයන් එය දැඩිව සිතට ගත යුතුය. මේ වන විට ජනතාව අතරින් ඉතා වේගයෙන් ප්‍රතික්ෂේප වන්නට පටන් ගෙන ඇත්තේ දේශපාලනඥයන්ය. දේශපාලනඥයන් බහුතරයක් තම යුතුකම් වගකීම් නිසි ලෙස ඉටු නොකර පෞද්ගලික අරමුණු ඔස්සේ කටයුතු කරන්නට පටන් ගෙන ඇත. පසුගිය දින කිහිපයෙහි නැවත වරක් අපට එවැනි සිද්ධීන් දැක ගත හැකි විය. එසේම ඊට දැක්වූ ප්‍රතිචාරද දැක ගත හැකි විය. මේ කිසිවක් ශිෂ්ට සම්පන්න සමාජයක් අනුමත කරන්නේ නැත. එබැවින් දැන්වත් අප නිවැරදි විය යුතුය.

විශේෂඥ වෛද්‍ය රනිල් ජයවර්ධන යනු පෝෂණය සම්බන්ධව දැනුම් සම්භාරයක් සහිත වෛද්‍යවරයෙකි. ඔහු බොහෝ පර්යේෂණ සිදු කර ඇත. ඒ සඳහා සම්මානයෙන් පවා පිදුම් ලබා තිබේ. එවන් කීර්තිමත් වෛද්‍යවරයකු විසින් සිදුකරන සුළු වරදකින් සමාජය තුළ අපකීර්තියට පත්වීම තුළින් බරපතල පාඩුවක් ජනතාවට සිදුවේ. එනිසා එවැනි වෛද්‍යවරුන් දේශපාලනඥයන්ට දඬුවම් කළ යුත්තේ ප්‍රතිකාර කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් නොව ජරාජීර්ණ වූ දේශපාලනඥයන්ට පවා ප්‍රතිකාර කිරීමට අපගේ වෘත්තීය උතුම් යැයි පවසමිනි. රජෙක් වුවත් ලෙඩෙක් වුවහොත් ඉන් විඳින වේදනාව දන්නේ ඔහු පමණි. එම තත්ත්වය දේශපාලනඥයන්ට වටහා දීමෙනි.


**● උපාලි ද සේරම්**

බුදු මඟ
ධර්ම සංග්‍රහය
වෙසක් කලාපය
■ වෙසක් පෝය නිමිත්තෙන් මෙවර සදහම් ප්‍රහේලිකාවට දෙගුණයක තෑගි
■ අර්බුදයේ නිර්මාණකරුවා කර්මය ද?
■ අවබෝධයට හේතු වන කරුණු හතක්
■ ඇසතු හා සල් රුක්වල ඔසු ගුණ වරුණ
■ සගා දාවා හෙවත් තිබ්බතයේ වෙසක්
■ බෞද්ධ ආචාර්ධර්ම හා පුද්ගල සංවරය
■ වීර්යයේ මාත්‍රාව
■ ධර්ම සන්නිවේදනයේ මුවහත
ඇතුළු තවත් ලිපි සමග
දැන් වෙළෙඳපොළේ
උපාලි ප්‍රකාශනයක්



# දශක පහක් පැන්න ලංකාවේ මුල්ම තොරණ මෙන්න


තොටළඟ තොරණ නිර්මාතෘ එච්. ඒ. විල්බට් පෙරේරා (විල්බට් සිඤ්ඤෝ) සහ බිරිඳ


විල්බට් පෙරේරා මහතාගේ පුත් අනුර පෙරේරා



## 71 කැරැල්ල, පාස්කු ප්‍රහාරය, කොරෝනා වසංගතය විසින් තොරණ ප්‍රදර්ශනයට බාධා සිදුකරයි

මෙරට පමණක් නොව විදෙස් රටවල පවා ප්‍රකට තොටලඟ තොරණ මුල්වරට ඉදි කොට මේ වන විට වසර 66ක් ගතවී ඇත. එහි ඉතිහාසය පිරික්සා බලන විට වාර්තාවන තොරතුරුවලට අනුව එකල තොටළඟ තොරණ ඉදි කිරීමට වැය වී ඇත්තේ රුපියල් 7,500 ක් වැනි මුදලක්ය. අඩි 80 ක් පමණ උසකින් යුක්තව ඉදි කරන ලද එම තොරණ ආලෝකවත් කිරීම පිණිස විදුලි බුබුළු 25000ක් පමණ යොදා ගෙන ඇත. එතැන් සිට සෑම වසරකම වෙසක් සමයේ මුල් කරගනිමින් ඉදිකරනු ලබන තොටලඟ වෙසක් තොරණ ඉතිහාසගත වන්නේ මෙරට ප්‍රථම වරට ඉදිකරන ලද වෙසක් තොරණ ලෙසය. එකල නාගලගම් වීදියේ පදිංචිව සිටි ප්‍රකට දානපතියකු මෙන්ම ව්‍යාපාරිකයෙකු වූ විල්බට් පෙරේරා මහතාගේ පෞද්ගලික ධනයෙන් ඉදි කරන ලද තොටළඟ වෙසක් තොරණ එදා මෙදා තුර මෙරට තොරණ කලාව ගත් කල එහි ''යෝධයකු" බඳුය. වෙනත් වචනයකින් හැඳින්වුවහොත් සෑම වසරකම වෙසක් උත්සවය නිමිත්තෙන් මෙරට ඉදි කරනු ලබන වෙසක් තොරණ අතරින් සුවිශේෂී වටිනාකමක් ගත් සිරිමත් නිමැවුමක් ලෙස හැඳින්විය හැක. මෙරටට වෙසක් තොරණ හඳුන්වා දීමේ පුරෝගාමියකු වු විල්බට් පෙරේරා එහි ගෞරවය ද සහිතව 1986 වර්ෂයේදී මරණයට පත්වන අතර ඔහු මරණයට පත් වන්නේ තොටළඟ තොරණ ඉතිහාසයේ එක් පරිච්ඡේදයක් බවට පත් වෙමින්ය. එබැවින් සෑම වසරකම ඉදිකරන ''තොටළඟ තොරණ" පිළිබඳ කතාබහ කිරීමේදී එම සුවිශේෂී චරිතය අමතක කොට ඒ පිළිබඳ කතා බහ කිරීමට කිසිවෙකුට පුළුවන්කමක් නැත.

උතුම් වූ වෙසක් දින උදා වීමට දින කීපයකට පෙර එක්තරා පුද්ගලයෙක් දිවයින කාර්යාලය වෙත පැමිණියේ එබැවින් විය යුතුය. ඔහු නමින් අනුර පෙරේරා නම් විය. ඔහු අන් කවරෙක්වත් නොව තොටළඟ තොරණ නිර්මාතෘ විල්බට් පෙරේරා ගේ පුතණුවන් අතරින් එක් අයෙක්ය. මෙරට තොරණ කලාවේ පුරෝගාමියෙකු වූ තම පියාණන් පිළිබඳවත් තොටළඟ තොරණ සතු සිරිමත් මතකයන් රාශියක් පිළිබඳවත් වූ රසවත් මතක රැසක් අනුර පෙරේරා විසින් සිහිපත් කර සිටියේ එම හමු වීමේ ප්‍රතිඵලයක් ලෙසය.

''මගේ තාත්තා කියන්නේ මීට අවුරුදු හැට හැත්තෑවකට කලින් තොටළඟ ප්‍රදේශයේ හිටිය ධනවත් ව්‍යාපාරිකයෙක්. අදත් තොටළඟ ප්‍රදේශයේ ජීවත්වෙන පැරණි මිනිස්සු ඒ බව දන්නවා. ඒ වගේම මගේ තාත්තා බොහොම සැහැල්ලුවෙන් ජීවත් වෙච්ච පුද්ගලයෙක් ලෙස කා අතරත් ප්‍රකටව සිටි කෙනෙක්. තාත්තගෙ සමකාලීන මිතුරන් කියන විදිහට සමාජ සේවය පිණිසත් ඒ වගේම විනෝදය පිණිසත් අත දිග හැරල සල්ලි වියදම් කරන එක තාත්තා පුරුද්දක් විදියට කරගෙන ගිහින් තියෙනව. ඒ කතාව මගේ අම්මත් අපිත් එක්ක නිතර නිතර කියල තිබුණ කතාවක්. ඔහොම ඉන්න අතරේ අපේ ගෙවල් කිට්ටුව ළමා ළපටින් එකතුවෙලා පුංචි තොරණක් ඉදි කරන ආකාරය දැකල තමයි තාත්තා තීරණය කරලා තියෙන්නේ ප්‍රදේශයට ලොකු ගෞරවයක් ගේන්නත් එක්ක එයාගෙ වියදමින් ලොකු තොරණක් ඉදි කරන්න ඕන කියල..."

තම පියාණන් පිළිබඳවත් ඔහුගේ මැදිහත්වීම මත 1956 වර්ෂයේදී මුල්වරට ඉදිකරන ලද තොටළඟ තොරණේ ආරම්භය පිළිබඳව එලෙස අදහස් ප්‍රකාශ කළ අනුර පෙරේරා මහතා ඉන් නොනැවතී තවදුරටත් තොටළඟ තොරණ පිළිබඳ තව තවත් රසමුසු මතක අවදි කරන්නට විය. එකල අද මෙන් දියුණු ප්‍රදේශයක් නොවු තොටළඟට අලුත් ආලෝකයක් එකතු කළ තොටළඟ තොරණ ඉදිකිරීම පිණිස ප්‍රදේශවාසීන් විසින් දරන ලද ''වෙහෙස" පිළිබඳ අතීත විත්ති එම අතිතාවර්ජනයට ඇතුළත් විය.

## විවෘත කරන්නට ආ අගමැති බණ්ඩාරනායකට ගුවනින් මල් ඉහලා

''....ඒ කාලේ අද වගේ පහසුකම් තිබිලා නෑ. එහෙම වුණා කියලා ආවට ගියාට තොරණක් ඉදිකරන එක නෙවෙයි තාත්තගේ හීනය වෙලා තියෙන්නේ. මුදල් කීයක් වියදම් වුණත් කරන දෙය හරියට කරන එක තාත්තගේ පුරුද්දක්. ඒ හින්දා ගමේ හැමෝගෙම සහයෝගය ඇතිව මේ කටයුත්ත ආරම්භ කළාට පස්සෙ හැම කෙනෙක්ම තම තමන්ට පුළුවන් විදිහට ඒ සඳහා සහයෝගය දීල තියෙනව. පුවක් ගස් දෙතුන් සියයක් ඒ සඳහා අවශ්‍යයි කියලා දැනගත්තට පස්සේ මේ පළාතේ එච්චර පුවක් ගස් නැති හින්දා ඒවා යටියන්තොට, රුවන්වැල්ල ප්‍රදේශයෙන් ගේන්න කටයුතු කරල තියෙනව. එහෙම ගේන්න පුවක් ගස් කැලණි ගඟ දිගේ තමයි තොටළඟට ගෙනත් තියෙන්නෙ. මගේ තාත්තගේ ධන






පරිත්‍යාගයෙන් ඉදිකළ මුල්ම තොරණේ කතා වස්තුව තමයි ''මහා හද්‍රකල්ප කතා වස්තුව". ඒක ලංකාවේ මුල්වරට ඉදිකළ දැවැන්තම තොරණ හින්දා දස දහස් ගණනක පිරිසක් මේක නරඹන්න ඇවිත් තියෙනව. අපේ රටේ හිටපු අගමැතිවරයකු වූ එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහත්තයා අතින් තමයි එදා තොරණ විවෘත වෙලා තියෙන්නේ. අවස්ථාව වඩාත් අලංකාර කිරීම පිණිස ගුවනින් මල් පවා ඉහළ තියනව. ඒ වගේම නියමිත දින ගණනට වඩා වැඩි දින ගණනක් තොරණ ප්‍රදර්ශනය කරන්නත් සිද්ධ වෙලා තියෙනව.

ඒකට හේතුව තමයි රටේ විවිධ ප්‍රදේශවලින් දිනපතා විශාල සෙනඟක් පැමිණීම. එතැනදි තවත් අපූරු සිද්ධියක් සිදු වෙලා තියෙනව. ඒකත් මේ වෙලාවෙදි මතක් කරන්න ඕන ..."

තොටළඟ තොරණ පිළිබඳව අතීත තතු පැවසීම පිණිස දිවයින කාර්යාලය වෙත පැමිණි අනුර පෙරේරා සතුව පැරණි ලිපි ගොනුවක් ද විය. එහි තිබූ ලිපි ලේඛන අතර තොටළඟ තොරණ පිළිබඳ අතීත විස්තර අඩංගු ලිපි ලේඛන ද කාලයා විසින් දුර්වර්ණ කරන ලද ඡායාරූප එකතුවක් ද විය. එම ලිපි ලේඛන රැගෙන එන ලද්දේ ඔහු විසින් පවසා සිටින දෙය සනාථ කිරීම පිණිස විය යුතුය. වරින් වර එම ඡායාරූප සහ ලිපි ලේඛන පෙන්වමින් ඔහු පවසා සිටින අතීතය අසා සිටීම තුළ වුව ද පහල වන්නේ එකල ලාංකිකයන් සතු හැකියාවන් පිළිබඳ විස්මය දනවන සුළු බවක්ය.


''....මම අපූරු සිද්ධියක් ගැන කිව්වනේ. ඒ ගැන වැඩිදුරටත් විස්තර කරනව නම් තොටළඟ ඉදිකරන ලද ''මහා හද්‍රකල්ප කතා වස්තුව" ඇතුළත් තොරණ නරඹන්න ජපන් ජාතිකයන් පිරිසක් සහභාගි වෙලා තිබෙනව. ඒ අය මේ තොරණට කොච්චර වශී වුණා ද කිව්වොත් ඔවුන් තොරණ නැරඹුවාට පස්සේ එය ජපානයේ ප්‍රදර්ශනය පිණිස රැගෙන යන්න පුළුවන්ද කියල ඉල්ලීමක් කරල තියෙනව. ඒකෙ ප්‍රතිඵලයක් විදිහට තමයි තොටළඟ තොරණ ජපානයේ පවා ප්‍රදර්ශනය කරන්න අවස්ථාව ලැබෙන්නේ. ඒ සඳහා තොරණ නිර්මාණය කරපු චිත්‍ර ශිල්පියා, විදුලි කාර්මික ශිල්පියා ඇතුළු තවත් කිහිප දෙනෙකුට සහභාගි වෙන්න පවා අවස්ථාව ලැබුණා. දින ගණනාවක් ජපානය තොරණ ප්‍රදර්ශනය කරල නැවත ලංකාවට ගේද්දි ජපානයේ දී තොරණ සඳහා භාවිත කරපු විදුලි බුබුළු සහ තවත් උපකරණ රාශියක් තෑගි වශයෙන් අපේ රටට ප්‍රදානය කරන්නත් ජපන් ජාතිකයන් කටයුතු කරලා තියෙනව. ලංකාවේ මුල්වරට ඉදිකරපු තොරණ ජපානයේ පවා ප්‍රදර්ශනය වුණේ එහෙමයි ..."

## තොටළඟ තොරණ ජපන් ගෙන යයි

එවැනි අතීතයක් පසුබිම් කරගනිමින් ආරම්භ වන තොටළඟ තොරණ වෙසක් උත්සවය නිමිත්තෙන් කොළඹ ඒකාලෝක කරන වෙසක් තොරණ කීපය අතරින් සුවිශේෂී වටිනා වටිනාකමක් හිමි කරගන්නා නිර්මාණයක්ය. මේ වන විට එම කටයුත්ත පිණිස වෙනම සංවිධානයක් පිහිටුවාගෙන ඇති අතර එය නම් කරනු ලබන්නේ තොටළඟ වෛශාඛ්‍යාලෝක සමිතිය නමින්ය. පුළුල් සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වන එය විශාල සාමාජිකයන් පිරිසකගෙන් සමන්විත වන අතර මේවන විට තොටළඟ තොරණ ඉදිකරනු ලබන්නේ ඔවුන්ගේ එකමුතුවෙන් සහ සංවිධාන ශක්තියෙන්ය. මේ වන විට ඔවුන් විසින් තොරණ ඉදිකිරීම පිණිස ස්ථිර කොන්ක්‍රීට් කණු තුනක්ද වෙනම කාර්යාලයීය ගොඩනැගිල්ලක්ද පවත්වාගෙන යන අතර එම කොන්ක්‍රීට් කණු ඉදිකරනු ලබන්නේ තොරණේ ආරක්ෂාව පිණිසය. එවැනි ස්ථිරසාර පදනමක් යටතේ වසරකට වරක් මහජන ප්‍රදර්ශනය පිණිස ඉදි කරනු ලබන තොටළඟ තොරණ අවස්ථා කීපයකදී පමණක් මහජනතාවට දැක බලා ගැනීමට නොහැකි මං මේ රටේ පැවැති යම් යම් සිදුවීම් හේතුකොට ගෙනය. 1971 වර්ෂයේ සිදු වූ අප්‍රේල් කැරැල්ල හේතුවෙන් වරක් එය මහජනතාවට දැකබලා ගැනීමට නොහැකි වූ අතර ඉන් අනතුරුව 2019 වසරේ එල්ල වූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් ද තොටළඟ තොරණ දැකබලා ගැනීමේ අවස්ථාව ජනතාවට අහිමි වූහ. ඉන් අනතුරුව හටගත් කොරෝනා වසංගතයේ හේතුවෙන් තොටළඟ තොරණ පසුගිය වසර දෙක තුළද ජනතාවට දැක බලා ගැනීමට නොහැකි වූහ. කෙසේ වුවද මෙරට ඉදිකරන ලද ප්‍රථම තොරණ ලෙස ඉතිහාසයට එක්වන තොටළඟ තොරණ හෙට උපදින පරපුරට දැක බලා ගැනීම පිණිස මතු මතු ද ඉදිකිරීම ඒ සඳහා ම පිහිටුවා ගත් සංවිධානයේ මූලික අභිලාෂය බවට පත්ව ඇත්තේ තොටළඟ යනු වසරකට වරක් එහි ඉදිකරන තොරණ හේතුවෙන් රටම දන්නා නමක් බවට පත් වීමත් එම ජනප්‍රියත්වය එම ප්‍රදේශයට මහත් ආඩම්බරයක් ගෙන දෙන කරුණක් බවට පත් වීමත් හේතුවෙන් ය.

● රුවන් ජයවර්ධන.






# ජාතික වෙසක් උළෙලේ සිරියෙන් බැබළෙන
# කූරගල පුදබිම

**• මෙන්න කූරගල ඉතිහාසය**

රත්නපුර දිස්ත්‍රික්කයේ, බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බලන්ගොඩ කල්තොට ප්‍රධාන මාර්ගයේ කි.මී. 28ක් පමණ ඈතින් පිහිටි තන්ජන්තැන්න (තැන්න) ප්‍රධාන මාර්ගයේ සිට කි.මී. 2ක් පමණ දුරකින් ඓතිහාසික කූරගල ශෛලමය ගුහා පුදබිම පිහිටා ඇත. නැගෙනහිර දේශාංශක 800 44'' හා උත්තර අක්ෂාංශක 60 31'' අයත්ය. මුහුදු මට්ටමේ සිට උස මීටර් 177 පමණ වේ. වියළි හා සෞම්‍ය කලාපය (අතරමැදි කලාපය) අතර පිහිටයි.

තන්ජන්තැන්න ප්‍රධාන මාර්ගයේ ''කූරගල පුරාවිද්‍යා ස්ථානය'' යනුවෙන් නාම පුවරුවක් එදා සවිකර තිබුණි. ගල් මතුවී තැනින් තැන තාර ගැලවී තණකොළ වැඩුණු පටු පාරක් කිලෝ මීටරයක් පමණ දුර ප්‍රමාණයකට තිබුණි. පාර දෙපස නිවාස කිහිපයක්ද විය. මාර්ගය අවසානයේ දොළ පාරකි. එතැන් සිට කඳු මුදුන දක්වා ක්‍රමයෙන් උස් වූ ගල් පර්වතය මත පා ගමනින් ගමන් කළ හැකි විය. තැනින් තැන ගල් පඩි ද ඉදිකර තිබුණි. ඒ වනවිට පිවිසුම් මාර්ගයේ තොරණ වැනි ඉදිකිරීම් කිසිවක් නොවීය. ගල් පවර්තය මත චෛත්‍යයක නටබුන් වූ කළුපැහැ ගඩොල් ගොඩකි. ගල මුදුන හෙක්ටයාර් 10ක පමණ ඈතට පැතිරුණු ගල් තලාවක් විය.

තැනිතලා පර්වත මුදුනේ කුහරයකි. බැවින් (කුහර+ගල) කූරගල නාම භාවිත වේ. දෙතුන් දෙනෙක් සමඟ මම කුහරයට රිංගා ගියෙමි. හිස හා දෙදණ නමාගෙන ගල් අතරින්, දණගාගෙන බඩගාගෙන ඇදෙන ලෙස ඉතා දුෂ්කර මිනිත්තු දහයක පමණ ගමනක යෙදුනෙමි. මෙහි ඇතුළත තෙතමනය, වවුල් ගඳ සහිත වාතාශ්‍රය නිසා හුස්ම ගැනීමට පවා අපහසු විය. ගුහාව කෙළවර යකඩ කැබැල්ලක් ඉනිමඟ ලෙස පහතට බැසීමට තබා තිබිණි. එය අල්වාගෙන අඩියෙන් අඩිය පය තබමින් පහතින් වූ ගුහාවට ප්‍රවේශමෙන් ඇතුළු වුණෙමු. එය මීටර් තුනක් පමණ උස තුන් හතර දෙනෙකුට පේළියට සිටගෙන සිටිය හැකි ගුහාවකි. එක්වරම එහි සිටගෙන සිටීමට ලැබීම සිරුරට මහත් පහසුවක් විය. එහි ඉහළ වූ විශාල පර්වත දෙකක වූ හිඩැසකින් ගුහාව තුළට ආලෝකය කාන්දු වන බව පෙනේ.

කූරගල පුදබිමේ ගල්තලාව මතට දසතින් හමන උදෑසන සීතල සුළඟ නිහඬතාවය හාත්පසින් පෙනෙන දර්ශනීය පරිසරය ගතසිත සනසාලයි. එක්වරම නැගෙනහිර දෙසට පර්වතයේ මීටර් 100ක පමණ සෘජු බෑවුමකි. බෑවුමට පහතින් වූ කල්තොට නිම්නය හෙක්ටයාර් 2000ක් පමණ කුඹුරු යායකි. කල්තොට නිම්නයේ සිට ආරම්භ වන තැනිතලා භූමිය රුහුණු කතරගම දක්වා පැතිර පවතියි. කඳසුරිඳුන්ගේ සත්ගිරි පව්ව, වියළි කලාපයේ රක්ෂිත වනාන්තර, තැනින් තැන වූ වැව් මෙන්ම උඩවලව ජලාශයද කූරගල පුදබිමට පැහැදිලිව පෙනේ. කල්තොට නිම්නය මැදින් ගලායන වලවේගඟ කල්තොට ගොවිබිමට දියවර සපයමින් 1968 ඉදිකළ උඩවලව ජලාශයද පෝෂණය කරයි. දකුණු දෙසට උස්ව සමාන්තරව විහිදී යන කූරගල පර්වත බෑවුමේ බුදුගල පුරාණ විහාරය අනුරාධපුර යුගයට අයත් ශෛලමය මාලිගාවක නටබුන් වනගතව පබ්බතය තුළ ඇත. කිරිමකුළුගොල්ල, දියවිනි ඇල්ල, හඳගිරිය (මහවලතැන්න වලව්ව) මහවලතැන්න සානුව දක්වා පැතිර යයි. කූරගලට ආසන්න වලවේගඟේ සංචාරක මධ්‍යස්ථානයක් වන සුන්දර දූවිලි ඇල්ලද පිහිටා ඇත. බටහිර දෙසින් බලන්ගොඩ මාරතැන්න අහස උසට නැගුණු උමයංගනාවගේ දෙපියයුරු වැනි දෙතනගල කඳු දෙකද පසුබිමෙන් ශ්‍රීපාදස්ථානයද උතුරු දෙසට ලෝකාන්තය හා හපුතලේ කඳු පියස ඇතුළු දස දිසාවම පැහැදිලිව දර්ශනය වේ. අමාවක දිනක රාත්‍රියට හපුතලේ සිට ඉදල්ගස්හින්න දක්වාවූ දුම්රිය මාර්ගයේ කෙළඹ බලා ධාවනය වන රාත්‍රී තැපැල් දුම්රියේ විදුලි ආලෝකය නාගරාජයෙකු ඇදෙන්නා සේ කූරගලට පෙනේ.

**• උරුමය**

දිනක් මම කූරගලට ගියෙමි. එවිට බෑවුමේ වම්පැත්තේ ගුහාව අසල පුරාවිද්‍යා ස්ථානයක ගල් කඩමින් ගොඩගසා හතර පස් දෙනෙකු ගුහාවට බද්ධකර ඉදිකිරීමක යෙදී සිටියහ. ගල්ගුහාව හා ඒ ආසන්නයේ වර්ණ යොදා නම්ගම් සටහන් කර වනසා තිබුණි. සෘජු පිවිසුම් සහිත ගල් ගුහාවල වැසි සමයේදී වැසි ජලය ගල්ගුහා තුළට කාන්දු වෙයි. ආදී මුතුන්මිත්තෝ ඒ බව දැන කටාරම් කෙටීමෙන් ජලය ගුහාව තුළට යෑම නවතාලීමේ ක්‍රමවේදය භාවිතා කර තිබෙති. සිංහරාජ වනාන්තරයේ විසි තිස්දෙනකුට වාසය කළහැකි ගල්ගුහා තැනින්තැන ඇත. මෙම ගල්ගුහාවල ඉහළ පර්වතය වැසි ජලය බැස යන ලෙස ස්වභාවිකව ආනතියකට පිහිටා තිබෙයි. එම නිසා මෙහිදී කටාරම් තාක්ෂණය සිදුකර නැත. කූරගල පුදබිමේ ගුහාවල සෘජු පිවිසුම් ඇති බැවින් කටාරම් කොටා ඇත.










වරෙක අතිපූජ්‍ය අග්ගමහා පණ්ඩිත බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහා නාහිමි බෞද්ධ දර්ශනය ව්‍යාප්ත කිරීම උදෙසා විදේශගත විය. එහිදී හෙළදිව රහතුන් වහන්සේලා වැඩසිටි බලන්ගොඩ කූරගල පුදබිමේ ගල්ගුහා ත්‍රිත්වයේ බෞද්ධ උරුමය තහවුරු කිරීම සඳහා ගවේෂණය කර ග්‍රන්ථාරූඪ කිරීමට ඇපකැප වී කටුතු කළේ රත්නපුර මාරපන ශාස්ත්‍රෝදය පිරිවෙනේ පූජ්‍ය පණ්ඩිත කිරිඇල්ලේ ඥානවිමල හිමිපාණන් බව උන්වහන්සේ කීහ. ඒ බව උන්වහන්සේගේ කෘතියකද සඳහන්ය.

**• සබරගමුව ලියකියවිලි**

පණ්ඩිත කිරිඇල්ලේ ඥානවිමල හිමි ශෛලමය පර්වත පාමුල

ගල්ගුහා තුනක කටාරම් පේළි තුනක් ඇත. ක්‍රි. පූ. 2 වන 3 වන වසරවල කූරගල (කුහර දෙකක් ඇති බැවින් කූරගල නාම ව්‍යවහාර වේ.) පිහිටුවා ඇත්තේ දත්ත, ලක්ෂ්මණ හා සුමණ තිදෙනා විසින් බව පුරාවිද්‍යා පරීක්ෂණවලින් තහවුරු වී ඇත.

දත්තගේ ගල් ගුහාව විශාල වන අතර කටාරම්වලට පහළින් පැරැණි බ්‍රාහ්මී අක්ෂර කොටා සඟසතු කොට ඇත. ප්‍රධාන ගල්ගුහා තුනකි. එහි කටාරම් කොටා ඇත.

**• ශිලා ලිපි තුන**

1 වන ලිපිය :- ''දතහ පුදන ලෙනේ''
අදහස :- දත්තගේ ගල් ගුහා (ගුහාව) මහා සංඝයා වහන්සේට පූජා කරන ලදී.
2 වන ලිපිය :- පරුමක ශුමණයක''
අදහස :- ප්‍රධාන ශුමණ (සමන්) ගේ ගල්ගුහාව මහා සංඝයා වහන්සේට පූජා කරන ලදී.
3 වන ලිපිය :- පරුමක ලශමයන''
අදහස :- ප්‍රධාන ලශම (ලක්ෂමන) ගේ ගල්ගුහාව මහා සංඝයා වහන්සේට පූජා කරන ලදී.

**• (උපුටා ගැනීම අවසන්)**

අන්‍ය ලබ්ධිකයෝ කූරගල පුදබිම හිමිකර ගැනීමට විවිධ උපක්‍රම යෙදූහ. රහතන් වහන්සේලා වැඩවිසූ ඓතිහාසික, කූරගල පුදබිම බෞද්ධ උරුමයක් බව ඉතිහාසයෙන් පෙන්වා දී ඇත. එම උරුමය අයුක්තියෙන්, අසාධාරණයෙන් පවරා ගැනීමට එරෙහිව නඩු මඟට බැසීමට පූජ්‍ය වටද්දර ඥානිස්සර හිමි තීරණය කළේය. උසාවියේ දශක ගණනාවක් කූරගල නඩුව විභාගයට ගැනිණි. නඩු දිනට බලන්ගොඩ පෙට්ටිගල පාරේ බෝම්බුව පන්සලේ සිට උදෑසන නඩු ලියකියවිලි ගොනුවක් රැගෙන වටද්දර ඥාණිස්සර හිමි බලන්ගොඩ නගරයට පැමිණෙයි. උන්වහන්සේ උදෑසන බලන්ගොඩ නගරයේ සැරිසරන්නේ නඩු දිනට බව බොහෝදෙනා දනිති. නඩු දිනක බලන්ගොඩ නගරයේදී උන්වහන්සේ මට හමුවිය.

'අද කූරගල නඩුවතේ දැන් අවුරුදු දහසයක් වෙනවා'. යනුවෙන් උන්වහන්සේ පැවසූහ. කෙසේ හෝ කූරගල නඩුවෙන් අහිමිවී ගිය බෞද්ධ උරුමය, උන්වහන්සේගේ හුදෙකලා අභීත ප්‍රයත්නය අවසානයේ ජයග්‍රහණය කළේය.

සබරගමුව ප්‍රදේශයේ පමණක් නොව හෙළදිව පුරා පවතින බෞද්ධ උරුමය රැකගැනීමට, ආරක්ෂා කිරීමට ගිහි පැවිදි පුරාවිද්‍යාව පිළිබඳ විද්වතුන් රාශියක් සබරගමුව ප්‍රදේශයේ සැදීපැහැදී සිටින බව සිහිපත් කළ යුතුය.

**• "විය යුත්ත කෙසේ හෝ විය යුතුය"**

ඓතිහාසික කූරගල පුදබිම නවලොවට සරිලන ආකාරයෙන් ප්‍රතිනිර්මාණය කිරීමට සංවිධානයෙන් ධෛර්යයෙන්, කැපවීමෙන් ඉටුකිරීමේ කාර්යය පැවරුණේ පූජ්‍ය වතුරකුඹුරේ ධම්මරතන හිමිපාණන්ටය. (නෙල්ලිගල හාමුදුරුවෝ) උන්වහන්සේ ඓතිහාසික කූරගල පුදබිම අභිමානවත් අසිරිමත් ස්ථානයක තැබීමට කටයුතු කරගෙන යෑම ප්‍රශංසනීය බව කිව යුතුය.

**• කූරගල පුදබිම අවට සශ්‍රීකත්වය**

කූරගල පුදබිම අවට පිහිටි හපුතලේ අඩවිය, බලන්ගොඩ අඩවිය උඩවලට අඩවිය හා තණමල්විල අඩවිය එහි රක්ෂිත වනාන්තරය සතා සිවුපාවා, ඓතිහාසික ස්ථාන හා ජන විඥානය පිළිබඳ රාජකාරි අත්දැකීම්, පළපුරුදුකම් වන නිලධාරියෙකුව සිටියදී මම ලබා ගතිමි. රුහුණු රාජධානියේ අවසාන කල්තොට ප්‍රදේශය ලෙස සලකනු ලැබේ. කල්තොට හම්බෙගමුව වැනි කූරගල පුදබිමට අසන්න වූ භූමියේ ගල්කණු, ශෛලමය බුද්ධ ප්‍රතිමා හා නිදන් වස්තු කැණීම් කිරීමේදී හමුවන බව ප්‍රදේශයේ අය පවසති. රුහුණු හා සෙංකඩගල රාජධානිය අතර අතීතයේ ගමනාගමනය සිදුව ඇත්තේ කල්තොට කූරගල, මහපැලැස්ස, හල්දුම්මුල්ල, ඉදල්ගස්හින්න, කැප්පෙටිපොල (පාළුගම), කඳපොල මහකුඩුගල, මන්දාරම්නුවර (මතුරට) ස්ථාන හරහා බව සඳහන් වේ. මේ මාර්ගය පාගමනින් යන සමහරු අද දක්වාම භාවිත කරති. එසේම කූරගල, මුල්ගම (මුල්ගම වලව්ව) බලන්ගොඩ, රාස්සගල හරහා ශ්‍රීපාදස්ථානයට මාර්ගය වැටී ඇත. එමෙන්ම හපුතලේ ආසනයේ කෙළවර වලවේගඟේ වම් ඉවුරැද, වැල්ලවාය ආසන්නයේ කල්තොට වෙලිඔයද, බලන්ගොඩ ආසන්නයේ ආරම්භයද යන මේ ත්‍රිත්වය කූරගල පුදබිම කේන්ද්‍රකර ගනිමින් පවතියි. අතීතයේ දන්ත ධාතූන් වහන්සේගේ ආරක්ෂාව සලකා කූරගල පුදබිම ආසන්නයේ සඟවා තබා ඇත. එහි ආරක්ෂක කපොලු ලෙස පොල්ලමුරේ, ඉඹුලමුරේ, මොලමුරේ, පනාමුරේ (මඩුවන්වල වලව්ව ඇත්ගාල) ස්ථාපිත කර ඇති බව සඳහන් වෙයි. එමෙන්ම කූරගල පුදබිම කේන්ද්‍ර කර ගනිමින් තන්ජන්තැන්නේ මංගර දේවාලය, සොරගුණේ කතරගම දේවාලය, ඉඹුල්පේ උග්ගල් අලුත්නුවර දේවාලය, බලන්ගොඩ බොල්තුඹේ දේවාලය, පිහිටුවා ඇත. කොට්ටිඹුල්වල පුරාණ ගල්ලෙන් රජමහා විහාරය හා පල්ලෙබැද්දේ සංබපාල රජමහා විහාරයද වෙයි. අතීතයේ කිංචිගුණේ (සමනල වැව) කැණීම්වලදී යපස් කර්මාන්තය පැවතී ඇති බව සොයාගෙන ඇත. මෙම ප්‍රදේශයේ ජනතාවගේ ජීවනෝපාය ගොවිතැන වුවත් කූරගල සිට රජවක දක්වා භූගත නිධි ලෙස පවතින කැල්සයිට් කර්මාන්තය, මැණික් කර්මාන්තය, උක් හකුරු කර්මාන්තය හා හේන් ගොවිතැන ප්‍රධාන වේ.

හැටේ දශකයේ කල්තොට, කූරගල ආශ්‍රිත පදේශවල මැලේරියාව බහුලව ව්‍යාප්ත වී ඇත. හේන් කෘෂි භෝග ගොන් බැඳි කරත්තවලින් බලංගොඩට ගෙන එන ලදී. ඒ වන විට කල්තොට ප්‍රදේශයේ මැලේරියාව පැවති බැවින් බලන්ගොඩ ජනතාව එම කෘෂි භෝග පරිහරණයට මැළිකමක් දැක්වූහ. දැන් එම ප්‍රදේශය ජනාවාස වී ලෙඩදුක් වලින් තොර සශ්‍රීක පුරවරයක් වී ඇත.

කූරගල අවට ප්‍රදේශයේ ඖෂධ පැළෑටි බහුලය. සුදුහඳුන් ගසේ පුනර්ජන්මීය ප්‍රදේශකි. Diarie of G. A. Rathnapura H.WACE-1887/03/11 වලවේ නිම්නයේ රාජකාරියේ යෙදී සිටියදී වෙසක් ඕකිඩ් (උඩවැඩියා) - Dendrobium/Rhododendrons, වන රාජ - King of the Forest' ඉරි රාජ - Striped King ගුරුළු රාජ හා මීටර් 1/2ක් පමණ උස නාගධරණ පැළෑටි ද දුටු බව සටහන් කරයි.

දියවින්න රක්ෂිත වනාන්තරයේ කෝන්ගහමංකඩ ගජ මදාරා, මල් මදාරා (Cleistanthus Collinus order Euphobiaci) අතු පතර විහිදී ගිය වෘක්ෂරාජයෙක් දැක ඇත. එහි ගෙඩි විෂ සහිත බවත් ඉතා තද රතු පැහැ අරටුවක් සහිත බවත් කියයි. මෙම ගසේ කැබැල්ලක් රජවක පුද්ගලයෙකු පසුකාලීනව මට ලබා දුනි. එසේම කූරගල සෘජු පර්වත බෑවුමේ කළුනික ගසක් ඇති බවද රත්නපුර ඒජන්ත තැන සටහන් කර ඇත.

කටුපත්ඔයෙන් එගොඩ කෝන්ගහමංකඩ ප්‍රදේශයේ එදා හේන් ගොවිතැන සාරවත් වී ඇත. බඩඉරිඟු, කුරක්කන්, මිරිස්, රතුලූනු බහුලව තිබී ඇත. රජවක ප්‍රදේශයේ විසූ එක්තරා යකැදුරෙක්, කොලු ගැටයෙකු සමඟ හඳගිරිය කන්දෙන් බැස මෙම හේන් වගාවට පැමිණ ඇත. හේන් වගාකරුවන් විසින් ඔහුට ඉහත කී කෘෂි භෝග මල්ලක් පුරා දෙයි. එය ඉතා බර මල්ලකි. ''ඔය කොල්ලට මේ බර මල්ල හඳගිරිය කන්දේ ඔසවාගෙන ගිය හැකි දැයි'' හේන් වැසියන් යකැදුරාගෙන් අසති ''උඹලා බැඳලා දීපල්ලකෝ උෟ ගෙනියයි'' ඒ බර උසුලාගෙන ගිය කොලුගැටයා ලෙස යකෙකු බැඳගෙන යකැදුරා පැමිණෙන බව සඳහන් වෙයි.

බුද්ධ කාලයේ හා ඉන් පසුවත්, බුදුන් වැඩසිටි තැන් මෙන්ම ශාරීරික ධාතු තැන්පත් කර ඉදිකරන චෛත්‍ය හා ශෛලමය ප්‍රතිමා හා වෙනත් කලාත්මක නිර්මාණ හෙළදිව පුරා පවතී. බුදුන් උපන් භූමිය ලෙස සලකන හෙළදිව මෙකී ඓතිහාසික සිද්ධස්ථානවලට විවිධ ක්‍රමවලින් හානි පමුණුවා භූමිය අයිතිකර ගැනීමේ සටනක යෙදී සිටී. මෙය ලොව පුරා අතීතයේ සිට සිදුවන ක්‍රියාවලියකි. ඇෆ්ගන් තලෙයිබාන්වරු අවුරුදු දහස් ගණනක් වූ සේද මාවතේ ගල් පර්වතවල ඉදිකළ බාමියන් බුදු පිළිම 2001දී විනාශ කළහ. බෞද්ධයෝ අන්‍ය ලබ්ධිකයන්ගේ පූජනීය ස්ථානවලට හානි නොකරති.

අන්‍ය ලබ්ධිකයන් විසින් නතුකර ගැනීමට ප්‍රයත්න දැරූ කූරගල පුදබිම ඓතිහාසික බෞද්ධ උරුමයක් බව එම පින් බිමේ පුරාවිද්‍යා ගවේෂකයෝ නිරන්තරව කියන්නාහ. 2022 වෙසක් කලාපය පින් බිමෙහි පැවැත්වීමට වතුරකුඹුරේ ධම්මරතන හිමි (නෙල්ලිගල හාමුදුරුවෝ) ඇප කැපව සිටීම පින්වන්ත කාර්යයකි. මෙය සමස්ත සිංහල බෞද්ධ ජනතාවගේම ජයග්‍රහනයකි.

බලන්ගොඩ -
● කේ.කේ.එච්. දයානන්ද

# වාර්තාවක් තැබූ අගමැති

මෙරට දේශපාලන සහ සමාජ ඉතිහාසයට නොමැකෙන කළු පැල්ලමක් එක් කළ සඳුදා පස්වරුවේ විසිපස්වන අග්‍රාමාත්‍යවරයා ලෙස කටයුතු කළ මහින්ද රාජපක්ෂ මහතා අග්‍රාමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස් විය. අග්‍රාමාත්‍යවරයා සිය ධූරයෙන් ඉවත් වී පැය 76 ක් ගත වන තුරුම එම පුරප්පාඩුව පිරවීම සඳහා කිසිවකු ඉදිරිපත් වී තිබුණේ නැත. අනතුරුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සමඟ සාකච්ඡාවකින් පසුව පාර්ලිමේන්තු මන්ත්‍රී රනිල් වික්‍රමසිංහ මහතා පසුගිය දොළොස් වැනිදා පස්වරුවේදී නිදහස් ශ්‍රී ලංකාවේ 26 වෙනි අග්‍රාමාත්‍යවරයා ලෙස ජනාධිපතිවරයා ඉදිරියේ දිවුරුම් දුන්නේය. වික්‍රමසිංහ මහතා හය වන වතාවටත් යළිත් අග්‍රාමාත්‍ය ධුරය සඳහා පත් වන්නේ වැඩිම වාර ගණනක් අග්‍රාමාත්‍ය ධුරයට පත් වූ මහජන නියෝජිතයා ලෙස ඉතිහාසගත වෙමිනි. මෙරට දේශපාලනය තුළ එක් මන්ත්‍රී ධුරයක් පමණක් හිමි පක්ෂයකින් අග්‍රමාත්‍යවරයෙක් තෝරාගන්නා ප්‍රථම අවස්ථාව ද මෙය වීම සුවිශේෂී කාරණාවකි.

වර්ෂ 1949 මාර්තු 24 වැනිදා එස්මන් වික්‍රමසිංහ සහ නාලිනී වික්‍රමසිංහ යුවලට දාව රනිල් ශ්‍රියාන් වික්‍රමසිංහ ලෙස මොහු උපත ලබන්නේ පවුලේ දෙවැනියා ලෙසයි.


## රටේ විසිහයවැනි අගමැති

කොළඹ රාජකීය විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයෙන් නීතිය හදාරන වික්‍රමසිංහ අධිනීතිඥයකු වශයෙන් අධිකරණයට පිවිසියේය. කැලණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ රනිල් වික්‍රමසිංහයන්ගේ බිරිඳයි.

1972 වසරේදී කැලණිය ආසනයෙන් දේශපාලන ගමනට අත්පොත් තැබූ වික්‍රමසිංහ මහතා 1977 වසරේ පැවති මහ මැතිවරණයේදී බියගම ආසනය නියෝජනය කරමින් පළමුවරට පාර්ලිමේන්තුවට වරම් හිමිකර ගත්තේය. අලුතින් පිහිටුවූ බියගම ආසනයේ පළමු එක්සත් ජාතික පක්ෂ සංවිධායකවරයා බවට පත්වූයේද රනිල් වික්‍රමසිංහයන්ය.

ජේ. ආර්. ජයවර්ධන රජය යටතේ විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙසත් අධ්‍යාපන සහ කර්මාන්ත කැබිනට් අමාත්‍යවරයා ලෙසත් කටයුතු කළේය. අවුරුදු 27 දී ජේ. ආර්. ජයවර්ධන රජය යටතේ යෞවන කටයුතු සහ රැකීරක්ෂා අමාත්‍ය ධුරය භාරගත් ඔහු එවකට පාර්ලිමේන්තුව නියෝජනය කළ ලාබාලතම ඇමැතිවරයා ද වූයේය.

මෙතුමා පළමුවරට අග්‍රාමාත්‍ය ධුරය සඳහා පත් වන්නේ 1993 වසරේදීය. කාර්මික සංවර්ධන පනත ගෙන ඒම, කාර්මික කොමිසම පත් කිරීම අධ්‍යාපන විද්‍යාපීඨ ආරම්භ කිරීම, මහරගම ජාතික අධ්‍යාපන ආයතනය සහ අධ්‍යාපන කොමිසම පිහිටුවීම ආදී වැඩසටහන්වලදී වික්‍රමසිංහ මහතා මූලිකත්වය ගෙන කටයුතු කළේය. 1993 මැයි 07 සිට 1994 අගෝස්තු 19 දක්වා පළමු අග්‍රාමාත්‍ය ධුර කාලය දැරූ වික්‍රමසිංහ මහතා 1994 ජනාධිපතිවරණයෙන් පසු එක්සත් ජාතික පක්ෂයේ සහ විපක්ෂයේ නායකයා බවට පත් විය. 1999 දී ජනාධිපතිවරණයට ඉදිරිපත් වුවත් එහිදී ජයග්‍රහණය කිරීමට නොහැකි වීමත් සමඟ 2001 වර්ෂයේදී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය යටතේ පිහිටු වූ ආණ්ඩුවේ දී නැවතත් අග්‍රාමාත්‍යවරයා ලෙස දිවුරුම් දුන්නේය.





හයවෙනි වරටත් අගමැති

දැඩි යුදමය වාතාවරණයක් පැවති සමයක එල්ටීටීඊ සංවිධානය සමඟ සටන් විරාම ගිවිසුමකට එළැඹීමට ද ඒ මහතා තීරණය කළේ මේ කාල සීමාව තුළයි. 2001 දෙසැම්බර් 09 සිට 2004 අප්‍රේල් 06 දා දක්වා අග්‍රාමාත්‍ය ධුරය දැරූ මොහු 2004 වර්ෂයේදී යළිත් විපක්ෂ නායක ධුරයට පත් විය. 2005 ජනාධිපතිවරණයේදී නැවතත් මෙතුමාට පරාජය භාරගැනීමට සිදු විය. 2015 වසරේ දී මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති ධුරයට පත්වීමත් සමඟ වික්‍රමසිංහ මහතා නැවතත් අග්‍රාමාත්‍යවරයා ලෙස දිවිරුම් දුන්නේය. 2018 වර්ෂයේ දී දින 52ක කාලයක් සඳහා අග්‍රාමාත්‍ය ධුරය අහිමි වුණත් නැවතත් ව්‍යවස්ථානුකූලව එම ධුරයෙහි ඔහුට හිමි විය.

2020 පැවැත්වුණු මහා මැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂයට පරාජය භාර ගැනීමට සිදු වුණත් එම පක්ෂයට හිමි වූ එකම ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයට නැවතත් රනිල් වික්‍රමසිංහ මහතා තෝරා පත් කර ගැනුණි.

මෙම කාල සීමාවන් අතරතුර රටෙහි ඇතිවුණු ආර්ථික සහ සමාජීය අර්බුදයන්ට විසඳුම් ඉදිරිපත් කරමින්, ඒ වෙනුවෙන් අවශ්‍යය මොහොතේ තම හඬ අවදි කරමින් සිය දේශපාලන ගමන පැමිණි වික්‍රමසිංහ මහතා කොවිඩ් වසංගතය හමුවේ දී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව ඔහුගේ අදහස් ඇතැම් අවස්ථාවල ජනාධිපතිවරයා ඇතුළු බලධාරීන් සමඟ ද බෙදා ගැනීමට අමතක කළේ නැත.

## එක් මන්ත්‍රී ආසනයකින් අගමැති තනතුරට

කෙසේ වෙතත් රට තුළ ඇතිවූ අරගලකාරී ස්වභාවයන් සමඟ හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා පසුගිය සතියේ ධුරයෙන් ඉවත් වීමත් සමඟ ඇතිවූ පුරප්පාඩුව පිරවීම සඳහා අග්‍රාමාත්‍යධුරය භාර ගැනීමට වික්‍රමසිංහ මහතා සිය කැමැත්ත පළ කළේය. මීට පෙර පස් වතාවක් අග්‍රාමාත්‍ය තනතුරේ දිවුරුම් දුන්නද අග්‍රාමාත්‍ය ධුරය දැරූ කිසිදු අවස්ථාවක ඔහුට සිය ධුර කාලය සම්පූර්ණ වන තුරු තනතුරේ රැඳීමට ඉඩ නොලැබුණු බවද සිහිපත් කළ යුතුය.

''මිනිස්සු මේ වෙලාවේ අමාරුවෙන් ජීවත් වෙන්නේ. ඊළඟ මාස කිහිපය තුළ මේ තත්ත්වය මීටත් වඩා දරුණු අතට හැරෙනවා. අපි මේ තත්ත්වයෙන් ගොඩ එන්න ඕනේ. ඒ වැඩ කටයුතු කරලා දෙන්න තමයි මම රට භාරගත්තේ. අපි නැවත රුපියලට වටිනාකමක් දිය යුතුයි. මේ රටේ තරුණයන්ට අනාගතයක් තිබිය යුතුයි.''

සිය ධුරයෙහි දිවුරුම් දීමෙන් අනතුරුව මාධ්‍යවේදීන් සමග ඉහත ලෙසින් අදහස් බෙදා ගත් වික්‍රමසිංහ මහතා

රටෙහි ඇති වී තිබෙන ගැටලුවලට සියලු දෙනාගේද සහයෝගය ඇතිව විසඳුම් ලබාදෙන බවත් තව දුරටත් තරුණ අරගලය ඉදිරියට කරගෙන යා යුතු බවත් කියා සිටියේය.

අග්‍රාමාත්‍යවරයා සිය ධුරයේ දිවුරුම් දුන්නේ මෙරට බරපතළ ආර්ථික සමාජීය සහ දේශපාලන අර්බුදයක් උද්ගතව ඇති මොහොතකය. නව අග්‍රාමාත්‍යවරයා පිළිබඳව ඇතැම් පාර්ශ්ව තම ප්‍රසාදය පළකළ අතර තවත් පිරිසක් කියා සිටියේ රනිල් වික්‍රමසිංහ මහතා අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කිරීම දේශපාලනික වශයෙන් බුද්ධිමත් තීරණයක් නොවන බවයි. වසර ගණනාවක් පුරාවට දේශපාලනික සහ ආර්ථික ක්ෂේත්‍රයන්හි කරක් ගසමින් ලබාගත් දැනුම සහ අත්දැකීම් පදනම් කර ගනිමින් ශ්‍රී ලංකාව පවතින අර්බුදයන්ගෙන් මුදා ගැනීමේ අභියෝගයට වික්‍රමසිංහ මහතා මුහුණ දෙන්නේ කෙසේදැයි රටම අවදියෙන් බලා සිටියි.

අග්‍රමාත්‍ය ධුරය සඳහා කිසිවකුත් ඉදිරිපත් නොවූ මොහොතක එම තනතුර භාර ගනිමින් රටේ ඇතිවන අර්බුදවලට විසඳුම් සොයමින්, ශ්‍රී ලාංකේය ජනතාවට සේවය කිරීමට ප්‍රතිඥා දෙමින් වැඩ භාරගත් නව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාට සිය රාජකාරිය නිසි අයුරින්ම ඉටු කරන්නට ශක්තිය ධෛර්යය ලැබේවා යි 'දිවයින' අපිද සුභාශිංසන එක් කරන්නෙමු.

● කුමාරි ඉරුගල්බංඩාර

---

# කෝච්චි ටිකට් ගාණත් වැඩිවෙයිද?

## පාරට බහින අයට පයින්ම යන්න වෙයිද?

දුම්රිය ඉතිහාසය සලකා බලන කල දුම්රිය සේවයේ ලංකාවේ මුල්ම අවධියේ ගමනාගමනය සඳහා භාවිතා කෙරුණේ අස්ව කෝච්චිය. එයද භාවිතා කෙරුණේ රටේ සිටින ප්‍රභූ පැලැන්තියේ අය සඳහා සහ තැපැල් සේවය සඳහායි. ඉන් අනතුරුව එය සාමාන්‍ය ජනතාවගේ පොදු ප්‍රවාහනය සඳහා භාවිතා කරන්නට පටන්ගෙන දීර්ඝ කාලයකි. වර්තමානය වන විට දුම්රිය යනු කාර්යාල සේවක සේවිකාවන්ට ඉතා ප්‍රයෝජනවත් ප්‍රවාහන මාධ්‍යයක් වී තිබේ. ශ්‍රී ලංකාවේ දුම්රිය සේවය වසර 154ක් තරම් ඉතිහාසයකට දිව යන්නකි. වර්තමානයේ දුම්රිය සේවාව ලංකාවේ බොහෝ ප්‍රදේශවලට ව්‍යාප්ත වී ඇති අතර වර්තමානය වන විට සිදු වෙමින් තිබෙන්නේ දිනෙන් දිනම දුම්රිය සේවය අර්බුදයට ලක්වීමය.

2022 ඔක්තෝබර් 01වැනිදා සිට දුම්රිය ගාස්තුවල මිල 15%කන් ඉහළ දැමීමට දුම්රිය දෙපාර්තමේන්තුව තීරණය කර ඇත. මෙයට අදාළ ගැසට් පත්‍රය අමාත්‍යාංශයට යොමු කර ඇතැයි දැනගැනීමට ඇත. මීට පෙර දුම්රිය ගාස්තු ඉහළ දැමීමක් සිදු වූයේ 2008 වසරේදීය.

දුම්රිය ගාස්තු බස් ගාස්තු මෙන් වැඩි වීමක් සිදු නොවේ. තෙල් මිල ඉහළ යැමට සාපේක්ෂව බස් ගාස්තුවල මිල ගණන් නොනවත්වා වැඩි වෙයි. සමාජයේ ඕනෑම තරාතිරමක රජයේ, පෞද්ගලික අංශයේ සේවකයන් හා කම්කරුවන් දුම්රියෙන් ගමන් පහසුව සලසා ගනිති. එයට හේතුව වෙනත් ප්‍රවාහන සේවාවන්වලට වඩා දුම්රිය ප්‍රවේශපත්‍ර අඩු මුදලකට ලබා ගත හැකි වීමයි.

අද රටේ පවතින උද්ධමනය ඉහළ යෑම නිසා බඩු මිල ගෑස්, ඉන්ධන මිල වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ රැසකද බස් ගාස්තු මිලද දරා ගත නොහැකි තරමින් ඉහළ ගොස් ඇත. එහෙත් සේවක වැටුප්වල කිසිදු වැඩි වීමක් සිදු වී නොමැත. මේ වාතාවරණය තුළ ඉතා සහනදායි මිලකට තිබුණු දුම්රිය ගාස්තුව 15%කින් දුම්රිය දෙපාර්තමේන්තුව ඉහළ දැමීමට තීරණය කර තිබීම අද පවතින ආර්ථික ප්‍රශ්න හමුවේ මගී ජනතාවට දරාගත නොහැකිය. දුම්රිය මගී ජනතාවගෙන් දුම්රිය ගාස්තු වැඩි වීම පිළිබඳ ඔවුන්ට දැනෙන අදහස් විමසීමේදී ගම්පහ ඉන්ද්‍රානි මහත්මිය මේ ගැන මෙසේ අදහස් පළ කළා.

''අපිට අනෙක් හැම දෙයක්ම වැඩි වෙලා තියෙද්දි දුම්රිය ගාස්තු විතරයි අඩුවට තිබුණේ. දැන් ඒකත් වැඩි කරනවලු. අපිට කෑම බීමයි රස්සාවට ඇවිල්ල යන්න ගියාම අතේ ඉතිරියක් නැහැ. අපිට ජීවත් වෙන්නත් අමාරු තත්ත්වයකට වැටිලා තියෙන්නේ.''

දුම්රිය මගියෙක් වන කළුතර කමල් මහතා මේ ගැන අපට මෙසේ අදහස් ප්‍රකාශ කළා.

''මම උදේ හවස කෝච්චියෙන් රස්සාවට යනවා. අපිට කෝච්චියේ ගාස්තුව අඩුයි. ඒත් දැන් ඒකත් වැඩි කරන්න යනවලු. අපේ රස්සාවේ පඩිවල වෙනසක් වෙලා නෑ. ඒත් හැම බඩුවක්ම වැඩි වෙලා ඒ අතරේ මේ දුම්රිය ගාස්තුත් වැඩි වෙලා. හරි අමාරු කාලයක් මේක. මේ ප්‍රශ්නය කවදා විසදෙයිද දන්නෑ. එතකම් අපිට දුක්විඳින්න වෙලා තියෙන්නේ.'' මොනවා කරන්නද?''

ශ්‍රී ලංකා දුම්රිය සේවය යනු ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රජයේ දෙපාර්තමේන්තුවකි. එය මහජනතාවගේ ප්‍රධාන ප්‍රවාහන පහසුකම් සපයන්නෙකුද වේ. ශ්‍රී ලංකා දුම්රිය සේවය මගීන් ප්‍රවාහනය හා බඩු ප්‍රවාහනය යන සේවාවන් දෙකම ඉටු කරයි. දුම්රිය සේවය ආරම්භයේදී සිදු වූයේ මගී ප්‍රවාහනයට වඩා බඩු ප්‍රවාහනයයි. එහෙත් අද වන විට එය මගී ප්‍රවාහනයට වැඩි නැඹුරුවක් සහිතව ක්‍රියාත්මක වේ.

මීට දශක දෙකකට පමණ පෙර කාලය ගතහොත් දුම්රිය දෙපාර්තමේන්තුවට ආදායම් ලැබෙන මාර්ග ගණනාවක්ම තිබිණි. එනම් දුම්රියක් මගින් ඉන්ධන සිමෙන්ති, පිටි හුනුගල් වැනි භාණ්ඩ ප්‍රවාහනය කර දී විශාල ආදායමක් ලබා ගැණිනි. දුම්රිය දෙපාර්තමේන්තුව සතුව ඉඩම් විශාල ප්‍රමාණයක් රට පුරා තිබේ. ඒවා නිසි ලෙස බදු දී මුදල් උපයා ගන්නා ලදී. දැන් ඒ සියලුම දේවල් දෙපාර්තමේන්තුවට අහිමි වෙමින් තිබේ. ටිකට්පත් වෙන් කිරීමේ සේවය දෙපාර්තමේන්තුවට සිදු කළ හැකිව තිබියදී එය පෞද්ගලික අංශයට ලබා දී ඇත. මේ ආකාරයට දෙපාර්තමේන්තුවට ලැබිය යුතු විශාල ආදායම් ප්‍රමාණයක් අහිමි වී ඇත. දැන් මගී ප්‍රවේශපත්‍ර අලෙවි කිරීම, පාර්සල් ප්‍රවාහනය වැනි දේවල්වලින් පමණකි. ආදායම් ලැබෙන්නේ. දුම්රිය ආපනශාලා ටිකවත් නිවැරදි ලෙස බදු ලබානොදීම නිසා අපේක්ෂිත ආදායම ලැබෙන්නේද නැත.

දැනට ලංකාවේ දුම්රිය සේවයේ දිනකට මගීන් මිලියන 3.72ක් ප්‍රවාහනය කෙරේ. ලංකාවේ රේල් පාරවල්වල දිග ප්‍රමාණය කිලෝමීටර් 1561ක් වේ. දුම්රියවල එන්ජින් (ලොකෝමෝටිව්) 72ක් ද වන අතර පවර් සෙට් 72ක්ද ඇත. දුම්රිය සේවකයෝ 17634 සිටිති. දෛනිකව දුම්රිය 306ක් දැනට ධාවනය වෙයි. දීර්ඝ සේවාවල දුම්රිය 67ක් ධාවනය වන අතර ඉන්ටර්සිටි 16ක් ධාවනයේ යොදා ඇත.

ආයතන වශයෙන් ගතහොත් දුම්රිය සේවයේ 2015 සිට 2021 දත්ත සලකා බැලුවහොත් අවුරුද්දක ආදායම රුපියල් මිලියන 7ක් පමණ වෙයි. 2015 දී දුම්රියේ ආදායම රුපියල් මිලියන 6.3 කි. 2016 දී 6.4කි. 2017 දී 6.4කි. 2018 දී 7.4කි. 2019 දී 7.9කි. 2019 දී දුම්රිය ආදායම එසේ ඉහළ ගියේ 2018 දී ගාස්තු වැඩි කළ නිසාය. ඒ ආදායමෙන් සියයට 75ක් ලැබෙන්නේ මගී ප්‍රවාහනයෙනි. නමුත් දුම්රිය සේවාව පවත්වාගෙන යැමට වන වියදම හෙවත් පුනරාවර්තන වියදම රුපියල් බිලියන 14ක් පමණ වෙයි. ඒ අනුව දුම්රිය සේවයෙන් සෑම වසරකදීම පාහේ රුපියල් බිලියන 7ක පාඩුවක් ලබයි. 2021 වර්ෂයේ මහ බැංකු වාර්තාව අනුව රුපියල් බිලියන 10.3ක පාඩුවක් ලබා ඇති බව සඳහන් වේ. එම වාර්තාව අනුව 2020 වර්ෂයේ රුපියල් බිලියන 10.1ක් අලාභයක් වාර්තා වී තිබුණි. මේ අනුව මගී ප්‍රවාහනයෙන් ඉපයූ ආදායම සියයට 53.0කින් පහළ යෑම මේ සඳහා ප්‍රධාන හේතුවක් වී ඇති බව පෙනී යයි. ලංකාවේ දුම්රිය සේවයේ ආදායම 2020 සාපේක්ෂව 2021 වර්ෂයේ බිලියන 2.7 දක්වා සියයට 41.3කින් පහළ ගොස් ඇති බව මහ බැංකුව වාර්තාවේ සඳහන් වේ.

මෙම ආදායම් පහළ යෑම සඳහා අප්‍රේල් හා අගෝස්තු යන මාසවලදී කොවිඩ් 19 වෛරසය ව්‍යාප්ත වීම ප්‍රධාන හේතුවක් වී ඇත. තවද පොදුවේ ගත් කල දුම්රියේ වියදම වැඩිවීමට පවතින ප්‍රධාන කාරණය දුම්රිය සේවයේ අකාර්යක්ෂමතාව වන අතර අනෙක් කාරණාව ඩීසල්, ලිහිසි තෙල්, ග්‍රීස් යනාදියෙහි මිල ඉහළ යෑමය.

ඩීසල් මිල ඉහළ යෑමට සාපේක්ෂව ගාස්තු ඉහළ නැංවිය යුතුද යන්න දැන් අපට ඇති වී තිබෙන ප්‍රශ්නයකි. වියදමට සාපේක්ෂව ආදායමක් නොමැති විට ඒ බර පැටවෙන්නේ ද භාණ්ඩාගාරයටය. පසුව වක්‍රාකාරව ඒ බර පැටෙවෙන්නේද ජනතාව මතටය. අපේ රටේ තිබෙන ප්‍රශ්නය ඒ බර සමාජයේ සියලු දෙනා මත සමසේ බෙදී යෑමය. දුම්රිය සේවාව පවත්වාගෙන යෑමේ බර කිසි දිනෙක දුම්රියක ගමන් නොකළ පුද්ගලයා මතද පැටවෙයි.

දිනෙන් දින පාඩු ලබන ශ්‍රී ලංකා දුම්රිය සේවය කිසියම් ප්‍රතිසංස්කරණයකට භාජනය කළ යුතුමය. ලංකාවේ කැබිනට් අනුමැතිය මත සියල්ල කිරීමට යෑම නූතන යුගයට නොගැළපේ.

නුවර හා කොළඹ ජන ඝනත්වය ඉතා ඉහළය. ඒ නිසා ඒ ප්‍රදේශවලට දුම්රියෙන් මගී ප්‍රවාහනය සඳහා පවතින ඉඩ හා පහසුකම් වඩාත් පුළුල් කළ යුතුය. එහෙත් ගැටලුව වී ඇත්තේ මගියා 21 වැනි සියවසේ සිටියදී දුම්රිය දෙපාර්තමේන්තුව 18 වැනි ශත වර්ෂයේ පසුවීමය.

● සුජානි ගුරුගේ





# • ඊශ්‍රායල් උණ්ඩයට බිළිවූ ඇමෙරිකානු මාධ්‍යවේදිනිය



ඉකුත් බදාදා දිනයේ බටහිර ඉවුරේ ජෙනින් නගරයේදී මාධ්‍යවේදිනියක් ඝාතනය වීම ලොවපුරා ජනමාධ්‍යවල ප්‍රධාන පුවතක් විය. අල් ජසීරාවේ අරාබි භාෂාවෙන් ක්‍රියාත්මක වන නාලිකාවක මාධ්‍යවේදිනියක වූ ශ්‍රීන් අබු අක්ලේ මෙලෙස ඝාතනය විය. ඇය ඝාතනය වූයේ ඊශ්‍රායල් හමුදා ප්‍රහාරයකිනි. ශ්‍රීන් සමග සිට අලි නමැති මාධ්‍යවේදියා ද වෙඩි ප්‍රහාරයට ලක්ව රෝහල්ගත කර ඇතත් ඔහුගේ තත්ත්වය බරපතළ නොවන බව මාධ්‍ය මගින් වාර්තා කර තිබේ.

ඊශ්‍රායල් අගමැති නෆ්ටාලි බෙනට් පවසන්නේ තම හමුදා පලස්තීන ත්‍රස්තයන්ගේ ප්‍රහාරයකට ලක්වුණු බවයි. එයට ප්‍රතිචාර ලබා දෙද්දී මාධ්‍යවේදිනියක් ඝාතනය වීම කනගාටුදායක බවත්ය. කෙසේ නමුත් එක් ඊශ්‍රායල හමුදා ප්‍රධානියෙක් පවසා තිබුණේ කැමරා අතැති ත්‍රස්තවාදීන් හමුදාවට ප්‍රහාර එල්ල කළ බවයි. ඇත්ත කවරෙක් කියන්නේ ද යන්න ප්‍රශ්නයකි. මියගිය මාධ්‍යවේදිනිය 51 හැවිරිදි වියේ පසුවන අතර ඇය ජෙරුසලමේ උපන් තැනැත්තියකි. 1997 සිට අල්ජසීරාව සමග එක්ව සේවය කරන ඇය මියයන අවස්ථාවේදීත් 'ප්‍රෙස්' යනුවෙන් මුද්‍රිත නිල් පැහැති ජැකට්ටුවක් ඇඳ සිටියාය. පලස්තීන වෙබ් අඩවියකට පුවත් සපයන මාධ්‍යවේදිනියක වන ශාසා හුසේන් පවසන්නේ මේ සිද්ධිය වූ අවස්ථාවේ එම ප්‍රදේශයේ කිසිදු ගැටුමක් පැවතියේ නැති බවයි. ඔහු පවසන ආකාරයට ඊශ්‍රායල් හමුදාව සිතා මතාම මාධ්‍යවේදීන් ඉලක්ක කර ප්‍රහාර එල්ල කර තිබේ. මම වෙඩි තියනකොට අසල තිබ්බ ගහක් අස්සට ගියා. ශ්‍රීන් වෙඩි වැදිලා බිමට වැටෙනව මම දැක්කා. මේ මාධ්‍යවේදියා ඒ අඳුරු සිදුවීම හෙළිකර සිටියාය. ශ්‍රීන් වැටුනත් හමුදාව වෙඩි තියන එක නැවැත්තුවේ නැහැ. මම ඇය දෙසට අත දිගුකර කෑගැහුවා. ඒත් වෙඩි තැබීම නතර වුණේ නැහැ. රූත් කොචාව් නම් ඊශ්‍රායල් හමුදා ප්‍රධානි පවසා ඇත්තේ මාධ්‍යවේදීන් දෙදෙනෙක් කැමරා වලින් සන්නද්ධව පලස්තීන ත්‍රස්තවාදීන් සමීපයේ සිටි බවයි. මාධ්‍යවේදීන් සමීපයේ සිටි ත්‍රස්තවාදීන් හමුදාවට වෙඩි තැබූ නිසා තමන්ද පෙරළා පහරදීම සිදුවූ බව කොචාව් හමුදා රේඩියෝව සමග ප්‍රකාශ කර තිබිණි.

ශ්‍රීන් ඇමෙරිකානු පුරවැසියෙක් නිසා ඇයගේ මරණය ගැන විශේෂ පරීක්ෂණයක් පැවැත්විය යුතු බව ඇමෙරිකානු කොංග්‍රස් සාමාජිකාවක් වන රෂ්ඩා ටලිබ් අල්ජසීරා රූපවාහිනිය සමග පැවැති සාකච්ඡාවකදී ප්‍රකාශ කර තිබිණි. ජෝර්දානයේ රාජකීය කුමරිය නිවේදනය කර ඇත්තේ ශ්‍රීන්ගේ මරණය 'ඇත්ත හා යුක්තියට එල්ල වූ බරපතළ ප්‍රහාරයක් බවයි. ඇමෙරිකානු මාධ්‍යවේදිනියක් ඊශ්‍රායල ප්‍රහාරයකින් මරුමුවට පත්වීම දැකීම අභාවාචක සිද්ධියකි. නමුත් ඊශ්‍රායල් හමුදාව බබා පාට් දමන්නේ නැහැ. පලස්තීන ක්‍රිස්තියානි පවුලක උපත ලැබූ ශ්‍රීන් ඇමෙරිකාවේ නිව් ජර්සිහි වාසය කළ තැනැත්තියකි.

**• චතුර පමුණුව**





වෙඩි වැදුනු අවස්ථාව

# ජයග්‍රහණය පමා වීමෙන් යුද්ධය රුසියාව තුළට

# ඉදිරි දෙසතියේ අලුත් යුද්ධයක්...

පින්ලන්තය ද දැන් සිටින්නේ යුක්රේනය සේම තර්ජිත තත්ත්වයක බව කිව හැකිය. මූලික තර්කනයක් ලෙස ගත් විට යුක්රේනය, නේටෝ සංවිධානය සඳහා එක්වීමට ගත් තීන්දුව හේතුවෙන් පුටින් සිය යුද බලය ලෝකයටම ප්‍රදර්ශනය කිරීම සඳහා ගත්තේ නමුදු, 'නේටෝ ගොඩ වැඩිකිරීමේ' එක්සත් ජනපද සැලසුම සඳහා පදනම වැටෙන්නේ, 1992 දී එක්සත් ජනපදය සම්මත කර ගන්නා ලද, 'ඕනෑම අනාගත ගෝලීය තරගකරුවකුගේ මතුවීම' අවහිර කිරීමේ සිය අභිප්‍රාය ලේඛනගත කර සම්මත කිරීමත් සමගය. 1990-91 පර්සියානු ගල්ෆ් යුද්ධයෙන් පසුව 1999 දී සර්බියාවට එරෙහි යුද්ධය, 2001 දී ඇෆ්ගන් ආක්‍රමණය, 2003 දී ඉරාකයට එරෙහි දෙවන යුද්ධය, 2011 දී ලිබියාවට එරෙහි යුද්ධය සහ සීඑයිඒ සහාය ලබාගත් සිරියාවේ සිවිල් යුද්ධය සඳහා එක්සත් ජනපදය යොමුව තිබුණි.

රුසියාව හා චීනය සමග සෘජු ගැටුමක් සඳහා එක්සත් ජනපදය වසර ගණනාවක් තිස්සේ සැලසුම් කරමින් සිටි බවට, මූලෝපායික ලේඛනවල සඳහන් වන කරුණු පිළිබඳ කිසිදු සඳහනක් මාධ්‍යයේ කොතැනකවත් සොයාගත නොහැක. රුසියාව වෙත යුක්රේන ආක්‍රමණය සඳහා, විරෝධය දක්වා සිටින බටහිර මාධ්‍ය සහ විචාරකයන් එක්සත් ජනපදයේ මෙම ප්‍රවේශය සිය කියැවීම සඳහා ඇතුළත් කර නොගැනීමට ප්‍රවේශම් විය. 2016 දී ආරම්භ කර එක්සත් ජනපදය, සිය න්‍යෂ්ටික අවි ගබඩාව ඩොලර් ට්‍රිලියන ගණනක දැවැන්ත මුදල් වැය කරමින් ප්‍රසාරණයක් සිදු කළේය. ඊට, සටන් බිමේදී භාවිතා කළ හැකි කුඩා ප්‍රමාණයේ න්‍යෂ්ටික අවි නිර්මානය කිරීම ද ඇතුළත් විය. 2018 දී, එක්සත් ජනපදය අතරමැදි පරාස න්‍යෂ්ටික බළකා (INF) ගිවිසුමෙන් ඉවත් වූ අතර නැගෙනහිර යුරෝපයේ රටවල සිට, ප්‍රධාන රුසියානු නගරවලට පහර දිය හැකි මිසයිල සංවර්ධනය කිරීම සඳහා අත්හදා බැලීම් ආරම්භ කළේය.

මේ සියල්ල දෙස, රුසියාව සහ චීනය පමණක් නොව එක්සත් ජනපද විරෝධය හිස මත දරාගත්, නොහික්මුණු උතුරු කොරියාවද බලා සිටියේ, එක්සත් ජනපදය තබන තබන පියවරක් පාසා, තමන් ද සන්නද්ධ වෙමිනි. දැන් එළඹ ඇත්තේ මෙසේ තරගයට සන්නද්ධ වීමේ ව්‍යාපාරය අවසන්ව, සංදර්ශනය සඳහා තිරය විවර වන මොහොතය.

රුසියන් උපකල්පනය යුක්රේනයේදී එලෙසම ඉටු වන්නේ නැත. යටත් වෙතැයි සිතා සිදු කළ ප්‍රහාරයට, ප්‍රතිප්‍රහාර ලබා දීම සඳහා යුක්රේන් ජනාධිපති සෙලෙන්ස්කි ගත් තීරණය, හාස්‍ය රංගන ශිල්පියා, තිරයේ වීරයා බවට බටහිර මාධ්‍ය ලියන තත්ත්වයක් දක්වා දිගු විය.

රුසියානු හිතවාදියෙක් වන බෙලරුස් ජනාධිපති ඇලෙක්සැන්ඩර් ලූ පවසා තිබුණේ, රුසියාව අපේක්ෂා නොකළ ආකාරයෙන් යුද්ධය දික් ගැස්සෙමින් තිබෙන බවය. මේ සඳහා හේතුව වන්නේ යුක්රේනයට දැන් ආවේශ වී සිටින්නේ එක්සත් ජනපදය වීමය. ඕනෑම පිරිවැයක් දරා, පුටින් යුක්රේනයේදී පරාජය කිරීම එක්සත් ජනපද උපාය මාර්ගය වී තිබේ. මතුව ඇති තත්ත්වය අනුව, පුටින් සහ රුසියාව තමන්ට අවශ්‍ය මාවතට ගෙන එම සඳහා 'අඩුව' ලෙස එක්සත් ජනපදය ගෙන ඇත්තේ යුක්රේනයය. රුසියානු ජෙනාරල්වරු විශාල පිරිසක් යුක්රේනයේදී වෙඩි කා මියයන්නේ එක්සත් ජනපදය විසින් යුක්රේනය සඳහා ලබාදෙන ඉලක්ක හේතුවෙන් බව බටහිර මාධ්‍ය පෙන්වා දෙන ලද්දේ ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ වාර්තා උපුටා දක්වමිනි. මේ සියල්ලෙන්ම කියවෙන්නේ 'හඬ සෙලෙනේස්කිගේ වුවත් අත බයිඩන්ගේ' බවය. රුසියානු අසල්වැසි සහ පුටින් හිතවාදී, මෙන්ම රුසියානු හමුදා සඳහා උතුරු දෙසින් යුක්රේනයට පිවිසීමට සිය රාජ්‍යය හරහා මාවත විවර කරදුන්, බෙලරුසියානු ජනාධිපතිවරයා පවා 'දික් ගැස්සීම' සම්බන්ධයෙන් ගැස්සී සිටින බව කිව හැකිය.

එක්සත් ජනපදය සහ යුරෝපය එකා මෙන් දැන් ප්‍රවේශ වී ඇත්තේ, රුසියාව තනිකර දැමීම පිණිසය. ඒ සඳහා යුක්රේන පන්නයේ තවත් කර්තව්‍යයන් ගණනාවක් මේ බටහිර බලඇණිය සිදු කරමින් තිබේ. රුසියාව ඊළඟ වටයේදී ආක්‍රමණය කළ හැකි සහ ප්‍රහාර එල්ල කළ හැකි යැයි හඳුනාගෙන ඇති රුසියානු අසල්වැසියන් වන පෝලන්තය, පින්ලන්තය දැන් තබාම සූදානම් ශරීරයෙන් තැබීම නේටෝවේ එක් වැයමකි. මේ වන විට පින්ලන්තය සිය කැමැත්ත නේටෝ වෙත ලබාදී තිබේ. පින්ලන්ත අගමැතිනි සන්නා මරීන් මේ බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළ අතර, බ්‍රිතාන්‍ය අගමැති බොරිස් යෙල්ස්ටින් සමග මේ වන විටත් පින්ලන්තය සහ ස්වීඩනය ආරක්ෂක ගිවිසුම් අත්සන් කර අවසන් වීමෙන් පෙනී යන්නේ, එක්සත් ජනපදය සහ නේටෝව එකතුව රුසියාව සඳහා එල්ල කරන තර්ජනයේ තරමය.



යුක්රේනයේ ස්හොරොඩ් හි අවතැන් වූ සිසුන් ඉගෙනුම ලබන රජයේ පාසලක් ළමුන් කණ්ඩායමක් සමග. ජිල් බිඩෙන් සහ යුක්රේන ජනාධිපති බිරිඳ ඔලේනා සෙලෙන්ස්කා

කොන්ග්‍රස් සභික මයික් ගැලගර්, බයිඩන් පරිපාලනයට චෝදනා එල්ල කරමින් පවසන ලද්දේ, සිය අවි බලය සපුරා යුක්රේනය වෙත ලබාදෙමින් එක්සත් ජනපදය අනවශ්‍ය ආකාරයෙන් තමන්ගේ ආයුධ ගබඩා හිස් කර ගන්නා බවය. චීනය විසින් තායිවානය ආක්‍රමණය කරන විට ඒ සඳහා එක්සත් ජනපදය මෙම තත්ත්වය අනුව ක්‍රියා කරනුයේ කෙසේ දැයි රිපබ්ලිකන් පාක්ෂික ගැලගර් ප්‍රශ්න කරමින් සිටියි. යුද අවි විශ්ලේෂක වාර්තා සඳහන් කරනුයේ පෙන්ටගනය සතු අවි බලයෙන් තුනෙන් එකක්, යුක්රේනය සඳහාම වන විට ලබාදී ඇති බවය. 'යුද්ධය දික් ගැස්සී' ඇත්තේ එක්සත් ජනපදයේ මෙම අවි පොම්ප කිරීම අනුව බව දැන් කිව හැකිය. මේ සම්බන්ධයෙන් රුසියාව ප්‍රකාශ කර ඇත්තේ, යුද්ධය සඳහා යුක්රේනය වෙත ලබා දෙන ඕනෑම ආධාරයක් සිය ඉලක්කය වනු ඇති බවය.

යුද ආධාර පමණක් නොව යුක්රේනය දිරිගැන්වීම සඳහා ද එක්සත් ජනපදය මේ වන විට සිය උපාය මාර්ග දියත් කර තිබේ. බයිඩන් ආර්යා ජිල් බයිඩන්, පෙර දැනුම් දීමකින් තොරව යුක්රේනයේ කීව් අගනුවර බලා පැමිණෙන ලද්දේ ඒ අනුවය.ජිල් බයිඩන් ආර්යාව පිළිගනු ලැබුවේ යුක්රේන ජනාධිපති ආර්යා ඔලේනා සෙලෙන්ස්කී විසිනි. මෙවැනි පියවරයන් අනුගමනය කරමින් එක්සත් ජනපදය වෙහෙස වන්නේ, පුටින්, ඔහුගේ කලාපය තුළම හිලෑ කර ගැනීමට හෝ රුසියානු බලය සිය උපාය මාර්ගය සඳහා අවශ්‍ය ආකාරයෙන්, යුක්රේනය හරහා තබා ගැනීමටය. පුටින්ගේ ඉලක්කයක් බවට එක්සත් ජනපදය පත් නොකර ගැනීමේ සිය අවශ්‍යතාවය වෙනුවෙන් වෙහෙසෙන බයිඩන් පරිපාලනය, පුටින් දමනය එවැනි පොම්ප කිරීම් මගින් පමණක් සිදු කළ නොහැකි බවද දන්නා බව පෙනී යන්නේ, සී.අයි.ඒ. ප්‍රධානි බිල් බර්න්ස් පවසා තිබුණේ, පුටින් පරාජය භාර ගන්නා පුද්ගලයකු නොවන බවය.

## බයිඩන් භාර්යාව යුක්රේනයට ඇවිත්...

## පෙන්ටගනයේ ආයුධ ගබඩා තුනෙන් එකක් යුක්රේනයට

පුටින්ගේ අණ පරිදි රුසියන් හමුදා යුක්රේනයට එරෙහිව හමුදාමය ක්‍රියාමාර්ගයක් අනුගමනය කළේ පසුගිය පෙබරවාරි 24 වැනිදාය. රුසියන් හමුදාවේ ඉලක්කය වූයේ යුක්රේනයේ කීව් අගනුවර ආක්‍රමණයයි. කෙසේ නමුත් තවමත් එය නොහැකිවී ඇති බවත්, රුසියන් හමුදාව දැඩි පසුබැසීමකට පත් වී ඇති බවත් සී.අයි.ඒ. බුද්ධි අංශ ප්‍රධානී බිල් බර්න්ස් පැහැදිලි කරයි.

'රුසියාව න්‍යෂ්ටික බලවතෙක්. යුක්රේනය ජය ගන්න බැරි වුණොත්, රුසියන් ජනාධිපති පුටින් යුක්රේනයට එරෙහිව න්‍යෂ්ටික ප්‍රහාරයක් එල්ල කරන්න පුළුවන්. එසේ නොවන්නත් පුළුවන්. හරියටම ඒක තහවුරු කරන්න බැහැ. කෙසේ නමුත් එක් දෙයක් පැහැදිලියි. පුටින් පරාජය භාර ගන්න කෙනකු නම් නොවෙයි' යැයි ඇමෙරිකන් බුද්ධි අංශ ප්‍රධානියා අවධාරණය කර තිබුණි.

මේ අනුව කියවෙන්නේ යුක්රේනයෙන් පමණක් ප්‍රශ්නය අවසන් නොවනු ඇති බවය.

දැනට ඇති තත්ත්වය අනුව රුසියාවට සිය ආක්‍රමණය පස්සට ඇද ගැනීමට නොහැකිය. එය රුසියාන් අභ්‍යන්තරය තුළ පුටින්ගේ දේශපාලන අවකාශය නිමා කරනු ඇති අතර, ඒ හා සමග එක්සත් ජනපදය තමන්ට අවශ්‍ය පන්නයේ පාලනයක් රුසියාව තුළ ගොඩනඟා ගන්නවාද ඇත. මේ නිසා යුක්රේන යුද්ධය තවත් දිශානති කිහිපයක් දක්වා වර්ධනය කර ගැනීමට හෝ යුක්රේනය වෙත 'හිරෝෂිමා පන්නයේ' පාඩමක් උගන්වා, වැඩේ අහවර කර ගැනීමට පුටින් යොමු වෙනවා ඇත. එසේ වූ පමණින් ද පුටින් නතර වේයැයි සිතීම අපහසු වන්නේ, එවැනි පරාජයක් යුක්රේනය අත්පත් කරගතහොත්, ඒ සඳහා එක්සත් ජනපදයට ද ඔහේ සිටීමට නොහැකි වන හෙයිනි. තව මාස කිහිපයක් තුළ චීනය ද තායිවානය දෙසට, යුක්රේන මට්ටමේ පිළිවෙතක් අනුගමනය කිරීම සඳහා පෙළඹුනහොත්, එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර ඇණියට සිදු වනුයේ, දෙකොන පත්තු වෙන විලක්කුවක් දරා ගෙන ලෝකය මෙහයවීමටය. මේ සියල්ල කියා පානු ලබන්නේ න්‍යෂ්ඨික අවියක් පත්තු වීමේ දුර්ලභ සහ අවසනාවන්ත අවස්ථාවක් සඳහා 'පීත්ත පටිය' සරසා ඇති බවය.

එන්න එන්නම 'නැකත' ළංකරමින් පසුගිය නව වෙනිදා, ජී - හත නායකයෝ රුසියාව තව තවත් දඬු අඬුවට තෙරපනු ලැබූහ. යුක්රේන ජනාධිපති ව්ලොදිමීර් සෙලෙන්ස්කී සහ ජී - හත රාජ්‍ය නායකයන් අතර වීඩියෝ තාක්ෂණය ඔස්සේ පවත්වන ලද රැස්වීමකදී, රුසියාවට නව සම්බාධක පැනැවීමට ජී - හත නායකයෝ තීරණය කළහ. ඒ අනුව රුසියානු තෙල් ආනයනය ක්‍රමානුකූලව නතර කිරීමට හෝ තහනම් කිරීමට මෙන්ම, ජී - හත නායකයෝ ඒකමතිකව කැමැත්ත ප්‍රකාශ කළ බව මාධ්‍ය වාර්තා සඳහන් කරයි.

මුල පටන්ම රුසියානුවාදී බෙදුම්වාදීන් විසින් අල්ලාගෙන සිටි යුක්රේනයේ නැගෙනහිර ප්‍රදේශ වන ඩොනෙට්ස්ක් සහ ලුයන ප්‍රදේශ තවත් පුළුල් කරමින් ඩොන්බාස් ප්‍රදේශය තම අණසක සඳහා යටත් කරගැනීමට රුසියානු හමුදා මේ වන විට සටන් කරමින් පවතියි. ටිම් සමගම යුක්‍රේන හමුදාව සාර්ථක ප්‍රතිප්‍රහාරයක් ලෙසායම් හි වයඹ දෙසින් පිහිටි කර්කිව් නගරය වටා, රුසියාවේ දේශසීමාව දෙසට ගමන් කර, රුසියානු කාලතුවක්කු කිහිපයක් නගරයෙන් ඉවතට තල්ලු කර ඇත. මෙය වෙනත් ස්ථාන සඳහා වන රුසියානු ප්‍රහාරාත්මක මෙහෙයුම් මන්දගාමී කරමින්, සැපයුම් මාර්ග ආරක්ෂා කිරීම සඳහා කලාපයේ තම ස්ථාන ශක්තිමත් කිරීමට රුසියාවට බල කෙරෙනු ඇත.

මේ අනුව රුසියාව පැමිණි ගමන් මග දැන් වෙනසකට භාජනය වී තිබේ. යුක්රේනය ද ආරක්ෂාකාරී පිළිවෙතින් එහාට ගොස් ප්‍රහාරත්මක ඉසව්වක් සඳහා ප්‍රවේශ වීම මෙහිදී දැක ගත හැකිය. එය බොහෝ විට එක්සත් ජනපද සහ නේටෝ උපාය මාර්ගය වනු ඇත. එසේ රුසියාව දෙසට යුක්රේනය ලවා පීඩනය ගෙන ඒම හෙවත් යුද්ධය රුසියාව තුළට තල්ලු කිරීම සඳහා වන සැලසුමක් ලෙස බ්‍රිතාන්‍ය අගමැති බොරිස් ජොන්සන් සහ පින්ලන්තය, ස්වීඩනය සමග අත්සන් කරන ලද ගිවිසුම සඳහන් කළ හැකිය. එය පින්ලන්තය වෙත රුසියානු ප්‍රහාරයක් දියත් වුවහොත් බ්‍රිතාන්‍ය සහය ලබාදීමට අමතරව, රුසියානු මායිමේ පිහිටි පින්ලන්තයේ සිට නේටෝ හමුදාව රුසියාව දෙසට ඇතුල් කිරීම සඳහා ප්‍රවේශ මාර්ග යක් වන බව කිව හැකිය. කෙසේ වෙතත් ඉදිරි දෙසතිය තීරණාත්මකය. යුක්රේනය අල්ලා ගැනීම සඳහා රුසියාවට වූ පමාව සහ සටන් බිම රුසියාව දෙසට තල්ලු කිරීම සඳහා වන වුවමනාව යන ආස්ථාන දෙකම එම දෙසතියේ පැහැදිලි වනු ඇත.

**• මනෝජ් අබයදීර**








# අවිහිංසාව සාමය අගය කළ තථාගතයන් වහන්සේ



බණ්ඩාරගම, කිඳෙල්පිටිය ශ්‍රී පුණ්‍යවර්ධනාරාමාධිකාරී ජගද්දලා සමාජ සුබසාධක ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, නියෝජ්‍ය ලේඛකාධිකාරී,
සියම්වංශාලංකාර සද්ධර්ම කීර්ති ශ්‍රී, රාජකීය පණ්ඩිත, දර්ශනපති, කථිකාචාර්ය

**පූජ්‍ය අගලවත්තේ ඤාණවිමල ස්ථවිර**

උතුම් වූ සම්බුදු තෙමඟුල සිහිපත් කරනු ලබන මෙම වෙසක් මාසය බෞද්ධ කාහටත් ඉතා වටිනා කාලයකි. එහෙත් වර්තමානයේ අප රට ඉතා කනගාටුදායක තත්ත්වයකට පත් වී ඇති බව නොරහසකි. අවිහිංසාව වෙනුවට හිංසනයත් සාමය වෙනුවට අසමගිය, ප්‍රචණ්ඩත්වයත් දකින්නට ලැබෙන කාලයක් බවට පත් වී තිබීම අතිශය ඛේදනීය කරුණකි. තථාගතයන් වහන්සේ පහළ වූයේ භාරත දේශයේ වුවද එම දහම සුරැකිව ඇත්තේ අප රටෙහිය. එසේම තථාගතයන් වහන්සේගේ ධාතූන් වහන්සේලා රැසක් අප රටෙහි ගෞරවාන්විතව පුද පූජාවන්ට ලක්ව පවතී. එබඳු රටක් ගිනි ගන්නේ කෙසේද? සාමය, සදාචාරය, අවිහිංසාව මිනිසුන් කෙරෙන් පලා ගියේ මන්ද? හිමිදිරියේ සිට රැය පහන් වන තුරා ධර්මය ශ්‍රවනය කිරීමෙන් පිරිත් ශ්‍රවනය කරමින් සිටින අපට මෙතරම් කුරිරු රෞද්‍ර විය හැකිද? මේ සියල්ලට ම හේතුව ධර්මය නොදැනීමයි, එසේත් නැත්නම් ඇසූ දහම ප්‍රායෝගිකව අපේ ජීවිතයට ළංකර නොගැනීමයි.

"සාමග්ගි" concordance සමගිබව මෙන්ම අවිහිංසා non – violence යන පද තුළින් හඳුන්වන්නේ අප කා තුළත් පැවතිය යුතු අවිහිංසාව හා සමගිසම්පන්න බවයි. අප තථාගතයන් වහන්සේ අවිහිංසාව අගය කළ ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයාණන් වහන්සේ නමකි. බෞද්ධයකු වීමේදී පංචශීල ප්‍රතිපදාව මත පිහිටා කටයුතු කිරීම අත්‍යවශ්‍ය වූවකි. එහි පළමුවැන්න නම් බෞද්ධයකු වූ මා ප්‍රාණඝාතයෙන් තොර වීම, අන්‍යයන්ට හිංසා කිරීමෙන් වැළකීමේ ප්‍රතිපත්තියට එකඟ වෙමියි යන්නයි. එයින් පෙනී යන්නේ ප්‍රාණඝාතය සිදු කරන අන්‍යයන්ට හිංසා කරන අයට බෞද්ධයකු යැයි කිව නොහැකි බවය. තථාගතයන් වහන්සේ සෑම අවස්ථාවක ම අවිහිංසාව ප්‍රතික්ෂේප කළහ. එය මනුෂ්‍යයන්ට පමණක් නොව තිරිසන්ගත සතුන්ට පවා නොගැළපෙන්නකි. අන්සතු දේපළ විනාශ කිරීම ද මෙයට අදාළ වේ. අන්සතු දේපළ පැහැර ගැනීම ද හිංසන කටයුත්තක් මෙන්ම අදින්නාදාන යන ශික්ෂා පදය උල්ලංඝනය කරන්නකි.

බුද්ධකාලීනව සිටි ෂඩ් ශාස්තෘවරු අතරින් ජෛන මහාවීර අවිහිංසාව අගය කළ අයෙකි. ඔහුගේ දහමේ අවිහිංසාවාදය පිළිබඳ ඉගැන්වේ. එහෙත් බුදු දහමේ අවිහිංසාවාදයක් පිළිබඳ කිසිසේත් සඳහන් නොවේ. අවිහිංසාවාදයේ ලක්ෂණයක් වන්නේ එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකි වීමයි. ඔහුගේ ඉගැන්වීම්වල ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකි ආගමික ප්‍රතිපදාවක් පැවතියේය. එනම් මඟ ගමන් කරන විට බිම අතුගාමින් යා යුතු බව ඔහු ප්‍රකාශ කළේය. ඊට හේතුව පොළොවෙහි ප්‍රාණීන් ඇති නිසාවෙන් බව ඔහු පෙන්වා දෙනු ලැබේ. නමුත් මෙය ප්‍රායෝගික නොවන්නක් බව බුද්ධිය ඇති ඕනෑම අයෙකුට වැටහෙන්නකි. අවිහිංසාවේ අගය බුදු දහම අගය කළ ද මෙය ප්‍රායෝගික විය යුතු බව බුදු දහම අවධාරණය කර ඇත.

ඉවසීමේ ගුණය, මෛත්‍රී සිතිවිලි ඇති අයෙකුට කිසි විටෙකත් තවත් අයෙකුට හිංසා පීඩා කිරීමට සිතක් පහළ වන්නේ නැත. එවැනි සිතක් පහළ නොවීමෙන් ද්වේශය (තරහව) මෙන්ම මෝහය (මුලාව/අනුවණකම) මත පදනම් වී තව කෙනෙකුට හිංසා කිරීමට, ඇනකොටා ගැනීමට, අනුන්ගේ දේපළවලට හානි කිරීමට සිත් ඇති වේ. මජ්ඣිම නිකායේ චූලගෝසිංග සූත්‍රයේ සඳහන් සාමය මීට කදිම නිදසුනකි. ගිහි පැවිදි දෙපාර්ශ්වය ම තුළම සමගි සම්පන්න බව තිබිය යුතු වේ. "සුඛා සංඝස්ස සාමග්ගී" සංඝයාගේ සමගිය සුව ඇති කරන්නක් බව, දියුණුව ඇති කරන්නක් බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත. ගෝසිංගසාල වනයට වැඩම කරනු ලබන බුදුරජාණන් වහන්සේව උයන්පල්ලා විසින් නවත්වා ගන්නා ලදී. එයට හේතුව වූයේ අනුරුද්ද, නන්දිය, කිම්බිල යන තෙරුන් වහන්සේලා උයනෙහි සමගිව වාසය කිරීමයි. පිටතින් කෙනෙකු පැමිණ එම සමගිය විනාශ කරතැයි ඔහු අදහස් කළේය. දොරටු අභියස වැඩ සිටින්නේ තම ශාස්තෘවරයාණන් වහන්සේ වූ තථාගතයන් වහන්සේ බව අනුරුද්ධ තෙරුන් වහන්සේ විසින් උයන්පල්ලාට දැනුම් දෙන ලදි. ඉන් අනතුරුව උයනට වැඩම කළ බුදුරජාණන් වහන්සේ විමසන ලද කාරණය අතිශය වටිනා වූවකි. ''අනුරුද්ධයෙනි ඔබලා සමගිව, සතුටුව විවාද නොකොට කිරි හා දියර මෙන් එකිනෙකා කෙරෙහි පිය මනාපයෙන් යුතුව වාස කරන්නේ දැයි විචාළේය. මෙයට පිළිතුරු දුන් අනුරුද්ධ තෙරුන් වහන්සේ ස්වාමිනි, අපි ඒකාන්තයෙන්ම එසේ වාසය කරන්නෙමුයි පිළිතුරු ලබා දී ඇත. එසේම අප එකිනෙකාට උදවු කරමින් කටයුතු කරන බව අනුරුද්ධ තෙරුන් වහන්සේ සඳහන් කොට ඇත. එහිදී මුලින්ම විමසන ලද ප්‍රශ්නයක් වූයේ ඔබලාට අවශ්‍ය නිදහස මෙන්ම ආහාරපාන පවතීද යන්නයි. මෙම කරුණු වර්තමානයට ද අතිශයින් වැදගත් වේ. අසමගිය ඇතිවීම සඳහා හේතු වන කරුණු අතර නිදහස නොමැතිවීම, ආහාර පාන ආදී මනුෂ්‍ය අවශ්‍යතාවන් අඩු වීම ද හේතුවක් වන බව පැහැදිලි කරුණකි.

අසමගිය ඇති වීම සඳහා හේතුවන කරුණු අතර,

නොසතුටු සිත් ඇති බව,

විරුද්ධවාදී බව,

ප්‍රිය මනාප බව නැතිවීම මෙන්ම පංගු බේරුව ද හේතු වන බව මෙම සූත්‍රයෙන් මනාව පෙන්වා දෙයි. යුද්ධයෙන් හෝ හිංසාවෙන් ලෝකයක් දිනාගත නොහැක. ඉන්දියාවම තම අණසකට ගත් අධිරාජ්‍යවාදියකු වූ ධර්මාශෝක රජතුමා පවා එහි ආදීනව, නිරර්ථක බව පසුකාලීනව මැනවින් දුටුවේය. යුරෝපීය අධිරාජ්‍යවරුන් හා සම්බන්ධව ද ගත හැක්කේ එයම ය. ජාතිය, කුලය, ආගම, ධනය, බලය ආදිය මත පදනම්ව සමගිය බිඳ වැටී හිංසාව ඉස්මතුව ප්‍රශ්න ඇති වන බව සක්සුදක් සේ පැහැදිලි වේ. තථාගතයන් වහන්සේ පවා අවස්ථා දෙකකදී හිංසාව, භීෂණය පදනම් ව ඇතිවීමට ගිය යුද කලකෝළාහලයන් නවත්වා ඇත. ඉන් පළමුවැන්න වනුයේ අජාසත් මහරජතුමා වජ්ජි දේශය ආක්‍රමණය කිරීමට ගත් උත්සාහයයි. දෙවැනි අවස්ථාව වන්නේ ජාතක අට්ඨකතාවේ එන කුණාල ජාතකය මගින් නිදසුන් සපයයි. මෙහි එන සංවාද අතිශය වැදගත් ය. රෝහිණී ගඟ දෙපසට එකතුවූ රජවරු ඇතුළු පිරිසගෙන් විමසා ඇත්තේ ඔබලා මෙම ගං තීරයට ම රැස් වූයේ මන්ද යන්නයි. ස්වාමීනි, අප මෙහි පැමිණියේ ගඟ බැලීමට හෝ එතෙර මෙතෙර යෑමට නොවේ. යුද වැදීම පිණිස යැයි පිළිතුරු ලබා දී ඇත. යුද්ධයට හේතුව කුමක් ද? ජලයයි. ජලයෙහි වටිනාකම කොපමණ ද? එහි වැඩි වටිනාකමක් නැත. එසේ නම් පොළොවේ වටිනාකම කොපමණ ද? එහි අගය මිල කළ නොහැක. යුද වැදීමට සිටින සෙබළුන්ගේ වටිනාකම කොපමණ ද? ඔවුන්ගේ වටිනාකම ද මිල කළ නොහැකිය. එසේ නම් නොවටිනා ජලයක් වෙනුවෙන් වටිනාකම සීමා කළ නොහැකි මේ මනුෂ්‍ය ජීවිත හානි කිරීම කොතරම් යුක්ති සහගත දැයි බුදුරජාණන් වහන්සේ ඔවුන්ට පහදා දී ඇති වීමට ගිය යුද්ධය සමථයකට පත් කළ අයුරු සංවාදාත්මක ස්වරූපයෙන් දක්වා ඇත. සමගිය බිඳ වැටී හිංසාව ඇති වීමට පාදක වන්නේ භෞතිකමය වටිනාකම් මත පදනම්වය. වටිනාකමක් දිය නොහැකි මනුෂ්‍ය ජීවිත හානි කොට නොවටිනා භෞතික දේ අපේක්ෂා කිරීමේ ඇති ඵලය කුමක් දැයි අප සැමදෙනාම වටහා ගත යුතුමය. ප්‍රශ්න විසඳාගත යුත්තේ ශරීරයේ ඇති ශක්තිය මත පදනම්ව නොව සිතින් සිතා බුද්ධිමත් ව ක්‍රියා කිරීමෙන් පමණි. එසේ නොවී ශරීරයෙන් ප්‍රශ්න නිරාකරණය කිරීමට යෑමෙන් සිදු වන්නේ තව තවත් ප්‍රශ්න උග්‍ර වීමය. බුදුරජාණන් වහන්සේ අවි ආයුධ ඉවත දැමූ ශාස්තෘවරයාණන් වහන්සේ නමකි. අවිආයුධ වෙළෙඳාම නොකළ යුතු වෙළෙඳාම් ගනයට අයත් වන්නේ එයින් සමස්ත මානව වර්ගයාට මෙන්ම සියලු සත්ත්වයින්ටම අයහපතක් සිදුවන බැවිනි. අන්‍යයන්ට හිංසා කරන අයගේ ආයුෂ පිරිහී දුර්වර්ණ වන බව බෞද්ධ දේශනයයි. සමගිය ඇති වීම සඳහා ප්‍රචණ්ඩත්වයෙන් තොර වීම, මිත්‍රශීලී බව, සාකච්ඡාවට එකඟවීම, සියලු මානව වර්ගයා ම එක හා සමාන යැයි පිළිගැනීම මිනිසත් බවෙහි අගය වටහා ගැනීම, අවිආයුධ පරිහරණයේ ආදීනව දැකීම, සදාචාර සම්පන්නවීමේ අගය දැකීම, නිවැරදි දැක්මක හා ප්‍රතිපත්තියක පිහිටා සිටීම, හිස් සෝෂාවලට නොරැවටීම, ආරවුලක් ඇති වූ විට පක්ෂග්‍රාහී නොවීම යන මෙම කරුණු සමගිය, අවිහිංසාව ඇතිවීම සඳහා රාජ්‍ය පාලකයන් හා ජනතාව තුළ ද පැවතිය යුතු යහපත් ගුණාංග වේ. වජ්ජීන්ගේ රට දියුණු වූයේ සප්ත අපරිහානී ධර්ම මත පිහිටා කටයුතු කිරීම හේතුවෙනි. එහි පළමුවැන්න හා දෙවැන්න වූයේ සමගිව රැස් වීම හා සමගිව විසිර යෑමත් ආර්ථිකමය අගාධයක සිටින අප දියුණුවක් අපේක්ෂා කරන්නේ නම් පාලකයන් මෙන්ම රටවැසි ජනතාව ද පෞද්ගලික ලාබ අපේක්ෂා අරමුණු මත හඟා නොගොස් පොදු සාමූහික නිවැරදි මඟක ගමන් කළ යුතුම කටයුත්තකි. ඒ සඳහා අන්තවාදී නොවී කටයුතු කිරීම සත්භාවයෙන්ම ගිහි පැවිදි දෙපාර්ශ්වය විසින් ම අද අදම සිදු කළ යුත්තකි.

මේ උතුම් වූ සම්බුදු ගුණ අසිරිය සිහිපත් කරනු ලබන මොහොතේ අප සැමගේ සිත් මෛත්‍රියෙන් පුරවා ගනිමින් සමගි සම්පන්නව අවිහිංසාවෙන් යුතුව කටයුතු කිරීමට අදිටන් කරගනිමු.

"සබ්බේ තසන්ති දණ්ඩස්ස - සම්බේසං ජීවිතං පියං
අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයෙ"

සියලු දෙනා ම දඬුවමට තැති ගනිත් - සියල්ලෝම ජීවිතයට ප්‍රිය වෙත්

ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය.

අපි උපදින මැරෙන අපේ මාතෘ භූමිය සදහම් සිසිලෙන් සැනසේවා!

DSI නිවසේ ඒකායන ප්‍රාර්ථනයයි.

**උතුම් වෙසක් පොහෝ දින ඔබ වෙත ගෙනෙන මෙම දහම් පඬුරේ බැතිබර දායකත්වය දරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම පාවහන් නිෂ්පාදකයන් වන DSI නිවෙසිනි.**

සම්බන්ධීකරණය
**අචලා ඉරෝෂි**




මෛත්‍රී, කරුණා බුදු ගුණයෙන්
ප්‍රචණ්ඩත්වයේ ගිනිදැල් නිවා දමමු

සබ්බේ තසන්ති දණ්ඩස්ස
සබ්බේ භායන්ති මච්චුනෝ
අත්තානං උපමං කත්වා
නා හනෙය්‍ය න ඝාතයේ
(ධම්මපදය - දණ්ඩ වර්ගය)

සියල්ලෝ දඬුවමට බියවෙත්. සියල්ලෝ මරණයට බියවෙත්. එබැවින් අනුන් තමන්ට සමාන සේ සිතා අනුන්ට හිංසා නොකළ යුතුය.
අනුන්ට හිංසා නොකරවිය යුතුය.

**ඇසෙනා බුදු බණ හඬින් වෛරී පාප සිතුවිලි සිතින් මුදා හරින්න.**
**ලොව්තුරා බුදු පියාණන්ගේ මග අනුව යමින් මිනිසත්කමේ ගුණ සුවඳ පතුරන්න.**

බැතිබර වෙසක් පැතුම
DSI Samson group
WELCOMING POSSIBILITIES
www.dsi.lk
RIBBS N&L

දිවයින
ඉරිද සංග්‍රහය

2022 මැයි මස 15 වැනිදා ඉරිදා

# තනි අලියෙක්

(A Lonely Tusker)

යුද ජයග්‍රහණය උදෙසා දේශපාලන නායකත්වය දුන් මහින්ද රාජපක්ෂට අවසානයේදී සිදුවූයේ කුමක්ද? කෝපාග්නියෙන් දැවෙන සහෝදර ජනතාව වෙතින් පණ බේරා ගැනීම සඳහා ත්‍රිකුණාමලේ නාවික හමුදා කඳවුර තුළ සැඟවීමටය. ගෝල්ෆේස් පිට්ටනියේ තිබූ 'ගෝඨා ගෝ ගම'ට පොහොට්ටු මැරයන් විසින් පහරදෙනු ලැබීමෙන් පසු මේ රටට ආණ්ඩුවක් නැති විය. පොලු මුගුරු අතින් රැගෙන මහ මගට බට පාදඩයෝ පොදු දේපළ සහ ඇමැතිවරුන්ගේ නිවාස ගිනි තබන්නටත් කඩ කොල්ල කන්නටත් පටන් ගත්හ. මේ කිසිදු තැනක යුද හමුදාව හෝ පොලිසිය සිටියේ නැත. එසේ මහ පාරෙන් අතුරුදන් වූ යුද හමුදාව සහ පොලිසිය අදටත් ආගිය අතක් නැත. දැනටත් මහ පාරේ සිටින්නේ ඉතා අහඹු ලෙස දැකගත හැකි ට්‍රැෆික් රාළහාමි කෙනෙක් පමණි. අව්වට වේලෙමින් වැස්සට තෙමෙමින් මිනිසුන්ගෙන් කුණුහරුප අසමින් පෙරලා මිනිසුන්ට කුණුහරුපෙන් බනිමින් ට්‍රැෆික් රාළහාමි ගත කරන ජීවිතය ඉතාම ශෝකජනක ජීවිතයකි. නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහ පාරේදී ගුටි කෑමෙන් පසු පොලිසියේ ධුරාවලිය දෙකයි පනහට බැස්සේය. දේශබන්දු තෙන්නකෝන් ගුටි කෑවේ නිකන්ම නොවේ. ගෝල්ෆේස් ගුටි කෙළියේදී ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයී යැයි ඔහුට ලොකු චෝදනාවක් තිබේ. තවමත් රට තුළ බරපතළ ඉන්ධන හිඟයක් සහ බරපතළ ගෑස් හිඟයක් පවතී. පැය 3 කරන්ට් කැපිල්ල පැය 5 ක් දක්වා දීර්ඝ වී ඇත. රුපියල් 500 ට තිබූ පරිප්පු කිලෝව අද වනවිට රුපියල් 600 කි. මෙයට තුන් මාසයකට පෙර රුපියල් 800 ක් ව තිබූ කිරි පිටි කිලෝව අද රුපියල් 2800 කි. පසුගිය සතිය පුරාම හයිවේ එකට ඇතුල්වන වාහනවලින් මුදල් අය කිරීම සඳහා ටිකට් කවුන්ටරවල සේවකයන් සිටියේ නැත. මැයි 9 වන සඳුදා රට ගිනි තබා ස්වල්ප වේලාවක් තුළදී පාදඩ මැරයෝ හයිවේවල පාලනය සියතට ගත් බැවින් ඒවායේ ටිකට් කවුන්ටරවල සිටි නීත්‍යානුකූල සේවකයෝ දිවි බේරා ගැනීම සඳහා පලා ගියහ. එදා සිට ඉකුත් සති අන්තය දක්වාම මේ රටේ ආණ්ඩුවක් තිබුණේ නැත. සිවිල් ජන බලය ඉතා දරුණුය. සිවිල් ජන බලය තුළ බූරුවෝද කොටළුවෝද සිටිති. මේ තිරිසනුන් පස්සා කකුල් වලින් පයින් ගහන විට පහර කන එකාගේ ඇට කටු බිඳී යයි. එහෙත් ගහන එකා බූරුවකු හෝ කොටලුවකු නිසා ඌට විරුද්ධව නෛතික ක්‍රියා මාර්ගයක් ගැනීමට නොහැක. රනිල් වික්‍රමසිංහ හය වෙනි වරටත් මේ රටේ අගමැති වන්නේ මෙවැනි දුර්දාන්ත සමයකදීය. සමහරවිට ලංකා ඉතිහාසයේ ලොකුම දුර්දාන්ත සමයේදී රට භාරගත් අගමැති ලෙස රනිල් වික්‍රමසිංහ ඉතිහාසයට එක්වනවා ඇත. රනිල් අගමැති වූ සැණින් ඇමරිකන් තානාපතිනිය ඔහුට සහාය පළ කරමින් නිවේදනයක් නිකුත් කළාය. ඇමරිකන් තානාපතිනිය යනු ඇමරිකාවේ නියෝජිතයාය. ඇය රනිල් ට සහාය දෙනවා යැයි කියන්නේ ඇමරිකාව රනිල් ට සහාය දෙන බවය. එම නිවේදනයෙන් ස්වල්ප වේලාවකට පසු සමගි ජන බලවේගයේ මහ ලේකම් රංජිත් මද්දුමබණ්ඩාර කියා සිටියේ තමන් හෝ සජබ රනිල්ට කිසිදු සහායක් නොදෙන බවය. සමහරවිට රංජිත් මද්දුමබණ්ඩාර මේ විහිළුව කරන්නට ඇත්තේ සජිත් ප්‍රේමදාසගේ ඉල්ලීමට අනුව විය යුතුය.

රනිල්ට අගමැතිකම භාර දීමට පෙර එම තනතුර භාරගන්නා ලෙස ජනාධිපති ගෝඨාභය සමගි ජන බලවේගයෙන් ඉල්ලා සිටියේය. එවිට සජිත් කිව්වේ ජනාධිපති අස්වෙනවා නම් අගමැතිකම භාරගන්නා බවය. එහෙත් අන්තිමේදී අගමැති තනතුරේ රනිල් දිවුරුම් දෙන විට එම තනතුර භාර ගැනීමට කැමති බව කියමින් සජිත් ජනාධිපතිට ලිපියක් යැවීය. මේ වනවිට අගමැති කෝච්චිය පිටත් වී අවසන්ය. එය කොටුවේ දුම්රිය පළෙන් පිටත් වී මහනුවරත් පසුකරගෙන ඉදිරියට යමින් තිබිණ. අගමැති පත් කිරීම ජනාධිපතිගේ අභිමතයයි. ඒ අගමැති පාර්ලිමේන්තුව තුළදී බහුතරය පෙන්වීම වෙනම කාරණයකි. අපගේ අවංක හිත මිතුරා වූ තිස්ස අත්තනායක යන හැම පැත්තක්ම අවසන් මොහොතේදී පරාජයට පත්වීම ඔහුගේ වරදක් නොවේ. එය ක්‍රමයේ වරදය.

ශ්‍රී ලංකාවේ 26 වන අගමැතිවරයා වන රනිල් වික්‍රමසිංහ රටකට ඉතා ප්‍රයෝජනවත් ධනවාදියෙකි. ඉන්දියාව, ජපානය, ඇමරිකාව ඇතුළු අතේ සල්ලි තියෙන රටවල් ඔහු සමග කිට්ටුවෙන් ගනුදෙනු කරයි. පාර්ලිමේන්තුව තුළදී තවමත් තනි අලියෙක් වන නමුදු ජාත්‍යන්තරයේදී රනිල් ශක්තිමත් ඇත් හමුදාවක සාමාජිකයෙකි. මේ වෙලාවේදී මේ රටේ ජනතාවගේ මූලික අවශ්‍යතාව වන්නේ බඩට කෑමත්, කරන්ට් එකත් පෙට්‍රල් සහ ඩීසල් ටිකත් ගෑස් සිලින්ඩරයත්ය. මේවා නැතිව ආලපාළු වී සිටින මේ රටේ ජනතාවගේ චිත්ත ධෛර්යය හයිවේ එකේ යන ලොරියකට යටවුණු Cavendish කෙහෙල් ගෙඩියක් මෙන් සමතලා වී ගොස් තිබේ. අගමැති වික්‍රමසිංහ ප්‍රමුඛත්වය දිය යුත්තේ මධ්‍යම හයිවේ එකේ ඉතිරි ටික නිම කිරීමට හෝ කොළඹ හදන ගොඩනැඟිලිවලට සිමෙන්ති ගෙනත් දීමට නොව මේ රටේ ජන සමාජය පෙලන මූලික අවශ්‍යතා සම්පූර්ණ කර දීමටය. මේ වනවිට කළු කඩේ ඩොලර් එකක් රුපියල් 400 කි. බැංකුවේ මිල රුපියල් 365 කි. මේ ආර්ථිකයට එකවර ඩොලර් බිලියන 5 ක් පොම්ප කිරීමට ජාත්‍යන්තරය පොලඹවා ගැනීමට හැකිනම් ඩොලරය රුපියල් 250 ට බැස්සවිය හැකිය. මේ මොහොතේදී විපක්ෂයේ ලොකුම ප්‍රශ්නය වන්නේ රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තුවේ බහුතරය කෙසේ පෙන්වන්නේ ද යන්නය. බහුතරය පෙන්වීම සම්බන්ධයෙන් රනිල් වික්‍රමසිංහ බලාගන්නවා ඇත. විපක්ෂයේ යුතුකම වන්නේ මිස් වුණු අගමැති කෝච්චිය ගැන කල්පනා කරමින් සිටීම නොව හැකි ආකාරයෙන් රට ගොඩගැනීමට උදව් කිරීමය. පාර්ලිමේන්තු බහුතරය මගින් ජනතාවගේ බඩ නොපිරේ. ජනතාවගේ බඩ පිරෙන්නේ රටට ඩොලර් ඇවිත් මිනිසුන් අතට සල්ලි ආවොත් පමණි. රට නැවතත් සංවිධානය වූ පසු වහාම මැතිවරණයකට යෑම ආණ්ඩුවේ වගකීමය. රනිල් වික්‍රමසිංහට මෙවර ලැබුණු අගමැතිකම ඉතාම වාසිදායක අගමැතිකමකි. ඒ සඳහා මැතිවරණයකට යෑමට ඔහුට වුවමනා වූයේ නැත. ඒ නිසා මේ අග මැතිකම තුළ ඡන්ද පොරොන්දු ද නැත. රටට යහපත් යමක් කිරීමට මේ තනි අලියාට හැකි වේවා යැයි අපි ප්‍රාර්ථනා කරමු. එය කර ගැනීමට බැරි වුණොත් ගෝල්ෆේස් කට්ටිය පැමිණ මේ තනි අලියාගේ හොඬවැල කපාගෙන යනු ඇත.

අංක: 223, බිලුමැන්ඩල් පාර, කොළඹ 13.
කර්තෘ මණ්ඩලය - 2448402, 2497500
ෆැක්ස් - 2344253, 2438750

වෙබ් අඩවිය - www.divaina.com
ඊමේල් - divaina@unl.upali.lk
divainapro@unl.upali.lk

www.facebook.com/divainanewspaper

දැන්වීම් අංශය - 2434190 (ප්‍රධාන කාර්යාලය)
ෆැක්ස් - 2344252, 2330024

බෙදාහැරීම් අංශය - 2497568, 2497519, 2497580
ෆැක්ස් - 2334564
කොටුව කාර්යාලය - 011 2334565

## ගිටිවානය

අනුරල සජිත්ලා දැම්මට බකට් එක
රනිලුයි ජනපතිඳු තේරුව බුලට් එක
ඔහුගේ වගකීම රැකුමට විකට් එක
තවමත් 'එව්රි රෙඩි' ජනතා ඇලට් එක

- අනුරාධ හිරිපිටියගේ



# අගමැති ගොසින්ය ජනපතිටත් නොගොසින් බැරිය!

නීතිය අතට ගත් පාදඩ අමන රැළ
භීතිය වපුරමින් කළ මහ විපත බල
වාසිය බල බලා දෙස්පාලනය කළ
ජාතික කියන නායකයන් කොහෙද බොල!

යව්වන සිතුම් උණුසුම් කළ අරගලය
රැව් දුන් අයුරු දැක මැද මහජන බලය
පව්කාරයන් සිටියේ කල් බල බලය
ඔව් සහතිකයි මේ නව ගමනක මුලය

- ගාමිණී

මහින්ද රාජපක්ෂ අගමැතිවරයා සිය ධුරයෙන් ඉල්ලා අස්වූයේ මේ රට බරපතළ විනාශයකට යොමු කරවමින් බව ඔහුට එරෙහිව සිදුවන දේශපාලන විවේචනවල හරය වී තිබේ. ඉකුත් මැයි 9 වැනිදා අප දුටුවේ ලංකාව මෑත ඉතිහාසය තුළ අතිශය ප්‍රචණ්ඩ හා මුග්ධ දේශපාලන මෙහෙයුමක් වෙනුවෙන් ලෙයින්, කඳුළෙන් පමණක් නොව ජීවිතවලින් ද විශාල වන්දියක් ගෙවූ ආකාරයයි. මෙය ඉතා ගැඹුරින් විමසා බලා නිසි දේශපාලන ප්‍රතිචාරයක් නොදක්වන්නේ නම් මේ රට තව තවත් විනාශයේ හා භීෂණයේ ප්‍රපාතය කරා ඇදී යාමක් මිස ඉන් ගොඩ ඒමක් සිදු නොවන බව අප සියල්ලෝම තේරුම් ගත යුතු වෙති.

එහෙත් තවමත් මෙරටේ මුල්බැස ගත් ජරාජීර්ණ දේශපාලන තිරයෙන් නිදහස් වීමට, ඒ දේශපාලන භාරකාරත්වය දක්වන පසුබෑම ඉතා පැහැදිලිය. ඔවුහු කිසිසේත් අභිනව දේශපාලන සංස්කෘතියක බිහිවීම අපේක්ෂා නොකරති. එයට නොයෙක් හතුරුකම් ද කරති.

ඉකුත් 9 වැනිදා ගාලුමුවදොර සාමකාමී විරෝධතාවට එල්ල කරන ලද ප්‍රචණ්ඩ හා ම්ලේච්ඡ ප්‍රහාරය නිසැකයෙන්ම අරලියගහ මැඳුරෙන් සමාජගත කරන ලද දේශපාලන විෂ දුමාරයක ඵලයකි. මුළු රටම ගිනි ජාලාවක් බවට පත් වී විනාශ වෙද්දී එම ප්‍රහාරයෙහි මැවුම්කරුවෝ ද අතුරුදන්ව සිටිති. අරලියගහ මන්දිරය ඉදිරිපිටත්, ගාලුමුවදොර ජනාධිපති කාර්යාල පරිශ්‍රයෙහිත් පැවති තරුණ විරෝධතා ව්‍යාපාරයට ආණ්ඩුවේ ද සහාය ලත් පොහොට්ටුවේ දේශපාලන මැරයන් සම්බන්ධ වූ බව කවුරුත් දනිති. ගාලුමුවදොර විරෝධතාව අලුත් ලොවක් ගැන හිතන පතන තරුණයන්ගේ අරගලයකි. මානව දයාව, ආදරය සමග මුසු වූ ඒ විරෝධතා ව්‍යාපාරය සඳහා මෙරටේ ඈත ගම් දනව්වල ජනතාවගේ ද ආශීර්වාදය ලැබුණි. නිර්පාක්ෂික, නිර්ආගමික මෙන්ම නිර්මාණශීලී තාරුණ්‍යයක ආධ්‍යාත්ම ප්‍රකාශනයක් ලෙස ගාලුමුවදොර අරගලය නම් කළ හැකිය. විවිධ ක්ෂේත්‍රවල වෘත්තිකයන්, සංස්කෘතික කලා ක්‍රියාකාරීන්, විද්වතුන් මෙන්ම සිවිල් සංවිධානවල පිරිස් හා ආගමික නායකයෝ ද ඒ විරෝධතා ව්‍යාපාරය අනුමත කළහ. එයට අනුබල, අනුග්‍රහයන් පවා ලබා දුන්හ. තරුණ විරෝධතාව සංකේතවත් කරමින් හඳුන්වාදුන් 'ගෝඨා ගෝ ගම' පුළුල් සංකල්පයක් ලෙස නුවර ගම්දනව් කරා ද පැතිරිණි. ඒ විරෝධතාකරුවන්ගේ සටනෙහි තේමාව වූයේ ''ජනාධිපති, අගමැති ඇතුළු පාර්ලිමේන්තුවේ 225 දෙනාම ගෙදර යා යුතුයි'' යන්නයි. ගාලුමුවදොර විරෝධතාකරුවන් විසින් සමාජගත කරන ලද ඒ තේමාව මෙරටේ ප්‍රබුද්ධ ජනතාවගේ ද අවධානයට ලක්විය. ඒ සම්බන්ධයෙන් නොයෙක් දේශපාලන සංවාද පවා ඇරඹුණි.

ශ්‍රී ලාංකික සමාජ දේශපාලනය අභිනව දිශාන්තයකට යොමු කිරීම ගාලුමුවදොර අරගලයේ අපේක්ෂාව වුව ද රාජපක්ෂ පාලනය එයට සංවේදී නොවීම ද පැහැදිලිව දැක ගත හැකි විය. රාජපක්ෂවරුන්ගේ දේශපාලන මැදිහත්වීම් පිළිබඳව විරෝධයක් ද දියත් වෙමින් තිබිණි. ජනාධිපති ගෝඨාභයගේ දුර්වල ආර්ථික හා දේශපාලන කළමනාකරණය විසින් ජන ජීවිතයට එල්ල කරන ලද පීඩනය ද දවසින් දවස උග්‍ර විය. ගෝඨාගෝගමට අමතරව මුළු රටේම ජනතාව ආණ්ඩුව ගෙදර යායුතු බව කියන්නට ද වූහ. සියලු දේශපාලන පක්ෂ විවිධ ආගමික නායකයන්, වෘත්තිය සමිති, වෙනත් සිවිල් සංවිධාන එක හඬින් කියා සිටියේ රාජපක්ෂ පාලනයට සාධනීය සැලැස්මක් නැති බවත්, පැහැදිලි දේශපාලන ප්‍රතිසංස්කරණයක් සිදු නොවුවහොත් රට අරාජික වන බවත්ය. එහෙත් ඒ කිසිවක් බරපතළ ලෙස අවධානයට ලක් නොවූ බව ජනාධිපතිවරයාගේ මෙන්ම අගමැතිවරයාගේ හැසිරීම්, කතාබහ ආදියෙන් පැහැදිලි විය. එසේ වුවද පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පක්ෂවලින් සමන්විත භාරකාර හෝ තාවකාලික පාලනයක් පිළිබඳව අදහසට ජනාධිපතිවරයාට ද එකඟ වීමට සිදු විය. 20 සංශෝධනයෙන් තමන්ට ලබාදුන් බලය පවා අත්හරින තැනකට ගෝඨාභය රාජපක්ෂ පැමිණ සිටියි. එහෙත් ගැටලුව වූයේ මහින්ද අගමැති ඒ අභිනව ප්‍රතිසංස්කරණ තුළ වුව ද තම නියෝජනය අත්හැරීමට එකඟ නොවීමය. විධායක බලය සහිත ජනාධිපතිවරයා ද එහිදී තම සහෝදරයාට නිදහසේ තීරණයක් ගැනීමට ඉඩදී තුෂ්ණිම්භූත වීම අද අපට පෙනී යන්නේ රට විපතකට ඇද දැමීමට හේතු වූ බවය. දේශපාලනයේදී ලේ නෑකම්, සහෝදර බැඳීම් වැනි දේවල් නොතකා හැරීමට ද ප්‍රබල නායකත්වයක පෞරුෂයක් අවශ්‍ය බව ද මෙහිදී සඳහන් කළ යුතුය. එසේම අත්දැකීම් බහුල දේශපාලනඥයකු මෙන්ම කීර්තිමත් රාජ්‍ය තාන්ත්‍රිකයකු ලෙස අගමැති මහින්දට ද එහිදී නිවැරදි දේශපාලන තීන්දුව ගැනීමට තිබිණි. එහෙත් එය ඉටු නොවීය. ජනතාවට එපා නම් මා යන්නම් යනුවෙන් 2015 දී අභිමානයකින් රටට ප්‍රකාශ කළ ඔහු 2022 වනවිට බරපතළ දේශපාලන පරිහානියකට පත්ව සිටි ආකාරය ද ඒ සිදුවීම් මාලාව තුළින් අපට පසක් කර ගත හැකිය.

අගමැති මහින්දට දේශපාලන විචක්ෂණ භාවයකින් යුතු මිත්‍ර සමාගමක් හෝ නොවූ බව අපගේ අදහසය. ඔහු වටකරගත් පිරිස අතර බහුතරය දේශපාලනිකව කුජීත වූ ජනතාවගේ පිළිකුලට ලක් වූ අපාය සහාය දුෂ්ට චරිත වූ බව ද සැඟවිය නොහැක. ප්‍රාදේශීය වශයෙන් ඒ ඒ ආයතනවල බලය ලබාගත් පොහොට්ටුවේ බහුතර පිරිස කෙබඳු දේශපාලන අපතයන්දැයි ජනතාව ද හොඳින් දනිති. පළාත් පාලන ආයතන පද්ධතියම ගඳගැස්සවූ, දූෂණය භීෂණය සිය පැවැත්මේ ලක්ෂණය බවට පත් කර ගත් පාදඩයන්, රස්තියාදුකාරයන් පොහොට්ටුවෙන් බලගැන්වූ ආකාරය ද රටම දනී. එදා එනම් මැයි 9 වැනිදා මහින්ද අග මැතිවරයාට දේශපාලන තීන්දුව ගැනීම සඳහා අරලියගහ මන්දිරයට කැඳවූයේ එබඳු පිරිසකි. ඒ අතර යහපත් ඇවතුම් පැවතුම් ඇති ස්වල්ප දෙනෙක් ද සිටීමට බාධාවක් නැත. අනෙක් අතට ඒ ප්‍රාදේශීය දේශපාලන හමුවට පොහොට්ටුවේ ප්‍රධාන දේශපාලන ධාරාවට අයත් හිටපු ඇමැතිවරුන් මෙන්ම වත්මන් ඇමැතිවරු ද වූ බව කියති. එම හමුවේ මූලිකයන් ලෙස ක්‍රියා කළේ හිටපු ඇමැතිවරයකු වූ ජොන්ස්ටන් ප්‍රනාන්දු හා සනත් නිශාන්ත බව ද සඳහන් වේ. මේ දෙදෙනාටම රට ගිනි ගත් පොහොට්ටු ත්‍රස්තවාදය මෙහෙය වූ බවට දැඩි විවේචන එල්ල වී තිබේ. එසේම මොවුන්ට දේශපාලන මැරකම් තක්කඩිකම් ගැන ද කුප්‍රකට කීර්තියක් ඇත. ඇත්ත වශයෙන්ම ගෝඨා ගෝ ගම අරගලය මේ වර්ගයට අයත් අශික්ෂිත දේශපාලනයට එරෙහිවය. පොහොට්ටුකාරයන්ගේ පාදඩ, තක්කඩි දේශපාලනයට එරෙහිවය. එහෙව් දේශපාලන අම්බරුවන්ගෙන් විමසා තම දේශපාලන තීන්දු ගැනීමට අගමැති මහින්ද කල්පනා කිරීම පවා ඇදහිය නොහැක. රාජපක්ෂවරුන්ගේ කීර්තිමත් දේශපාලන මැදිහත්වීම් සියල්ල නොතකා ඔවුන්ට ඉතිහාසයේ කුණු බක්කිය සූදානම් කළාහු මේ පොහොට්ටුකාරයෝ නොවෙත්ද? කුමක් වුවත් අරලියගහ මැඳුර සමුළුව මගින් ක්‍රියාත්මක වූයේ ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ මෙහෙයුමක් බව දැන් රටම දනී. මේ වනවිට රහස් පොලිසියට එහි සුලමුල සෙවීමට ද භාර වී තිබේ. කුමක් වුවත් එදා අරලියගහ මැඳුරේ පොහොට්ටු හමුව එක හඬින් කියා තිබුණේ මහින්ද අගමැති ධුරය අත් නොහළ යුතු බවය. එහෙත් සිදු වූයේ කෙබඳු විනාශයක්ද? අරලියගහ මැඳුරෙන් පිටතට පැමිණි පොහොට්ටු කාරයෝ අවි මුගුරු දරමින් සිය ප්‍රචණ්ඩත්වයේ නීච අභ්‍යාසයට යොමු වූහ. මේ මැර මෙහෙයුමට කුලී මැරයන්, පාතාලයන්, මංපහරන්නන් කාන්තාවන්ගේ චේන් කඩන්නවුන් වැනි පාහර, අමනයන් ද එක්ව සිටි බව කියති. කුමක් වුවත් මේ වර්ගයේ පාදඩ සමුළුවක තමන්ගේ මච්බිම ගැන උද්වේගකර ප්‍රකාශ කරමින් අගමැති කර ඇත්තේ ද ඒ මච්බිම දඩබිමක් බවට පත් කිරීමට අනුබල දීමකි. අරලියගහ මැඳුර පරිශ්‍රයෙහි සිටි නිරායුධ තරුණ, තරුණියන්ට පහරදී ඔවුන්ගේ අට්ටාල සුනුවිසුනු කළ මැරයෝ ජනාධිපති කාර්යාලය සමීපයේ වූ ගෝඨා ගෝ ගමට ද තිරිසන් ප්‍රහාරයක් එල්ල කළහ. එහි තිබුණු නොයෙක් සංස්කෘතික ක්‍රියාවන්ට සෙවණ දුන් තාවකාලික ඉදිකිරීම්, පසෙක තිබුණු පොත්පත්, සංගීත කලා භාණ්ඩ සියල්ල ගිනි තැබූ පොහොට්ටු පාදඩයන්ගේ ඒ බිහිසුණු, සාහසික මෙහෙයුම්, කුරිරු පහරදීම් සියල්ලම රූපවාහිනී නාලිකා ඔස්සේ මේ රටට පමණක් නොව ලොවටම දැක බලා ගැනීමට ද හැකි විය. රටක හැදියාව පිළිබිඹු වන්නේ ඒ රටේ ස්ත්‍රීන්ට දක්වන ගෞරවයෙන් යැයි බර්ටෝල්ඩ් බ්‍රෙස්ට් නමැති විශ්ව කීර්තිමත් නාට්‍යකරුවා පවසා තිබේ. 'ගෝඨාගෝගමට' එල්ල වූ ඒ තුච්ඡ ප්‍රහාරයෙන් ප්‍රකට වූයේ රාජපක්ෂ දේශපාලනයදැයි ඇසීම වැරදි නැත. නිරායුධ තරුණියන්ට බිම දමා පහරදුන් දසුන් අප බලා සිටින්නේ හද ප්‍රකම්පිත කළ කඳුළුත් සමගය. පොලු මුගුරුවලින් පහර දෙද්දීත් අතක් ඔසවන්ට හෝ අසල තිබෙන ගල් කැටයකින් හෝ පහරක් නොදී ඉවසා සිටි ගාලුමුවදොර තරුණයන් පන්සියපනස් ජාතක පොතේ එන ක්ෂාන්තිවාදී තවුසා පිළිබඳ කතාවේ නූතන ප්‍රකාශනයදැයි මට සිතුණි. ගාලුමුවදොර විරෝධතාකරුවන්ගේ ආධ්‍යාත්මික විචිත්‍රත්වය, අධිෂ්ඨානය කෙබඳුදැයි මේවා දකින ශිෂ්ට පුරවැසියෝ වටහා ගනිති. ඒ අශිෂ්ට ත්‍රස්ත ප්‍රහාරයෙන් පැය 24ක් ඉක්ම යන්නට පෙර යළිත් 'ගෝඨාගෝගම' ඉදිවී තිබීම මේ තාරුණ්‍යයේ බලමහිමය විදහා දක්වන්නකි. කුමක් වුව ද පාදඩයන්ගේ අනුමැතියෙන් අගමැති පුටුවේ එල්ලී සිටින්නට සනිටුහන් කරගත් මහින්ද අගමැති ඒ මැර මෙහෙයුම් සිදුවද්දීම සිය ධුරය අත්හැරීමට ක්‍රියා කිරීම ද සරදමක් වැන්න. අගමැති පුටුව වෙනුවෙන් රටක්ම ගිනි වැද්දූ නායකයකු ලෙස මහින්දට අශිෂ්ට වාර්තාවක් ලියා දුන් ජොන්ස්ටන්ලා හා සනත් නිශාන්තලා ද දැන් මහජන විරෝධය නමැති කුණාටුවට හසු වී සිටිති. ඒ සියල්ල හරිය. එහෙත් දේශපාලන අපතයන් සමග කුණු බක්කියට වැටීමට තරම් මහින්ද අගමැතිවරයා බොළඳ, ලාමක චරිතයක් වූයේ කෙසේද යන්නත් විමසිය යුතුය. අඩ සියවසකට නොඅඩු සිය දේශපාලන කිරි කළයට පොහොට්ටු වසලයන් ගොම පමණක් නොව සුළුදියත් එක්කර තිබෙන අයුරු දැන් විවේකීව සිටින මහින්දට පෙනී යා යුතුය. අරලියගහ මැඳුරේ තකතීරු වෘෂභ මෙහෙයුමට දොර වසා අගමැති පුටුවෙන් බැස නොයෑමේ විපත ද දැන් ඔහුට පෙනී යා යුතුය. අඩුම තරමින් අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධියත් රුවන්වැලි සෑයත් වැඳ පුදා ගන්නට ගිය මහින්දට ඒ පුදබිම අසලින් එල්ල වූ විරෝධය ගැනවත් ප්‍රබුද්ධ මනසින් විමසා බැලීමට හැකි වූයේ නම් මේ පොහොට්ටු භීෂණය වළක්වා ගැනීමට ඉඩ තිබිණි.

මහින්දට සත්‍යය - යුක්තිය මෙන්ම කළ යුතු හා නොකළ යුතු දේ පිළිබඳව ද නිරවුල්ව වටහා ගැනීමට බුද්ධියක් නොවූ බව මේ සියලු විනාශය අපට පෙන්වා දෙයි. පොහොට්ටුවට සම්බන්ධ බොහෝ දෙනකුගේ භෞතික සම්පත් ගිනි තබා විනාශ කරනු ලැබ ඇත. මහින්දගේ ආශීර්වාදය ඇතිව හෝ නැතිව සමහරුන් විසින් රැස් කරන ලද ධනය, චංචල හා නිශ්චල දේපළ ආදිය ද කෙබඳුදැයි ඒ විනාශ වූ දේවල්වලින් වුව ද නිශ්චය කළ හැකිය. හාල්මැස්සන් ලෙස දේශපාලනයට එක්ව තල්මසුන් විලසින් වැඩුණු බොහෝදෙනකු දේශපාලනයෙන් කර ඇත්තේ වස්තුව රැස් කිරීම බව ද පෙනී යයි. ඇතැම් ඇමැතියකුට නිවාස පමණක් තුන හතරක් තිබේ. තැන්පත් ධනය කොපමණදැයි අප්‍රකටය. විගණකාධිපති ලෙස සිටි ගාමිණී විජේසිංහ මහතා චෝදනා කළේ ද දේශපාලනඥයන් උපයා ගත් ධනය ගැනය.


අද රටේ තත්ත්වය කුමක්ද? ඉන්ධන, ගෑස්, භූමිතෙල්, විදුලිය, බෙහෙත් කිසිවක් නැත. ගොවියාට පොහොර නැත. ලේඛකයාට ලිපි ද්‍රව්‍ය නැත. හාල්, පිටි, සීනි, පරිප්පු ඇතුළු සියල්ලේ මිල දෙගුණ තෙගුණ වී ඇත. වැඩි මිලට ගැනීමටත් බඩු නැත. සිමෙන්ති හිඟය නිසා ඉදිකිරීම් සියල්ල ඇනහිට ඇත. කහට කෝප්පය, පාන් කෑල්ල වැනි පීඩිතයන් තොල කට ගෑ බොහෝ දේවල මිල ද වැඩි විය. බස්රිය, දුම්රිය ජනතා ගමනාගමනයට නොසෑහේ. පෞද්ගලික බස්, ත්‍රිරෝද ගාස්තු ඔරොත්තු නොදෙන තරමට වැඩි වී තිබේ. ආණ්ඩුවේ ඇමැත්තන්, බලවතුන් හොර රහසේ පොහොර, ඉන්ධන, ගෑස් ග බඩා කර ගත් අයුරු ද හෙළි වී තිබේ. ඒ එකකටවත් විසඳුමක් තබා පැලැස්තරයක් දැමීමට තරම්වත් හැකි වූ ඇමැතියෙක් රාජපක්ෂ පාලනයේ නොවීය. ලක්ෂ සීයකට ආසන්නව ජනතාවගේ මුදල් ගිලින පාර්ලිමේන්තුව ගැන කවර කතාද? සියඹලාපිටිය කෝලමට පමණක් කොපමණ මුදලක් වැයවන්ට ඇද්ද? දැන් හැංගී හිටියත් අපේ මැති ඇමැතිවරුන් ජැන්ඩියට ඇඳගෙන රැකවලුන් ද පිරිවරාගෙන සුඛෝපභෝගී රියවලින් යාම් ඊම් කළ පින්වන්තයෝය. ඒ උතුමන්ට සිටි භාර්යාවන්ගෙන් ද වැඩි දෙනෙක් ආර්යාවෝ බවට පත්ව සිටිති. ඔවුන් අතර අප වැනි සාමාන්‍ය පුරවැසියකුගේ, හුළඟවත් වදින අයෙක් ද නොවෙති. ප්‍රජාතන්ත්‍රවාදය නරක නැත. ජනතා සේවය පාඩු ලබන ව්‍යාපාරයක් නොවන බව දැන් සාක්ෂි සහිතවම ඔප්පු වී තිබේ.

ගාලුමුවදොර විරෝධතාකරුවන් 225 ම එපා යැයි කියන්නේ මේවා දැක බලාගෙනය. මුන් අතර වැඩිපුරම ඉන්නේ හොරුන්ය. ඒ හොරුන් අතර කම්බා හොරු ද සිටිති. ඒ හොර වළල්ලෙන් බිඳක් පසුගියදා ජ.වි.පෙ. නායකයෝ ද රටට පෙන්වා දුන්හ. ලංකාව මිනී කන්නන්ගේ දේශයක් බව කියා චිත්‍රපටියක් හැදූ සිද්ධියක් ද අපට මතකය. එදා එයට ජනතා විරෝධයක් ද නැගුණි. දැන් පෙනී යන ආකාරයට නම් ලංකාව 'ශූර චෞරයන්ගේ' දේශයකි. එබඳු තේමාවකින් යුතු චිත්‍රපටයකට මේ කාලය නරක නැත. හොරුන් ගැන ඒ හොරා කාගත් ධනය සැඟවූ තැන් ගැන ඇහෙන කතා බොහෝය. රාජපක්ෂලාට එල්ල වන හොරකම් පිළිබඳ චෝදනා කෙළවරක් නැත. සුදු රෙදි හොරුන්, ටයි කෝට් හොරුන් මෙන්ම හොරු සමග හෙලුවෙන් සිටි නිලධාරීන් ගැන ද දාහක් කතා ඇසෙයි. හොරකම් හා අල්ලස් දූෂණ ගැන දැමූ නඩුවලින්, නඩු හිරේ ගොස් හොරු ගැලවී සිටිති.

දැන් දැන් හොරුන්ට කෙසේ වෙතත් හොරකම්, මැරකම්, බලුකම් මෙන්ම ගොන්කම්වලට ද විපාක ලැබෙමින් ද තිබේ. එහෙත් හොරු අපරාජිතය. ජනතාව පරාජිතය. රට අරාජිකය. ජන ජීවිත මලානිකය. පසුගිය දිනක බස්නාහිර පළාත භාරව සිටි ඉහළම පොලිස් නිලධාරියා වූ දේශබන්දු තෙන්නකෝන්ට ද මහමඟදී නෙළූහ. ඔහු පණ බේරා ගත්තේ දෙපාවල හයිය තිබුණු හෙයිනි. ඒ රටේ ආරක්ෂාව ගැන පුංචි නිදසුනකි. මැති ඇමැතිවරු හැංගී සිටිති. සමහරු බංකර්වලය. හිටපු අගමැති ත්‍රිකුණාමල නාවික කඳවුරේ හිර වී සිටියි. නිස්කලංක සැහැල්ලු මනසකින් ඔහුට ඒ ආසන්නතම සිදුවීම් සිහිපත් කළ හැකිද? තමන් ප්‍රමුඛ තම සහෝදරයාගේ පාලනය මෙරටේ ජනතාවට දුන් පීඩනය, කෙබඳුදැයි ඔහුට විමර්ශනය කළ හැකිය. තමන් විසින් බලය සඳහා ගන්නා ලද ක්‍රියාකාරකම් මෙන්ම අනුන්ගේ බලය දුර්වල කිරීමට වංචනික ලෙස කළ මෙහෙයුම් ගැන ද ඔහුට සිහිපත් වනු ඇත. බලය පෝෂණය කිරීමේ විකෘති මනස නිසැකයෙන්ම අන්තරායකාරීය. බලයට පැමිණීමත්, ඒ බලය රැක ගැනීමත් වෙනුවෙන් රාජපක්ෂවරුන්ගේ මුග්ධ අනුගාමිකයන් හා පොහොට්ටුවේ මැර දේශපාලනඥයන් විසින් ද ගන්නා ලද සියලු වංක හා දුෂ්ට මෙහෙයුම් පරාජයට ද පත්ව තිබේ.

ගෝඨාභය ජනාධිපතිවරයා ද 11 වන බදාදා ජාතිය අමතා ප්‍රකාශ කළේ අලුත් අගමැති හා කැබිනට් මණ්ඩලයක් මගින් රටේ ජාතික, ආර්ථික හා දේශපාලන ස්ථාවරත්වය ගොඩනඟා ගැනීමට ක්‍රියා කරන බවය. එහෙත් ගාලුමුවදොර විරෝධතාකරුවන්ගේ ප්‍රබල යෝජනාව ජනාධිපතිවරයාද ඉවත් විය යුතු බවය. 'ගෝඨා ගෙදර යනු' නමැති එම අරගලයේ සටන්පාඨය බිම දැමීමට ද ඔවුහු සූදානම් නොවෙති. ස.ජ.බ. මෙන්ම ජ.වි.පෙ. අනුර කුමාර පවසන්නේ ද ජනාධිපතිවරයා ඉවත් වනතුරු කිසිවක් සිදු නොවන බවය. විසිවරක් සංශෝධනය කළ අපේ ව්‍යවස්ථාව 21 වැනි වරටත් වෙනස් කිරීමට ද ජනාධිපති සූදානම්ය. එහෙත් පාර්ලිමේන්තුවේ විපක්ෂ මෙන්ම ගාලුමුවදොර අරගලයේ තරුණයන් ද මෙම ජනාධිපතිවරයා සමග විසඳුමකට එකඟ නොවුවහොත් කුමක් විය හැකිද? නිදහසින් පසු පාලනය භාර ගත් කිසිදු පක්ෂයකට හෝ නායකයකුට මෙන්ම දේශපාලන න්‍යායකට හෝ රටට අවශ්‍ය දේ ලබාදිය නොහැකි විය. ගාලුමුවදොර අරගලය ඉඳුරා කියන්නේ ඒ සියලු දේශපාලනඥයන්ගේ කාලය අවසන් වී ඇති බවය.

● ගාමිණී සුමනසේකර





# කවුරුත් කතා කරන මොකක්ද මේ අන්තර්වාර ආණ්ඩුව


ගාලු මුවදොර පිටියේ මූලික සටන් පාඨය වූයේ Gota go home යන්නය. මෙම උද්ඝෝෂණ ක්‍රියාදාමයට මේ වන විට මසකට වඩා වැඩි කාලයක් සම්පූර්ණ වී ඇත. මෙම අරගලය ආරම්භ වී වැඩි කල් යන්නට මත්තෙන් Gota go home පමණක් නොව Mahinda go home ලෙසටද 225 ටම ගෙදර යන ලෙසට ද දක්වා සිය සටන් පාඨ පුළුල් කිරීමට අරගලකරුවෝ උත්සුක වූහ. තවද ගාලු මුවදොර පිටියෙන් ආරම්භ වූ මෙම සමාජ අරගලය අදවන විට දිවයිනේ සෑම අස්සක් මුල්ලක් නෑරම ව්‍යාප්තව වී ඇත. එනම් පූජ්‍ය පක්ෂය, සමාජ ක්‍රියාකාරීන්, වෘත්තිකයන්, සිවිල් සංවිධාන, කලාකරුවන් ඊට එකතු විය. දිනෙන් දිනම ලැව් ගින්නක් සේ සමාජය පුරාවටම රට පාලනය කරන ඇත්තන්ට එරෙහිව එල්ල වූ සමාජ තෙරපුම වර්ධනය විය. ඊට විසඳුම් දීමට පාර්ලිමේන්තුව දින කීපයක් පුරා රැස් වුවද කිසිදු විසඳුමකින් තොරව පාර්ලිමේන්තුවේ සභා රැස්වීම අවසන් විය. දින කීපය පුරාවටම සිදුවූයේ එකිනෙකාට වන අපවාද, අවලාද, බැන අඬ ගැසීම් පමණි. ඇතැම්විට පාර්ලිමේන්තු මන්ත්‍රීන් අතර වූ විහිළු තහළුය. ඒ වෙනුවෙන් ජනතාව පාර්ලිමේන්තුව රැස්වන දිනකට රුපියල් ලක්ෂ 92ක මුදලක් වැය කළේය. පාර්ලිමේන්තුවේ ඊළඟ සැසිවාරය මේ මස 16 දක්වා කල් තැබුණි. එහිදී ජනතාවට නම් තේරුම් ගියේ ගහපු පදයකුත් නැත බෙරේ පලුවකුත් නැත යන්න පමණි. එබැවින් ජනතාවට පාර්ලිමේන්තුව කෙරෙහි තිබූ විශ්වාසයද බිඳ වැටුණි.

## ● ජනාධිපති ධුරය හිස්වුණොත්...

පසුගියදා අග්‍රාමාත්‍යවරයා ඉල්ලා අස්විණි. එනම් අග්‍රාමාත්‍යවරයාගේ ඉල්ලා අස්වීමත් සමගම කැබිනට් මණ්ඩලය විසිර වේ. අග්‍රාමාත්‍යවරයා සහ කැබිනට් මණ්ඩලය විසුරුවා ඇති අවස්ථාවක එකී අග්‍රාමාත්‍යවරයාගේ සහ කැබිනට් මණ්ඩලයේ සියලු වගකීම් දරනුයේ රටේ ජනාධිපතිවරයා විසිනි. එනම් ගෝඨාට ගෙදර යන ලෙස කීවද අද වන විට අග්‍රාමාත්‍යවරයාගේද අමාත්‍ය මණ්ඩලයේ ද විධායක බලය අත දරා සිටි ජනාධිපති ගෝඨාභය විසිනි. එය සමාජ අරගලයේ විකෘති දේශපාලන පිළිබිඹුවකි. නමුදු එහිදී ජනතාවගේ විරෝධතා හමුවේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට ගෙදර යෑමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හැකියාව පවතීද යන්න පිළිබඳව අපට ගැටලුවක් මතුවේ. එනම් අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ 38 (2) වගන්තිය ප්‍රකාරව ජනාධිපති ධුරය හිස් වන අවස්ථා සඳහන් කර ඇත. ඒ අතරින් අද වන විට ප්‍රායෝගිකව ජනාධිපති ධුරය හිස් විය හැකි අවස්ථා මූලික වශයෙන් දෙකකි. ඉන් එකක් වන්නේ දෝෂාභියෝග යෝජනාවක් මගින් ජනාධිපතිවරයා ගෙදර යැවීමය. නැතිනම් ජනාධිපතිවරයා ඉල්ලා අස්විය යුතුය. එනම් දෝෂාභියෝග යෝජනාවක් සම්මත කරවා ගැනීම තරමක අසීරු ක්‍රියාවලියකි. එසේනම් අනිත් ක්‍රමය වන්නේ ජනාධිපතිවරයා ඉල්ලා අස් වීමය. යම් හෙයකින් ජනාධිපති ගෝඨාභය ඉල්ලා අස්වුවහොත් රට අරාජික වේද යන්න පිළිබඳව සමාජය තුළ මේ දිනවල පුළුල් කතිකාවතක් නිර්මාණය වී ඇත.

## ● ජනාධිපතධුරය හිස්වූ විට වන ව්‍යවස්ථාමය විසඳුම්..

අප රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපති ධුරය පුරප්පාඩු ඇති වූ විට එහි අනුප්‍රාප්තිකයා වන්නේ අග්‍රාමාත්‍යවරයාය. මෙවැනි අවස්ථාවක් ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ උදාවූයේ 1993 වර්ෂයේදීය. එනම් රණසිංහ ප්‍රේමදාස ත්‍රස්ත ප්‍රහාරයකින් මිය යෑමත් සමගය. එදා අග්‍රාමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ ඩී. බී. විජේතුංග අනුප්‍රාප්ත ජනාධිපතිවරයා වශයෙන් තේරී පත්විය. මෙහි බරපතළම තත්ත්වයක් නිර්මාණය විය හැක්කේ රටේ අග්‍රාමාත්‍යවරයෙකු නොමැති තත්ත්වයකදීය. එවැනි විටෙකදී පාර්ලිමේන්තුවේ කථානායකවරයා වැඩබලන ජනාධිපතිවරයා වශයෙන් තේරී පත්වේ. නමුදු මසක් ඇතුළත පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසය දිනාගත් තැනැත්තකු ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගත යුතුය.



## ● ගෝඨා ගියොත් රට කරන්නේ කවුද

ජනාධිපති ගෝඨාභය ගෙදර ගියොත් රට කරන්නට කවුරුත් නැහැ යන්න මිථ්‍යාවක් බව ජනතා විමුක්ති පෙරමුණ සහ පෙරටුගාමී පක්ෂය කියා සිටී. නමුදු සමගි ජන බලවේගය නම් කියන්නේ විධායක ජනාධිපති ධුරය මුළුමනින්ම අහෝසි කළ යුතු බවය. ඒ සම්බන්ධයෙන් පක්ෂ අභ්‍යන්තරයේ ද විවිධ කොටස් අතර මතභේදයක් පවතී. එනම් ජෙනරල් සරත් ෆොන්සේකා ජනාධිපති ධුරය අහෝසි කරනවාට විරුද්ධය. ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ මතය සමගි ජනබලවේගයේ මතයට සමානය. එනම් ඔවුන් කියා සිටිනුයේ ද විධායක ජනාධිපති ධුරය අහෝසි විය යුතු බවය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ පසුගියදා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් ස්වාධීන වූ මන්ත්‍රීවරුන් නම් මේ සම්බන්ධයෙන් තවමත් නිශ්චිත වූ අදහසක් දක්වා නැත. ඒ පිළිබඳව අදහස් දක්වන ආචාර්ය විජේදාස රාජපක්ෂ කියා සිටිනුයේ විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්නේ නම් ඒ හා බැඳුණු සමානුපාතික මැතිවරණ ක්‍රමය සහ පළාත් සභා ක්‍රමය සම්බන්ධයෙන් යම් එකඟතාවකට පැමිණිය යුතු බවය. එනම් රටේ ස්ථාවර වූ විධායකයක් නොමැතිව පිහිට වන පළාත් සභා වලට ස්වතන්ත්‍ර එනම් පෙඩරල් පාලනයක් කරා යෑමේ වැඩි අවකාශයක් උදාවිය හැකිය. නමුදු සමගි ජනබලවේගය හෝ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ මේ සම්බන්ධයෙන් තවමත් පැහැදිලි අදහසක් දක්වන්නේ නම් ඇත. අද වන විට අප රටේ පවතින්නේ ආරාජික තත්ත්වයකි. එනම් රට දේශපාලන වශයෙන් මෙන්ම ආර්ථික වශයෙන් වශයෙන් ද බිඳ වැටී ඇත. එමෙන්ම මුළු ලෝකයටම ණයකාරයෙක් බවට පත්වී ඇත. මෙවන් වූ දේශපාලන, ආර්ථික වටපිටාවක් තුළ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කළ යුත්තේ අතිශය කල්පනාකාරීවය.

**රනිල් දිගටම අගමැතිද**

## ● 21 සංශෝධනයෙන් පස්සේ විධායක ජනපතිගේ භූමිකාව

විධායකය යනු ජනතාවගේ පරමාධිපත්‍ය බලයේ මූලිකාංගයකි. එවැනි විටෙකදී පාර්ලිමේන්තුවේ 2/3 ක බහුතර ඡන්දයකින් පමණක් විධායක ජනාධිපති ධුරය අහෝසි කළ හැකි හැකිද යන්න පිළිබඳ ගැටලුව නිර්මාණය වේ. බොහෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විශාරදයන් පෙන්වා දෙන්නේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට නම් පාර්ලිමේන්තුවේ 2/3ක බහුතර ඡන්දයට අමතරව ජනමත විචාරණයක් ද පවත්වා ලිය යුතු බවය. අප රටේ අද පවතින තත්ත්වය තුළ ජනමත විචාරණයක් සඳහා යෑමට අවශ්‍ය සමාජ පසුබිමක් ද නැත. එබැවින් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ධුරයෙන් ඉල්ලා අස් නොවුණහොත් ඊළඟට අපට පැමිණෙන ගැටලුව වන්නේ වත්මන් ආණ්ඩුවට ඔහු සමග කටයුතු කරලීමේ අවකාශ පවතීද යන්නය. එසේනම් ඊළඟට කළ යුතු වන්නේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ධුරයේ සිටින නමුදු ඔහුගේ බලතල කප්පාදු කිරීමය. එනම් පාර්ලිමේන්තුවේ බලය ශක්තිමත් කළ යුතුය. විශේෂයෙන් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පාර්ලිමේන්තුවේ බලය වැඩි විය. නමුදු 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාට අහිමි වී ගිය බලය නැවත ජනාධිපති ධුරය වටා ඒකරාශි විය. එබැවින් නැවතත් 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පාර්ලිමේන්තුට ලබාදුන් බලතල නැවත ස්ථාපනය කිරීමට 21 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන යා යුතු බවට බොහෝ පාර්ශ්වයන් කරුණු ඉදිරිපත් කර ඇත. මෙහිදී 21වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා යෝජනාවලියක් ආචාර්ය විජයදාස රාජපක්ෂ විසින් දැනටමත් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස කථානායකවරයාට බාරදී ඇත. ඒ සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ද පසුගියදා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් ස්වාධීන වූ කණ්ඩායම්වල ද සහාය ලැබී ඇත. එමෙන්ම සමගි ජන බලවේගය ද 21 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා යෝජනාවලියක් සකස් කර ඇත. එනම් 19 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පදනම් කොට ගොඩනැගෙන 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ බොහෝ සාධනීය ලක්ෂණ දක්නට වෙයි.

## ● තාක්ෂණික අරගලය හමුවේ යට යන පැරණි දේශපාලනික මූලෝපාය

නිදහසින් පසු වසර 74 ක කාලයක් පුරාවටම අප රටේ පාලන තන්ත්‍රයට සම්බන්ධ වූ බොහෝ දේශපාලනඥයෝ සිදුකළේ රටත් සමඟ සෙල්ලම් කිරීමය. ඊට නොදෙවෙනි ජනතාවක් ද වෙයි. එනම් රටේ පාලකයො එරට ජනතාවගේ කැඩපතයි. එනම් ජනතාව අධම, දේශපාලන වශයෙන් නූගත් පිරිසක් නම් පාලකයෝද ඊට අනුරූපීව නිර්මාණය වේ. එහි ප්‍රතිඵල දැන් අප භුක්ති විඳිමින් සිටී. එනම් මුල්කාලීනව අප රටේ පැවතියේ ද්වි පක්ෂ ක්‍රමයකි. එනම් ගමක ජීවත් වූයේ යුන්පී කාරයන් සහ ශ්‍රී ලංකා කාරයන්ය. ඔවුහු බොහෝ විට තම දේශපාලන පක්ෂය හිමිකර ගන්නේ තම පියාගෙනි. එනම් ඔහු කැපුවත් කොළ කැපුවත් නිල් පිරිසකි. නමුදු අද වෙන විට එම තත්ත්වය බොහෝ දුරට වෙනස් වී ඇත. එනම් තාක්ෂණික කරුණු කාරණා අතින් වත්මන් පරපුර දැනුවත් ය. තවද දේශපාලන සාක්ෂරතාවද ඉහළ ය. ලෝකයේ එහා මුල්ලේ සිදු වුණ සිදුවීමක් අන්තර්ජාලය හරහා එක සැණෙකින් දැන ගැනීමේ හැකියාව වත්මන් පරපුරට ඇත. විශේෂයෙන් ජනතා විමුක්ති පෙරමුණ නායකත්වය දුන් 1971 සහ 88/ 89 කැරැල්ල වලදී තරුණ කණ්ඩායම් අතට ගත්තේ අවි ආයුධ ය. නමුදු නූතන පරපුර අතර ගත්තේ තාක්ෂණික දැනුමය. එබැවින් ගාලු මුවදොර වටා රොද බැඳ සිටින තරුණ පිරිස සිදු කරනුයේ තාක්ෂණික විප්ලවයකි. ඒ බොහොම සාමකාමී ය. මෙම නිහඬ එහෙත් ගැඹුරු අරගලය මහින්ද ප්‍රමුඛ ආණ්ඩුව තේරුම් ගත්තේ නැත. එබැවින් මහින්ද, ජොන්ස්ටන් වැනි දේශපාලඥයන් මෙම අරගලයට ප්‍රතික්‍රියා දැක්වූයේ සාම්ප්‍රදායික ක්‍රමවේද හරහාය. ඇතැම් විට මහින්ද දකින්නට ඇත්තේ එය මුල්කිරිගල අතුරු මැතිවරණයක් ලෙසිනි. එහිදී ජොන්ස්ටන්ට නම් එය කාක්කෙක්ගේ කාක් තට්ටක් එල්ලීමේ ක්‍රියාවලියට සමාන මනෝභාවයකි. ඔවුනට නොදෙවෙනි අනුගාමිකයන් පිරිසකි. එනම් මහින්දගේත් ජොන්ස්ටන්ගේත් කතාවලින් ඔදවැටුණ ජනතාව ගෝල්ෆේස් පිටියට කඩා වැදුණි. එනම් මහින්දට වැරදුනේ එතැනය. අවසානයේදී ඔහුට සිදුවූයේ එම සභාව අමතා පැයක් යන්නට මත්තෙන් අග්‍රාමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස්වීමට ය.

**මාස හයකින් පස්සේ මොකද වෙන්නේ**



## ● මොකක්ද මේ අන්තර්වාර පාලනය

අග්‍රාමාත්‍යවරයා අන්තර්වාර ආණ්ඩුවක් හෝ ජාතික ආණ්ඩුවක් හෝ වැනි පාලන උපක්‍රමයක් භාවිත කරමින් සිය දේශපාලන යාන්ත්‍රණය හසුරුවා ගැනීමට සිදුවේ. ඔහුට පාර්ලිමේන්තුවේ බහුතරයක් නොමැති තත්ත්වයක් තුළ මෙය වඩාත් කැපී පෙනෙන ලෙස ඉස්මතු වේ. එනම් පවතින පාර්ලිමේන්තු සංයුතිය හමුවේ ආණ්ඩුවට හිමිව පවතින්නේ සුළුතර මන්ත්‍රී ධුර සංඛ්‍යාවකි. මෙවන් සුළුතර අණ්ඩුවක් තුළින් ලක් ජනතාවට සේවාවක් කිරීමට හැකියාව පවතීද යන්න පිළිබඳව බොහෝ දෙනා තුළ පවතින්නේ කුතුහලයකි. නමුදු මෙම අන්තර්වාර පාලනය පිහිටුවා ගන්නේ සුළු කාලයකට ය. එනම් ඉදිරි මහ මැතිවරණය පැවැත්වෙන තෙක්ය. එහිදී ජනතාවට යහපත් යෝජනාවක් ඉදිරිපත් වූ විට සියලු දෙනාම ඊට එක් විය යුතුය. අන්තර්වාර පාලනයක පොදු ලක්ෂණය ද එයම වේ. මෙවන් ආණ්ඩු ක්‍රමයක තුළ දේශපාලන ඩීල් තිබිය නොහැකිය. එනම් ආණ්ඩුවක් පිහිටුවා ගන්නේ රටේ අරාජිකත්වයක් ඇති අවස්ථාවකය. එනම් බරපතළ සමාජ, ආර්ථික, දේශපාලන අර්බුදයකට පිළියමක් වශයෙනි. එවන් වටපිටාවක් තුළ කිසිම දේශපාලනඥයකුට රට සමඟ සෙල්ලම් කිරීමට හැකියාවක් නැත. ඔවුන් සියලු දෙනාම රටේ ජනතාවගේ යහපත වෙනුවෙන් ගනු ලබන සෑම අණපනතක්ම සම්මත වීම සඳහා සහාය දැක්විය යුතුමය. එහිදී රටට අහිතකර දේට එකහෙලා විරුද්ධ වීමට ද හැකිය. මෙම ක්‍රමය තුළ පක්ෂයට වඩා රට ඉස්මතු වේ. මෙවැනි ආණ්ඩු ක්‍රමයක විශේෂත්වය වන්නේද එයමය. මෙවැනි ආණ්ඩුවක් ලබා දෙන්නේ පාලකයන්ට කා බී ප්‍රීති සැණකෙළි පවත්වන්නට නම් නොවෙයි. මේ තාක් කල් නොකරපු වැඩ කරන්නට ය. සැබැවින්ම අන්තර්වාර පාලනයක් යනු දේශපාලනඥයන්ට ජනතාවගෙන් තමන්ට අතපසු වූ, මගහැරුනු, මග හැරපු, නොකර සිටි වැඩ ක්‍රියාත්මක කොට ක්‍රියාවෙන් ජනතාවගෙන් සමාව ගන්නා අවධියක් බඳු ය. එබැවින් තනි පක්ෂයකට බහුතර බලයක් නොමැති වුවද මෙම අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන් ආණ්ඩුකරණයට දායක වීමේ අවකාශ උදාවේ.

## ● අමාත්‍යාංශවල ලේකම්වරු පත්කිරීම නීත්‍යානුකූල ද?

මෙවැනි අර්බුදකාරී අවස්ථාවකදී රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට ලැබෙනුයේ ඉහළ අවධානයකි. රට කරවන ලේඛනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. එනම් රටේ මූලික නීතිය ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. සෑම සියලු පුරවැසියන් කටයුතු කළ යුතු වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුගතවයි. ඉන් පරිබාහිරව කටයුතු කිරීමට කිසිදු පුරවැසියෙකුට හිමිකමක් නොමැත. එනම් රටේ පවතින සියලුම නීතීන් අභිබවා වඩාත් උත්තරීතර වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. පසුගිය දිනවල රට තුළ පැවතියේ ගිනි තැබීම් දේපළ විනාශ කිරීම්, පහරදීම් ජීවිත හානි කිරීම හේතුවෙන් ජනාධිපතිවරයා විසින් හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත් කෙරිණි. එවැනි ආකාරයේ සාපරාධී ක්‍රියාවන් සිදු කරන අය සඳහා වෙඩි තැබීමට ත්‍රිවිධ හමුදා වෙත අවසර ලබා දෙන ලදී. එහිදී ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මේජර් ජනරාල් කමල් ගුණරත්න මාධ්‍ය හමුවේදී ඒ පිළිබඳව දන්වා සිටියේය. නමුදු නීති විශාරදයන් නම් කියා සිටියේ කමල් ගුණරත්නට එවැනි ප්‍රකාශයක් කිරීමේ නීත්‍යානුකූල හිමිකමක් නොවන බවය. එනම් අමාත්‍ය මණ්ඩලය නොමැති අවස්ථාවක අමාත්‍ය ලේකම්වරු ද ස්වභාවිකව විසිරෙන බවය. එනම් ව්‍යවස්ථාවේ 44(1)(අ) අනුව ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලය සහ එහි කාර්යයන් සහ කාර්තව්‍යයන් තීරණය කළ යුතුය. එසේ තීරණය කළ අමාත්‍යවරු පාර්ලිමේන්තුව තුළින් තෝරා පත්කර ගත යුතුය. 44(1)(ආ). එසේ තීරණය කරන ලද අමාත්‍යාංශවලට ලේකම්වරු පත් කළයුතු බවට ආණ්ඩු ව්‍යවස්ථාවේ 52(1) වගන්තියේ සඳහන් වේ. එහිදී මේජර් ජෙනරල් කමල් ගුණරත්න මෙම ප්‍රකාශය කරන විට අමාත්‍යාංශය සඳහා අමාත්‍යවරු නිශ්චිතව පත්කර තිබුණේ නැත. එසේ නම් ඔහු විසින් කරන ලද ප්‍රකාශවල කිසිදු නීත්‍යානුකූල භාවයක් නොමැති බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විශාරදයන් පෙන්වා දුනි. නමුදු ආණ්ඩුව පැත්තෙන් ගෙන එන තර්කය වන්නේ නිශ්චිත අමාත්‍යාංශය සඳහා අමාත්‍යවරු පත් කර නොතිබුණද අමාත්‍යාංශයන් දැනටමත් ජනාධිපතිවරයා යටතේ ක්‍රියාත්මක වන බව ය. එබැවින් අමාත්‍යාංශ සඳහා ලේකම්වරු පත්කිරීම කිසිදු නීතිමය බාධාවක් එමගින් ඇති නොවන බව ය. එම තර්කයේ ද යම් සාධනීයතාවයක් පෙන්නුම් කරයි.

රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් අපිට විවිධ නීති තර්කයන් මතුකරලිය හැකිය. අණ පනත්, රෙගුලාසි ගැන අපට දින ගණන් කතා කළ හැකිය. නමුදු ඒ එකකින්වත් ජනතාවගේ දැවෙන ප්‍රශ්නවලට කඩිනම් විසඳුම් ලැබෙන්නේ නම් නැත. තාමත් මිනිසුන් ගෑස්, ඉන්ධන, භූමිතෙල් පෝලිම්වලය. ජනතාවට තුන් වේල පිරිමහ ගන්නට බැරිව සාගින්නේය. තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු මුළුමනින්ම කඩාකප්පල් වී ඇත. එමෙන්ම විදුලිය නැතිව ඉටිපන්දම් දැල්ලෙන් විභාගයට පාඩම් කරන දරුවන් දිහා බලාගෙන හූල්ලන දෙමව්පියන් ය. මේ සියල්ල අතරේ අගමැතිවරු, කැබිනට් අමාත්‍යවරු පත් වේ. නමුදු ජනතාවට අත්වන සෙතක් නම් නැත. විශාල අපේක්ෂාවන් වෙනුවට අද ජනතාව ඉල්ලන්නේ තම ජීවත්වීමේ අයිතිය යි. දරුවන්ගේ අධ්‍යාපනික අයිතියයි. කවුරු ජනාධිපති වුවද කවුරු අගමැති වුවද ජනතාවට කම් නැත. ඔවුන්ට අවශ්‍යව ඇත්තේ ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට සැලස්මක්, දැක්මක්, වැඩපිළිවෙළක් ය. අවම වශයෙන් අධ්‍යාපනය, කෘෂිකර්මාන්තය, විදුලිබල හා බලශක්ති, පොදු ප්‍රවාහන වැනි ප්‍රධාන ක්ෂේත්‍රයන් පිළිබඳ වන ජාතික ප්‍රතිපත්තියක් නිර්මාණය කරගත යුතුව ඇත. එනම් ඡන්දය ඉල්ලාගෙන නිවාසවලට එන දේශපාලනඥයෝ ජනතාවගේ සිත් තුළ බොහෝ අපේක්ෂාවන් ඇති කළ ද ඒවා ඡන්දයටම පමණක් සීමා කළේය. මෙම මජර දේශපාලනය දැන්වත් අහවර විය යුතුය. ඔවුන් එකී ජරාජීර්ණ වූ දේශපාලන ක්‍රමය අවසන් කිරීමට සූදානම් නොමැත්තේ නම් අපගේ ඉදිරි පරපුර එකී දේශපාලන ක්‍රමය අවසන් කිරීමට දෙපාරක් හිතන්නේ ද නැත. එබැවින් අලුතින් පත්වූ අග්‍රාමාත්‍යවරයාට මෙන්ම කැබිනට් මණ්ඩලයට ද ඒ පිළිබඳව පූර්ණ වගකීමක් ඇත. එසේ නොවුණහොත් ජනාධිපතිවරයාට මෙන්ම අග්‍රාමාත්‍යවරයාටද වැඩි කල් යන්නට මත්තෙන් Ranil go home කියනු නොඅනුමානය.

නීතිඥ
● සංජීව බෝපෙආරච්චි

**වෙසක් පුරපසළොස්වක පොහෝ දින බම්බලපිටිය සිරි වජිරාරාම විහාරස්ථානයේ සීල සමාදාන වැඩසටහන් මාලාව මෙසේය.**

පෙ.ව. 6.00 - 7.15 සීල සමාදානය, අනුශාසනාව සහ බුද්ධ පූජාව - පූජ්‍ය මීගොඩ සුබිත හිමිපාණෝ, පෙ.ව. 7.15 - 8.00 හීල දානය, පෙ.ව. 8.00 - 9.00 ධර්ම දේශනාව - පූජ්‍ය තල්පාවිල කුසලඤාණ හිමිපාණෝ, පෙ.ව 9.00 - 10.00 භාවනාව - පූජ්‍ය බණ්ඩාරවෙල ඤාණරුචි හිමිපාණෝ, පෙ.ව. 10.00 - 11.00 ධර්ම දේශනාව - පූජ්‍ය තලල්ලේ චන්දකිත්ති හිමිපාණෝ, පෙ.ව. 11.00 - 11.15 සම්බුද්ධ පූජාව - පූජ්‍ය පැනසිහගම ඛේම හිමිපාණෝ, පෙ.ව. 11.15 - 12.15 දහවල් දානය සහ විවේකය, ප.ව. 12.15 - 1.00 පිරිත් සජ්ඣායනාව - පූජ්‍ය කඹුරුගමුවේ මහානාග හිමිපාණෝ, ප.ව. 1.00 - 2.30 ධර්ම සාකච්ඡාව - පූජ්‍ය වැලිගෙපොළ සීලවංශ හිමිපාණෝ, ප.ව. 2.30 - 3.00 ගිලන්පස විවේකය, ප.ව 3.00 - 4.00 භාවනාව - පූජ්‍ය පිටිපන සාසනරතන හිමිපාණෝ, ප.ව. 4.00 - 5.00 ධර්මානුශාසනාව - පූජ්‍ය රණස්ගල්ලේ ඤාණවීර හිමිපාණෝ, ප.ව. 5.00 - 6.00 ධර්මානුශාසනාව - පූජ්‍ය බොරැල්ලේ අතුල හිමිපාණෝ, ප.ව. 6..00 - 6.30 අටවිසි පූජාව පැවැත්වීම - සිරි වජිරාරාමවාසී ස්වාමීන් වහන්සේලා

බම්බලපිටිය සිරි වජිරාරාම විහාරස්ථානයේ වෙසක් පුරපසළොස්වක පොහෝ දින පැවැත්වෙන ළමා සීල සමාදානය වැඩසටහන් මාලාව මෙසේය.

පෙ.ව. 8.00 - 8.30 සීල සමාදානය සහ අනුශාසනාව - පූජ්‍ය සිරි වජිරාරාමයේ ඤාණසීහ හිමිපාණෝ, පෙ.ව. 8.30 - 9.15 ගිහි දේශනය - වෛද්‍ය තමාරා වික්‍රමසේකර මහත්මිය, පෙ.ව. 9.15 - 10.00 ධර්ම දේශනාව - පූජ්‍ය කඹුරුගමුවේ මහානාග හිමිපාණෝ, පෙ.ව. 10.00 - 10.15 ගිලන්පස විවේකය, පෙ.ව. 10.15 - 11.00 භාවනාව සහ සම්බුද්ධ පූජාව පූජ්‍ය රාජාංගනයේ සීලවිමල හිමිපාණෝ, පෙ.ව. 11.00 - 12.30 දහවල් දානය සහ විවේකය, ප.ව. 12.30 - 1.15 පිරිත් සජ්ඣායනාව - පූජ්‍ය පැනසිහගම ඛේම හිමිපාණෝ, ප.ව. 1.15 - 2.15 ධර්ම දේශනාව - පූජ්‍ය ගබ්බෙල වජිර හිමිපාණෝ, ප.ව. 2.15 - 2.30 ගිලන්පස විවේකය, ප.ව. 2.30 - 4.00 දහම් පිළිසඳර - පූජ්‍ය මීගොඩ සුබිත හිමිපාණෝ, ප්‍රියන්ත මායාදුන්නෙ මහත්මා



පැවති සෑම ආණ්ඩුවකම මර්දනයේ යකඩ සපත්තුවලට පෑගෙමින් මේ රටේ ශිෂ්‍ය ව්‍යාපාරය මතු පරපුර වෙනුවෙන් අත් කරගත් ජයග්‍රහණ බොහෝය. ලෙයින් කඳුලින් සටහන් වූ එම සටන් ඔස්සේ පන්නරය ලැබූ ඔවුන් මේ මොහොතේ රටේ පවතින දේශපාලන අරාජිකත්වය සහ ආර්ථික කඩා වැටීම හමුවේ පැන නැඟුණ ජනතා අරගලයට සාධනීයව මැදිහත්ව සිටිනු පෙනෙයි. සමස්ත අරගලය හමුවේ අසෙන ඒ හඬ බැහැර කළ නොහැකි එකකි. මේ එම හඬ නියෝජනය කරමින් අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු **වසන්ත මුදලිගේ** අප සමග සම්මුඛ සංවාදගත වූ අයුරුය.

# දෙසීය විසිපහම එපා කියන්නෙ මේ ක්‍රමවේදයම එපා කියන එක

අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු - **වසන්ත මුදලිගේ**

**ගෝඨාභයට මේ ඩීල්එක ඇතුලෙ ඉඳන් ආරක්ෂා වෙන්න අපි ඉඩ දෙන්නෙ නෑ**

**'ජනතාව කියන දේ ඇහෙන්නෙ නැත්නම් තේරෙන විදියට කියන්න අපි සූදානම්'**



**• අරගලයේ ආසන්න ජයග්‍රහණය හිටපු අගමැති මහින්ද රාජපක්ෂ ධුරයෙන් ඉවත්ම. දැන් නව අගමැතිවරයෙක් රජය භාරගෙන තිබෙනවා. අරගලයේ පාර්ශ්ව මේ වෙනසත් එක්ක තෘප්තිමත් වෙනවද?**

රටේ ජනතාව පාරට බැස්සෙ ඇයි කියන තැන ඉඳන් අපි ඔය ප්‍රශ්නයට උත්තර හොයන්න ඕන. හේතුව පහුගිය කාලේ ගොවියගේ පැත්තෙන් මුහුණ දුන්න ප්‍රශ්න ප්‍රමාණයක් තිබුණා. ධීවරයගේ පැත්තෙන්, රාජ්‍ය සහ පෞද්ගලික සේවකයගේ පැත්තෙන් මුහුණ දුන්න ප්‍රශ්න ප්‍රමාණයක් තිබුණා. ශිෂ්‍යයාගේ පැත්තෙන් වගේම මේ රටම මුහුණ දුන්න ප්‍රශ්න ප්‍රමාණයක් තිබුණා. ඒ ප්‍රශ්න සමග විවිධ සටන් පාඨ සමග හැමෝම සටන් කළා. ඒ එක එක සටන් පාඨ එකතු වෙලා හැදුණ ඉල්ලීම තමයි මේ ආණ්ඩුවම ගෙදර යන්න ඕන, ගෝඨා ගෝ හෝම් කියන තැනට මේ අරගලය ආවේ. ඒ සටන් පාඨයත් එක්ක විවිධ ක්‍රියා මාර්ග තේරුවම ආණ්ඩුවට සිදුවුණා ජනතාව ඉස්සරහ දණ ගහන්න. කැබිනට් එක පළවෙනි මොහොතේ අයින් වෙන්නෙ ඒ නිසා. මහ බැංකු අධිපති අයින් වෙන්නේ ඒ නිසා. අවසානයේ ඒක අගමැතිවරයා ඉල්ලා අස්වීම දක්වාම ගේනවා. මේවා තාවකාලික ජයග්‍රහණ වුණාට ජයග්‍රහණයේ වැඩි පංගුව තියෙන්නෙ ගෝඨාභය ජනාධිපතිවරයා ඉවත් වීම තුළින්. ඔය තත්ත්වය ඇතුලෙ තමයි අපට නව අගමැතිවරයෙක් දිවුරුම් දීම හමුවෙන්නෙ. ඉතින් මේ පත්වුණ අගමැතිවරයා කවුද? මේ අගමැතිවරයා තමයි ලංකාවේ පස් වතාවක් අගමැතිවරයා වෙලා මේ ආර්ථික දේශපාලන ප්‍රශ්නවලට උත්තර හොයන්න බැරි වුණු පුද්ගලයා. ඒ වගේම පාස්කු ප්‍රහාරය වෙන වෙලාවෙත් රටේ අගමැති මොහු. නිකන් නෙවෙයි දහනව වන ව්‍යවස්ථා සංශෝධනය ඇතුළේ බලතල හොඳට තිබුණ අගමැතිවරයෙක්. ඒ වගේම මේ වෙද්දි ඩොලර් හිඟය කියල ආර්ථික අර්බුදය ඇතිවෙන්න එක හේතුවක් මහ බැංකු මංකොල්ලය. මහ බැංකුවේ රටේ මුදල් මංකොල්ලකාපු වෙලාවේ රටේ හිටිය නායකයා තමයි මේ ඉන්නෙ. ඒ වගේම පහුගිය මැතිවරණයේදී අවම වශයෙන් මහජන ඡන්දයකින් පත්වෙන්න බැරි වුණ එකම මන්ත්‍රී ධුරයක් පමණක් තිබෙන පක්ෂයේ නායකයා. ඉතින් ජනාධිපති ඇයි මේ වගේ පුද්ගලයෙක් රටේ අගමැති විදියට තෝරගත්තෙ. ඒ නිසා මේ අගමැති පත්වීම අරගලයට කිසිම පිළිතුරක්වත් අරගලය බාල වීමට හේතුවක්වත් රටේ මිනිස්සුන්ට සතුටුවීමට හේතුවක්වත් වෙන්නේ නෑ.

**• එවැනි චෝදනා ඉදිරිපත් කරනවානම් ඔබ හිතන්නේ ජනාධිපතිවරයා මේ වෙලාවේ රනිල් වික්‍රමසිංහව තෝරාගන්න ඇත්තෙ මොකටද?**

ඒකට පළවෙනි හේතුව රාජපක්ෂ චවුර වළල්ල ආරක්ෂා කරගන්න පුළුවන් රාජපක්ෂ බංගලාවේ ඉන්න හොඳම සුවච කීකරු ගෝලයා තමයි රනිල් වික්‍රමසිංහ. මෙයාව එලවන්න තමයි රටේ මිනිස්සු ලක්ෂ හැට නවයක් ඡන්දය දීලා ගෝඨාභයලව ගෙනාවේ. ගෝඨාභයල කිව්වෙ මහ බැංකු හොරු අල්ලනවා කියල. පාස්කු ප්‍රහාරයට සම්බන්ධ අය අල්ලනවා කියල. එහෙම කියපු අය ඒ වෙලාවේ බලයේ හිටපු කෙනාවම ගේනවා. අරගලයේ අපි කිව්වේ ගෝඨාභය රාජපක්ෂ යන්න. හැබැයි ගෝඨාභය රාජපක්ෂ කරේ තමන් යන එක නතර කරගෙන ඉන්න පුළුවන් විදියට අගමැතිවරයෙක් පත්කර ගත්ත එක. ඒ නිසා අපි මෙය ඉදිරියේදී අනිවාර්යෙන් පරාජය කරනවා. ගේඨාභය ජනාධිපතිවරයා ගෙදර යවනවා.

**• රනිල් වික්‍රමසිංහ අගමැතිව සිටියදී මේ තත්ත්වය තුළ ගෝඨාභය ජනාධිපතිවරයා ගෙදර යවනවා නම් අනුප්‍රාප්තික ජනාධිපති බවට පත්වෙන්නෙ රනිල් වික්‍රමසිංහනේ?**

මේ අරගලය ඇතුලේ රටේ ජනතාවගේ ප්‍රමුඛ ඉල්ලීම් කිහිපයක් තියනවනෙ. ගෝඨා ගදෙර යන එක. පහුගිය කාලේ හොරා කාපූ සල්ලි ලබාගන්න එක. විගණනය. විධායක ජනාධිපති ක්‍රමය අයින් කිරීම වගේ යෝජනා. අපි කියන්නෙ, ගෝඨාභය රාජපක්ෂ ගෙදර යන්න කියන එකත් එක්ක අපි ඉල්ලුවේ මොකද්ද. අපි ඉල්ලුවේ විධායක ජනාධිපති ක්‍රමයත් ඉක්මනින්ම අහෝසි වෙන්න ඕන කියන එක. එතනදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ කියල කෙනෙක් පවතින්න බෑනෙ. එක එක ඒවා එකින් එක ගන්නෙ නැතුව සම්පූරුණ යෝජනා එකට ගත්තම මේක පැහැදිලි කරගන්න ලේසියි. රටේ ජනතාව මේ කියන්නෙ ගෝඨාභය කියන තනි මනුස්සයාට යන්න කියන එක විතරක් නෙමෙයි. මේ රට අරාජිකත්වයට ගෙන ගිය ගෝඨාභයල වගේ පාලකයෝ නැත්නම් මේ විධායක කියන ක්‍රමය පවා වෙනස් කරන්න ඕන කියන එක. ඒ නිසා තමයි අපි යෝජනා කළේ විධායක ක්‍රමය අහෝසි කරන ගමන් නව ව්‍යවස්ථාවක් හදන්න පවා සාකච්ඡා වෙන්න ඕන කියල. මේ ඔක්කොම සංයුක්තව ගත්තම ගෝඨාභය අයින් වුණා කියල රනිල් වික්‍රමසිංහ ජනාධිපති පුටුවේ ඉන්නවා කියල අපේ ඔළුවට මැවෙන්නෙ නෑ.

**• අලුත් ව්‍යවස්ථාවක් හදන්න හරි, ව්‍යවස්ථාවට සංශෝධන ගේන්න හරි වෙන්නෙ ඔබලා ප්‍රතික්ෂේප කරන මේ පාර්ලිමේන්තුවේ ඉන්න පිරසත් එක්කනෙ. කොහොමද මේක ප්‍රායෝගික වෙන්නේ?**

අපිට මේ තියන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටේ ප්‍රශ්න විසඳන්න අසමත්. මේ ව්‍යවස්තවේ නීති රෙගුලාසි නෛතික පදනම් ඕන තරම් තියෙද්දි ඒ ආණ්ඩුම ව්‍යවස්ථාව නොසලකා රටේ මහ ජනතාව පාරට ආවා. එහෙම පාරට ඇවිත් අරගලයක් ඇතුලේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පත් කරපු අගමැතිවරයා පවා අයින් කරන තැනට පත්වුණා. එහෙමනම් රටේ ජනතාවගේ බහුතර ඒ හඬ නියෝජනය කරන පිරස සමග සාකච්ඡා කරන්න දැන් පටන් ගන්න ඕන. ඒක කරන්නෙ රනිල්ද, පාර්ලිමේන්තුවේ කමිටි එකක් දාලද, නැත්නම් කථානායක මූලික වෙලාද, අගවිනිසුරු මූලික වෙලාද එහෙමත් නැත්නම් වෙනම මහජන කවුන්සිලයක් හරහාද කියන එක තීරණය කරන්න වෙන්නෙ මේ රටේ පාරට බැහැල ඉන්න විවිධ වූ මේ සංවිධානත් එක්ක. මහ පාරට බැහැල ඉන්න සංවිධාන එකතු කරගත්තු සාකච්ඡා සභාවක් දැන් අපිට ඕන. නැත්නම් මහජන මණ්ඩලයක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදන සාකච්ඡාව පටන් ගන්න වෙන්නෙ මේ සභාව ඇතුළෙ. ජනතාවට පිළිගන්න පුළුවන් ඉල්ලන වෙනස කරන්න වෙන්නෙ ඒ සාකච්ඡාව ඇතුළෙ විතරයි. මේ තියන පාර්ලිමේන්තුව තුළ මහජන මතය නියෝජනය වෙන්නෙ නැනෙ. ඒක නිසා ඒක ඇතුලේ අපි මේ කතා කරන ප්‍රශ්න ඇතුළෙ විසඳුම් ලැබෙයි කියල විශ්වාස කරන්න බෑ. ඒකයි අපි කියන්නෙ මේ ඉන්න සියලු පාර්ශ්ව එකතු කරගත්ත ව්‍යුහයක් හදන්න ඕන. එම ව්‍යුහයයි දැන් මේ පාර්ලිමේන්තුවේ නඩත්තු වන ව්‍යුහයයි අතර ඒකාබද්ධ සාකච්ඡාවකින් තමයි මේක කරන්න වෙන්නෙ.

**• මේ පිරිසවත් මේක කරයි කියල අරගලයේ නිරත කණ්ඩායම් අතර දැනට පාර්ලිමේන්තුව නියෝජනය කරන කිසියම් කණ්ඩායමක් ගැන විශ්වාසයක් තියනවාද?**

ඔබ දකින්න ඇති සටන් පාඨයක් පසුගිය කාලේ මේ අරගලයේදී ගොඩක් මිනිස්සු දෙසිය විසිපහම එපා කියල බෝඩ් අල්ලන් හිටියා. ඇත්තටම ඒ සටන් පාඨය ඇතුලේ ප්‍රකාශයට පත්වෙන්නෙ, පසුගිය කාලේ පාර්ලිමේන්තු ක්‍රමවේදයට තියන විවේචනය. මේ ඔළු ගෙඩි දෙසීය විසිපහ කියන එකම නෙමෙයි මේ. ගෙවී ගිය කාලය පුරා රටේ ජනතාවට තිබුණ ප්‍රශ්නවලට පාර්ලිමේන්තු ක්‍රමය තුළ උත්තර ලැබුණද කියන විවේචනය තමයි ඒකෙන් කියවෙන්නෙ. උදාහරණයක් විදියට කොතලාවල පෞද්ගලික විශ්වවිද්‍යාල පනත එද්දී පාර්ලිමේන්තුවේ මතයත්, ඒකට ජනතාවගේ තිබුණ මතයත් අපි දැක්කා. ගුරු වැටුප් ප්‍රශ්නයේදීත් අපි ඒක දැක්කා. රටේ දේපල විකුණද්දී, සමහර ගිවිසුම් අත්සන් කරද්දී, පොහොර කප්පාදු කරද්දී පාර්ලිමේන්තුවේත් රටේ ජනතාවගේ මතයත් අපි දැක්කා. මේතනදී හැම වෙලාවෙම මත දෙකක් විදියට තිබුණෙ. ඉතින් මේ දෙසිය විසිපහම එපා කියන මේ අරගලය ඇතුළේදි කවුරුත් මේ පාර්ලිමේන්තුව ඇතුළේ කවුරුත්ම නිර්දේශ කරන්නෙ නෑ මෙයා ඇවිල්ල කරන්න කියල. සියලු පාර්ශ්ව සාමුහික ක්‍රියාකමක් ඇතුලේ මේ ප්‍රශ්නයට උත්තර හොයමු කියන එකයි අරගලය ඇතුළේ තියෙන්නෙ. මොකද අපි දන්නවා කාටවත් මේ ප්‍රශ්නෙ හෙට විසඳන්න සුපිරි බලයක් නැනෙ. ඒකට තමයි දැන් සාමුහික සහභාගිත්වය ගැන දැන් සාකච්ඡාවෙමින් තියෙන්නෙ. ඒකට තමයි මේ ආණ්ඩුව හෝ කවුරුත් සාධනීය පිළිතුරක් නොදී තියෙන්නෙ.

**• අරගලයෙදි මේ කියන්නෙ සිස්ටම් එක වෙනස් කරන්න කියන එකනෙ. එත් එක්කම ජනතාව මේ වටා රොක් වෙන්නෙ ගෑස් නැති වීම, ඉන්ධන නැති වීම, බඩු මිල ඉහළ යෑම වැනි ජීවත්වීමට අපහසු වූ දෛනික ආර්ථික ගැටලුත් එක්ක. නව අගමැතිවරයා දිවුරුම් දුන්න ගමන් කියනවා තමන් මේ ආර්ථික ගැටලු ඉක්මනින්ම විසඳනවා කියල. මේවා විසඳුවොත් අරගලයේ තියන ජවය අඩුවෙයිද?**

ඒ වෙලාවේ නව අගමැතිවරයා කිව්ව ප්‍රකාශය අපි දැක්කා. ඔහු කිව්වා, තුන් වේල කන්න පුළුවන් රටක් හදන්න ඕන. තරුණයන්ට නිදහසේ ඉන්න පුළුවන් රටක් හදන්න ඕන. රුපියලේ අගය වැඩි කරන්න ඕන. මේ කරුණු තුන කියල හතරවෙනියට ඔහු කිව්වේ ඉක්මනට අයි. එම්. එෆ්. එකෙන් ණය ගන්න ඕන. ඉතින් අයි. එම්. එෆ්. එකෙන් ණය ගන්න එක උත්තරයක් වෙනවද. පහු ගිය කාලේ ණය අරගෙන ගත්ත ණය වාරික ගෙවාගන්න බැරුව එහෙම තමයි මේ අර්බුදය නිර්මාණය කෙරුණේ. ඒක මේ රටේ කාටත් මතක ඇති. සුපිරි වීරයෙක් වගේ අගමැති පුටුවට ආව රනිල් වික්‍රමසිංහ දැන් කියන්නෙ ණය ගන්නවා කියල. ඉතින් ණයක් අරන් කෙටිකාලීනව මේ ප්‍රශ්නය විසඳුවා කියල ඒක දීර්ඝකාලීන උත්තරයක් වෙන්නෙ නෑ.

**• ඒක වැරදි නම් ඔබලගේ යෝජනාව මොකක්ද?**

අපි යෝජනා කරනවා 2015 ඉඳන් මේ රටේ බදු ගෙවපු නැති සමාගම් තියනවා. ඒ ගෙවල නැති සමාගම්වල නොගෙවූ බදු ප්‍රමාණය රුපියල් කෝටි ගාණක්. අන්න ඒක අය කරගන්න ක්‍රමවේදයක් හදන්න. දැන් ආණ්ඩුවට ඩොලර් නැති වුණාට ආණ්ඩුවට සම්බන්ධ දේශපාලකයන්ට, හිතවත් සමාගම්වලට ඕන තරම් කළු සල්ලි නැද්ද. ඒ සල්ලි ගන්නෙ නැද්ද. ඒක කරන්නෙ නැතිව අයි. එම්. එෆ්. ගිහින් ණය ගන්නවා කියනවා. රටේ ජනතාවට තුන් වේලම කන්න පුළුවන් වටපිටාවක් හැදෙනවනම් හොඳයි. හැබැයි අපි දන්නවා කයිවාරු ගැහුවට ප්‍රායෝගික තලයේ රනිල්ටවත් ගෝඨාභයටවත් ඕක කරන්න බෑ. ණය විතරක් අරගෙන මේක කරන්න ගියොත් ආයෙත් වටයකින් මීට වඩා දරුණු විදියට අපි වැටෙන්නෙ මේ වළටම තමා.

**• අරගලය කරන තරුණ කණ්ඩායම් ඇතුළේ මේ ප්‍රශ්නය විසඳාගෙන යන්න ඊට වඩා සාධනීය විසඳුමක් තියනවද?**

මේ අරගලය තුළ අපි ඇතුළු තවත් විවිධ පාර්ශ්ව ගණනාවක් ඉන්නවා. ඔවුන් විවිධ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලය විදියට අපිත් යෝජනා දහතුනක් ඉදිරිපත් කර තිබෙනවා. පොදුවේ මුළු රටේ ඉන්න සියලුම අරගලකරුවන් කියන්නෙ ගෝඨාට ගෙදර යන්න. ඊට පස්සෙ මේ පාර්ශ්ව ඉදිරපත් කළ යෝජනා වලින් ගන්න පුළුවන් යෝජනා මොනවද කියල සාකච්ඡාවට බඳුන් කරල ගන්න. මේ ඉන්න පාර්ශ්වත් පාලනයට සම්බන්ධ කරගමු වගේ එන යෝජනා. මේ සියල්ල සාකච්ඡාවට බඳුන් කරමින් තමයි අපි ඉස්සරහට රට හදන්න අදාළ මැදිහත් වීම කරන්නෙ.

**• ඔය මොනව කිව්වත් තමන්ගෙ ධූර කාලය ඉන්නවා කියල ජනාධිපතිවරයා කියා තිබෙනවා. අරගලයත් නතර කරන්නෙ නෑ කියා ඔබලා කියනවා. පාලනයට ප්‍රතිවිරුද්ධව අරගලය, වැඩ වර්ජන නිසා ඇතිවන මේ අස්ථාවරත්වය රට තවත් ආගාධයට ගෙනයෑමනෙ වෙන්නෙ?**

ලක්ෂ හැට නවයක් ගත්ත ආණ්ඩුව පළවෙනි මොහොතෙ ජනාධිපතිතුමාට කිව්වෙ පුටින් කෙනෙක්, තරු ගොඩක් තියනවා, මහතීර් මොහොමඩ් නැත්නම් ලී ක්වාන් යූ කෙනෙක් කියලනෙ. ඊට පස්සෙ එයා තමයි හොඳටම කරන්නෙ කියලත් කව්වා. එහෙම කියපු ආණ්ඩුවක අගමැතිවරයාට ඉල්ලා අස්වෙන්න වුණා. අරගලයෙදි මේ කරන මැදිහත් වීමත් එක්ක ජනාධිපතිවරයා කියනවනම් ධූර කාලේ ඇතුළේ අයින් වෙන්නෙ නෑ කියල. අපි ඒක කරනවා. අපි ඒක කරන්නෙ මීට වඩා විවිධ දැවැන්ත මැදිහත් වීම් ඇතුළෙ. මොකද අපි ඒක කරනවාම කියල කියන්නෙ අපි අගමැතිව අයින් කරල පෙන්වලා තියනවා. දැන් රටේ ජනාධිපති පාරක් හොයාගෙන තිබ්බට රනිල් වික්‍රමසිංහ දාල තමන් කටුව ඇතුලෙ ඉඳන් ආරක්ෂා වෙන්න, අපි කියනවා එහෙම ආරක්ෂා වෙන්න බෑ රටේ ජනාධිපතිට. පරමාධිපත්‍ය බලය තියෙන්නෙ ජනතාව ළඟ. එහෙම අයින් වෙන්නෙ නෑම කියනවනම් හරි අපි කරල බලමු. මහ පාරේ මැදිහත් වීම් ඇතුළේ කරල බලමු. අපි මේ අරගලයට ආවේ අතරමැදින් නවත්වන්න නෙමෙයි. මොකද රට ආරාජික වෙනවා කියල බොරු පම්පෝරි ගහන්නෙ ආණ්ඩුවනෙ. දැනටත් රට කොහොමත් අරාජිකයි. අරාජික වෙන්න දෙයක් නෑ රට. රට ආරාජික කරල තියෙන්නෙ ගෝඨාභය රාජපක්ෂ. අරාජික වූ රට ගොඩගන්න තමයි ගෝඨාභයට අයින් වෙන්න කියල කියන්නෙ. ඒ සිංහල ගෝඨාභය රාජපක්ෂ තේරුම් ගන්න ඕන මුලින්.

**• පාර්ලිමේන්තුව ළඟ හොරු ගෝ ගම පටන්ගෙන විරෝධතාව තාවකාලිකව නතර කරල එතනින් ආවේ නැවතත් අරගලය එතැනට එනවා කියල. නැවත ඒ සටන් පාඨයත් එක්ක අරගලය දියවන්නාවට යනවද?**

පාර්ලිමේන්තුව අසල අපි ඒ ක්‍රියාමාර්ගය තේරුවේ ජනතා මතය පාර්ලිමේන්තුවේ ක්‍රියාත්මක වෙන්නෙ නැති නිසා. තවදුරටත් අපි විශ්වාස කරන්නෙ මේ පාර්ලිමේන්තුව ඇතුළේ රටේ ජනතාවගේ ප්‍රශ්නය කතා වෙන්නෙ නෑ කියල. ඉතින් එහෙම නැති තාක් අපිට සිද්ධ වෙනවා මේ රටේ අම්මා තාත්තගේ ප්‍රශ්නය අරගෙන පාර්ලිමේන්තුව අසල ක්‍රියාමාර්ගවලට යන්න. අපි ලෑස්තියි ඒ ප්‍රශ්න අරගෙන අගමැතිගේ ගෙදරටත් යන්න. අපි ලෑස්තියි රටේ ජනාධිපති දැන් ඉන්න තැනටත් යන්න. ඉතින් රටේ ජනතාවගේ ප්‍රශ්න ජනතාව කියන දේ ඇහෙන්නෙ නැත්නම් ඇහෙන විදියට කියන්න අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යය බලමණ්ඩලය විදියට ගතයුතු හොඳම ක්‍රියාමාර්ගත් එක්ක මැදිහත් වෙනවා.

**• තිස්ස ගුණතිලක**

# අලුත් අගමැති ආර්ථිකය ගොඩදමයිද?

## ඩොලරයේ අගය අඩුවීමක්...



ආර්ථිකය ඉතාම අමාරු අඩියකට වැටී ඇති මොහොතක, එම තත්ත්වයෙන් ආර්ථිකය ගොඩ ගැනීම සඳහා ඉතා අමාරුවෙන් පියවර ගනිමින් සිටියදී ඉතා කනගාටුදායක සිදුවීමක් සිදු විය. එනම් අරලියගහ මන්දිරය ඉදිරිපිට පැවති 'මයිනාගෝගම' විරෝධතාවට හිටපු අගමැති මහින්ද රාජපක්ෂ මහතා මහතාගේ ආධාරකරුවන් පිරිසක් අමානුෂික මැර ප්‍රහාරයක් එල්ල කිරීමයි. ඒ පිරිස පැමිණියේ ද අරලියගහ මන්දිරයේ සිට එහි පැවති මහින්ද රාජපක්ෂ මහතාට සහාය පළ කිරීමේ රැස්වීමකට සහභාගි වීමෙන් පසුවය. ඒ සඳහා එම පිරිසට අරලියගහ මන්දිරයේ ගාලු පාරට පිවිසෙන දොරටුව ද විවෘත කරදෙන දෙනු ලැබිණි. එම දොරටුවෙන් පිටතට පැමිණි ඔවුන් 'මයිනාගෝගම' ට ප්‍රහාරයක් එල්ල කිරීමෙන් පසු ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට තිබූ 'ගෝඨාගෝගම' ප්‍රදේශයට ද ගොස් එහි තිබූ කුඩාරම් සහ අට්ටාල කඩා දමා ප්‍රහාරයක් එල්ල කළේය. මේ සමග මුළු රටම ගිනි ගත්තේය. ඒ නිසා සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියාවලින් මිනිස් ජීවිත කිහිපයක් අහිමි වී, තවත් විශාල පිරිසක් තුවාල ලබා මැති ඇමැතිවරුන්ගේ ඇතුළු වෙනත් නිවාස ගිනිබත් කිරීම ඇතුළු අති විශාල දේපළ හානියක් ද සිදු විය. මේ සියලු විස්තර ඔබ දැනටමත් දනී. මේ ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කළ දෙපිරිසටම නීතිය ක්‍රියාත්මක විය යුතුය. පසුව ආරක්ෂක ලේකම්වරයා මොනවා කීවත් මේ අනීතික ක්‍රියා සහ දේපළ විනාශයන් වැළැක්වීමට පොලිසිය ඇතුළු ආරක්ෂක අංශ හරිහැටි ක්‍රියාත්මක වූ බවක්ද නොපෙනිණි.

මේ සියලු දේට බලපෑ මුල් හේතුව විදේශ විනිමය අර්බුදය උග්‍ර වීමෙන් කලක් තිස්සේ ජනයා මුහුණ දෙන බලවත් ආර්ථික පීඩනයයි. ඒ ප්‍රශ්න විසඳීමට ප්‍රමාණවත් පියවර නොගෙන විරෝධතාකරුවන්ට පහර දී, රටම ගිනි තැබීම නිසා ඇති වූ අවසාන ප්‍රතිඵලය කුමක්ද? දේශපාලන සහ සමාජ අස්ථාවරත්වය තවත් වර්ධනය වීමයි. එනම් ආර්ථිකය ගොඩ ගැනීම සඳහා මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය විසින් ඉතා අමාරුවෙන් ගනිමින් සිටි පියවරයන්ට බලවත් හානියක් සිදු වීමයි. සියලු දේට වඩා වැදගත් වන්නේ මේ කරුණයි. මේ ගැන ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා පසුගියදා (මැයි 11) මාධ්‍ය හමුවක් පවත්වමින් කරුණු හෙළි කළේය. මූලික වශයෙන්ම ඔහු කීවේ වහාම දේශපාලන ස්ථාවරත්වක් ඇති කර ගත යුතු බවයි. එසේ නැතහොත් කිසිවෙකුටත් මේ ආර්ථික අගාධයෙන් රට ගොඩ ගැනීම දුෂ්කර වනු ඇති බවයි. ඔහු තවත් රතු එළියක් ද දැල්වූයේය. එනම් සති දෙකක් ඇතුළත ස්ථාවර දේශපාලන තත්ත්වයක් ඇති කර නොගතහොත් තමා මහ බැංකු අධිපති ධුරයෙන් ඉවත්වන බවයි. දේශපාලන පක්ෂ එකතු වී රට තුළ දේශපාලන ස්ථාවරභාවය ඉක්මනට ඇති කර නොග න්නේ නම් තමා මහ බැංකු අධිපති ධුරයෙන් ඉල්ලා අස්වන බව ජනාධිපතිවරයා ඇතුළු පක්ෂ නියෝජිතයන්ට පැහැදිලිව ප්‍රකාශ කළ බව මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා පසුගිය මැයි 11දා මහ බැංකු මූලස්ථානයේදී මාධ්‍යවේදීන්ට පැවසීය.

මේ මාධ්‍යවේදීන්ගේ ප්‍රශ්න කිරීම් හමුවේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා මෙසේ කීවේය.

රටේ දේශපාලන ස්ථාවරභාවය ඉක්මනට ඇතිකර නොගන්නේ නම් ඔබ ඉල්ලා අස්වන බවට දේශපාලන පක්ෂ නියෝජිතයන් පිරිසක් සමඟ පැවති සාකච්ඡාවකදී ප්‍රකාශ කළා දැයි මෙහිදී මාධ්‍ය කළ විමසුමකදී මහ බැංකු අධිපතිවරයා ඒ බව තහවුරු කළේය.





## මහ බැංකු අධිපතිගෙන් රතු එළියක්

මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ

ඔහු ඒ සම්බන්ධයෙන් මෙසේ පැහැදිලි කළේය.

"මම මහ බැංකු අධිපති ධුරය භාර ගන්න කැමති වන විට මෙහෙම තත්ත්වයක් තිබුණේ නෑ. ඒ වන විට මිරිහාන සිද්ධිය වෙලත් නෑ. ඒ සිද්ධිය තමයි මම ආවයින් පසු මේ දේශපාලන අස්ථාවරත්වය ආරම්භ වීමේ සිද්ධිය. ඊට පසු සිදුවීම් දිගටම සිදුවුණා. මගේ බලාපොරොත්තුව තිබුණේ සති දෙකක් පමණ ඇතුළත දේශපාලන ස්ථාවරත්වය ඇතිවෙයි. ඒ නිසා කරගෙන යන ආර්ථික වැඩපිළිවෙළ සාර්ථකව කරගන්න පුළුවන් වෙයි කියලයි. දැන් මාසයක් ගිහින් තිබෙනවා. පසුගිය සඳුදා ඉඳලා ඒ තත්ත්වය තවත් වැඩි වුණා. මම දැන් ඒ පණිවුඩය කියල තියෙනවා සියලුම දේශපාලන පක්ෂවල අයට. ඒ අය එකතු වෙලා යම් කිසි ආකාරයකට දේශපාලන ස්ථාවරත්වයක් ඇති කර ගන්නේ නැත්නම් මේ රට ගොඩ ගන්න බෑ කියලා. ඒක මමද වෙන කවුද ඉන්නෙ කියන එක ප්‍රශ්නයක් නෑ. කාටවත් බෑ ආර්ථික වශයෙන් මේ රට ගොඩගන්න මෙහෙම අස්ථාවර තත්ත්වයක් පවතින විටක. එහෙම අරාජික වන රටක, නීතිය හා සාමය හරියට ක්‍රියාත්මක නොවන රටක, ස්ථාවර දේශපාලන තත්ත්වයක් නොමැති රටක මහ බැංකු අධිපති වශයෙන් කවුරු හිටියත් ඒ දේ කරන්න අමාරුයි.

අඩු තරමේ තවත් සතියක් දෙකක් ඇතුළත එවැනි දේශපාලන එකඟතාවක් ඇතිකර ගත්තේ නැත්නම් මම මේ තනතුරේ ඉන්නේ නැති බව මම ප්‍රකාශ කරල තිබෙනවා..

හේතුව තමයි මම හිටිය කියල විසඳුමක් වෙන්නෙ නෑ. ඒක තනිවම මට හෝ කවුරු මේ තනතුරට ආවත් මහ බැංකුවක් විසින් තනිවම මේ රට ගොඩගැනීමට බැහැ. ඒ අත්‍යවශ්‍ය ස්ථාවර දේශපාලන තත්ත්වය රටේ නැත්නම්. එහෙම වුණොත් සමාජ හා දේශපාලන අස්ථාවරත්වය වර්ධනය වෙලා අපි හැමෝම අමාරුවේ වැටෙන තත්ත්වයකට රට පත්වෙනවා. එවැනි පාලන ක්‍රමයක මහ බැංකු අධිපතිවරයකු ලෙස කටයුතු කරන්න මගේ බලාපොරොත්තුවක් නැහැ. ඒ බව ඉතා පැහැදිලිව ජනාධිපතිතුමා ඇතුළු සියලු දේශපාලන පක්ෂවලට කියල තියෙනවා
ගිය සතියෙ මේක සිදුවුණාම.

දැනටමත් අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල හිඟයක් තියෙනවා. තව දින කිහිපයක් මෙහෙම ගියොත් යළි පැය 10 ක් 12 ක් විදුලිය නැතිව ඉන්න වෙයි. පෙට්‍රල්, ඩීසල් නැතිවෙයි. ගෑස් නැතිවෙයි. ජනතාවට වෙන විකල්පයක් නැති නිසා සාමකාමී හෝ ප්‍රචණ්ඩකාරී මහජන උද්ඝෝෂණ ඇතිවෙයි. ඒ නිසා හැකි ඉක්මනින් ස්ථාවර දේශපාලන විසඳුමක් අවශ්‍යයි.

මෙසේ මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා ආණ්ඩුවට මෙන්ම සියලු දේශපාලන පාර්ශ්වයන්ට පැහැදිලි පණිවිඩයක් දී තිබේ. එක්ව යම් දේශපාලන සම්මුතියකට පැමිණිය යුතු බවයි. කෙසේ හෝ වහාම යම් දෙයක් වූයේය. ජනපතිවරයා ජාතිය අමතමින් කියා සිටියේ පාර්ලිමේන්තුවේ බහුතර සහාය ඇති අගමැතිවරයෙක් පත් කරන බවයි. ඒ අනුව පසුගිය බ්‍රහස්පතින්දා (13) යහපාලන රජයේ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා අන්තර්කාලීන රජයේ අගමැති ලෙස පත් කර තිබේ. මේ සම්බන්ධයෙන් ඇතැම් අයගේ විරෝධය ද මතුව තිබේ. පාරට බැස විරෝධතා පවත්වන අයට රනිල් වික්‍රමසිංහ මහතා අගමැති ලෙස පත් කළ රජයක් අවශ්‍ය කළා ද යන්න නම් ප්‍රශ්නයකි. පසුගිය මහ මැතිවරණයෙන් රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වයෙන් එජාපය බිංදුවටම වැටුණි. මේ නිසා පොදුජනයා මෙන්ම එජාප පාක්ෂිකයා ද පසුගිය මහ මැතිවරණයෙන් ඔහුවත් එජාපයත් ප්‍රතික්ෂේප කර තිබුණි. අන්තිමට හිටපු අගමැතිවරයා පාර්ලිමෙන්තුවට ආවේ එම පක්ෂයට ජාතික ලැයිස්තුවෙන් ලැබුණු මන්ත්‍රී ධුරයෙනි. ඒ නිසා එවැනි කෙනෙක් මේ අන්තර්කාලීන රජයේ අගමැති ලෙස පත් කිරීම ගැන බොහෝ විවේචන තිබේ. කෙසේ හෝ මේ මොහොතේ අවශ්‍ය වන්නේ පුද්ගල චරිත නොව ආර්ථික ප්‍රශ්නයට විසඳුමකි. ඒ විසඳුම දීමට මේ ඇති කළ නව වෙනස සමත් වේද යන්න අපි බලමු. කුඩා සාමාජිකයන් පිරිසකගෙන් සමන්විත කැබිනට් මණ්ඩලයක් ද ඉතා ඉක්මනින් පත් කර ගනු ඇත. මේ ලිපිය ඔබ කියවන මොහොත වන විට ඒ දෙය ඇතුළු තවත් බොහෝ දේ සිදුව තිබෙන්නට පුළුවන. මේ නව අගමැති ප්‍රමුඛ රජය ඉතා ඉක්මනින් ක්‍රියාත්මක වී මේ ආර්ථික ප්‍රශ්න සමනය කිරීමට අවශ්‍ය කඩිනම් පියවර වහාම ගත යුතුව තිබේ. ඒ කටයුතු අසාර්ථක වුවහොත් වනු ඇත්තේ මහ බැංකු අධිපති කියන පරිදිම මහජනයාගේ ආර්ථික පීඩනය තවත් උග්‍ර වී රට අරාජික තත්ත්වයට පත් වීමයි. ඒ දෙය නොවන විසඳුම් මගකට වහාම අවතීර්ණ වී ඉදිරියට ගමන් කිරීමට තිබේ.

### විදේශ සංචිත මට්ටම

මේ වනවිට විදේශ විනිමය සංචිතය අඩියටම හිඳී ගොස් ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාලේඛනවලට අනුව 2022 අප්‍රේල් මාසය අවසන් වන විට මෙරට නිල සංචිත වත්කම් ප්‍රමාණය ඩොලර් මිලියන 1,827 ක් ලෙසින් සටහන්ව ඇති අතර එයින් විදේශ විනිමය සංචිතය ලෙස ඩොලර් මිලියන 1,618 ක් ලෙසින් දැක්වුණි. මේ විදේශ විනිමය සංචිතය තුළ ඇතුළත් වන, චීන මහජන බැංකුවෙන් ලබා ගන්නා ලද ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක විනිමය හුවමාරු පහසුකමේ අගය ඉවත් කළ විට ඉතිරි වන්නේ ඩොලර් මිලියන 118 ක් පමණි. මේ අප්‍රේල් අගදීය. මේ වන විට තවත් අත්‍යවශ්‍ය ආනයන භාණ්ඩ මූල්‍යනය කිරීමට විදේශ විනිමය වැය වන්නට ඇත. මේ නිසා විදේශ විනිමය සංචිතය බින්දුවයි කියා හිටපු මුදල් ඇමැති අලි සබ්රි මහතා කියූ අදහස වැරදි නැත. මහ බැංකුව චීන විනිමය පහසුකම ගැන කියා සිටියේ මෙම විනිමය හුවමාරු පහසුකම භාවිතයට ගැනීමේදී කොන්දේසි පවතින බවයි. මේ සම්බන්ධයෙන් පසුගිය මැයි 11 වැනිදා පැවති මාධ්‍ය හමුවක දී ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතාගෙන් මාධ්‍ය විමසීමක් කළ අතර එහිදී ඔහු පැවසුවේ මෙම මුදල දැනට කිසිවකට හෝ භාවිතා කළ නොහැකි බවයි. ඒ ගැන ඔහු මෙසේ ද කියයි.

'අපි ඉල්ලීමක් කරලත් තියෙනවා ඒගොල්ලන්ගෙන් මේක රිලැක්ස් කරන්න කියලා, පාවිච්චි කරන්න පුළුවන් ආකාරයට. ඒ මුදල අඩුම ගානේ චීනෙන් ඉම්පෝර්ට් කරන ඒවාටවත් පාවිච්චි කරන්න පුළුවන් විදියට. අපි උත්සාහ කරනවා ඒ සම්බන්ධයෙන් වන කොන්දේසිය වෙනස් කරලා අපිට පාවිච්චි කරන්න පුළුවන් විදියට එය හදාගන්න..

කුමන ආකාරයකින් හෝ අපගේ විදේශ විනිමය සංචිත මට්ටම වර්ධනය කරගත යුතු වේ. නැතහොත් දැනට පිරිහෙන රුපියල පාලනය කිරීමට මහ බැංකුවට ඇති ශක්තිය ද ඉතා අවමය. මේ නිසා දිගින් දිගටම වැඩිවෙන ඩොලරයේ අගය අනුව මෙරට ඉන්ධන ඇතුළු සියලු භාණ්ඩ මිල ගණන් අඛණ්ඩව වැඩි වෙමින් මහජන පීඩනය තවත් උග්‍ර වේ. කෙසේ වෙතත් මෙරට බලපත්‍රලාභී වාණිජ බැංකු කිහිපයකම දෛනික විනිමය අනුපාතික සටහන්වලට අනුව එක්සත් ජනපද ඩොලරයක විකුණුම් අගය ගිය සිකුරාදා (13) රු. 365.00 ක් දක්වා පහළ ගොස් තිබෙනු දක්නට ලැබිණි. ඊට පෙර දින (12) වාණිජ බැංකුවලට අනුව ඩොලරයක විකුණුම් මිල රු. 380 ක් ලෙසින් සටහන්ව තිබුණි. මෙලෙස ක්‍රමයෙන් විදේශ විනිමය ලැබීම් වර්ධනය කරමින් දැනට අධිතක්සේරු වී ඇති විනිමය අනුපාතය නිසි මට්ටමට පත් කර ගත යුතුව තිබේ. එවිට මේ භාණ්ඩ මිල ඉහළ යෑම පාලනය කරගෙන ඇතැම් විට භාණ්ඩ මිල යම් මට්ටමකට අඩු කර ගැනීමට ද බැරි කමක් නැත.

### ආර්ථික සුරක්ෂිතතාව ඇති කිරීම

අද වෙසක් පොහොය නිසා බුදු දහමෙන් ද යමක් කිව යුතුය. එනම් බුදු දහමේ සඳහන් වන පරිදි ආර්ථික සුරක්ෂිතතාව ඇති කිරීමට ක්‍රියා කිරීම කිසියම් රාජ්‍ය පාලකයකුගේ මූලිකම කාර්යයකි. කොරෝනා වසංගතය ඇතුළු නොයෙකුත් අභියෝග ඇති වූ බව ඇත්තය. එහෙත් මේ ගෝඨාභය රාජපක්ෂ රජය රටේ ආර්ථික සුරක්ෂිතතාව ඇති කිරීමට බලවත් ලෙස අසමත් විය. රට පාලනය කිරීමේදී විශාරදයන්ගේ උපදෙස් ගැනීමත් රාජ්‍ය පාලකයකුගේ තවත් මූලික කාර්යයකි. එහෙත් කාබනික කෘෂිකර්ම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී මේ ජනපති ක්‍රියා කළේ ඉතාම උද්ධච්ච ආකාරයෙන් තමන්ගේ සිතැඟි පරිදි තනි මතයට බව දැකගත හැකි විය. එවකට සිටි කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් අඩුපාඩු පෙන්වා දුන් විට ඔහු වහාම නෙරපා හැරි අයුරු අපට මතකය. බුදු දහමේ සඳහන් රාජ්‍ය පාලකයකුට තිබිය යුතු ගුණාංග සහ ප්‍රතිපත්ති හැකිතාක් දුරට තම රාජ්‍ය පාලනය සඳහා එකතු කර ගැනීමෙන් යහපත් රාජ්‍ය පාලනයක් ඇති වේ. එහෙත් එවැනි දෙයක් ද දැකගත නොහැකි විය. ඒ අනුව

මේ කාලය දෙස බැලීමේ දී පෙනෙන්නේ රටේ ආර්ථික සුරක්ෂිතතාව ඇති කිරීමට වත්මන් රජය බලවත් ලෙස අසමත්ව වීම නිසා අන්තිමට ජනයාගේ ජීවිත සුරක්ෂිතතාව ද අවදානමට ලක් විය. ආණ්ඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ඇතුළු කිහිප දෙනකුගේ ජීවිත ද අහිමි විය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට විරෝධතාකරුවන් මහ මග පහර දී තිබිණි. මේ නිසා නීතිය හා සාමය රැකීමට ද රජයට නොහැකි විය. මේ විරෝධතා සියල්ල මෙන්ම මුල සිටම ජනතාවගේ ආර්ථික පීඩනය ද රජය තක්සේරු කළේ අඩුවෙනි. රට අද පවතින ඛේදජනක ඉරණමට ගොදුරු වීමට හේතුව එයයි. දැන් 69 ලක්ෂයේ ජනවරම ගැන කතාකර ඵලක් නැත. රජයේ අදූරදර්ශී ක්‍රියාකලාපය නිසා ඔවුන් ද ඇතුළුව සියලු ජනයා දුක්ඛිත තත්ත්වයට පත් විය. ඒ නිසා ඔවුන් සියලු දෙනා තවමත් තම රජය පැත්තේ සිටින්නේ යැයි සිතන්නේ නම් එය විශාල මුළාවකි. ඒ 69 ලක්ෂයේ ජනවරම එදා දුන්නේ යහපාලන රජයෙන් රට බේරා ගැනීමටය. එහෙත් හරියට රාජ්‍ය පාලනය නොකළ නිසාත් දිගින් දිගටම එම ජනවරම අනුව ක්‍රියා නොකළ නිසාත් අවසානයේ සිදු වූයේ ජනයා ගෙදර යැවූ බැඳුම්කර චෝදනා එල්ල වූ යහපාලන රජයේම සිටි අගමැතිවරයාම ගෝඨාභය රාජපක්ෂ ජනපතිට, අගමැතිවරයා ලෙස පත් කිරීමටය. එය දෛවෝපගත සිදු වීමකි. පසුගිය රජයේ බැඳුම්කර හොරු අල්ලනවා කියා බලයට පැමිණ අන්තිමට ඒ දෙය නොකර මේ රජය රට බංකොලොත් කර විශාල දේශපාලන අර්බුදයක් නිර්මාණය කර ගත්තේය. එය පසුව බලවත් සමාජ ප්‍රචණ්ඩත්වයක් කරා ද වර්ධනය විය. ඒ නිසා යහපත් රාජ්‍ය පාලකයෙකුගේ ගුණාංග අනුගමනය කරමින් දැන්වත් රට වැසියා සිටින දුක්ඛිත තත්ත්වය වටහාගෙන ඉදිරියේ දී පත්කර ගන්නා අන්තර්පාලන රජය විසින් හෝ නිසි පියවර ගනිමින් සමාජ හා දේශපාලන ස්ථාවරත්වය ඇති කරගෙන වහාම රටේ ආර්ථික සුරක්ෂිතතාව ඇති කිරීමට කඩිනම පියවර ගත යුතු වේ. ඒ සඳහා වහාම මේ ප්‍රචණ්ඩකාරී වාතාවරණය සමනය කරගෙන ජනයා ද කිසියම් ඉවසීමකින් ක්‍රියා කළ යුතු මොහොතකට අප මුහුණ දී සිටිමු.

**ශ්‍යාම් නුවන් ගණේවත්ත**

# 2022 වසරේ ලෝකයේ ප්‍රකෝටිපති දේශපාලන චරිත

ලෝකයේ ධනවත් ව්‍යවසායකයා කවුද බැව් දැන ගැනීමට අපි බොහොම උනන්දුයි. ''ෆෝබ්ස්'' (Forbes) වැනි ව්‍යාපාරික සඟරාවන් මගින්ද වාර්ෂිකව ලෝකයේ ධනවත් ව්‍යවසායකයන් ගැන වාර්තා කරනවා. ප්‍රකෝටිපති දේශපාලන නායකයන් ගැනත් ඔබේ විවිධ අනුමානයන් තිබෙනවා. ''ෆෝබ්ස්'' සඟරාව මගින් ප්‍රකාශිතව ඇති ලෝකයේ ප්‍රකෝටිපති දේශපාලඥයන් 20 දෙනා ගැන දැනුවත් වුණොත් මේ සැක සංකාවන් දුරස් කර ගැනීමට හැකියාව තිබෙනවා. ඒ වගේම මේ ලැයිස්තුවත් වාර්ෂිකව උච්චාවචනය වෙනවා. ප්‍රමුඛතාව ඇති අය ඉවත් වීමට වගේම අලුත් දේශපාලන නායකයන් මේ ලැයිස්තුවට ඇතුළත් වෙන්නත් පුළුවනි. ඒ නිසා කිසිම ලෙසකින් දේශපාලන ප්‍රකෝටිපතියන්ගේ ලැයිස්තුව වුණත් ස්ථාවර නැහැ. නමුත්...ඉදිරි වසරේදී මේ ලැයිස්තු යාවත්කාලීන කරන විට සමහර විට අලුත් දේශපාලන නායකයන්ගේ නම් ලැයිස්තුවට ඇතුළත් වෙන්නත් පුළුවනි.

**★ ව්ලැඩිමීර් පුටින්**

ලෝකයේ රාජ්‍ය නායකයන් අතර ධනවත් පුද්ගලයා රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් බැව් වාර්තා වේ. සමාජවාදී නායකත්වය බොහොම සැහැල්ලු චරිතයක් යැයි අපි උපකල්පනය කළත් 'ෆෝබ්ස්' සඟරාවට අනුව ඔහුගේ ධනවත්කම ඩොලර් බිලියන 70 ක් බැව් වාර්තා වේ.

**★ මයිකල් බ්ලූම්බර්ග්**

ඇමරිකාවේ හිටපු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ටත් වඩා ධනවත් නිව්යෝක් නගරයේ නගරාධිපති මයිකල් බ්ලූම්බර්ග්ගේ වත්කම ඩොලර් බිලියන 56 ක් බැව් වාර්තා වෙනවා. 2022 වසර වෙන විට ඔහු ලෝකයේ ධනවත් රාජ්‍ය නායකයන් අතර දෙවැනි තැනට පත්ව සිටිනවා.

**★ මහා වජිරලෝන්කෝන්**

තායිලන්තයේ මහා වජිරලෝන්කෝන් තායිලන්තයේ රාජ්‍ය නායකයා ලෙසින් කටයුතු කරන අතර ඔහු රාජකීය හමුදා පාසලෙන් සහ බ්‍රිතාන්‍ය, ඔස්ට්‍රේලියාව සහ ඇමරිකා එක්සත් ජනපදයේ හමුදා පුහුණුව ලබා තිබෙනවා. 2022 වසරේ යාවත්කාලීන කිරීම් අනුව මහා වජිරලෝන්කෝන් ලෝකයේ තෙවැනි ධනවත් රාජ්‍ය නායකයා ලෙසින් වාර්තාගතව ඇති අතර ඔහුගේ වත්කම ඩොලර් බිලියන 30 ක් බැව් වාර්තා වෙනවා.

**★ ෂෙයික් මන්සූර් බින් සයාඩ් අල් නාහයන්**

2022 වසරේ යාවත්කාලීන කිරීම් අනුව එක්සත් අරාබි එමිරේට්ස් හි රාජ්‍ය නායකයා ලෙසින් සැලකෙන ෂෙයික් මන්සූර් බින් සයාඩ් අල් නාහයන් ලෝකයේ සිව්වැනි ධනවත් පුද්ගලයා බැව් වාර්තා වෙනවා.1970 වසරේ උපත ලද ට්‍රෘසියල් රාජ්‍යයේ උපත ලද ෂෙයික් දේශපාලන නායකත්වයට අමතරව ව්‍යවසායක කටයුතුවලද නිරත පුද්ගලයෙකු ලෙසින් ඩොලර් බිලියන 30 ක් බැව් වාර්තා වේ.

**★ අල්වලිඩ් බින් ටලාල් අල්සියුඩ්**

සමාජ හිතෛෂී චරිතයක් ලෙසින් සහ ව්‍යවසායකයෙකු ලෙසින් සමාජගත චරිතයක් ලෙසින් සැලකෙන අල්වලිඩ් බින් ටලාල් අල්සියුඩ් රජතුමා සෞදි අරාබියේ රාජකීය පවුලේ සාමාජිකයෙකි. ඩොලර් බිලියන 20 ක වත්කමක් ඇති අල්වලිඩ් බින් ටලාල් අල්සියුඩ් ලෝකයේ පස්වැනි බිලියනපතියා බවට පත්ව සිටිනවා.

**★ සුල්තාන් බෲනායි**

බෲනායි රාජ්‍යයේ සුල්තාන්වරයා ලෙසින් සැලකෙන හුසානි බුල්කායි මු ඉසඩින් චඩුල්ලා ලෝකයේ හයවැනි බිලියනපතියා බැව් වාර්තා වෙනවා. ඩොලර් බිලියන 20 ක වත්කමක් ඇති සිංගප්පූරුවේ ජාතික විශ්වවිද්‍යාලයේ සහ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ආචාර්ය (ගෞරව) සම්මානය ඇතුළු සම්මාන කීපයක් ලබා ගෙන තිබෙනවා.

**★ අබ්දුල් බින් අහමඩ් අල් ගුහායිර්**

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ රාජකීය පවුලක සම්භවය ඇති අබ්දුල් බින් අහමඩ් අල් ගුහායිර්ගේ වත්කම ඇමරිකානු ඩොලර් බිලියන හයකි. ප්‍රමුඛ පෙළ බැංකු අයිතිකරුවෙකු වන ලෝකයේ දේශපාලන ධනවතුන් අතර දහතුන් වැනියා වේ.

**★ ඉමෙල්ඩා මාකෝස්**

මැනිලා හි උපත ලද ඉමල්ඩා මාර්කෝස් පිලිපීනයේ ප්‍රබල දේශපාලන චරිතයක් වේ. පිලිපීනයේ හිටපු ජනාධිපති ෆර්ඩිනන්ඩ් මාර්කෝසගේ වැන්දඹු බිරිඳ වන ඉමෙල්ඩා විලාසිතාවන් ගැන වැඩි උනන්දුවක් දක්වන කාන්තාවක් වන අතර ඇය සතු පාවහන් එකතුව දහසක් ඉක්මවා තිබේ. ධනවත් දේශපාලන චරිත ලැයිස්තුවේ පහළොස් වැන්නී වන ඉමෙල්ඩාගේ වත්කම ඩොලර් බිලියන පහක් බැව් වාර්තා වේ.

**★ කිම් ජොන් උන්**

උතුරු කොරියාවේ දේශපාලන නායකත්වය දරන කිම් ජොන් උන් ඇමරිකානු ඩොලර් පහක වත්කම ඇති දේශපාලන ධනවතුන් අතර දහසය වැන්නා බැව් වාර්තා වෙනවා. 2011 වසරේ ඔහු බලයට පත් වූයේ පියා වූ කිම් ජොන් ඉල්ගේ අභාවයෙන් පසුවයි. ස්විස්ටර්ලන්තයේ පාසල් අධ්‍යාපනය ලත් කිම් ජොන් උන් ප්‍රබල ඒකාධිපති චරිතයක් ලෙසින් ප්‍රසිද්ධියට පත්ව ඇත.

**.★ ලිචෙටෙන්ස් ටීන් කුමරු**

ලෝක ධනවත් දේශපාලන චරිත අතර දහනව වැන්නා ලෙසින් ප්‍රමුඛතාව ලබා ඇති අතර ඔහුගේ වත්කම ඇමරිකානු ඩොලර් බිලියන 3.5 ක් බැව් වාර්තා වේ. ලිචෙටෙන්ස්ටීන් කුමරුට ප්‍රංශ, ඉංග්‍රීසි සහ ඉතාලි භාෂා කීපයක ප්‍රවීණත්වය ඇත.

**★ ඩොනල්ඩ් ට්‍රම්ප්**

ඩොනල්ඩ් ට්‍රම්ප් කී සැණම මහත් වූ ධන කුවේරයෙක් යැයි අප සිතුවත් ලෝකයේ ධනවත් දේශපාලන චරිත අතරදී ඩොනල්ඩ් ට්‍රම්ප් 20 වැන්නා බැව් වාර්තා වෙනවා. දේශපාලනයට පැමිනීමට පෙරාතුවත් ඔහු ව්‍යවසායකයෙකු ලෙසින් කටයුතු කළ අතර පෞද්ගලික රූපවාහිනී සේවාවක් පවා ට්‍රම්ප් සතු විය. නමුත් මේ වෙන විට ඔහුගේ වත්කම ඩොලර් බිලියන 3. 1 ක් බැව් වාර්තා වෙනවා.

**පුනයා චාන්දනි ද සිල්වා**



# ‘අරගලයට’ අරලියගහ මන්දිරයෙන් ප්‍රබල උත්තේජකයක්!

**විධායකය, ව්‍යවස්ථාදායකය (පාර්ලිමේන්තුව) සහ අධිකරණය වර්ධනය වෙමින් පවතින අර්බුදය බව අමුතුවෙන් කිවයුතු නැත. එම තත්ත්වය විමසා බැලිය යුතු වන්නේ ආර්ථික - දේශපාලන - සමාජීය ව්‍යකූලත්වය ද අවධානයට ලක් කිරීමෙනි. විධායකය නියෝජනය කරන ගෝඨාභය රාජපක්ෂ සහ හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තර්ජනයකට මුහුණ දී ඇත. අධිකරණය නියෝජනය කරන ශ්‍රී ලංකා නීතිඥ සංගමය දේශපාලන අර්බුදය විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග අගය කළ යුතුය. වර්තමාන ව්‍යාකූලත්වය ශ්‍රී ලංකාව වේගයෙන් විනාශයට ඇදගෙන යමින් පවතියි. ද්‍රවිඩ ත්‍රස්තවාදයට දශක තුනකට ආසන්න කාලයක් කළ නොහැකි වූ දේ ශ්‍රී ලංකාවේ තරුණ පහේ ප්‍රජාත්‍රන්තවාදී ක්‍රමය තුළ දේශපාලන පක්ෂ අත්කර ගනීවිද ?**

බෙදුම්වාදී ද්‍රවිඩ ත්‍රස්තවාදය පරාජය කිරීමට දේශපාලන නායකත්වය දුන් දෙවරක් ජනපති (2005 නොවැම්බර් -2015 ජනවාරි) හිටපු අගමැති (2020 අගෝස්තු - 2022 අප්‍රේල්) මහින්ද රාජපක්ෂ මහතාට ත්‍රිකුණාමලයේ නාවික හමුදා කඳවුරු සංකීරණයේ ආරක්ෂාව පැතීමට සිදුවූයේ ඇයි ?

හිටපු අග්‍රාමාත්‍යවරයා නාවික හමුදා ආරක්ෂාව යටතේ සිටින බවට ආරක්ෂක ලේකම් විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න සහ නාවික හමුදාපති නිශාන්ත උලුගුතැන්න පසුගිය මැයි 11 දින තහවුරු කළේය. ඒ ඊට පෙරදින අග්‍රාමාත්‍යවරයා ඇතුළු කිහිප දෙනකුට ගුවන් හමුදා හෙලිකොප්ටරයකින් කොළඹ සිට ත්‍රිකුණාමලයට යෑමට අවශ්‍ය පහසුකම් සැපයීමට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා කටයුතු කළ බවට ගුවන් හමුදාව ප්‍රකාශ කර තිබෙන තත්ත්වයක් තුළය.

හිටපු අග්‍රාමාත්‍යවරයාගේ ආරක්ෂාව නැගෙනහිර නාවික විධානය තුළ තහවුරු කිරීමට සිදුවීම අවධාරණය කරන්නේ ආණ්ඩුවට රුපියල් හිඟවීම සහ රටට ඩොලර් නැත්තටම නැතිවීම නිසා ඇතිවූ දේශපාලනික සහ සමාජීය අර්බුදය සමස්ත ශ්‍රී ලංකාවම අස්ථාවර කර ඇති බවයි.

මහා බැංකුවේ අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ ජාතික ආර්ථිකය මරණාසන්න බව පවසයි. හිටපු අග්‍රාමාත්‍යවරයා නැගෙනහිර නාවික විධානය තුළ තම ආරක්ෂාව තහවුරු කරගැනීම සහ මහා බැංකුවේ අධිපති සමස්ත දේශපාලන නායකත්වයට කළ අනතුරු ඇඟවීම ශ්‍රී ලංකාව නව මානයකට ගෙන ගොස් ඇත. නන්දලාල් වීරසිංහ කළ අනතුරු ඇඟවීම දේශපාලන නායකත්වය තේරුම් ගනීවිද? නැතහොත් තවදුරටත් රට ව්‍යාකුල කිරීම දේශපාලන පක්ෂ-වෘත්තීය සමිති - සිවිල් සංවිධාන නායකත්වය දේවකාරියක් ලෙස කරාවිද ?

තුනෙන් දෙකකට ආසන්න පාර්ලිමේන්තුවේ බලයක් හිමිව තිබූ ආණ්ඩුවට වැරදුනේ කොතැනද කියා විමසා බැලීම ගෝඨාභය රාජපක්ෂ සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ වගකීමයි.

විධායක බලය හිමි ජනාධිපතිවරයාට එම පක්ෂය තුළ තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධවීමට තිබූ අවස්ථාව ප්‍රමාණවත් වූවාද? එලෙසම ජාතික කෘෂිකර්මාන්ත ප්‍රතිපත්තිය උඩු යටිකුරු කිරීම ඇතුළු ජනාධිපතිවරයා ගත් ආන්දෝලනාත්මක තීන්දු තීරණ ආණ්ඩු පක්ෂය පිරිහීමට කොපමණ බලපෑමක් කළාද?

විශේෂයෙන්ම ආර්ථිකය බරපතළ ලෙස අවුල් වීමේ පසුබිම තුළ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ මිරිහාන පොලිස් වසමේ පැඟිරිවත්ත පාරේ පිහිටි පෞද්ගලික නිවාසය ඉදිරිපිට මාර්තු 31 දින පිපිරී ගිය ජනතා විරෝධය වටහා ගැනීමට ආණ්ඩු පක්ෂයට නොහැකි විය. විධායකය සහ ව්‍යවස්ථාදායකය ජනතා විරෝධය නිසියාකාරයෙන් තේරුම් ගත්තේ නැත. වෘත්තීය සමිති ඇතුළු ආණ්ඩුවට එරෙහි කණ්ඩායම් රජයේ නොසැලකිල්ල නිසා ඇතිවූ විරෝධතා රැල්ල අපූරුවට පාවිච්චි කළේය. රජය සුපුරුදු ක්‍රියාමාර්ග හරහා එම අභියෝගය යටපත් කිරීමට නැතහොත් මර්දනය කිරීමට උත්සාහ කළ බව අමුතුවෙන් කීමට අවශ්‍ය නැත.

මෙහිදී විධායකය හොබවන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජනාධිපතිවරණ අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ බව නොසලකා මෙම තත්ත්වය කිසිසේත් විමසා බැලිය නොහැක.

මාර්තු 31 වන දින සිට අප්‍රේල් 08 වන දින දක්වා පැවති ගැටුම්කාරී තත්ත්වය මැයි 09 දින පෙරවරු 11 ට පමණ පුපුරා යෑමට හේතු වූයේ අරලියගහ මන්දිරය අග්‍රාමාත්‍යවරයාට සහයෝගය පළ කිරීමට කැඳවූ අනවශ්‍ය රැස්වීම නොවේද? අවසන් ප්‍රතිපලය විරෝධතාකරුවන් දැඩිව අවධාරණය කළ අග්‍රාමාත්‍යවරයාගේ ඉල්ලා අස්වීම නොවේද? අද හිටපු අග්‍රාමාත්‍යවරයා ත්‍රිකුණාමලයේ නාවික හමුදා ආරක්ෂාව යටතේය. තත්ත්වය යහපත් නැත. හිටපු අගමැතිවරයාට කොපමණ කාලයක් නාවික හමුදා ආරක්ෂාව යටතේ සිටීමට සිදුවේද?

ආණ්ඩුවට එරෙහිව ක්‍රියාත්මක අවශ්‍ය ‘බූස්ට්’ එක ලබා දුන්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ බිම් මට්ටමේ නායකත්වය යටතේ ක්‍රියාත්මක ඕනෑම ඡන්දයකදී එම පක්ෂයට වැඩ කරන කණ්ඩායම නොවේද? අරලියගහ මන්දිරයට පැමිණි එම කණ්ඩායම ජොන්ස්ටන් ප්‍රනාන්දු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා සහ අගමැති මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යවරයා සභාව ඇමතීමෙන් පසුව අගමැති මැඳුර ඉදිරිපිට සහ ගාලුමුවදොර විරෝධතාකරුවන් හට අමානුෂික ලෙස පහර දුන්නේ ඇයි? එම කණ්ඩායම අරලියගහ මන්දිරයට කැඳවා තිබුණේ විරෝධතාකරුවන් ඉවත් කිරීමටමද ? එදින පෞද්ගලික රූපවාහිනී නාලිකා අරලියගහ මන්දිරයෙන් කලහකාරී ලෙස පිටවන පොහොට්ටු ආධාරකරුවන් කළ වික්‍රමය සජීවීව ආවරණය කළේය. මාර්තු 10 දින අරලියගහ මන්දිරය අසලදී විරෝධතාකරුවන් පිරිසකගේ පහරකෑමට ලක්වූ කොළඹ ප්‍රදේශය භාර දේශබන්දු තෙන්නකෝන් නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ නායකත්වයෙන් පොලිසිය ඊට පෙරදින ක්‍රියාකළ ආකාරය සජීවීව ආවරණය කර ඇත. අරලියගහ මන්දිරය පොලිසිය සමඟ කුමන්ත්‍රණය කළාද ? යන ප්‍රශ්නය පූජ්‍ය ඕමල්පේ සෝභිත හිමි ඇතුළු පාර්ශ්ව කිහිපයක්ම මතුකර ඇත. මෙහෙයුමට නායකත්වය දුන්නේ අරලිගහ මන්දිරයද ?

ලියුම්කරු මතුකරන මෙම කාරණාව කිසිසේත්ම නියෝජ්‍ය පොලිස්පතිවරයාට කළ පහර දීම සාධාරණීකරණය කිරීමක් නොවේ.

නමුත් මෙහෙයුම බරපතළ ලෙස වැරදී ඇත. ආණ්ඩුවට එරෙහිව ක්‍රියාත්මක මෙහෙයුමට අරලියගහ මන්දිරය ප්‍රබල උත්තේජකයක් ලබා දුන් බව අද කවුරුත් අවබෝධ කර ගෙන ඇත. එම ‘බූස්ට්’ එක නැතහොත් සුපිරි උත්තේජකය ඇති කළ දේශපාලන සුනාමිය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විනාශ කර ඇත. ශ්‍රී ලංකාවේ ලාබාලම සහ ප්‍රබලම පක්ෂය අද අබල දුබල වී ඇත. නැවතත් ජාතික මට්ටමේ ඡන්දයකට ඉදිරිපත් කිරීමට ප්‍රබල කණ්ඩායමක් සොයා ගැනීම එම පක්ෂයට බරපතළ අභියෝගයක් බව අමුතුවෙන් කිවයුතු නැත.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට භූමියේ සැබෑ තත්ත්වය තේරුම් ගැනීමට නොහැකි වූයේ ඇයි? අග්‍රාමාත්‍ය ධුරයෙන් ඉවත් වූ මහින්ද රාජපක්ෂ මහතා ත්‍රිකුණාමලයේ නාවික හමුදා ආරක්ෂාව යටතේ සිටීම ජනතාවට ප්‍රශ්නයක් වූයේ ඇයි ? එම තත්ත්වය ඇත්තවශයෙන්ම බරපතළ ගැටලුවකි.



පාර්ලිමේන්තුව නියෝජනය කරන 225 ම ජනතාව ප්‍රතික්ෂේප කරන බවට යම් පාර්ශ්ව කර ඇති ප්‍රකාශ තුළ හිටපු අග්‍රාමාත්‍යවරයාට එරෙහිව ක්‍රියාත්මක විරෝධතාව සැඟවිය නොහැක.

හිටපු අග්‍රාමාත්‍යවරයාට ලබා දෙන ආරක්ෂාව සම්බන්ධයෙන් විදේශීය මාධ්‍ය කමල් ගුණරත්න ආරක්ෂක ලේකම්වරයාගෙන් ප්‍රශ්න කිරීම එක්තරා ආකාරයකට අවාසනාවන්ත තත්ත්වයකි. එදා (2006 ජූනි 15) ත්‍රස්තවාදීන් කැබිතිගොල්ලෑවේදී ක්ලේමෝ බෝම්බ ප්‍රහාරයක් එල්ල කර දරුවන් ඇතුළු සාමාන්‍ය වැසියන් 60 දෙනකු මරා දැමීමෙන් පසුව තම ජීවිත ආරක්ෂාව පවා නොතකා එම ප්‍රදේශයට ගොස් ජනතාවට මහත් ශක්තියක් වූ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාට ආරක්ෂාවක් නැතිවීම ඉතාමත් කනගාටුදායක තත්ත්වයකි. එතුමා දුන් දේශපාලන නායකත්වය අසමසමය. බටහිර බලවතුන් කළ කෙළවරක් නොමැති බලපෑම්වලට ජනාධිපති මහින්ද රාජපක්ෂ යට වූයේ නැත. එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ ත්‍රිවිධ හමුදාපතිවරුන්වන ජෙනරාල් සරත් ෆොන්සේකා, වයිස් අද්මිරාල් වසන්ත කරන්නාගොඩ සහ එයාර් මාර්ෂල් රොෂාන් ගුණතිලක නොවන්නට එදා පරාජය කළ නොහැකි යැයි පැවසූ ත්‍රස්තවාදය අදටත් රටට තර්ජනයක් විය හැකිව තිබුණි.

වර්තමාන දේශපාලන අර්බුදය (රාජපක්ෂවරුන් මුහුණ දෙන අභියෝගය) විමසා බැලිය යුතු වන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ දෙවැනි ධුර කාලය (2010 ජනවාරි -2015 ජනවාරි) සහ 2010 සැප්තැම්බර් තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද අතිශය විනාශකාරී 18 වැනි සංශෝධනය මෙන්ම එම නීතිය බල රහිත කිරීමට 2015 අප්‍රේල් හිදී පාර්ලිමේන්තුවේදී අනුමත වූ 19 වැනි සංශෝධනය ද සලකා බැලීමෙනි. මෙහිදී වර්තමාන ආණ්ඩුව මහත් උජාරුවෙන් 2020 ඔක්තෝබර් මාසයේදී සම්මත කරගත් 20 වැනි සංශෝධනය දේශපාලන කොඩිවිනයකි. ජේ. ආර්. ජයවර්ධන 1978 දී හඳුන්වාදුන් ඒකාධිපති ව්‍යවස්ථාව තව දුරටත් ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත කරගත් 20 වැනි සංශෝධනය ශ්‍රී ලංකාව අස්ථාවර කිරීමට ප්‍රබල සාධකයක් විය. නමුත් ව්‍යවස්ථා බලය ආයුධයක් කරගත් පොහොට්ටු පක්ෂය අද සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප වී ඇත. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ දෙවැනි ධුර කාලයේදී ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළෙන් ලබාගත් ණය කන්දරාවට ශ්‍රී ලංකාව යටවී ඇත. පැඟිරිවත්තේ පිපිරීමෙන් පසුව සති කිහිපයකට මුදල් අමාත්‍ය ධුරය දැරූ ජනාධිපති නීතිඥ අලි සබ්රි රොනී දී මැල් ගෙන් පසුව මහින්ද රාජපක්ෂ ඇතුළුව අනෙකුත් මුදල් අමාත්‍යවරුන් වගකීම් විරහිතව කටයුතුකර ඇති ආකාරය පාර්ලිමේන්තුවේදී සහ සජීවී ස්වර්ණවාහිනී වැඩසටහනකදී ප්‍රකාශ කළේය.

එජාපය 19 වැනි සංශෝධනය විශේෂයෙන්ම සම්මත කළේ මහින්ද රාජපක්ෂ නැවත ජනාධිපතිවරණයට ඉදිරිපත් වීම වැළැක්වීමටය. එම සංශෝධනය සමස්තයක් ලෙස රාජපක්ෂවරුන්ට බාධකයක් විය. බැසිල් රාජපක්ෂට සහ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති හෝ මහමැතිවරණයකට ඉදිරිපත් වීම වැළක්වීමද එම සංශෝධනයේ තවත් අරමුණක් විය. නාමල් රාජපක්ෂ ද ඉලක්ක විය. රාජපක්ෂවරුන් එම ව්‍යවස්ථා අභියෝගය ජයගත්තේය. නමුත් එම ජයග්‍රහණය වඩාත් ශක්තිමත් කිරීමට සම්මත කරගත් 20 වැනි සංශෝධනය පොහොට්ටු පක්ෂයට ආපිට කැරකී ඇවිත් ඇත. දේශපාලන බලය අනවශ්‍ය ලෙස වැඩිවීමද පක්ෂ මුරණ්ඩු කරවයි. වියරුවෙන් ක්‍රියාකරයි. කිසිදු අවවාදයක්, උපදෙසක් සලකන්නේ නැත. නමුත් 20 වැනි සංශෝධනයේ තිබෙන විශේෂ ලක්ෂණයක් වන්නේ රාජ්‍ය අංශයට සහ රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය එකතු වී දූෂණ, වංචා සහ අක්‍රමිකතා කිරීමට අවශ්‍ය පරිසරය ව්‍යවස්ථානුකූලවම නිර්මාණය කිරීමයි.

ව්‍යවස්ථාවෙන් දූෂිතයන්ට ආරක්ෂාවක් දුන් ශ්‍රී ලංකාවට අමතරව තවත් රටවල් තිබේ දැයි සොයා බැලිය යුතුය. විගණකාධිපති ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න සහ කෝප් සභාපති මහාචාර්ය චරිත හේරත් මෙම ලියුම්කරු කළ විමසීම්වලදී අවධාරණය කළේ 20 වැනි සංශෝධනය දූෂිත ක්‍රියාවන්ට ආරක්ෂාවක් බවයි.

ද්‍රවිඩ ත්‍රස්තවාදය පරාජය කළ පසුව මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ප්‍රකාශ කළේ තමන් දූෂණයට එරෙහිව යුද්ධයක් ආරම්භ කරන බවයි. අද වනවිට ත්‍රස්තවාදය පරාජය කළ ශ්‍රී ලංකාව දූෂණයට, වංචාවට සහ අක්‍රමිකතාවලට එරෙහි යුද්ධයෙන් පරාජය වී ඇත. ජනතාව අද අවි අමෝරා ගෙන ඇත. විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය මුහුණු දෙන අර්බුදය එයයි. අහස උසට නැඟ ඇති ජීවන වියදම සහ අත්‍යවශ්‍ය සියලුම භාණ්ඩ සහ සේවා හිඟ තත්ත්වයක් තුළ ජනතාවට බල කණු තුනම විශ්වාස නැත. තව දුරටත් වර්ධනය වන මහජන විරෝධතා අවධාරණය කරන්නේ සමස්ත අවස්ථාවාදී, වලත්ත දේශපාලන යාන්ත්‍රණයේ නොහැකියාවයි.

එම තත්ත්වය සියලුම රාජපක්ෂවරුන් ඉවත් කර, අන්තර්කාලීන පාලනයක් ඇති කළ පමණින් වෙනස් කළ නොහැක. සියලුම දේශපාලන පක්ෂ සැබෑ වෙනසකට ලක් විය යුතුය. දේශපාලනය යහපත් විය යුතුය. පාර්ලිමේන්තුවට ඇතුළු වූ සැනින් ලක්ෂ 300 ක් පමණ තීරු බදු සහනයක් යටතේ ගෙන්වූ සුපිරි මෝටර් රථයක් මහ භාණ්ඩාගාරයට අදායම් අහිමි කර විකුණන මහජන නියෝජිතයන් ශ්‍රී ලංකාවට අවශ්‍ය නැත. කොවිඩ් ව්‍යසනයෙන් ආර්ථිකය බරපතළ අර්බුදයකට ලක්වී බොහෝ ආනයන නවතා සිටි 2021 දී මහජන නියෝජිතයන්ට තීරු බදු රහිත වාහන ගෙන්වීමට කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළේ මුදල් අමාත්‍යාංශය බව වගකිවයුත්තන්ට අමතකය. එම අමාත්‍යාංශය 2020 දී සුදු සීනි බද්ධ කිලෝවකට රුපියල් 50 සිට සත 25 දක්වා අඩු කළේ රජයට තව දුරටත් අදායම් මාර්ග අහිමි කරමින්ය. ඒ 2020 ඔක්තෝබර් 13 දිනය. ඊට මාස 10 කට පමණ පෙර බදු ගණනාවක් ඉවත් කළේ සහ අඩු කළේ රුපියල් බිලියන 500 කට වැඩි ප්‍රමාණයක් මහා භාණ්ඩාගාරයට අහිමි කරමිනි. එවකට මුදල් ඇමැති වූයේ මහින්ද රාජපක්ෂය. කැබිනට් මණ්ඩලය නිසි ලෙස ක්‍රියාත්මක විය යුතුය. එසේ නොමැති කැබිනට් මණ්ඩලය සාපේක්ෂව කුඩා වූවාට වැඩක් නැත.

අතිශය ආන්දෝලනාත්මක යුගදනව් ගිවිසුම 2021 සැප්තැම්බර් 17 දින මහ රෑ අත්සන් කර පොහොට්ටු කැබිනට් මණ්ඩලය ලෝකයට හෙළිදරව් කළේ ශ්‍රී ලංකා දේශපාලනයේ අශීලාචාර බවයි. ඊට එරෙහිව පාර්ශ්ව කිහිපයක් රටේ ඉහළම උසාවියේ පැවරූ නඩු හේතු නොදක්වාම ඉවත දැමූ බව සත්‍යයකි. ජනතා අරගලය විධායකයට, ව්‍යවස්ථාදායකයට සහ අධිකරණයට බල කරන්නේ සැබෑ වෙනසක් බව අවධාරණය කළ යුතුය.

● **ශමින්ද්‍ර ෆර්ඩිනැන්ඩෝ**

---

## සිතමු!



# ගිනි නිවන පැන් වුවමනා කර තිබේ

පසුගිය නව වැනි සඳුදා ශ්‍රී ලාංකේය ඉතිහාසයේ අඳුරුතම කළු දිනයක් බවට පත් වූයේ රට තුළ ඇති වූ බරපතළ ප්‍රචණ්ඩකාරී ස්වභාවයයි.

ගාලු මුවදොර පිටියේ මාසයකට වැඩි කලක් අවිහිංසාවාදී අරගලයේ නිරත තරුණ ප්‍රජාව ඉලක්ක කර එල්ල වූ ම්ලේච්ඡ ප්‍රහාරය සාධාරණත්වය අගයන කිසිදු මිනිසෙකුට මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට එය කිසි ලෙසකින් අනුමත කළ නොහැක.

නමුත් අර්බුදවලින් තැලී පොඩිවී මිරිකී සිටි අහිංසක මිනිසුන් වෙත එල්ල වූ අමානුෂික ප්‍රහාරයෙන් පසු සිදුව ඇති ප්‍රචණ්ඩ ක්‍රියාවන් ද කිසිසේත් අනුමත කළ හැකි තත්ත්වයක් නොවේ.

දශක පහක ප්‍රචණ්ඩත්වය වැලඳගත් ශ්‍රී ලාංකික සමාජය ගෝල්ෆේස් සාමකාමී විරෝධතාව තුළින් ලොවට පෙන්වූ ආදර්ශය ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ඉහළ නංවන්නක් විය. එහෙත් අවාසනාවකට ඒ සියල්ල සුනුවිසුනු වී යෑම මෙම සංවිධානාත්මක ප්‍රහාරය හේතුවෙන් සිදුවිණ.

සිදු වූ සියල්ල සිදු වී හමාරය. දැන් ඉතිරිව ඇත්තේ යළි එවැන්නක් සිදුනොවීමට වගබලා ගැනීමය. ගිනි ඇවිළවීම පහසු නමුත් ගිනි නිවීම දුෂ්කර කාර්යයකි. වෛරය, ක්‍රෝධය වෙනුවට මෛත්‍රිය අවිහිංසාවාදය පැතිරවීම අප කාගේත් යුතුකමකි. යුක්තිය සාධාරණත්වය වෙනුවෙන් හැම විටම ක්‍රියා කිරීම තුළින් බොහෝ ගැටලුවලට විසඳුම් සොයා ගත හැකි වනු ඇති.

නීතියේ ආධිපත්‍යය කිසිදු වෙනස්කමකින් තොරව ක්‍රියාවට නැගීම අත්‍යවශ්‍යය. උවමනාවටත් වඩා අපේ රට නැවත ලෙයින් තෙත්වී ඇත. තවත් එවැනි ලේ වැගිරවීම් වෙනුවට සාමකාමීත්වය සඳහා කැපවීම සියලු දෙනාගේම යුතුකමයි.

සත්‍ය කිසිදා යටපත් කළ නොහැකි බව සියල්ලෝ ම අවබෝධ කරගත් විට මෙවැනි ප්‍රචණ්ඩත්වයන් ඇතිවීමට ඉඩක් නැත.

හදිසි නීතිය ඇඳිරි නීතිය වන නීතිමය තත්ත්වයන් භාවිතා කළ යුත්තේ ජන ජීවිත ආරක්ෂා කිරීමට මිස ජනතාව තලා පෙළා දැමීමට නොවේ. මේ ප්‍රචණ්ඩකාරී තත්ත්වය ඇතිවී හෝරා කිහිපයක් ගත වෙද්දී මීගමුවෙන් වාර්තා වූ සුපුරුදු ජාතිවාදය මුළු රටටම ලබාදුන්නේ සැබැවින්ම කම්පනයකි.

නමුත් කතෝලික පියතුමන්ලාගේ මැදිහත්වීම තුළ සිංහල, මුස්ලිම් සියලු ගම්වැසියන් එකාවන්ව එම තත්ත්වය පාලනය නොකළේ නම් කොතැනින් කෙසේ එය කෙළවර වන්නට තිබුණේද යන්න ගැටලුවකි.

ශ්‍රී ලාංකිකයන් ලෙස අප මේ මොහොතේ හදවතින් නොව බුද්ධියෙන් කටයුතු කරමින් ආවේගශීලීව නොසන්සුන්තාවයෙන් කටයුතු කරනු වෙනුවට ඉවසීමෙන් සන්සුන්ව කටයුතු කරමු. හැම විටම අනෙකාට ගරු කරමින් අවබෝධයෙන් මේ තීරණාත්මක මොහොතකට මුහුණ දෙමු.

සාමකාමී අරගල සාමකාමී විරෝධතා පැවැත්වීම ගැටලුවක් කරගත යුතු නැත. එම අරගල විරෝධතාවල නිරත මිනිසුන්ගේ හඬට කන් දෙමු. ඔවුන්ගේ ඉල්ලීම්වලට සවන් දෙමු. ඒ ඉල්ලීම්වලට යහපත් ප්‍රතිචාර දැක්වීම වෙනුවට විවිධ කූට දේශපාලන උපක්‍රම හරහා ජනතාව ප්‍රකෝප නොකිරීම සහ ඔවුන් ප්‍රචණ්ඩත්වයට යොමු නොකිරීම බලධාරීන්ගේ යුතුකමයි.

මේ මොහොත වන විට රටේ දෛනික ජන ජීවිතය මුළුමනින්ම කඩා වැටී ඇත. මේ තත්ත්වයෙන් ගොඩ ඒමට තිර අදිටනින් නීත්‍යානුකූලවූත්, සදාචාරාත්මකවූත් සාධාරණ ප්‍රවේශයකට එළඹෙමු.

පාලකයින් අත්තනෝමතිකව හැසිරෙනු වෙනුවට ජන මතයට ගරුකරමින් කටයුතු කළ යුතුව ඇත. හෙට අපේ රට විනාශ වනු දැකීමට අපි කවුරුත් කැමති නැත. ඒ වෙනුවෙන් සාමකාමීව පෙළ ගැසෙමු.

අවිහිංසාවාදී ප්‍රජාතන්ත්‍රවාදී රටක් අනාගත පරපුරට භාර දීමට බුද්ධිමත්ව පෙළගැසෙමු. වගකීම් ඉටු කරමු.

● **ඉම්තියාස් බාකීර් මාකාර්**



## සතියේ දේශපාලනය



### අගමැති සටනින් රනිල් ජයගත් හැටි

අප්‍රේල් 29 වැනි දා සිදු වූ සෙනසුරු මාරුවත් සමග රටේ දේශපාලන කරලියේ ලොකු විපිරියාසයක් වනු ඇතැයි කීවේ මේ රටේ ජ්‍යොතිෂ ශාස්ත්‍රඥයෝ ය. දේශපාලනඥයෝ වැඩිදෙනා එම මතය ප්‍රතික්ෂේප කර සිටියහ.

එහෙත් පසුගිය සති කිහිපය තුළ රාජපක්ෂවරුන්ගේ ආණ්ඩුවට මුහුණ පාන්නට සිදුව තිබූ අභියෝග හා විරෝධතා හමුවේ රාජපක්ෂවරුන් අතර සමගිය ද බිඳ වැටෙන්නට පටන් ගත් නිසා රාජපක්ෂ කඳවුර ඇතුළාන්තයේ නුපුරුදු වෙනස් යමක් සිදුවෙමින් පවතින බව ජනතාව දැන සිටියහ.

ජනාධිපතිවරයා තමන්ට කිසි ලෙසකත් ගෙදර යන්නට නොකියන බව විශ්වාස යැයි අගමැති මහින්ද කොපමණ කීවත් ජනාධිපතිවරයාට එය වෙනත් ආකාරයකින් කියන්නට සිදු වූයේ රටේ ඇතිව තිබූ වත්මන් උණුසුම් වාතාවරණය නිසාය. අවසානයේ ඇති වූයේ අගමැතිවරයා ධුරයෙන් ඉවත්ව යනවාද නැද්ද කියා දෙගිඩියාවකි.

ආණ්ඩු පක්ෂයේ මහින්දවාදීහු පිරිස අගමැතිවරයාට තනතුරේ බලය අත්නොහරින්නැයි බල කළ අතර ගෝඨාභයට පක්ෂපාත පිරිස හා ස්වාධීන වූ මන්ත්‍රී පිරිස මහින්දට ඉවත්වන්නැයි බලකර සිටියහ.

මහින්ද මේ මොහොතේ සිටියේ දෙලොවක් අතරය. පසුගිය සති අන්තයේ මේ පිළිබඳ දිගින් දිගටම සාකච්ඡා ඇති විය. ඒ අනුව බලන විට ඉකුත් 8 වැනි ඉරිදා ව තීරණාත්මක දවසක් විය.

### "තනතුරින් නොයන්න" ඇතුළෙන් ආ පීඩනය

ඉරිදා දිනයේ ආණ්ඩු පක්ෂයේ මහින්දවාදීන් අරලියගහ මන්දිරය තුළත් ඉන් පිටතත් සාකච්ඡා වට ගණනාවක්ම පවත්වනු ලැබූහ. මේ අතරින් බොහෝ දෙනකුට අවශ්‍යව තිබුණේ මහින්ද අගමැතිවරයාට ඉල්ලා අස් වන්නට ඉඩ දීමට නොව, ඔහුව තවදුරටත් තනතුරේ රඳවා ගැනීමට ය. බොහෝදුරට ඔවුන්ට තිබුණේ තම තමන්ගේ තනතුරු හා පදවි තානාන්තර නැතිවේ යැයි බියක් හා සංකාවක් බව පැහැදිලිවම පෙනෙන්නට විය.

මේ සම්බන්ධයෙන් ඉරිදා හවස අරලියගහ මන්දිරයේ පැවති සාකච්ඡාවලදී යම් යම් උණුසුම් තත්ත්වයන් පවා ඇති වූහ. මේ කෙසේ වෙතත් පසුගිය 6 වැනි සිකුරාදා පැවති කැබිනට් මණ්ඩල රැස්වීමෙන් අනතුරුව ආණ්ඩුවේ බහුතරයක්ම ඇමැතිවරු සිටියේ අගමැතිවරයාත් ඇමැති මණ්ඩලය අද ඉල්ලා අස්විය යුතුය, කියන මතයේය.

මේ අනුව යමින් ආණ්ඩුවේ බොහෝ මැතිඇමතිවරු හා මන්ත්‍රීවරු පළාත් පාලන ආයතන මට්ටමෙන් පක්ෂයේ කිට්ටුම ක්‍රියාකාරීන් සඳුදා උදේ කොළඹට රැගෙන එන්නට වැඩ කටයුතු සංවිධානය කළේ මහින්ද රාජපක්ෂ අගමැති වරයාට සුබ පතා සමුගැනීමේ උත්සවයක් පවත්වන්නට ය. එහෙත් මේ ජන හමුව සම්බන්ධයෙන්ද රැස්වීම් සංවිධායකයන් අතර පැහැදිලි එකඟතාවක් නොවූ බව පසුව සිදු වූ සිද්ධීන් අධ්‍යයනය කිරීමේදී පැහැදිලිවම තේරුම් ගත හැකි විය.

### ආණ්ඩුවක් හදන්න ජනපතිගෙන් යෝජනා...

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ පසුගිය සතිඅන්තයේ ඔහුගේ සමීපතමයන් සමඟ සාකච්ඡා කරමින් කල්පනා කළේ පාර්ලිමේන්තුවේ වැඩි දෙනෙකුගේ කැමැත්ත හා විශ්වාසය දිනූ අගමැතිවරයෙක් පත් කර ගැනීමේ කටයුත්ත ගැනය. එය හිතන තරම් ලේසි පහසු කාර්යයක් වූයේ නැත.

ජනාධිපතිවරයා පළමුවෙන්ම මේ ගැන රටේ ප්‍රධාන විපක්ෂය වන සමගි ජන බලවේගයේ නායකත්වය සමග සාකච්ඡා කළේය. එහෙත් සජිත් ප්‍රේමදාස ඒ සම්බන්ධයෙන් ස්ථිර වචනයක් දුන්නේ නැත.

''මම මොන දේශපාලන තීන්දුව ගත්තත් ගන්නේ පක්ෂයේ අයගේ කැමැත්ත අකැමැත්ත අනුව. මේ ගැන අපේ කෘත්‍යාධිකාරි මණ්ඩලය සමඟ සාකච්ඡා කරලා තීන්දුවක් දෙන්නම්" සජිත් කීවේය.

ඉන් අනතුරුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ ද මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත්විණි. එතන හිටියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු විපක්ෂයේ පක්ෂ එකොළහේ සන්ධානයයි. ආණ්ඩුවෙන් ස්වාධීන වූ පොහොට්ටුවේ මන්ත්‍රීවරු පිරිස ද ඊට එකතු වී සිටියහ.

කෙසේ වෙතත් ඔවුන් තුළ රටට පිළිගත හැකි හොඳ වැඩපිළිවෙළක් විය. පළමුව මෙම කණ්ඩායම විසින් ඉදිරිපත් කරන නම් කීපය අතරින් සුදුසු අය රටේ ජනාධිපතිවරයා විසින් තෝරා ගන්නටත් ඉන්පසුව ආණ්ඩුවක් සෑදීම සඳහා එකතු වන පක්ෂවල නායකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ජාතික විධායක මණ්ඩලය සමග ජනාධිපති සහ අගමැති සාකච්ඡා කර කැබිනට් මණ්ඩලය හා සෙසු නිලතල පත්කිරීමටත් මූලික එකඟතාවක් මෙම සාකච්ඡා වට තුළ ඇතිව තිබුණේ දින කිහිපයකට පෙර සිට ය. මේ හැරුණ විට ජනාධිපතිවරයා ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා වැනි පුද්ගලයින් කීප දෙනකු සමඟ ද සාකච්ඡා කර අග්‍රාමාත්‍ය ධුරය භාරගන්නා ලෙස අදහස් විමසා තිබූ බවද එළි විය.

ඒ අනුව අගමැතිවරයකු පත් කිරීමට හා ඊළඟ ආණ්ඩුව පත් කර ගැනීමට ජනාධිපතිවරයාත් සෙසු පාර්ශ්වත් අතර තිබූ සංවාදයට හා එකඟතාවට ශ්‍රී ලංකා නීතිඥ සංගමය ඇතුළු සෙසු සිවිල් සංවිධාන කීපයක ද දායකත්වය හා අවධානය යොමුව තිබූ යොමුව තිබූ බව පැහැදිලි විය. කොටින්ම නීතිඥ සංගමය මෙය සම්බන්ධයෙන් ඍජුවම මැදිහත් ව තිබූ බව පෙනෙන්නට විය. ඉකුත් 9 වැනිදා ඉතිහාසගත කලබැගෑනිය ඇතිවූයේ ඇති වූයේ ඒ අල්ලපනල්ලේ ය.

### අරගලයට එරෙහිව පොහොට්ටු අරගලය...

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂට සමීපව සිටි දේශපාලනඥයෝ හා ආධාරකරුවෝ පිරිස ඒ වන විටත් මතවාදීව දෙකට බෙදී සිටියහ.

''ජනතාව පාරට බැහැලා කියන්නේ ගෝඨා ගෝ හෝම් කියලා. එයානෙ වැරදි කළේ. එහෙමනම් එයා අස්වෙන්න ඕනා. අගමැති තුමා මොකටද අස් වෙන්නේ..." එක් පිරිසක් එසේ තර්ක කරමින් අගමැතිවරයා රඳවා තබා ගන්නට උත්සාහ කළ අතර තවත් පිරිසක් කියා සිටියේ මේ මොහොතේ ජනතා විරෝධය පිළිගෙන අගමැතිතුමා ඉල්ලා අස්වී ආණ්ඩුව විසුරුවා හැරීම වඩාත් සුදුසු බවය. මේ නිසා අගමැතිතුමා ද හිටියේ දෙලොවක් අතරය.

ඉකුත් නම වන සඳුදා උදේ පළාත් පාලන ආයතන මට්ටමින් හා වෘත්තිය සමිති මට්ටමෙන් සංවිධානය කර තිබූ අරලියගහ මන්දිරයේ රැස්වීමට ජනතාව පැමිණියේ පුළුල් හා අසහාය මහජන සේවාවකින් පසුව ඉවත් ව යන තම නායකයා ට අවසන් වරට ආයුබෝවන් කියා සමුගැනීමේ සමුගැනීමේ බලාපොරොත්තුවක් ඇතිවය. එහෙත් ඔවුන් වැඩිදියුණු කොට එහිදී මුහුණ දෙන්නට සිදුවූයේ බලාපොරොත්තු නොවූ අත්දැකීමටය. රැස්වීමේදී ජොන්ස්ටන් කතා කළේය. අනතුරුව රෝහිත අබේගුණවර්ධන කතා කළේය. පවිත්‍රා කතා කළාය. මේ කතා තුනම ඉල්ලා අස් වන්නට අගමැතිවරයාගේ හිත හදන කතා නොවීය. ඔවුන්ගේ ඉල්ලීම වූයේ උද්ඝෝෂකයන් සුළු පිරිසකගේ කුමන්ත්‍රණ හා බලකිරීම මත අගමැතිවරයා ඉල්ලා අස්විය යුතු නැති බවය. අගමැති සිය කථාව අතරතුර ජනතාවගෙන් ප්‍රශ්නයක් ඇසීය. තමන් තවදුරටත් රැඳී සිටිය යුතුද නැත්නම් ගෙදර යා යුතුද කියා ඇසූ ප්‍රශ්නයට ජනතාවගේ ප්‍රතිචාරය සතුටුදායක විය. රැස්වීම අවසන් විය. කවුරුන් හෝ නිවේදකයෙක් ශාලාවේ රැඳී උන් මහජනතාවට අරලියගහ මන්දිරයෙන් එළියට ගොස් දකුණට හැරී යළිත් දකුණට හැරී ගාලු පාරට පිවිස දිගටම යන්නට මාර්ග සැලැස්මක් කියාදුන්නේය. සියල්ල සංවිධානය කර යම් යම් පිරිස් මේ යන්නේ කොහාටදැයි කල්තියා දැන සිටියාට මහින්ද රාජපක්ෂට ආයුබෝවන් කියන්නට සැරසී පැමිණි බොහෝ දෙනෙක් ඊළඟට වන්නේ කුමක්දැයි කියා දැන සිටියේ නැත. අසූ තුනේ කළු ජූලියට පමණක් දෙවැනි වූ මහා ඛේදවාචකයකට මුල්වූ අවාසනාවන්ත සිද්ධි දාමය පටන් ගත්තේ මේ ජන බලවේගය ගාලුපාර ඔස්සේ ගාලුමෝදර පිටියට අවතීර්ණ වීමත් සමගය.

එතනින් පසු සිදුවූ දේ වචනෙන් විස්තර කර අමුතුවෙන් කිව යුතු නොවන්නේ ඇතැම් ජනමාධ්‍ය ඔස්සේ සමාජ මාධ්‍ය ඔස්සේ මේ රටේ ජනතාව ඒ සිදුවීම් සියල්ල නෙත් පුරා බලා අවසන්ව ඇති නිසාය.

එදා උදෑසන අරලියගහ මන්දිරයේ රැස්වීමට පැමිණි මහින්දවාදී කළහකරුවන් පිරිසක් සංවිධානාත්මකව ගෝඨාගෝගම වෙත දියත් කරන ලද ඒ තිරශ්චීන ප්‍රහාරයෙන් අනතුරුව සෑම තත්පරයක් පාසාම සිදු වූ දේ මේ රටේ දේශපාලනයේ දී බොහෝ සේ වැදගත් ය. රටේ ප්‍රධාන පුද්ගලික නාලිකා කිහිපයක් ඇතුළු ජාතික හා සමාජ මාධ්‍ය ජාල ඒ මුළු පහරදීම ම රටටම පෙනෙන්නට සජීවීව විකාශය කර තිබුණේ මේ රටේ තවත් ඛේදවාචක රාශියකට මග පාදා දෙමිනි. රටම ගිනි ගොඩක් බවට පත් කරන්නට නායකත්වය දෙමින් යැයි කීවාට වරදක් නැත. ''ගෝඨා ගෝ ගමේ නිරායුධ, නිර්පාක්ෂික අරගලකරුවන්ට මේ තිරිසන් ප්‍රහාරය එල්ල කරන්න පැමිණි රාජපක්ෂ මැරයෝ දැන් තමන් ආපු බස්වල නැගලා ගම් පළාත්වලට යන්න පටන් අරන් තියෙනවා. නිරායුධ උද්ඝෝෂකයන්ට ප්‍රහාර එල්ල කළ මේ මැරයො ඔබේ ප්‍රදේශය හරහා යද්දී ඒගොල්ලන්ව භාරගෙන සලකන්න ඔබටත් අවස්ථාව උදා වෙනවා. අපේ මේ අරගලයට යම් හෝ දායකත්වයක් සපයනවා නම් ළඟම නගරයට එන්න. පාර අයිනට එකතුවෙන්න. මේ එන අපරාධකාරයන් ගැන බලාගන්න" විද්‍යුත් නාලිකා කිහිපයක් විසින් අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ ඉහළ නායකයෙකු යැයි කියන මේ තරුණයාගේ එම අණ දීම හා ප්‍රකාශය සජීවීව විකාශය කර දැමූහ. අරගලයේ දෙවන මෙහෙයුම ක්‍රියාත්මක වූයේ එතැන් සිටය. අරලියගහ මන්දිරයේ තිබූ රැස්වීම සඳහා පිට පළාත්වලින් සෙනඟ පැමිණි බස් රථවල හා වාහනවල අංක තහඩු හා තොරතුරු රැගත් තවත් විස්තර පත්‍රිකාවක් ද ඉහත කී නිවේදනයට සමගාමීව සමාජ මාධ්‍ය ඔස්සේ ඒ වන විට රට පුරාම පැතිර ගොස් තිබිණි.

### අරගලයට ඉහළ අහසේ මඟුල්ගෙදර...

ගෝල්ෆේස් පිටිය යුද පිටියක්ව තිබූ සඳුදා උදේ ඒ ආසන්නයේ වූ ෂැංගිලා හෝටලයේ ලෝටස් ශාලාවේ ප්‍රකට දේශපාලඥයෙකුගේ දියණියක විවාහ වන මංගල උත්සවයක්ද පැවැත්විණි. විවාහ වූයේ රංජිත් සියඹලාපිටිය ගේ ලොකු දියණියයි. ඇගේ අතගත් මනාලයා ගේ දෙමවුපියන් ද කෑගල්ල ප්‍රදේශයේ සුප්‍රකට පවුලක නීතිඥ යුවළකගේ පුතණුවන් වීම නිසා මංගල උත්සවය සඳහා ඇදී ආ ආරාධිතයන් පිරිසද සුළුපටු නොවීය. ජනාධිපති ගෝඨාභය, අගමැති මහින්ද, විපක්ෂ නායක සජිත්, එජාප නායක රනිල් ඇතුළු පාර්ලිමේන්තුවේ අති විශාල ගණනක් දේශපාලනඥයෝ මෙම මංගල උත්සවයට සහභාගි වීමට නියමිතව තිබිණි. එහෙත් මේ සුවිශේෂී ඛේදවාචකය ඇතිවූයේ එම විවාහ මංගල උත්සවය ෂැංග්‍රිලා හෝටලයේ පැවැත්වෙන අතරවාරයේ ය. මංගල උත්සවය පසෙක තබා සියල්ලෝම උඩු මහලේ වීදුරු ජනේල අසලට වී ඉන් පහළ ගෝල්ෆේස් පිටියේ සිදුවූ අවාසනාවන්ත සිදුවීම් සියල්ල දෙස අනිමිස ලෝචනයෙන් යුතුව බලා සිටින ආකාරය දැක ගත හැකි විය. මනාල යුවළද වෙන කළ හැකි කිසිවක් නොමැතිව එයම කළහ. ජනාධිපති ගෝඨාභය සජිත් ප්‍රේමදාසට දුරකථනයෙන් කරන ලද ආරාධනයට පසු පසුගිය සඳුදා උදේ විශේෂ පාර්ලිමේන්තු කණ්ඩායම් හමුවක් කැඳවනු ලැබීය. ජනාධිපතිවරයා කරන ලද ආරාධනාව මෙහිදී සජිත් මන්ත්‍රීවරුන්ට හෙළිදරව් කළේය. ''මම මන්ත්‍රීවරුන්ගේ අදහස්වලට පිටින් එකක් කරන්නේ නෑ... අනිත් එක අපි කරන දෙයින් මාසයක් තිස්සේ දැන් ගෙ ා්ල්ෆේස් පිටියේ අරගල කරන අරගලකරුවන්ගේ අපේක්ෂාවන් ඉටු වෙන්නත් ඕන... මොකක්ද ඕගොල්ල මේ ගැන කියන්නෙ..." ''රට වැටිලා ආර්ථික වශයෙන් හෙම්බත් වෙලා ඉන්න මේ වෙලාවේ අපි දේශපාලනය ගැන හිතනවට වඩා රට හා ජනතාව ගැන හිතන්න ඕන..." මන්ත්‍රීවරු කීහ. ''විධායක ජනාධිපතිකම අහෝසි කරන්නත් ඕනි වගේම ගෙ ා්ඨාභය යන්නත් ඕන..." සජිත් සුපුරුදු වාක්‍ය කියාගෙන ග යේය. හරින් ඇතුළු පිරිසක් මෙයට ප්‍රති තර්ක ගොඩනගමින් වාද කරන්නට වූහ. ගෝඨා ගෝ ගමට රාජපක්ෂ පෙළපාලියේ අය පහර දුන් බවට ආරංචිය ලැබුණේ ඒ අතරතුරයි. අරගලයට පහරදෙන වීඩියෝවන් කීපයක් මේ වෙලාවේ කාවින්ද ජයවර්ධන සිය නායකයා ට පෙන්වා සිටියේය.

''අපි වහාම මෙතෙන්ට යන්න ඕන. ඉක්මනින් වාහන ගන්න..." සජිත් කීවේය.

වාහනවල නැගී සජිත් ඇතුළු පිරිස යන ගමනේදී කාවින්ද ජයවර්ධන ෆේස්බුක් ලයිව් විකාශයක් ද කළේය. ඒ මොහොත වන විට පහරදුන් මැර පිරිස් ගෝල්ෆේස් පිටියෙන් ඉවත්ව ගොස් තිබුණත් පොලු මුගුරු රැගත් තව පිරිසක් ගෝල්ෆේස් පිටියේ සිටියහ. කාවින්ද ජයවර්ධන ඔවුන්ව හැඳින්වූයේ මහින්දගේ මැරයෝ කියාය. වාහනවලින් බැස සජිත් ගෙ ා්ල්ෆේස් පිටිය වෙත ඇවිදගෙන යද්දී ඔහුට ඛේදවාචකයකට මුහුණ දෙන්නට සිදු විය. පොලු මුගුරු රැගත් කලහකාරීන් පිරිසක් සජිත් ඇතුළු පිරිසට පහර දෙන්නට පටන් ගත්හ. කාවින්දගේ විකාශය එතෙකින් නිමාවට පත්විය. සජිත් ප්‍රේමදාසට ඒ මොහොතේ කවුරුන් විසින් පහර දෙනු ලැබූවත් සජිත් එම ප්‍රහාරය ද හුවා දැක්වූයේ මහින්දගේ මැරයන් විසින් කරන ලද පහරදීමක් කියාය. එහෙත් ඒ වන විට සජීවීව විකාශය වෙමින් තිබූ යම් යම් චැනල්වල හා සමාජ මාධ්‍යවල දර්ශනවලට අනුව සජිත් ට පහර දුන්නේ අරගලයේම සිටි තරුණයන් පිරිසක් බව පැහැදිලිව ආනාවරණය විය. ඔහුට පළමු ප්‍රහාරය එල්ල කළේ එක්තරා කාලයක තමන්ට ලැම්බෝගිනියක් අවශ්‍ය යැයි කියමින් හඬා වැටුණු තරුණ කලාකරුවකු වීම තුළ, එම ප්‍රහාරය මෙහෙයවණු ලැබුවේ කවර දේශපාලන දහරාවක් විසින් දැයි සජිත් හැර අන් ප්‍රේක්ෂක සියල්ලෝම සැක හැර වටහාගෙන තිබිණි.

### කට්ටියක් බේරේ තව කට්ටියක් බේරේ...

අරගල භූමිය වෙත සංවිධානාත්මකව පහරදුන් කළහකාරී පිරිස් බලාපොරොත්තු වූයේ අරගල භූමියෙන් අරගලකරුවන් පන්නා දැමූ පසු ඉතුරු ටික ආණ්ඩුවේ හමුදාවන් පැමිණ බලා ගනිවී යැයි කියාය.

එහෙත් එම සිද්ධිය නිසා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ හොඳටම උරණ වී සිටියේය. මෙතෙක් දිනක් ඉතා සාර්ථකව යම් යම් පාර්ශ්වයන් සමග පවත්වාගෙන එමින් තිබූ සාකච්ඡා හා එකඟතා සියල්ල මෙතනින් පසු අවලංගු වී යන බව ඔහු වටහා ගත්තේය. මේ නිසා ඔහු ක්‍රියා කළේ අරගලයට පහරදුන් කළහකරුවන් වෙනුවෙන් තදින් නීතිය ක්‍රියාත්මක කිරීමේ ස්ථාවරයේය. අවසානයේ අරගලයට හිතාමතාම පහර දෙන්නට පැමිණි කළහකරුවන්ට අවාසනාවන්ත ඉරණමකට මුහුණ දෙන්න සිදුවිය.

අරගලයට පහර දී පැන යන මහින්දගේ කළහකරුවන් කොටුකරගෙන පහර දෙන්නට තවත් ක්ෂණික මෙහෙයුමක් මේ අතරවාරයේ ක්‍රියාත්මක වූයේ කොළඹ නවම් මාවත ගංගාරාමය කොම්පඤ්ඤ වීදිය ආදී ප්‍රදේශවල නාගරික පැල්පත්වාසී හා මහල් නිවාස වාසී මුස්ලිම් දෙමළ සිංහල තවත් කළහකාරීන් පිරිසකගේ මැදිහත්වීමෙනි. ඔවුන් මඟ රැක සිට මහින්දගේ කළහකාරීන් පැමිණි බස්වලට ගොඩවෙන්නට නවම් මාවත වෙත පැමිණි පිරිස් සොය සොයා මදි නොකියන්නට නෙළන්නට වූහ. කිසිදු ඉවක් බවක් නොමැතිව ඇතැම් පිරිස් බේරේ වැව වෙත තල්ලු කර දැමූ හ. අවසානයේ වූයේ ගෝල්ෆේස් අරගලයට පහරදෙන්නට සම්බන්ධ වූ පිරිසටත් ඒ කිසිවකට සම්බන්ධ නොවී මහින්ද මහත්තයට ආයුබෝවන් කියන්නට පැමිණි දෙපිරිසටත් එක ලෙස දහම් මාවත අවට ගමේ චන්ඩින්ගේ අනේකවිධ වධහිංසාවලට මුහුණ දෙන්නටය. පිරිසක් හිස් ලූ ලූ අත පැන දිවූහ. පිරිසක් ගුටි කෑහ. තව පිරිසක් බේරෙ වැවට දැමූහ. වැඩි දෙනෙක් ආපසු අරලියගහ මන්දිරේටම රිංගා ගත්හ.

### මරබිය මැද රජමැඳුරේ රාත්‍රිය...

මහින්දවාදී කලහකාරීන් විසින් ගෝල්ෆේස් පිටිය සාමකාමී අරගලයට පහරදී තුවාල කර දමනු ලැබූ සංඛ්‍යාව විස්සකට වැඩි නැත. එහෙත් ඊට වන්දි වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුටත් ඔහුගේ ආරක්ෂක නිලධාරියාටත් ජීවිත බිලි දෙන්නට සිදුවූයේ නිර්පාක්ෂික සාමකාමී අරගලයේ සන්නද්ධ අංශය රට පුරා දියත් කරනු ලැබූ ඒකාබද්ධ මෙහෙයුම්වල ප්‍රතිඵලයක් හැටියටය. පහරදී අතපය කඩා ඔලු පලනු ලැබූ සංඛ්‍යාව තුන්සියයකට ආසන්න විය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හා ඔවුන්ගේ හිතවතුන්ට ආධාරකරුවන්ට නිලධාරීන්ට අයත් ගෙවල් දෙසීයකට වඩා ගිනි පත් කර දමනු ලැබූහ. අරලියගහ මන්දිරයට රිංගාගත් ආධාරකරුවන්ගේ තත්ත්වය ඉතා සෝචනීය විය. ඇතැම්හු අරගලකාරී කලහකරුවන්ගෙන් හොඳ හැටි ගුටි පූජාවට මුහුණ දුන් අය වූහ. බොහෝ දෙනකුගේ ඔලු පැළුම් තිබිණි. අතපය කඩා දැමීම් හා කපා කොටා දැමීම් ද ගණනාවකි. එහෙත් ඔවුන්ව රෝහල්ගත කිරීමද අවසානයේ ප්‍රශ්නයක් වූයේ ඔවුන්ව පටවා යවන ගිලන්රථ ද ආපසු හා හරවා එවන්නට තරම් කලහකාරීන් සාහසික වී සිටි නිසාය. අවසානයේ යුද හමුදා කොමාන්ඩෝ බළකායේ ආධාරයෙන් ඔවුන්ව රෝහල්ගත කරන්නට හැකි වුවත් රෝහලේ දී පවා කලහකාරීන් මැදිහත්ව තුවාලකරුවන්ට පහර දෙන්නට හා හිංසා පීඩා කරන්නට වූහ. වෛද්‍ය වෘත්තියේ ආචාරධර්ම කියා දෙමින් ඔවුන්ව බේරා ගන්නට වෛද්‍යවරු ඉදිරිපත් වුවත් ඔවුන්ටද කලහකාරීන්ගේ බලහත්කාරකම් අඩුවක් නොවීය. එදින මුළු රාත්‍රියම පහන් වන තුරු කලහකරුවන් අරලියගහමන්දිරය වට කරගෙන සිටියහ. කඩා බිඳ විනාශ කරනු ලැබූ බස්රියක් පදවාගෙන එක් අවස්ථාවක කලහකාරීන් අලියගහ මන්දිරයේදී නවම් මාවත ගේට්ටුව වෙත පහර දුන්හ. එය කඩා බිඳ දමා ඇතුළට ඒමේ උත්සාහය පරාජය කළේ යුද හමුදාවේ හා විශේෂ කාර්ය බළකායේ සීමිත ආරක්ෂකයන් නිලධාරීන් පිරිස්කගේ කැපවීම් නිසාය. අවස්ථා කිහිපයකදීම අගමැතිවරයා තම සහෝදරයාට දුරකථනයෙන් කතා කරමින් අරලියගහ මන්දිරයේ ආරක්ෂාව තහවුරු කරන මෙන් ඉල්ලා සිටියහ. අරලියගහ මන්දිරයේ ආරක්ෂාව භාර ආරක්ෂක ප්‍රධානීන් ද තම තමන්ගේ ප්‍රධානීන් අමතා ආරක්ෂාව මදි යැයි කියමින් බැගෑපත් වූහ. අවස්ථා දෙකකදීම ගේට්ටු කඩා ඇතුළට එන්නට කලහකාරීන් උත්සාහ කළත් යුද හමුදාව එම උත්සාහයන් ව්‍යාරථ කළේ අපමණ කැපවීමෙන් නිදි වර්ජිතව රැය පහන් කිරීම නිසාය.

### වැටුණු රට ගොඩගන්න රනිල්ට හැකිවෙයිද...

අගමැතිකම භාරගෙන අලුත් ආණ්ඩුවක් හදන්න දායක වන්නැයි ජනාධිපතිවරයා කරනු ලැබූ ආරාධනයෙන් පසුව රනිල් වික්‍රමසිංහ තම හිතවතුන් හමුවූයේය.

''ඔබතුමා ඉස්සරවෙලාම ඔය යෝජනාව භාර ගන්න එපා. සජිත් තමයි විපක්ෂනායක. එයා මේ වෙලාවේ වගකීම භාරගන්න සතුටු නම් අපට තියෙන්නේ ඒකට ඉඩ දීලා පැත්තකට වෙලා උදව් කරන එක... එයා අකමැති නම් දෙවනුව අපි සලකා බලමු...." රුවන් විජේවර්ධන යෝජනා කළේය. මේ අතර සමගි ජන බලවේගයේ තරුණ මන්ත්‍රීවරුන්ගෙන් මෙන්ම පොහොට්ටුවේ තරුණ මන්ත්‍රීවරුන්ගෙන් ද මේ පිළිබඳව විමසා රනිල් වෙත පැමිණි දුරකථන ඇමතුම්වල නිමක් නොවීය.

''ඔයගොල්ලො මට සහාය දෙනවා නම් මට පුළුවන් අභියෝගය භාර ගන්න... හැබැයි ඉතින් ඉස්සර වෙලා විපක්ෂ නායකතුමා මොකක්ද ගන්න පියවර කියලා අපි බලන්න ඕන." රනිල් උත්තර දුන්නේය.

''අගමැතිකම භාරගන්නට නම් දැඩි කොන්දේසි දමා සජිත් ඉදිරිපත් කර තිබූ යෝජනාව ජනාධිපතිවරයාගේ නොසතුටට හේතුවක් විය. සජිත් තනතුර භාරගන්නට නම් ජනාධිපති ගෝඨාභය එම තනතුරින් ඉවත් වීමේ වැඩකටයුතු ආරම්භ කළ යුතු බව ඔහුගේ කොන්දේසි අතර තිබිණි. එහෙත් අගමැතිකම භාරගන්නට රනිල් එබඳු කිසිදු කොන්දේසියක් ඉදිරිපත් කර තිබුණේ නැත.

''මේ වෙලාවේ මේ රටට අවශ්‍ය වෙන්නේ කොන්දේසි දම දම ආණ්ඩුවක් හැදීම කල් දමන එක නෙවෙයි. පිළිගත හැකි ආණ්ඩුවක් හදලා ජාත්‍යන්තරයේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශ්වාසය දිනා ගැනීම. ස්ථාවර ආණ්ඩුවක් හැදුනොත් තමයි ජාත්‍යන්තරය උදව් කරන්නේ. ස්ථාවර ආණ්ඩුවක් මේ සති දෙක තුළ නොහැදුනොත් මේ ඉන්න මහ බැංකුවේ අධිපතිතුමා ඉල්ලා අස් වී යන බව දැනුම් දීලා තියෙනවා... ඒක කෙටිකාලීනව ආණ්ඩුවක් හදලා මේ තියෙන ප්‍රශ්න ටික විසඳගන්න මම එකඟයි. රට කෙලින් කර කරගත්තට පස්සේ ඊළඟට අපි දේශපාලනය කරමු..." රනිල් වික්‍රමසිංහ ගේ ස්ථාවරය ඉතා පැහැදිලි අවංක එකක් විය. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ද එය සතුටින් පිළිගෙන තිබීම විශේෂත්වයකි.

### පක්ෂ 11ට නොදන්නවා රනිල්ට කතා කරලා...

මේ කලබැගෑනිය අතරේ අගමැතිවරයෙක් ඉක්මනට පත්කර ගැනීමට ජනාධිපතිවරයාට අවශ්‍ය විය. ජනාධිපතිවරයා ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමය ද මැදිහත් කරගෙන පක්ෂ එකොළහේ සන්ධානය, සමගි ජන බලවේගය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ආණ්ඩුවෙන් ස්වාධීන වූ මන්ත්‍රී පිරිස හා අනෙකුත් සෙසු දෙමළ පක්ෂ එකමුතුවෙන් සාකච්ඡාවක් අරඹා තිබිණි. එහි යම් යම් එකඟතා ගණනාවකට ද පැමිණ සිටියහ.

ඒ අතරතුර හදිසියේම ඔහු රනිල් වික්‍රමසිංහ සමග ඇති කරගෙන තිබූ එකඟතාවය ක්‍රියාවට නඟන්නට තීරණයක් ගත්තේය. එම තීරණය ගැන කිසිවක් නොදැන පක්ෂ එකොළහේ සන්ධානය එදින වෙනම සාකච්ඡාවක් කළේ මෙසේය. බදාදා උදේ ටිරාන් අලස්ගේ කාර්යාලයේදී විපක්ෂයේ පක්ෂ එකොළහේ කණ්ඩායම සහ ආණ්ඩුවෙන් ස්වාධීන වූ කණ්ඩායම එක්වී වෙනම සාකච්ඡාවක් පවත්වනු ලැබුවේය. ඊළඟ ආණ්ඩුව පිහිටුවීමේ කටයුත්ත කෙසේ කරන්නේද කියා ඔවුන් එහිදී සාකච්ඡා කළහ. පළමු මාතෘකාව වූයේ ජනාධිපති පත් කිරීමයි. විජේදාස රාජපක්ෂ, නිමල් සිරිපාල ද සිල්වා, ඩලස් අලහප්පෙරුම යන තිදෙනා ද මෙම සාකච්ඡාවට සහභාගි වී සිටියහ.

"කවුරු අගමැති වුණත් වැඩක් නෑ... මේක සර්ව පාක්ෂික ආණ්ඩුවක් වෙන්න නම් ජේවීපී ඒකයි සජබෙයි මේකට හවුල් කරගන්න ඕන. එහෙම නැත්නම් පොහොට්ටුව විතරක් හදන ආණ්ඩුවකට අපිට සහයෝගය දෙන්න බැහැ. අපි ස්වාධීන වෙනවා.." මහින්ද අමරවීර හා ලසන්ත අලගියවන්න පක්ෂ 11 සන්ධානය ඇතුළේ තිබූ ප්‍රශ්නයක් නිසා තර්ක විතර්ක කර නැගිට ගියහ. "අගමැතිකමට යෝජනා කරපු නම් අතර මගේ නම මුලදී තිබුණා. දැන් හැලිලා තියෙන්නෙ කොහොමද..." නිමල් සිරිපාල ද සිල්වා ප්‍රශ්න කළේය.

"ඔබතුමාගේ ප්‍රකාශ පරස්පරයිනේ. දැන් ඉස්සෙල්ලා පක්ෂයක් හැටියට කිව්වා ආණ්ඩුවට සහයෝගය නොදී ස්වාධීන වෙනවා කියලා. දැන් ඒ පාර අහනවා ඇයි මගේ නම නැත්තෙ කියලා..." ඒ ගැනද ලොකු කතාබහක් ඇති විය. ආණ්ඩුවට තමන් ද එකතු වන්නේ නැතැයි කියමින් නිමල් සිරිපාල ද තර්ක කළ අතර එමගින් ඇති වූ ප්‍රශ්නයක් නිසා ඔහු ද නැගිට ගියේය. "අපි මේ නම් තුනම ජනාධිපතිතුමාට යවමු ඕන එකක් කරගන්න..." මෛත්‍රීපාල සිරිසේන කීවේය. "අවශ්‍ය නම් මගේ නම වුණත් මෙතනින් අයින් කරන්න. මේ විදියට නම් පටලවාගෙන අපි අපි වාද කරන්න හොඳ නෑ. මේ වෙලාවේ රටේ ලොකු ප්‍රශ්නයක් තියෙනවා. දේශපාලනය කරන්න කලින් රට ගොඩගන්න තැනකට අපි විසඳුම් හොයන්න ඕන..." ඩලස් කීවේය. එම සාකච්ඡාව එතරම් උණුසුම් එකක් විය. ඉක්මනින් අවසන් විය.

### රනිල් තෝරාගත් බව ජනපති දැනුම් දෙයි

ජනාධිපතිවරයා බ්‍රහස්පතින්දා උදේ දහයට සූම් තාක්ෂණය ඔස්සේ හිටපු කැබිනට් අමාත්‍යවරුන්ගේ රැස්වීමක් කැඳවූයේය. රැස්වීම සඳහා අමාත්‍යවරු 16 දෙනෙක් සූම් ඔස්සේ ඉදිරිපත් විය.

ඒ වන විට රට මූල්‍යමය වශයෙන් අසීරු අඩියකට වැටී තිබූ අතර මහ බැංකුවේ අධිපතිවරයා ද ස්ථාවර ආණ්ඩුවක් සාදාගන්නේ නැතිනම් තමන් තව සතියක් බලා ඉල්ලා අස් වී යන බවට ද අනතුරු අඟවා තිබිණි. තත්ත්වය මෙසේ තිබියදී ජනාධිපතිවරයාට අවශ්‍ය වූයේ ඉතා ඉක්මනින් අගමැතිවරයකු තෝරා ගැනීමට ය. "දැනටමත් ඒ සඳහා අපේ නම් තුනක් ඔබතුමා වෙත ඉදිරිපත් කරලා තියෙනවා..." හිටපු ඇමැතිවරයෙක් කීය.

"මට නම් තුනක් ඇවිල්ලා තියෙනවා නම් තමයි... හැබැයි මට මෙතන ලොකු ගැටලුවක් තියෙනවා. මේ වෙලාවේ තානාපතිවරු, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නියෝජිතයෝ, ව්‍යාපාරික ප්‍රජාව මට කතා කරලා කියන යෝජනාවක් තියෙනවා. ඒගොල්ලෝ කියනවා ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් තියෙන පළපුරුදු නායකයෙකුට මිස මේ වෙලාවේ මේ තියෙන ප්‍රශ්නයට උත්තර හොයන්න බෑ කියලා. එයාලා රනිල් වික්‍රමසිංහගේ නම යෝජනා කරනවා. ඕගොල්ලෝ මොකද ඒ ගැන කියන්නේ..."

හිටපු ඇමැතිවරු කිසිවක් කීවේ නැත.

"එයා එක්කත් ටිකක් කතා කරලා බලන්න. එයාට හොඳ අයිඩියාස් තියනවා. ලෝකෙ පිළිගැනීමක් තියෙනවා."

"ඒ වගේම එතුමන්ට පාර්ලිමේන්තුව ඇතුළේ හොඳ පිළිගැනීමක් තියෙන්නත් ඕන..." මන්ත්‍රීවරු තර්ක කළහ.

අවසානයේ එම යෝජනාව අනුමත කළේය. ඔහු එහි තිබෙන යෝග්‍යතාව ගැන ද බොහෝ කරුණු කීවේය.

අග්‍රාමාත්‍ය ධුරය භාරගැනීමට සජිත් ප්‍රේමදාස මග හැරීම සම්බන්ධයෙන් පක්ෂය අභ්‍යන්තරයේ ද ප්‍රශ්න රැසක් මතු විය. පක්ෂය ඇතුළාන්තයේ පසුගිය බදාදා පැවැති රැස්වීමේදී මේ පිළිබඳ සාකච්ඡා වූයේය. හරීන් ප්‍රනාන්දු ඇතුළු කණ්ඩායමක් මෙයට තදින්ම විරෝධය ප්‍රකාශ කළේය. සජිත් මේ ගැන නිසි පිළිතුරක් ලබා දී නිසි පරිදි ක්‍රියා කරන්නෙ නැත්නම් තමන් ඇතුළු මන්ත්‍රීවරු කිහිප දෙනෙක් වහාම ස්වාධීන වී රටේ අනාගතය වෙනුවෙන් කටයුතු කරන්නට කැපවෙන බව ඔහු එළිපිටම කියාපෑවේය. ඔහුගේ සහයෝගය ඒ වන විටත් ආණ්ඩුව භාර ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින රනිල් වික්‍රමසිංහට ලබාදෙන බවට ද කතා පැතිර ගියේය. පක්ෂයේ බොහෝදෙනකු කියන්නට වූයේ අග්‍රාමාත්‍ය ධුරය ලබා ගෙන රට නිවැරදි මාවතට ගෙන යෑම සඳහා ස්වභාවධර්මය විසින් මේ අවස්ථාව සමගි ජන බලවේගයට ලබාදුන් වාසනාවක් බවය. අවසානයේ සජිත් ද මේ ගැන ගැඹුරින් කල්පනා කළේය.

### සජිත් ප්‍රමාදයි රනිල් ඉක්මන් වෙයි

කෙසේ වෙතත් අවසානයේ රනිල් වික්‍රමසිංහ මහතා අපේ රටේ ඊළඟ අගමැති බවට පත්විය. කොතරම් විවේචන තිබුණත් රනිල් ඒ කිසිවක් ගණන් ගත්තේ නැත.

රනිල් පත්වන්නට ඔන්න මෙන්න තිබියදී සජිත් ප්‍රේමදාස ද ජනාධිපතිවරයා වෙත ලිපියක් යවනු ලැබීය. පෙර ඉදිරිපත් කරන ලද කොන්දේසි ලිහිල් කරමින් තමන් මේ යෝජනාවට එකඟ බව ඔහු එහි කියා තිබිණි. එහෙත් ඒ වන විට සජිත් බොහෝ සේ ප්‍රමාද වී තිබිණි. රනිල්ගේ අත්සන් කිරීම තහවුරු විය. බ්‍රහස්පතින්දා හවස ජනාධිපති මන්දිරයේ දී රනිල් ඊළඟ අග්‍රාමාත්‍යවරයා ලෙස දිවුරුම් දුන්නේ ය.

● බුලිත ප්‍රදීප් කුමාර

# ජර්මන් ජාතික පෙම්වතා වියපත් ශ්‍රී ලාංකික පෙම්වතියගේ මිලියන තුනකට විදලා...

විමලා කන්තලේ වෙන්ඩ්‍රාසන්පුර ප්‍රදේශයේ පදිංචි අවිවාහක කාන්තාවකි. වයස අවුරුදු හැත්තෑවකි. තනියම ජීවත්වන ඇය කිහිපවරක්ම ප්‍රේමයෙන් පරාද වූ තැනැත්තියකි. නව යෞවන වයසේදී පටන්ගත් ප්‍රේම සම්බන්ධතා බිඳ වැටීම නිසා අවසානයේ ඇය අවිවාහකව ජීවත් වීමට තීරණය කළාය.

ආදරයෙන් පැරදුනත් ඇය සුඛෝපභෝගී ජීවිතයක් ගත කළාය. ඒ සඳහා අවශ්‍ය කරන මුදල් හදල් ඇයට ඇතිතරම් තිබුණි. වයස ඉලක්කමක් පමණක් කරගත් ඇය කොණ්ඩය කොටට කපා තරුණියන් මෙන් ඇඳුම් පැළඳුම් ඇඳ විවිධ විලාසිතා පවා සිදු කළාය. එයට අමතරව සතියට වරක් දෙවරක් සැලෝන්වලට ගිය ඇය නිරතුරුවම උත්සාහ කළේ තම මහලු පෙනුම තරුණ පෙනුමක් බවට පත්කර ගැනීමටයි.

එලෙස ජීවත්වන ඇය ජීවිතයේ තනිකම, පාළුව, කාන්සිය මකා ගැනීම සඳහා ෆේස්බුක්, වට්ස්ඇප් ආදිය භාවිත කිරීමට පුරුදු වී සිටියාය. ඒ හරහා මිතුරු මිතුරියන් ඇසුරු කළ ඇය ඔවුන් සමග දුක සැප ද බෙදා ගත්තාය. දැනට මාස කිහිපයකට පෙර ෆෙඩ්රික් නමැති ජර්මන් ජාතිකයකු වට්ස් ඇප් හරහා ඇයගේ මිතුරෙකු බවට පත්විය. ඔහු සමඟ ඇය නිතරම කෙටි පණිවිඩ හුවමාරු කර ගත්තේය. එම පුද්ගලයා දිනක් ඇයගේ වට්ස් ඇප් ගිණුමට මෙලෙස පණිවුඩයක් තැබුවේය.

''මාස කිහිපයක ඉඳන් අපි එස්. එම්. එස්. වලින් පණිවුඩ හුවමාරු කරගන්නවා විතරයි. ඔයා හොඳ කෙනෙක් කියලා තේරෙනවා. ඒක නිසා මම ආසයි ඔයත් එක්ක කතා කරන්න. මගේ හැම විස්තරයක්ම ඔයාට කියන්න. වරදවා මං ගැන හිතන්න එපා. ඔයා කැමතිනම් විතරක් අපි කතා කරමු.''

විමලාගේ සිතේ ද එම පුද්ගලයා පිළිබඳව මැවී තිබුණේ යහපත් ප්‍රතිරූපයකි. එම නිසා ඔහුගේ ඉල්ලීම අහක දැමීමට ඇය කිසිසේත් කැමති වූයේ නැත. ඒ අනුව ඇය ඔහුට මෙලෙස කෙටි පණිවිඩයක් තැබුවාය.

''ඇයි මම ඔයා ගැන වැරදියට හිතන්නෙ. ඔයා ඕන වෙලාවක මට කෝල් කරන්න.''

එම කෙටි පණිවුඩය දුටු විගසම ෆෙඩ්රික් ඇමතුමක් ලබා ගෙන ඇය සමඟ මෙලෙස කතා බස් කළහ.

''හෙලෝ විමලා මම ෆෙඩ්රික්.''

''ඔව් මම දන්නවා. ඉතින් කොහොමද.''

''මම හොඳින් ඉන්නවා. ඔයාට කොහොමද?''

''මමත් හොඳින් ඉන්නවා.''

''මෙච්චර කල් අපි එස්. එම්. එස්. වලින් විතරයිනේ දැන හැඳින ගත්තේ. මට හිතුනා ඔයත් එක්ක කතා කරන්න.''

''ඒකනේ. ඉතිං කියන්න ඔයා ගැන විස්තර.''

''ඔයා දන්නවනේ මම ජර්මන් ජාතිකයෙක් කියලා. මගේ බිරිඳ මැරිලා දැන් අවුරුදු ගාණක් වෙනවා. මට ළමයි දෙන්නෙක් ඉන්නවා. ඒ දෙන්නත් විවාහ වෙලා වෙනම ඉන්නේ. දැන් මම තනිකඩ ජීවිතයක් ගෙවන්නේ.''

''එහෙමද. මම නම් විවාහ වෙලා නෑ තවම.''

''ඇත්තටම ඔයා මැරි කරලා නැද්ද?''

''නැහැ ඇත්තටම නැහැ.''

''ඇයි අනේ තවමත් ලස්සනට ඉන්නවා. මැරි කළේ නැත්තේ.''

''ඒක ලොකු කතාවක්. මම කැමති නැහැ දැන් ඒ ගැන මතක් කරනවාටත්.''



''සමාවෙන්න. මම ඔයාගේ හිත රිද්දුවා නම්.''

''නැහැ ඔයා මගේ හිත රිද්දුවේ නැහැ. මම කිව්වේ මගේ හිතේ තියෙන දේ. ඒ ගැන ඔයා කලබල වෙන්න එපා.''

''හරි අපි ඒ ගැන කතා නොකර ඉමු.''

''ඒක නෙවෙයි මම ඔයාගෙන් ප්‍රශ්නයක් අහන්නද?''

''ඕන දෙයක් අහන්න විමලා. මම අවංකවම උත්තර දෙනවා.''

''ඇයි ඔයා ආයි කසාද බැන්දේ නැත්තේ.''

''මට ආයි කසාද බඳින්න සුදුසු කෙනෙක් හම්බ වුණේ නැහැ.''

''ඇයි ඔය රටේ ඕන තරම් ලස්සන කෙල්ලො ඉන්නේ.''

''ඒක නම් ඇත්ත. ඒත් මට ගැළපෙන කෙනෙක් හම්බ වුණේ නැහැ.''

''තවමත් හොයනවද ඔයා කෙනෙක්ව''

''ඔව් මට ගැළපෙන කෙනෙක් හම්බ වුණොත් මම කසාද බඳිනවා. මට ඇතිවෙනකන් සල්ලි තියෙනවා. මට ඒ සල්ලි වලින් කසාද බඳින කෙනත් එක්ක සුපිරි ජීවිතයක් ගත කරන්න පුළුවන්.''

''සල්ලි තියෙනවා නම් හොඳ කෙනෙක් හොයාගන්න පුළුවන්නේ.''

''අනේ එහෙම බැහැ. ගොඩක් අය මට කැමැති වෙන්නේ මගේ සල්ලි නිසා. මම එහෙම අයට කොහෙත්ම කැමැති නැහැ.''

''ඔව් ඔයා කියන කතාවත් ඇත්ත. ගොඩක් ගෑණු කැමති සල්ලිවලට විතරයි.''

''මම හිතන්නෙ ඔයා මැරි කරානම් හොඳයි කියලා.''

''මටත් එහෙම හිතෙන වාර අනන්තයි. ඒත් මට ගැළපෙන කෙනෙක් මට හම්බ වුණේ නැහැ.''

''ඉතින් දැන් හොයාගන්න.''

''ඇත්තටම මං මේ රටේ අයට දැන් කැමති නැහැ. දෙන්නෙක් තුන්දෙනෙක් මාව රැවැට්ටුවා.''

''එහෙමද ?''

''ඔව් ඒක තමයි මම මැරි නොකරන්න ප්‍රධානම හේතුව.''

''දැන් ඔයා ඕවා ගැන හිතලා දුක්වෙන්න එපා. හිත හොඳ අයට තමයි වරදින්නේ.''

''අනේ නැහැ මට ඒ ගැන කිසිම දුකක් නැහැ දැන්.''

''ඔයාගේ ඒ කතාව ඇහුවම මට ගොඩක් දුක හිතුනා ඔයා ගැන.''

''ඒ සිද්ධියත් එක්ක පිරිමි ගැන මගේ සිතේ ලොකු කළකිරීමක් ඇති වුණා. ඒ අනුව මම තීරණය කළා කවදාවත් කසාද බඳින්නේ නැහැ කියලා.''

එතනින් නොනැවතුණු ඔවුන් දෙදෙනා පැය කිහිපයක් පමණ ආගිය තොරතුරු කතාබස් කළහ. එතැන් සිට දිනපතාම දෙදෙනා තම තමන්ගේ පෞද්ගලික තොරතුරු පවා හුවමාරු කර ගත්හ. සති කීහිපයක් එලෙස ගතවිය. තවත් එක් දිනක ඔවුන් දෙදෙනා මෙලෙස කතාබස් කළහ.

''විමලා දැන් අපි මාසයක් විතර වෙනවා දැන් අඳුරගෙන. ඒක නිසා මම ඔයාට යම් යෝජනාවක් ගේන්න ඉන්නේ. කමක් නැතිද ඒක ඔයාට කිව්වට.''

''කිසි ප්‍රශ්නයක් නෑ පෙඩ්රික් ඔයා කියන්න.''

''හැබැයි මේක අහලා ඔයා හිත කලබල කර ගන්නත් එපා.''

''ඔයාට පිස්සුද ? මම එහෙම කර ගන්නේ නැහැ. මගේ හිත හයියයි. ඕනම දෙයක් දරාගන්න පුළුවන්.''

''ඇත්තටම මම ඔයාට ආදරෙයි.''

''මොනවා.''

''ඔව් මම ඇත්ත කියන්නේ.''

''මට ඒක හිතාගන්නවත් බැහැ පෙඩ්රික්.''

''ඇයි එහෙම කියන්නේ. දැන් අපි මාස ගණනක් කතා කළා. එතකොට මට තේරුණා ඔයා හොඳ කෙනෙක් කියලා. ඒක නිසා තමයි මම ඔයාට ඇත්තටම ආදරෙයි කිව්වේ.''

''මටනම් මේක අදහගන්නවත් බැහැ. ඒ වුණාට අපි දැන් වයසයිනේ.''

''එහෙම හිතන්න එපා. අවංක ආදරයට වයස බාධාවක් නොවෙයි. ඔයා ඒ ගැන අහලා නැද්ද?''

''ඕන තරම් අහල තියෙනවා. ඒත් මට තවම හිතාගන්න බැහැ. ඔයා කරපු මේ යෝජනාවට.''

''ඇයි හිතාගන්න බැරි. ඔයාට මාව අවිශ්වාසද.?''

''කවදාවත් මට ඔයාව අවිශ්වාස නැහැ. ඒත් මට මේක විශ්වාස කරන්න බෑහැ තවම. මම මේ හීනයක් දකිනවා ද කියලා හිතෙනවා. ''

''එහෙම හිතන්න එපා. මේක සැබෑ වෙන හීනයක්. මම ඇත්තටම ඔයාට ආදරෙයි.''

''නැහැ නැහැ මම වැරදියට ඔයා ගැන හිතලා එහෙම කිව්වේ නැහැ. තවමත් මට මේක හිතාගන්න බැරි දෙයක් ''

''මම හොඳට හිතලා මේ තීරණය ගත්තේ. මට ඕනේ ඔයාගේ කැමැත්ත විතරයි.''

''මේ වගේ යෝජනාවකට මම කොහොමද අකැමැති වෙන්නේ. මමත් ඇත්තටම ඔයාට ආදරෙයි. මගේ හිතෙත් ඔයා ගැන පැහැදීමක් තිබුණා.''

''විමලා මගේ ජීවිතේ සතුටුම දවසක් අද. මට මගේ ජීවිතේ යළි හම්බුනා වගේ දැනෙනවා.''

''මටත් එහෙමයි. මැරෙනකම් මම ඔයා ළඟ ඉන්නවා. ඒ වගේම ඉක්මනට ඔයාව අපේ රටට ගෙන්න ගෙන කසාද බඳිනවා.''

දෙදෙනාගේ ආදර කතාව එදින එලෙස පටන් ගත්හ. එතැන් සිට විමලාගේ ජීවිතයම වූයේ ජර්මන් ජාතික පෙඩ්රික් පමණි. ආදරයෙන් පැරදී සිටි ඇය යළි තම ජීවිතය ගැන බලාපොරොත්තු තබා ගත්තාය. ලද සෑම මොහොතකම දෙදෙනා පෙම් බස් දෙඩූහ.

තවත් දිනක පෙඩ්රික් ඇයට මෙලෙස පැවසුවේය.

''මම ඔයාට දෙයක් කියන්න හිටියේ.''

''ඒ මොකක්ද පෙඩ්රික්.''

''මගෙ ළඟ වයිෆ්ගෙ රත්තරන් බඩු ගොඩක් තියෙනවා. ඒව කෝටි ගාණක් වටිනවා. මම ඒ ටික ඔයාට එවන්න ඉන්නේ.''

''මට'' (ඇය පුදුමයෙන් මෙන් එලෙස ඇසුවාය.)

''ඔව් ඔයාට තමයි. දැන් ඒවා අයිති වෙන්න ඕනා ඔයාටනේ.''

''අනේ මට ඒක හිතාගන්නවත් බැහැ. එච්චර වටින රත්තරන් බඩු මට මොකටද?''

''ඒ ගැන හිතන්න එපා. මම නේ ඔයාට ඒවා දෙන්නෙ.''

''රත්තරන් බඩු එපා මට ඕනේ ඔයාව.''

''මම ඒක දන්නවා. ඒක නිසා තමයි මම බඳින්නත් ඉස්සෙල්ලා මේවා දෙන්න තීරණය කළේ.''

''අනේ මන්දා ඔයාගේ කැමැත්තක්.''

''ඒ විතරක් නොවෙයි. ඒ රත්තරන් බඩු එක්ක මම සල්ලි වගේකුත් එවනවා. සේරම වටිනාකම කෝටි හතරක් විතර වෙනවා.''

''ඇයි පෙඩ්රික් ඔයා මට ඕච්චර සල්ලි රත්තරන් බඩු එවන්නේ.''

''ඔයා මගේ අනාගත බිරිඳ නිසා. මම ඉක්මනටම ඒ බඩු ටික ලංකාවට එවනවා.''

''මම නම් ආයි කියන්නේ ඕනේ නැහැ කියලා.''

''එහෙම කියන්න එපා. මම එක තීරණය කරලා ඉවරයි.''

''ඉතින් මම මොනාද ඔයාට දෙන්නේ.''

''මට ඔයාගෙන් මොකුත් එපා. ආදරය විතරක් කරන්න.''

''මගේ ජීවිතයටත් වඩා ඔයාට මම ආදරෙයි.''

''ඒක මම දන්නවා.''

දෙදෙනාගේ කථාව එලෙස අවසන් විය.

දින කිහිපයක් ගතවිය. තවත් එක් දිනක කෝටි හතරක වටිනාකමින් යුතු සල්ලි සහ රත්තරන් බඩු මෙරටට දැමූ බව ඔහු පැවසීය. ඒ සමඟම එම භාණ්ඩ දැමූ ආයතනයේ නමක් සහ රිසිට් වගයක්ද ඇයට එව්වේය. එලෙස භාණ්ඩ දමා දින දෙකකට පසු පෙඩ්රික් ඇයට ඇමතුමක් ලබා දී මෙලෙස පැවසුවේය.

''විමලා පොඩි ප්‍රශ්නයක් වෙලා තියෙනවා.''

''ඒ මොකක්ද පෙඩ්රික්.''

''මම එවපු භාණ්ඩවල වටිනාකම වැඩි නිසා එම කුරියර් ආයතනයට සල්ලි වගයක් බඳින්න වෙලා තියෙනවා. ඒවා මට මෙහෙ ඉඳන් බඳින්න බැහැ.''

''ඉතින් මම මොකද්ද කරන්න ඕනා.''

''මම එකවුන්ට් නම්බර් එකක් දෙන්නම්. ඒකට ඔයාට සල්ලි දාන්න පුළුවන්ද?''

''ඕක සුළු දෙයක්නේ.''

''මට මෙහෙ ඉඳන් ඒ එකවුන්ට් එකට සල්ලි දාන්න බැහැ ඒකයි මම ඔයාට කිව්වේ.''

''හරි හරි ඒක ප්‍රශ්නයක් නැහැ. කීයක් දාන්න ඕනද?.''

''ලක්ෂ පහක් දාන්න ඕනා.''

''හරි මම හෙට දාන්නම්. ඔයා මට එකවුන්ට් නම්බර් එක එවන්න''

ෆෙඩ්රික්ගේ කීමට අනුව ඔහු ලබා දුන් එම ගිණුම් අංකයට පසුදිනම රුපියල් ලක්ෂ පහක මුදලක් තැන්පත් කළාය. එහි ගිණුම් හිමියාගේ නම ලෙස සඳහන්ව තිබුණේ ජෝන් ස්මිත් නමැති නමකි. එලෙස මුදල් තැන්පත් කර තවත් දින දෙකකට පසු තවත් ලක්ෂ තුනක මුදලක් තැන්පත් කරන ලෙස පෙඩ්රික් අයට පැවසුවේය. ඒ අනුව එම මුදල ද ඇය එම ගිණුමේ තැන්පත් කළා ය. එතනින් නොනැවතුණු ඔහු තවත් අවස්ථා කිහිපයකදීම ඇයට මුදල් තැන්පත් කරන ලෙස පැවසුවේය. ෆෙඩ්රික්ව විශ්වාස කළ ඇය කිසිදු බියක් සැකක් නැතුව එම මුදල් ද තැන්පත් කළාය. අවසානයේ ඇය එම කෝටි ගණනක් වටිනා රත්තරන් සහ මුදල් වෙනුවෙන් රුපියල් ලක්ෂ 29ක මුදලක් එම ගිණුමට තැන්පත් කර තිබුණාය.


එලෙස මුදල් තැන්පත් කළ පසු පෙඩ්රික් ඇය සමඟ කතා කිරීම ක්‍රමක්‍රමයෙන් මග හැරියේය. ඒ පිළිබඳව ඇය විමසූ විට ඔහු පැවසුවේ මේ දිනවල තමා කාර්යබහුල බවයි. තවත් දින කිහිපයක් එලෙස ගතවිය. එක්වරම ඔහුගේ ජංගම දුරකථනයද විසන්ධි කර තිබුණි. දින කිහිපයක් ඇය හැඬූ කඳුළින් යුතුව ඔහුව සම්බන්ධ කර ගැනීමට උත්සාහ කළාය. එහෙත් පලක් වූයේ නැත. අවසානයේ තමන් කිසියම් පුද්ගලයකුට රැවටී ඇති බව ඇය තේරුම් ගත්තාය. අවසානයේ ඇය කන්තලේ පොලිස් ස්ථානයට ගොස් මේ පිළිබඳව පැමිණිලි කළාය. පැමිණිල්ලට අනුව ඇය වංචාකාරයෙකුට රැවටී ඇති බව පොලිස් නිලධාරීහු තේරුම් ගත්හ. ඇයගෙන් ලබාගත් තොරතුරු මත මෙම වංචාකරු කවුරුන්ද යන්න පිළිබඳව එම නිලධාරීහු පරීක්ෂණ පවත්වති.

මෙය අද ඊයේ සිදුවූවක් නොව, දැනට වසර ගණනක සිට කිසියම් සංවිධානාත්මක පිරිසක් විසින් කාන්තාවන් රවටා මෙවැනි වංචනික ක්‍රියා සිදු කරති. එම නිසා ඔබත් මෙවැනි සමාජ මාධ්‍ය ජාල ඔස්සේ මිතුරු වී මුදල් සහ තෑගිබෝග දීමට එන මෙවැනි වංචනිකයන්ට හසු නොවන්න.

කන්තලේ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අශෝක වීරක්කොඩි මහතාගේ නියෝග මත සහකාර පොලිස් අධිකාරී 1 රෝහණ වනිගසේකර මහතාගේ අධීක්ෂණය යටතේ විශේෂ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක තිලකරත්න මහතාගේ මෙහෙයවීම යටතේ වැඩිදුර පරීක්ෂණ සිදුකරති.

**● ගයාන් සමරසිංහ.**

පසුබිම් වාර්තාව - **කන්තලේ ඩබ්. එම්. වික්‍රමසිංහ**

# ● සිහිමුළා නොවී සතුටින් මියැදෙමු


පිංවත ප්‍රශ්නවලින් ගිනිගත්ත හදවතකට, බවුසරයකින් වතුර විද්ද කියල හරියන්නේ නැහැ. වතුරවල රස්නය දැනෙද්දී, ඒ හදවත තවත් ගිනිගන්නවා. පිංවත ගිනිගත්ත හදවතකට කඳුළු ගෑස් ගැහුවාය කියලා හරියන්නේ නැහැ. වේදනාකාරී දෑස්වලින් කඳුළු මතුවෙද්දී, ඒ හදවත තවත් ගිනිගන්නවා. පිංවත ගිනිගත්ත හදවතකට මෛත්‍රිය ගැන කියාදී වැඩක් නැහැ. මෛත්‍රියක් නැති මනුෂ්‍යයන්ගේ ඒ වචන ඇසෙද්දී, ඒ හදවත් තවත් ගිනිගන්නවා. පිංවත ගිනිගත්ත හදවතක්, සත්‍යයයි, ඇත්තයි ඉල්ලන්නේ. ඒත් අපි ළඟ තිබෙන්නේ බොරුව නම් ඒ හදවත් තව තවත් ගිනිගන්නවා හැර කෙසේ නම් ඒ ගිනි නිවීයන්නද. පිංවත ජල ප්‍රහාර, කඳුළු ගෑස් සහ මෛත්‍රියක් නැති මනුෂ්‍යයන්ගේ මෛත්‍රිය වෙනුවට, ගිනිගත් හදවත් වලට ''ඇත්ත'' දෙන්න. එවිට අනෙක් සියල්ලම බොරුවක් බව වැටහේවි. සත්‍යය නැති ලෝකයක, සත්‍යයට හැර, අන් සියල්ලටම හොඳ වටිනාකමක් ලැබෙනවා. භික්ෂුව ඉහතින් සටහන් තැබුවේ පංචශීලයේ ඇති, බොරුකීමෙන් වැළකීම කියන එක ශිල්පදයක තිබෙන උතුම් වටිනාකමයි.

පිංවත් ඔබ දන්නවාද මේ ලෝකයේ තිබෙන ලොකුම බොරුව මොකක්ද කියලා. ලෝකයේ තිබෙන ලොකුම බොරුව තමයි, රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණයෝ, නිත්‍යයි, සැපයි, සුභයි, ආත්මියයි කියන බොරුව. අපි හැමෝම මේ ලොකුම බොරුව සරණ යන නිසාමයි පුංචි පුංචි බොරු සියල්ලක්ම කියන්නේ. බොරුවෙන් තොර ලෝකය හරිම ලස්සනයි. ඒ ලස්සන ලෝකය පංචශීලයෙන්ම බබලනවා. උතුම් සම්මා සතිය සහ සම්මා සමාධිය, ඒ ලස්සන ලෝකය දෙස අහක බලාගෙන ඉන්නේ නැහැ. ඒම ධර්මතාවයෝ, විදර්ශනා ප්‍රඥාවට පාවඩ එලන්නේ, සප්තබොජ්ජංගයන්ගේ සුදු රෙදි වලින්මයි. පිංවත මොනතරම් නම් ලස්සන ධර්මයක් තිබෙන ලෝකයකද, අපි මේ බොරුවට යටවෙලා ජීවත්වෙන්නේ. පිංවත් ඔබට පෙනෙනවා නේද, අවිද්‍යා පච්චයා සංස්කාර කියන ධර්මතාවයේ තිබෙන කුරිරුභාවය අම්මෝ, පැටව් ඉන්න කොටි දෙනක් වගේම දරුණුයි. ඒත් සෙනෙහසින්ම අපි මේ තුරුළුවෙන්න යන්නේ ඇයටම නේද. පිංවත ඔබ මරණාසන්න මොහොත දක්වා, නොනැසෙන ජනප්‍රියභාවයට කැමති නැද්ද. ඔබ අභියෝග ඉදිරියේ මහමෙරක්සේ සිටගන්න කැමති නැද්ද. ඔබ දිනාගත් සියල්ලම අපරාජිතව බුක්තිවිඳ මැරෙන්නට කැමති නැද්ද.

ඔබ සිහිමුලානොවී මරණයට පත්වෙන්නට කැමති නැද්ද. මෙය සටහන් තබන භික්ෂුව නම්, ඉහත කාරණා සියල්ලටම කැමතියි. ඒ නිසාමයි භික්ෂුව ශීලය ඉදිරියේ හොඳින් සිහිය පවත්වාගෙන යන්නේ. භික්ෂුවට හොඳටෝම විශ්වාසයි පිංවත් ඔබත්, ඉහත කාරණාවන්ට ගොඩාක්ම කැමතියි කියලා. පිංවත අංක එකට ශීලය ගන්න. අංක දෙකට ඔබේ ජීවිතය දමන්න. දැන් ඔබට පුළුවන් බොරුවෙන් පිරුණු ලෝකය තුළ සැබෑම ඇත්ත දකින්න. රූපය අනිත්‍යයි, වේදනාවෝ අනිත්‍යයි, තවත් කුමකට නම් බොරු කියන්නද, බොරු කරන්නද. පිංවත සිහි මුලා නොවී මැරෙන්න කැමතිනම් ලස්සන "ඇත්තට'' එන්න.

බුදුරජාණන් වහන්සේගේ සැබෑම ශ්‍රාවකයින්, අභියෝග කියන කාරණය ධමනය කොටගෙනයි





මහ රහතන් වැඩි මඟ ඔස්සේ

වැඩසිටින්නේ. උන්වහන්සේලාට අභියෝගයක් යනු තවත් ධර්මයක් පමණක්මයි. උන්වහන්සේලා පළමුවැනි අදියරේදී අභියෝග ධමනය කරන්නේ, තම ශීලයේ ශක්තියෙන්. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, කම්පිත ලෝකය ඉදිරියේ, අකම්පිතව, මහමෙරක් සේ නොසැල්වී වැඩසිටීම ශීලයේ ආනිශංශයක්මය කියලා. ශීලයට පුළුවන් ලෞකික ප්‍රඥාව තුළ ලෝකය විසුරුවා පුළුල්ව දැකීමට අවශ්‍ය, ඉන්ද්‍රිය සංවරභාවය ඇතිකොට දෙන්න.

සිල්වතා තමා ඉදිරියට එන අභියෝග සම්මා දිට්ඨි සහ සම්මා සංකප්පයන් තුළින් ධර්මානුකූලව විවෘත කොටදකිනවා. එවිට ඔහු පසුවෙන්නේ සම්මා සතිය සහ සම්මා සමාධිය තුළමයි. සප්තබොජ්ජංගයෝ වැඩුන සිතක් තුළ, අභියෝග දියවෙලා යන්නේ, හිරුඑළියට නිරාවරණයවූ ගිතෙල් පිඩක් වගේමයි.

පිංවත ඔබ මෛත්‍රියට කැමතිද. මෛත්‍රියට පුළුවන් ඔබ ඉදිරියට එන අභියෝග, එම අභියෝග ඔබ වෙතට ඒමට මුල් වූ, අවිද්‍යා පච්චයා සංඛාරා කියන ධර්මතාවය දෙසටම, ආපසු හරවා යවන්නට. හැබැයි ඔබේ මෛත්‍රිය සම්මාදිට්ඨියෙන් පෝෂණයවූ මෛත්‍රියක් වෙන්න ඕනේ. පිංවත එවිට ඔබ ඉදිරියට එන බාධක, වැටකඩොළු, අතීත අකුසල් සංස්කාර, මෛත්‍රිය ඉදිරියේ, ඔබේ අතේම නැටවෙන රූකඩයක් පමණක්ම වෙනවා. පිංවත අම්බලන්ගොඩ රූකඩ කලාව අපේ ජීවිතවලින් දුරස්ථව ගියත්, අභියෝග ඉදිරියේ එම අභියෝග නටවන, මෛත්‍රියේ රූකඩ කලාව, මේ මොහොතේත් ජීවමානව තිබෙනවා. පිංවත අද අදම මෛත්‍රිය වඩන්න. ඒ ලස්සන වෙන්න නොවේ. ඔය තිබෙන ලස්සන මදැයි. කරුණා කර සම්මා සතිය, සම්මා සමාධිය උදෙසා ඔබේ මෛත්‍රිය, සුදු මල් ඇතිරූ පාවඩයක් කොටගන්න. පිංවත බලන්නකෝ මෛත්‍රිය මොනතරම් නම් ලස්සනද කියලා. ඔබ තවමත් ජීවිතයට ලස්සන ගේන්න කරන මිච්ඡා ධර්මයන්, කාටත් හොරෙන් ඔබම සිතලා බලන්නකෝ. බුදුරජාණන් වහන්සේ නම් සංඝයා වන අපිට දුන්නේ තුන්සිවුරයි, පාත්‍රයයි පමණක්මයි. අඩුම ගානේ පවුඩර් පෙට්ටියක්වත් අපිට විනයානුකූලව දීලා නැහැ. ඒත් අපි අවලස්සනත් නැහැ. අපි ලස්සනත් නැහැ. අපි අනිත්‍යවූ ඵස්සය හේතුවෙන් සකස් වෙන, අනිත්‍ය වූ විඳීම් දෙස, ධර්මයේ උපේක්ෂාවෙන් දකිමින්, ඔබේ ලෝකයත් ලස්සන කරනවා. පිංවත මහා සංඝරත්නයයි ඔබේ ලෝකය ලස්සන කරන්නේ. පිංවත හදවතින්ම කොණ්ඩඤ්ඤ මහෝත්තමයන් වහන්සේට, මහා ප්‍රජාපතී උත්තමාවියට වන්දනා කරන්න. ඒ නොමැකෙන උත්තරීතර ලස්සන, ඔබ අගය කරන ඔබේ මැකීයන රූපයේ, නොමැකෙන, ලස්සනක් බවට පත්කොටගන්න.


පිංවත මේ දවස්වල ඔබේ සිත, නාසයේ හුස්ම රැල්ලෙන් ඔබ්බට අරගෙන යන්න නම් එපා. එතැනයි සංසිඳුනු සිතක ඇරඹුම තිබෙන්නේ. ඔබේ සිත, නාසයේ හුස්ම රැල්ලෙන් බැහැරට ගියොත් ඔබටත් හොරා ඔබේ සිත සිත්සේ අයාලේ යාවි. මේ දවස්වල හන්දියක්, හන්දියක් ගානේ දන්සල් වැහි වැහැලා. මාරයාගේ දන්සල් කෑම මේසවල ලෝභ, ද්වේශ, මෝහ, රසවත්ම ආහාර, අතුරුපස වලින් දන්සල් පිරී ඉතිරී යනවා, පිංවත තිබ්බ පලියට, අඬගහපු පලියට, දන්සල් වඳින්න යන්නේ නැතුව බොහෝම සිහිනුවණින්, මේ නිමේෂයේදී ගිනිගන්නා පංචඋපාදානස්කන්ධ ලෝකය පරිහරණය කරන්න. මාතෘභූමියට වෙනසක් අවශ්‍යයි, ඒත් එය බටහිර ලෝකයට අවශ්‍ය කරන, තවත් විනාශයක් නොවිය යුතුමයි.

පිංවත් මහත්මයෙක් භික්ෂුවගෙන් ඇසුවා, වත්මන් දේශපාලන ප්‍රශ්න වලට ධර්මානුකූල විසඳුම කුමක්ද කියලා. පිංවත භික්ෂුව ලෝකය දකින්නේ අවිද්‍යාවේ කැඩපත තුළින්. අවිද්‍යාව තිරිහන් කරන රස ඕජාව වෙන්නේ තෘෂ්ණාවයි. ඉහත අර්ථයන් බැහැර කරලා දේශපාලන ප්‍රශ්නයක් විග්‍රහ කරන්න බැහැ. බුදුරජාණන් වහන්සේ ශ්‍රාවක අපිට පනවලා තිබෙන්නේ රටේ නීතියට, රටේ ව්‍යවස්ථාවට ගරු කරන්නය කියලා. ව්‍යවස්ථාවෙන් බැහැර විසඳුම් වලට සංඝ සමාජයට අනුශාසනා කරන්න බැහැය කියලා භික්ෂුව විශ්වාස කරනවා. වර්තමාන දේශපාලන අර්බුදයට ධර්මානුකූලව සටහන් තැබිය හැකි විසඳුම් දෙකක් තිබෙනවා. වර්තමාන රාජ්‍ය නායකතුමා නිවැරදි කරගෙන, දූෂිත ඇමැතිවරුන්ගෙන් තොරව නියමිත ධුර කාලය අවසන් කරන්න එතුමාට ඉවසීමෙන් සහ අවධියෙන් අවස්ථාව දෙන්න. ඊට ඔබ අකමැතිනම් ව්‍යවස්ථානුකූලව පාර්ලිමේන්තුව තුළින් තුනෙන් දෙකේ බහුතරයකින් එතුමාව නීත්‍යානුකූලව ඉවත්කර ගන්න. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාවන්ට අදාළවයි භික්ෂුව ඉහත සටහන තැබුවේ. භික්ෂුව බොහෝම කරුණාවෙන් දැනුම් දෙනවා බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාවන්ට ගරු නොකලොත්, හෙට මුළු රටම කොළඹට පැමිණියත්, ඔබ ලබන ජයග්‍රහණය තවත් විනාශයකම ආරම්භයක් වෙන්න පුළුවන්ය කියලා. භික්ෂුව මේ සටහන තබන්නේ අප්‍රේල් මාසේ තුන්වැනි සතියේ, පිංවත මේ මොහොතේ රජයේ පාර්ශවයන් සිල් සමාදන්වූ වේශයෙනුත්, විපක්ෂයේ පාර්ශවයන් ගැලවුම්කරුවන්ගේ වේශයෙනුත්, පිංවත් ජනතාව ගාලුමුවදොර පිටියේ සටන්පාඨ කියමින්, සිංදු, විරිඳු කියමින්, අවුරුදු ක්‍රීඩා, කිරි උතුරවමින්, බොහොම සංවරශීලි වේශයෙනුත් පෙනී සිටියත්, බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ ඉහත සියල්ල දැකිය යුත්තේ, අවිද්‍යාවේ කැඩපත තුළින්, විද්‍යාවේම ඇසෙන් බව ගෞරවයෙන් දැනුම් දෙනවා. ඉහත සටහනට යම් පාර්ශවයක විරෝධයක් තිබේ නම්, බොහෝම කරුණාවෙන් දෑත් එකතුකොට භික්ෂුව සමාවෙන්න කියලා කියනවා.

පිංවත මේ දුෂ්කර මොහොතේ මෛත්‍රී චිත්තය ගොඩාක් වටිනවා. කරුණාකර මේ නිමේෂයේදී ඔබේ මෛත්‍රිය කුඩු කරගෙන, කොටු කරගෙන සිටින්නට එපා. ඔබේ මෛත්‍රිය භවාත්‍රය පුරා විසුරුවා දකින්න. භික්ෂුව මේ නිමේෂයේදිත් භවාත්‍රයටම මෙත් වඩනවා. මුළු මනුෂ්‍ය ලෝකයේම ජීවත්වෙන පිංවත් ජනතාව සිහියට නගාගෙන, භික්ෂුව හදවතින් පසඟ පිහිටුවා එක චිත්තයකින් ජනතාවට වන්දනා කරනවා. සියලුම දිව්‍යතලවල දෙවියන්, සිහියට නගාගෙන, භික්ෂුව හදවතින්ම පසඟ පිහිටුවා එක චිත්තයකින් සියලුම දෙවියන්ට වන්දනා කරනවා. සියළුම බ්‍රහ්මතලවල් සිහියට නගාගෙන, භික්ෂුව සියලුම බ්‍රහ්මයන්ට හදවතින්ම පසඟ පිහිටුවා එකචිත්තයකින් වන්දනා කරනවා. පිංවත බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයන්ගේ මෛත්‍රිය භවාත්‍රයම පිනෙන් උණුසුම්කොට දෙනවා. පිංවත ඔබට සිතෙන්න පුළුවන්, භික්ෂුව ඇයි දෙවියන්ට, බ්‍රහ්මයින්ට හදවතින් නමදින්නේ කියලා. පිංවත තමා බිංදුවට වැටිලා ලෝකයාට යහපත දෙන තැන්, මහා සංඝරත්නය නැමති අර්ථය තුළ අප්‍රකටව ඕනෑ තරම් තිබෙනවා. මේවා ගැන සටහන් තබන්නට ගියොත් නොදන්නාභාවය නිසාම අනවශ්‍ය විවේචනයන්ට ලක්වෙන්න පුළුවන්.

පිංවත වෙසක් මාසයේ උදාවේදී භික්ෂුව ඔබට හදවතින්ම කෙරෙන වෙසක් සුභපැතුමකුයි, ඉහත සටහන තුළින් ඔබට අදම තැපැල් කලේ. මෙත් සිතින් මේ වෙසක් සුභ පැතුම්පත පිළිගන්න. පෙරළා භික්ෂුවට වෙසක් සුභ පැතුම්පත් එවන්න එපා. ඒ සිතත්, ඒ කැමැත්තත්, අවිද්‍යාවටම භාරදෙන්න. එවිට ඔබ සමස්ත ගෞරවණීය මහා සංඝරත්නයටම වෙසක් සුභ පැතුමක් සිදු කළා වෙනවා. පිංවත හැඟීම් වලට යටවුණොත් ඔබේ දෑස්වලට කඳුළු උනන්න පුළුවන්. වහාම නාසයේ හුස්ම රැල්ලට සිහිය පිහිටුවා ගන්න.

**● පූජ්‍ය රාජගිරියේ අරියඥාන ස්වාමින්වහන්සේ**




අධර්මයෙන් ජීවත්වීම ය, ධර්මයෙන් මරණයය යන දෙකින් ධර්මයෙන් වන මරණය ම උතුම් යැයි ධර්මයේ සඳහන්ව ඇත. මනුෂ්‍යයෝ පරලොව යහපත - පරලොව සැපය සඳහා ආගම් පිහිට කර ගනිති. මෙලොවට ද ආගම්වල පිහිට ඇතත් ඇත්තේ ස්වල්ප වශයෙනි. රත්නත්‍රය හැඳින ගැනීම බුද්ධාගම ඇදහීමේ අත්තිවාරම ය. රත්නත්‍රය නො හඳුනන තැනැත්තා කරන පින්කම් අත්තිවාරමක් නැති ව තැනූ ගොඩනැගිල්ලක් සේ දුබල ය. එහෙත් අද අපි කතා කරන්නේ වෙසඟ ගැනය. වඩා උතුම් ලෙස සැලකෙන්නේ වෙසක් පොහොයයි. ලෝකවාසී බෞද්ධ ජනතාවට වෙසක් පුර පසළොස්වක පොහොය තරම් වෙනත් උතුම් පොහොයක් නැත. ශ්‍රී ලංකාවේ අපට 2018 පසු නිසියාකාරව වෙසක් සැමරීමට අවස්ථාව සැලසුනේ නැත. සහරාන් බෝම්බ ගැසූ නිසා 2019 වෙසක් පෝය දිනයේ පන්සල් අසල ද හමුදා භටයින් ඔබමොබ හැසිරෙනු දක්නට ලැබිණි. වෙසක් තොරණ කුඩු නිර්මාණය වුණේ නැත. අතරින් පතර දන්සල් එකක් දෙකක් පැවැත්විණි. එය ත්‍රස්තවාදයේ අඳුරින් වැසිණි. නමුත් 2020 -2021 පෝය දෙකම කොරෝනා අඳුරට බිලිව ගියේය. එහෙත් මේ වෙසක් පොහොය අරගල අඳුරට බිලිවන්නට ඉඩ දිය යුතු නැත. හැකි ආකාරයෙන් වෙසඟ සැමරිය යුතුය. ලෝකයේ ථෙරවාද, මහායාන යන සෑම රටකම වෙසක් උත්සවය සම්බන්ධව සැමරීම් කළ ද, ශ්‍රී ලංකාව ඉතාමත් ගෞරවයෙන් උත්කර්ෂවත්ව සුවිශේෂී උත්සවයක් ලෙස මේ පොහොය සැමරීම විශේෂත්වයකි. ලෝකයේ වෙනත් කිසිදු රටක වෙසක් උත්සවය මේ ආකාරයෙන් සමරන්නේ නැත.

අප මහ බෝසතාණන් වහන්සේ සසරේ එක්තරා ආත්ම භවයක සුමේධ තාපසයාණන්ව, දීපංකර බුදු පියාණන්ගේ පාද මූලයේදී මතු බුදුබව පතා ප්‍රථම වරට නියත විවරණ ලැබුවේ වෙසක් පුර පසළොස්වක පොහොය දිනකයි. සසරේ අවසන් ආත්ම භාවයේදී විසිනව වන වියට එළැඹුණු සිදුහත් කුමරු උයන් කෙළියට පැමිණෙද්දී ජීවිතයේ අනියත වටහා දුන් සතර පෙර නිමිතිවල ව්‍යාධි රූපය පළමුව දුටුවේද වෙසක් පුර පසළොස්වක පොහොය දිනකදීය. බුද්ධත්වයෙන් දස මසකින් කිඹුල්වත්පුර තම උපන් ගමට වැඩම කළ බුදු පියාණන් වහන්සේ ඥාතීන්ගේ අතිමානය දුරැලීමට යමා මහා පෙළහර පෑවේද වෙසක් පුර පසළොස්වක පොහොය දිනකය. බුදුරජාණන් වහන්සේගේ තෙවන ලංකාගමනය වූ කැලණියට වැඩම කොට චූලෝදර, මහෝදර නා රජුන් ප්‍රමුඛ බොදු මහ ජනතාවගේ දානය වළඳා ඔවුනට ධර්ම දේශනා කර ශ්‍රී පාද පද්මය පිහිටුවා අනෙකුත් ස්ථානයන්ට වැඩම කිරීම සිදු වූයේ ද වෙසක් පුර පසළොස්වක පොහොය දිනකදීය.

අප ව්‍යවහාර කරන බුද්ධ වර්ෂය ආරම්භ වනුයේ බුදුරදුන්ගේ පරිනිර්වාණයත් සමග ය. ආර්ය වංශික විජය රජතුමාගේ සම්ප්‍රාප්තියත් එදිනම සිදු වූ හෙයින් වර්ෂය ද ඒ සමග ඇරඹෙයි. එසේ නම් මුළු ලෝකයේ කිසිදු ජාතියකට නැති අන්දමට සිංහලයාට ආගමික වර්ෂයත්, ජාතික වර්ෂයත් එක් දිනයක යෙදීම මහත් වාසනාවකි. එසේම සිංහල රජුන්ගේ රාජාභිෂේක සම්ප්‍රදාය වෙසක් පෝයදාක ආරම්භ වී තිබේ. අපේ ඉතිහාස කතාව එනම් මහා වංශයේ සඳහන් ආකාරයට අනුව සෑම රජකුම වෙසක් උත්සව පවත්වා ඇත. දුටුගැමුණු රජතුමා වෙසක් උත්සව 27 ක් පැවැත්වූ බව, මහා වංශයේ 32 වන පරිච්ඡේදයේ සඳහන් වේ. ඉතිහාසය පුරාම සඳහන් වන "මහාවේශාඛ පූජා" යන වචනයට අනුව මහා වෙසක් උත්සව උත්කර්ෂයෙන් පැවැත්වූ බවට එහි අර්ථ ගැන්වේ. මහාවංශයට අනුව, දුටුගැමුණු රජතුමාගෙන් පසු භාතිය රජතුමා වෙසක් උත්සව 28 ක් පැවැත්වූ බවට තොරතුරු මහාවංශයේ 34 වන පරිච්ඡේදයේ සඳහන් වේ. වසභ රජතුමා ඔටුණු පළන් වර්ෂයේ සිට පිළිවෙළින් වෙසක් උත්සව 44 ක් පැවැත්වූ බව මහාවංශයේ 25 වන පරිච්ඡේදයේ සඳහන් ය. වෝහාරතිස්ස රජතුමා වෙසක් උත්සවය පවත්වා දිවයිනේ සියලුම භික්ෂූන් වහන්සේලාට තුන් සිවුරු පූජා කළ බව මහාවංශයේ 36 වන පරිච්ඡේදයේ සඳහන් වේ. ගෝඨාභය හා ජෙට්ඨතිස්ස රජතුමා වෙසක් උත්සව පැවැත්වූ ආකාරය මහා වංශයේ 36 වන පරිච්ඡේදයේ සඳහන් වේ. ඉතිහාසය පුරා වෙසක් උත්සව පවත්වාගෙන පැමිණි ආකාරය ඓතිහාසික සාධක තුළ සඳහන් ව ඇත. එම සෑම ස්ථානයකදීම පවත්වන ලද වෙසක් උත්සවයන්හි සිරිත් විරිත් හා වෙසක් උත්සව පැවැත්වීමට හේතු වූ කාරණාවන් ඓතිහාසික සාධක තුළින් උකහා ගත හැකි ය. පළමු පරාක්‍රමබාහු රජතුමා වෙසක් උත්සවය ප්‍රබල සමාජ උත්සවයක් ලෙස පැවැත්වූ ආකාරයත්, මිහින්තලා සෙල් ලිපියෙහි සඳහන් "මඟුල් ජෙටක්" යන වචනයෙන් ප්‍රධාන මංගල්‍යයක් ලෙස පැවැත්වූ බවටත් මිහින්තලා සෙල් ලිපිය උදාහරණයක් ලෙස දැක්විය හැකි ය. කෙසේ නමුත් පෘතුගීසි හා ඕලන්ද යුගවල වෙසක් උලෙළ පහතරටින්, යටපත්ව ගියේය. 1815 පසු උඩරට ද එය යටපත් විය. එයට හේතුව ක්‍රිස්තියානිය පැතිර යෑමයි. පානදුරාවාදය නිසා බෞද්ධ ප්‍රබෝධය වේගයෙන් පැතිරෙන්නට විය. 1885 ඕල්කට්තුමා පැමිණ පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටු වීය. 1885 බෞද්ධ කොඩිය ආරම්භය - මිගෙට්ටුවත්තේ ගුණානන්ද හා හික්කඩුවේ සුමංගල වැනි හිමිවරුන්ගේ කැපවීම - සරසවි සඳරැස වැනි පත්‍ර කළ සටන නිසා යළිත් ජාතික ප්‍රබෝධයක් ඇති විය. වෙසක් පෝය රජයේ නිවාඩුවක් බවට පත් විය. 1885 මාර්තු 27 වැනි දින අංක 4648 දරන ගැසට් පත්‍රය මඟින් වෙසක් පොහොය දිනය රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර, 1886 අංක 4 දරන ආඥා පනත මඟින් නීතිගත කරන ලදි. 'සරසවි සඳරැස' පුවත්පත මේ බව වාර්තා කර තිබුණේ මෙසේය. "මෙම මස විසිඅට වැනිදාට (1885 අප්‍රේල් 28) පැමිණෙන වෙසඟ පුර පසළොස්වක දින ආණ්ඩුවේ නිවාඩු දිනයක් කොට ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර තිබේ. ඉතින් මෙවක් පටන් සංවත්සරයක් පාසා පැමිණෙන වෙසඟපුර පසළොස්වක් දින බෞද්ධයන් උදෙසා ආණ්ඩුව විසින් දෙන නිවාඩු දවසක් ලෙස ලංකාවේ ව්‍යවහාර වන බව මෙයින් සැලකිය යුතුයි." (සරසවි සඳරැස 1885 අප්‍රේල් 03)

වෙසඟ සැමරීම ද ආමිස පූජාවකි. ආමිස පූජාව නිවන නමැති චූඩාමාණික්‍යය දරා සිටින දාගැබේ පාදම ය. ආමිස පූජාවලින් තොරව ප්‍රතිපත්ති පූජාව පිරීම ඉතා දුෂ්කර ය. ප්‍රතිපත්ති පූජාව යනු බුදුන් වහන්සේ දේශනා කළ නිවන් මාර්ගයේ ගමන් කිරීමයි. ආමිස පූජාව බෞද්ධ සමාජයේ ප්‍රගමනයට හේතුවෙයි. බෞද්ධ ප්‍රබෝධය ඇති කිරීමට කුඩා අටපට්ටමේ සිට මහා තොරණ දක්වා විහිදෙන පහන් ආලෝකයට හැකිය. වෙසක් දිනයට නොයෙක් නොයෙක් සැරසිලි, වෙසක් කුඩු, තොරණ හැදීම වැනි සංස්කෘතික කාරණා ලෝකයේ අන් රටවල දැකිය නොහැකිය. අපගේ සංස්කෘතික නිර්මාණවලට ලෝකයා වසඟ වී තිබෙන්නේ අපටම අනන්‍ය සිංහල බෞද්ධ හැඩයක් එම නිර්මාණවල තිබෙන නිසාය. ලෝකයේ වෙසක් නිර්මාණ යම් ප්‍රමාණයකට තිබුණත් අපේ රටේ නිර්මාණ තරම් මවිත වීමක් එම නිර්මාණවලින් සිදුවන්නේ නැත. වෙසක් කාලයේ පවත්වන දන්සල්වලට බෞද්ධයන් පමණක් නොව අන්‍ය ආගම්වලට අයත් පිරිස් ද සහභාගි වෙති. එයින් ලෝකයාටම කියාපාන පණිවුඩය වන්නේ ආගමික සහජීවනයයි. වෙසඟේ ඉදිකෙරෙන සෑම බෞද්ධ නිර්මාණයක්ම භාවිත කළ යුත්තේ හුදු ප්‍රදර්ශනාත්මක අදහසින් නොව බුද්ධාලම්භන ප්‍රීතිය ජනිත කිරීමේ අදහසිනි.

රටේ අවුල් වියවුල් තත්ත්වයක් උද්ගතව තිබුණ ද එය අපේ වෙසක් සැමරුමට බාධාවක් විය යුතු නැත. මේ අවස්ථාවේ බෞද්ධ විරෝධී බලවේග වඩා බලවත්ව සිටින සමයකි. පසුගිය දිනවල පන්සල්වලට කඩා පැන ඒවා පරීක්ෂා කරන ආලවකයින්ද දැක ගැනීමට හැකි විය. මේ කවර විපතක්ද? අන්‍යාගමික ආක්‍රමණයට ලක්ව තිබූ කුරගල පුදබිම අද ජාතියේ මහා පුදබිමක් බවට පත්ව බෞද්ධ ලෝකයට දායාද වනු දැකීම මෙරට සිංහල බෞද්ධයින්ගේ නොව ලෝකවාසී බෞද්ධයින්ගේත් සතුටට හේතුවකි. නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ නිර්මාතෘ වතුරකුඹුරේ ධම්මරතන නායක ස්වාමීන් වහන්සේ ඓතිහාසික කුරගල පූජා භූමියේ වත්මන් භාරකාරත්වය දරන අතර උන්වහන්සේගේ කැපවීම නිසා මේ මහා කාර්යය යථාර්ථයක් බවට පත්විය. ඇත්තෙන්ම වත්මන් ජනපතිතුමා නොවන්නට මෙය සිහිනයක්ම පමණි. එය අද නොව මතු ඉතිහාසයේ සටහන් වනු ඇත. කවරක් නමුත් මේ වෙසක් දිනයේ මගේ වෙසක් ප්‍රාර්ථනාව කුමක්ද? සිංහල බෞද්ධයින්ට උදැල්ලෙන් වතුර අදින්නට වන කාලයක් උදා නොවේවා යන්නයි. නුවණැත්තෝ මෙය වටහා ගනිත්වා!

**● චතුර පමුණුව**

# ● නීතිඥ සංගමයේ අවධානය පිණිසයි

ශ්‍රී ලංකාව තුළ ගෞරවනීය වෘත්තියක් ලෙස සලකන වෛද්‍යවරුන්, විද්වතුන් යැයි කියාගත් පිරිස් ඉහළ පෙළේ ව්‍යාපාරිකයන් සමග ධර්ම දේශනා බෝධි පූජා පිංකම් අවස්ථාවන්හිදී පවා ජනතාව වෙත මෙම රජය බලයට පත් කිරීමට ගත් කැපකිරීම අද අපහාසයට උපහාසයට පමණක් නොව ඔවුන් ද ජනතාව නොමග යැවූ අපරාධකරුවන් සේ පොදු ජනතාව විශ්වාස කරනු ලැබේ.

එමෙන්ම වර්තමාන නීතිඥ සංගමය ද සියලු පාර්ශ්වයන් එකමුතු කොට ඉතා විශ්වාසවන්ත මගපෙන්වීමක් සිදුකරන බැව් අපට පෙනේ. එය ඉතා අවංක සහ සෘජු ප්‍රතිපත්ති මත පිහිටා කොරෙන යෝජනාවක් සේම ඔබ සංගමයේ යෝජනා නිසි ලෙසම ක්‍රියාත්මක වන්නේ දැයි සොයා බැලීමේ විමර්ශන කණ්ඩායමක් ද ඔබ සංගමයේ ප්‍රධානත්වයෙන් රටට අදරැති මෙයට පෙර සෘජුව සහ අවංකව සේවයි කළ විශිෂ්ට විශ්‍රාමික පුරවැසියන්ගෙන් ඇතුළත් වන්නේ නම් එය ද ප්‍රතිපලදායක වන්නේය. එවැනි බලපෑම් කණ්ඩායම් පිහිටුවීම මෙන්ම එම කණ්ඩායම ද නිවැරදිව මෙහෙයවීම හා අධීක්ෂණය ඔබ සංගමය සතු වේ නම් එය ද මහජන විශ්වසයෙහි තවත් අඟනා අවස්ථාවක් වනු ඇත.

මෙම දුෂ්කර අවස්ථාවෙහි රට ගොඩනැංවීමේ සියලු ආකාරයෙහි ඉතා අවංක ස්වෙච්ඡාවෙන් සේවය කළ හැකි දෙස් විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට ද ආරාධනා කිරීම මැනවි. කිසිදු දීමනාවක් නොමැතිව හුදු ස්වෙච්ඡාවෙන් වසර 3 ක් වත් සේවය කළ හැකි වටිනා තැනැත්තන් මේ රටෙත් විදෙස් රටවලත් ඇති බව මගේ පිළිගැනීමයි. එවැනි කිහිපදෙනකු මේ වනවිටත් ස්වකීය කැමැත්ත පළ කර ඇත. එවැනි තැනැත්තන්ගේ සුදුසුකම් අනුව පමණක් නොව අප රට දියුණු කිරීමේ සැලැස්ම සමග ආරාධනා කරන්නේ නම් ඔවුහු කැමැත්තෙන් සිටිති.

එවැනි තැනැත්තන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් පත් කළ මන්ත්‍රීවරුන් වෙනුවෙන් ආදේශ කළ හැකි වන්නේ නම් එය ද වටිනා යෝජනාවකි. යම් ලෙස එම පත්කළ මන්ත්‍රීවරු අස්වීමට අකමැති වන්නේ නම් ඒ කවුරුන් දැයි රටට අනාවරණය කිරීමෙන් ඔවුන් පත් කළ පක්ෂය ඔවුන් ඉවත් කිරීම සඳහා බලපෑමක් ඇති කළ හැක.

ශ්‍රී ලංකා නීතිඥ සංගමය වශයෙන් ඔබගේ වටිනා උත්සාහය සහ මෙම කැපකිරීම බලගන්වනු පිණිස මෙම යෝජනාව ද ඉදිරිපත් කරමි. වර්තමාන සෑම මහජන නියෝජිතයෙක්ම තෙවසරක් අනිවාර්ය ස්වෙච්ඡා සේවයෙහි යෙදෙන ලෙසත් අවශ්‍ය වන්නේ නම් පමණක් රටේ පුරවැසියන්ගෙන් ලැබෙන මහජන දීමනාවක් ලෙස අර්ථගන්වමින් ප්‍රදානය කිරීම තුළින් ඔවූහු සැබෑ මහජන සේවකයන් බැව් අර්ථගැන්විය හැක.

අපේ රට ඉතා දුෂ්කර තත්ත්වයකට වැටී ඇති අවස්ථාවෙහිදී ඔබ සංගමය මගින් ඉදිරිපත් කර ඇති යෝජනා ඒ ඒ පක්ෂය දක්වා ඇති උනන්දුව හා එකඟතාවය පදනම්කොට ගෙන හැකි ඉක්මනින් සියලු පාර්ශ්වයන්ගෙන් සැදුම්ලත් නායකත්ව මණ්ඩලයක් මගින් සියලු පරිපලාන කටයුතු මෙහෙයවිය යුතුය. රට වෙනුවෙන් කෙරෙන ගනු ලබන සෑම තීරණයක්ම විනිවිද බවින් යුක්ත විය යුතු සහ එය ඕනෑම අයකුට දැනගත හැකි නව අදහස් එකතු කිරීමේ හැකියාවද තිබිය යුතුය. මේ මොහොතෙහි ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකා කඩිනමින් අප සංගමයෙහි කැපවීම අපේක්ෂා කරන අතර නව ප්‍රවේශයකින් අපගේ මාතෘභූමිය රැක ගැනීමේ කාර්යභාරය පිළිගන්නා ලෙස මෙත් සිත් පෙරටුව සිහිපත් කරමි.



**සම්මාජීව බෞද්ධ ආශ්‍රමාධිපති / මිතුරු මිතුරෝ අධ්‍යක්ෂක**
**● කුප්පියාවත්තේ බෝධානන්ද හිමි**

# ලුහුඬු දැන්වීම්

## රැකියා ඇබෑර්තු

මොරටුව හොරේතුඩුව නිවසක උදෑසන 7.30 සිට සවස 5 දක්වා සේවය කිරීමට කාන්තාවක් අවශ්‍යයි. දරුවන් බලාගැනීමේ පලපුරුද්ද විශේෂයි. අමතන්න 0112648307, 0715326412 15/5992

**විවිධ**

අපගේ study abroad Consultancy ආයතනයට පහත සඳහන් ඇබෑර්තු සඳහා සේවකයින් වහා බඳවා ගනු ලැබේ. බලාපොරොත්තු වන්නා වූ රැකියාව සඳහන් කර එවන්න. Receptionist, Web Designer, FB Promotion (කාන්තා) Marketing (පිරිමි) Study Abroad, Course Courdinator Nation plus 2 Consultancy 57, W.A. Silva M/W Wellawatta. 0777475783, 0115810054
nationplus171@gmail.com 15/6676

# ජන දුක නිවන්න හරින් - හර්ෂ දැඩි ස්ථාවරයක

චමින්ද සිල්වා

අගමැති රනිල් වික්‍රමසිංහ මහතා අන්තර්කාලීන රජයට සම්බන්ධවීමට ආරාධනා කළහොත් රට වෙනුවෙන් කරන යහපත් ක්‍රියාදාමයකදී කකුළෙන් නොඇද ඊට සහය ලබාදිය යුතු යැයි සමගි ජනබලවේගය පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හරින් ප්‍රනාන්දු මහතා ' ඉරිදා දිවයින සංග්‍රහය'ට පැවසීය. ගාලුමුවදොර (ගෝඨාගෝගම) අරගලයට පාදක වූ තරුණ අභිලාෂයන් හා මුඛ්‍ය අරමුණු පාවා නොදෙමින් වගකීම් සහගතව රට ගැන සිතා ක්‍රියාකළ යුතු බවත් පැවසූ ඒ මහතා මේ රටේ කිසිවකු එහිලා ගන්නා නිවැරදි තීරණවලට මුදලට ගන්නා උදවිය ලෙස හංවඩු ගැසීම ඉතාම කනගාටුදායක බවත් කීවේය.

මේ අතර සජබ පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂ ද සිල්වා මහතාද පක්ෂයේ පැවති විශේෂ සාකච්ඡාවකදී ප්‍රකාශ කර ඇත්තේ රට බරපතළ ආර්ථික අර්බුදයකට මුහුණ පා සිටින මේ අවස්ථාවේ පළමුව දේශපාලන තීන්දුවකට වඩා රට ගැන සිතා නිවැරදි තීන්දුවලට එළඹිය යුතු බවත්ය. එය ප්‍රමාද කිරීම තවත් අර්බුද රැසකට රට පත් කිරීමක් බව ද ඔහු පවසා ඇත.

# අරගලයට දින 37 යි

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන්

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට වහා ඉල්ලා අස්වන ලෙසට බල කරමින් කොටුව ජනාධිපති ලේකම් කාර්යාලය අසල පැවැත්වෙන විරෝධතාවය අද (15 වැනිදා) 37 වැනි දිනයටත් ක්‍රියාත්මක වෙයි. වෙසක් පොහෝ දිනය නිමිත්තෙන් අරගල භූමිය තුළ බෞද්ධ කොඩි හා වෙසක් සැරසිලිවලින් සරසා තිබෙනු දැකගත හැකිවිය. පසුගිය අප්‍රේල් 09 වැනිදා ආරම්භ වූ මෙම විරෝධතාවට නීතිඥවරුන්, වෛද්‍යවරුන්, වෘත්තීය සංගම්, විවිධ වෘත්තිකයින් එක්වූහ.

# වෙසක් සැරසිලි මිල අහස උසට

බී. ටී. කේ. ජාඇල අතිරේක

මෙවර වෙසක් සමයේ ප්‍රදේශයේ පන්සල්, නිවෙස් ඇතුළු විවිධ ස්ථානවල විවිධ සැරසිලි සඳහා භාවිතා කරන සව්කොළ ඇතුළු අනෙකුත් ද්‍රව්‍යයන්ගේ මිල අධික ලෙස ඉහළ ගොස් ඇති බව පාරිභෝගිකයෝ පවසති.

පෙර රුපියල් රුපියල් 5ක පමණ මිලකට තිබූ සව් කොළයක මිල මේ වන විට රු. 15 දක්වාද, ලොකු ඉටිපන්දමක මිල රු. 100 දක්වාද ඉහළ ගොස් ඇති අතර ඊට අමතරව බකට් සහ කම්බි, බල්බ් වැල් ආදි සෙසු ද්‍රව්‍යවල මිලද ශීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇති බව ජනතාව පෙන්වා දෙති.


# මහින්ද ඇතුළු පිරිස අත්අඩංගුවට ගන්න ඉල්ලන නඩුව සලකා බැලීම 17 වැනිදා

ඒ. ජේ. ඒ. අබේනායක

පසුගිය 9 වැනිද අරලියගහ මන්දිරයේ සහ ගාලුමුවදොර පිටියේ විරෝධතාවයක නිරතව සිටි සාමකාමී විරෝධතාකරුවන් පිරිසකට අමානුෂික ලෙස පහරදී බරපතළ තුවාල සිදු කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් හිටපු අගමැති මහින්ද රාජපක්ෂ, හිටපු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු, පාර්ලිමේන්තු මන්ත්‍රී සනත් නිශාන්ත, මොරටුව නගරාධිපති සමන් ලාල් ප්‍රනාන්දු සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් යන මහත්වරුන් අත්අඩංගුවට ග න්නා ලෙස ඉල්ලා නීතිඥ සේනක පෙරේරා මහතා ගොනු කළ පෞද්ගලික නඩුව සළකා බැලීම සඳහා ලබන 17 වැනිදා කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය හමුවේදී කැඳවීමට කොටුව මහෙස්ත්‍රාත්වරයා පෙරේදා (13දා) නියෝග කළේය. එකී සැකකරුවන් එකී අමානුෂික පහරදීම සඳහා අරලියගහ මන්දිරයට පසුගිය 9 වැනිදා රැස්වූ පිරිස කුපිත වන ආකාරයෙන් ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇතුළු පිරිස කටයුතු කර ඇති බවත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශ බන්දු තෙන්නකෝන් එම පිරිස මැඩපැවැත්වීමට අවශ්‍ය පියවර ගැනීමට අපොහොසත් වී ඇති බවත් පැමිණිලිකාර නීතිඥවරයා සිය පැමිණිල්ල මගින් අධිකරණයට දන්වා තිබිණි. එකී සැකකරුවන් නීති විරෝධී රැස්වීමක සාමාජිකයන්වීම, පහරදීම, සාපරාධී බියගැන්වීම් යනාදී වැරදි සිදුකර ඇතැයි ද නීතිඥ සේනක පෙරේරා සිය පැමිණිල්ල විසින් අධිකරණයට වැඩිදුරටත් දන්වා තිබිණි.

කොටුව මහෙස්ත්‍රාත් තිළිණ ගමගේ මහතා හමුවේ එම නඩුව ඊයේ (13දා) කැඳවූ අවස්ථාවේදී පැමිණිලිකාර සේනක පෙරේරා මහතා විවෘත අධිකරණය හමුවේදී කරුණු දක්වමින් ගාලු මුවදොර පිටියට අදාළ නඩු කටයුතු සහ පැමිණිලි මහෙස්ත්‍රාත් තිළිණ ගමගේ මහතා ඉදිරියේදී කැඳවීමක් නොකරන ලෙස ඉල්ලා නීතිඥවරුන් අධිකරණ සේවා කොමිෂන් සභාව හමුවට ඉදිරිපත් කළ ලිපියට තමන්ද අත්සන් කර ඇති නිසා එය කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය හමුවට යොමු කරන ලෙසට ඉල්ලා සිටියේය.

එකී නඩුව කොටුව මහෙස්ත්‍රාත්වරයා හමුවේ කැඳවීමෙන් පැමිණිල්ලට අගතියක් විය හැකි බව පැවසූ නීතිඥ සේනක පෙරේරා මහතා කළ කරුණු දක්වීම සලකා බැලූ මහෙස්ත්‍රාත් තිළිණ ගමගේ මහතා එම නියෝගය කළේය.



නිර්පාක්ෂික අගමැතිවරයෙක් පත් කරන්න කියලනේ බං ජනතාව ඉල්ලුවේ...
ඉතිං... ඒකනේ බං ආසනයක්වත් දිනාගන්න බැරිවුණ කෙනෙකුට ඒක දුන්නෙ.

## අභියෝගයට මම ලෑස්තියි...

තමාට මෙම අවස්ථාවේදී පටු දේශපාලන ආකල්ප අවශ්‍ය නැති බවත්, විද්වත් වෘත්තිකයන්ගේ, විවිධ මත දරන දේශපාලන පක්ෂවල ද සහයෝගය ලැබෙනු ඇතැයි විශ්වාස කරන බව ද සඳහන් කළේය.

තරුණ අභිලාශයන්ට මුල්තැන දෙමින් රටේ නිවැරදි ආර්ථික කළමනාකරණයක් හා ස්ථාවර භාවයක් ඇති රටක් බිහිකිරීමට තමාට කළ හැකි උපරිමය කරන බව ද අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

මේ අතර අග්‍රාමාත්‍යවරයා පෙරේදා (13 දා) ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බග්ලේ මහතා හමුවිය. එහිදී සිදුකළ සාකච්ඡාවක ප්‍රතිඵලයක් ලෙස අග්‍රාමාත්‍යවරයා ඉදිරි දින කීපයේදී ඉන්දියාවේ නිල සංචාරයක නිරතවීමට නියමිතය. මෙම සංචාරයේදී අග්‍රාමාත්‍යවරයා ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහතා හමු වී සාකච්ඡා පැවැත්වීමට බලාපොරොත්තු වේ. එහිදී ශ්‍රී ලංකාවේ දැනට පවතින ඉන්ධන ගැටලුව විසඳා ගැනීමට තවදුරටත් ඉන්දියාවේ සහාය ලබා ගැනීම අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා ඉන්දීය ණය සහන ලබාගැනීමේ වැඩසටහන තවදුරටත් දීර්ඝ කර ගැනීම සඳහා ද සාකච්ඡා පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

## උතුම් සම්බුදු....

බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණය යන බුදු තෙමඟුල සිදුවූයේ අද වැනි අසිරිමත් වෙසක් පුන් පොහෝ දිනකය.

ලෝක බෞද්ධ මහා සම්මේලනයේ යෝජනාවකට අනුව වෙසක් පුර පසළොස්වක පොහෝ දිනය සමස්ත ලෝකවාසී බෞද්ධයන්ගේ දිනය ලෙස පිළිගන්නා අතර එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනය විසින් වෙසක් පොහොය ජාත්‍යන්තර නිවාඩු දිනයක් ලෙසින්ද ප්‍රකාශයට පත්කර ඇත. අද දිනයේ දිවයින පුරා වෙහෙර විහාරස්ථානවල ආමිස පූජාවට මුල් තැනක් දෙමින් දාන, සීල, භාවනා වැඩසටහන් පැවැත්වෙයි. ප්‍රතිපත්ති පූජාවට අනුව දන්සල් පැවැත්වීම, තොරණ, වෙසක් පහන් කූඩු ආදිය ඉදිකිරීමටද කටයුතු සංවිධානය කර ඇත. රටේ පවතින වාතාවරණය අනුව මෙවර එම කටයුතු සීමාවී ඇත.

# රනිල්ට පොහොට්ටුවේ උපරිම සහය

## සාගර කාරියවසම් කියයි

අනුර බාලසූරිය, චමින්ද සිල්වා

දේශපාලන පක්ෂයක් ලෙස ස්වාධීනත්වය රැකගෙන රට මුහුණදී තිබෙන ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා වත්මන් අගමැති රනිල් වික්‍රමසිංහ මහතාට තම පක්ෂයේ සහයෝගය ලබදෙන බව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ සාගාර කාරියවසම් මහතා පැවසීය. මේ අවස්ථාවේ දේශපාලනයට වඩා රට ආර්ථික අර්බුදයෙන් ගොඩගැනීම ප්‍රධාන කාර්ය බැවින් ඒ සඳහා වගකිවයුතු දේශපාලන පක්ෂයක් විදියට සිය වගකීම ඉටු කරන බව ද හෙතෙම පැවසීය.

රටේ පවතින ආර්ථික අර්බුදය දඩමීමා කරගෙන ඇතැම් අන්තවාදී කල්ලි කණ්ඩායම් ප්‍රජාතන්ත්‍රවාදී නොවන ක්‍රමවලින් රට අස්ථාවර කරන්න දරන උත්සාහයන්ට ඉඩදිය නොහැකි බවත් තම පක්ෂය රට වෙනුවෙන් තිබෙන වග කීම් දේශපාලනය පදනම් කරගෙන පැහැර නොහරින බවත් හෙතෙම සඳහන් කළේය. ජනාධිපතිවරයාගේ ආරාධනාවට අනුව රජයේ ඇමැති ධුර පිළිබඳව තීරණයක් ගන්නා බව ද මන්ත්‍රීවරයා සඳහන් කළේය.

# සජබ ඇමැති ධුර ගන්නවා නම් ඉක්මනට නම් එවන්න

## ජනපති සජිත්ට ලියයි

රට බරපතළ දේශපාලන සහ ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් පවතින අවස්ථාවක නව අමාත්‍ය මණ්ඩලය පත්කිරීම ද බොහෝ කල් දැමීමට නොහැකි බැවින් ඊට සමගි ජනබල පක්ෂයෙන් ද ඇමැතිවරුන් ඇතුළත් කළ යුතු නම් නොපමාව දැනුම් දෙන ලෙස ආරාධනා කරන බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විපක්ෂ නායක සහ සමගි ජනබල පක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා වෙත ලිපියක් යවමින් සඳහන් කර ඇත.

එම ලිපිය මෙසේය.

අග්‍රාමාත්‍ය ධුරය භාරගැනීම සම්බන්ධයෙන් 2022 මැයි මස 12 දිනැතිව ඔබ විසින් මා වෙත යොමු කරන ලද ලිපියට පිළිතුරු වශයෙනි.

දැනට රට තුළ උද්ගතව පවතින සමාජ, ආර්ථික හා දේශපාලන අර්බුදය සම්බන්ධයෙන් විවිධ පාර්ශ්වවලින් ඉදිරිපත් වූ යෝජනා සැලකිල්ලට ගනිමින්, පාර්ලිමේන්තුවේ බහුතරයක් පක්ෂ නියෝජනය කරනු ලබන අන්තර්කාලීන ආණ්ඩුවක් පත්කිරීම සඳහා අවස්ථාව සලසමින්, අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ සමස්ත අමාත්‍ය මණ්ඩලය ඉල්ලා අස්වීමට පසුගිය මැයි මස 6 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එකඟතාවය ඇතිකර ගන්නා ලදි.

මෙම එකඟතාවයෙන් පසු, නව අන්තර්කාලීන රජයක අග්‍රාමාත්‍ය ධුරය භාරගන්නා ලෙසට මා විසින් මුලින්ම ආරාධනා කරන ලද්දේ ඔබටය. එම අවස්ථාවේදී, ඔබ විසින් මා වෙත දැනුම් දෙනු ලැබුවේ, ඒ සඳහා ඔබ සූදානම් නොමැති බවත්, කෙසේ වෙතත්, එම ආරාධනය සම්බන්ධයෙන් සමගි ජනබලවේගය හා සමගි ජනබල සන්ධානයේ සෙසු මන්ත්‍රී කණ්ඩායම සමඟ සාකච්ඡා කොට ඔබගේ තීරණය දැනුම් දෙනු ලබන බවයි. පසුගිය මැයි මස 9 වැනි දින හිටපු අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය ඉල්ලා අස්වන තුරු ද මේ සම්බන්ධයෙන් ඔබෙන් ප්‍රතිචාරයක් නොලැබුණු බැවින්, පවතින අස්ථාවර තත්ත්වය කඩිනමින් අවසන් කර අන්තර්වාර රජයක් පිහිටුවීම සම්බන්ධයෙන් එකඟතාවක් ඇතිකර ගැනීම සඳහා මා විසින් පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන අනෙකුත් පක්ෂ නායකයන් සමඟ ද සාකච්ඡා ආරම්භ කරන ලදි.

මේ අතර මැයි මස 10 වන දින ඔබ විසින් පුවත්පත් සාකච්ඡාවක් පවත්වමින් මගේ නායකත්වය යටතේ, අන්තර්වාර රජයක කිසිදු වගකීමක් භාර ගැනීමට ඔබ සූදානම් නොමැති බවට ප්‍රකාශ කරන ලදී. ඉහත තත්ත්වය තුළ අනෙකුත් පක්ෂ නායකයන් සමඟ කරන ලද සාකච්ඡාවන්ගේද ප්‍රතිඵලයක් වශයෙන්, මෙම අභියෝගාත්මක අවස්ථාවේ අග්‍රාමාත්‍ය ධුරය භාර ගැනීම සඳහා සුදුසුතම පුද්ගලයා ලෙස අවස්ථා කීපයකදීම මෙරට අග්‍රාමාත්‍ය ධුරය හොබවන ලද පරිණත දේශපාලනඥයකු වන රනිල් වික්‍රමසිංහ මහතා පත් කිරීමට මම තීරණය කළෙමි.

ඒ අනුව රනිල් වික්‍රමසිංහ මහතා 12 වැනිදා අග්‍රාමාත්‍ය ධුරයේ දිවුරුම් දීමට තීරණය වූ අතර, එසේ දිවුරුම් දීමට සුළු වේලාවකට පෙර ඔබ විසින් ඉහත ලිපිය මා වෙත යොමු කරමින්, මෙතෙක් සියලු පක්ෂ සමඟ සාකච්ඡා කොට එකඟ වී නැති කොන්දේසි කිහිපයක් යටතේ, අග්‍රාමාත්‍ය ධුරය භාර ගැනීමට සූදානම් බව දැනුම් දී ඇත.

කෙසේ වෙතත්, ඔබ විසින්ම අග්‍රාමාත්‍ය ධුරයේ වගකීම භාර ගැනීම ප්‍රතික්ෂේප කර තිබූ තත්ත්වයක් තුළ, පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන අනෙකුත් පක්ෂ නායකයන් සමඟද සාකච්ඡා කොට රනිල් වික්‍රමසිංහ මහතා අග්‍රාමාත්‍ය ධුරයට පත්කිරීමට මා විසින් ගනු ලැබූ තීරණය මේ මොහොතේ වෙනස් කළ නොහැකි බව දැනුම් දෙමි.

එසේ වුවද, පවතින ආර්ථික සහ දේශපාලන අර්බුදයට විසඳුම් සෙවීම, ජාතික අවශ්‍යතාවක් ලෙස සලකා ඔබේ පක්ෂයේ යම් පිරිසක් ඉදිරියේදී පත්කිරීමට නියමිත නව අමාත්‍ය මණ්ඩලයට ඇතුළත් කිරීමට එකඟ වන්නේ නම්, ඒ සම්බන්ධයෙන් නොපමාව මා දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් ආරාධනා කර සිටිමි.

රට බරපතළ දේශපාලන සහ ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් පවතින අවස්ථාවක, නව අමාත්‍ය මණ්ඩලය පත් කිරීම ද බොහෝ කල් දැමීමට නොහැකි බැවින් ඔබගේ කඩිනම් ප්‍රතිචාරය අගය කරමි.

# රනිල්ගේ සහායට එජාපයෙන් පස්කට්ටුවක්

## සාගල-ඉන්ධන හා ගෑස්, රුවන්-බෙහෙත්, වජිර හා රංගෙ-ආහාර, අකිල-පොහොර

හේමන්ත රන්දුණු, නෝමන් පලිහවඩන

රටේ පවතින බරපතළම අර්බුද වන ඉන්ධන, ඖෂධ, අත්‍යවශ්‍ය භාණ්ඩ සහ පොහොර ලබාදීම සම්බන්ධයෙන් පවතින ගැටලු සහ ඒවාට විසඳුම් ලබාදීම සම්බන්ධයෙන් සොයා බලා වහාම වාර්තාවක් ලබා ගැනීමට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා එක්සත් ජාතික පක්ෂයේ හිටපු මන්ත්‍රීවරුන් පස්දෙනකු පත්කර ඇත.

ඒ අනුව පවතින ප්‍රධානම අර්බුදයන්ගෙන් එකක් වන ඉන්ධන සහ ගෑස් සැපයීම සම්බන්ධව පවතින ගැටලු සහ ඒවාට කඩිනමින් විසඳුම් ලබාගැනීම පිළිබඳව සොයා බලා වාර්තාවක් ලබා ගැනීමට පසුගිය රජයේ හිටපු අමාත්‍යවරුන් වන සාගල රත්නායක මහතා පත්කර ඇත.

ඖෂධ හිඟය සම්බන්ධව සොයා බැලීමට හිටපු අමාත්‍යවරයකු වන රුවන් විජේවර්ධන මහතාත්, කිරිපිටි, සීනි, සහල් ඇතුළු අත්‍යවශ්‍ය ආහාර ආනයනය කිරීම සහ ඒවා හිඟයකින් තොරව බෙදාහැරීම සම්බන්ධව සොයා බැලීමට වජිර අබේවර්ධන සහ පාලිත රංගෙ බණ්ඩාර යන හිටපු අමාත්‍යවරුන්, රසායනික පොහොර සම්බන්ධ ගැටලු සොයා බැලීමට හිටපු අමාත්‍යවරයකු වන අකිල විරාජ් කාරියවසම් මහතාත් පත්කර ඇත. දින තුනක් ඇතුළත මෙම ගැටලු සම්බන්ධව සොයා බලා වාර්තාවක් ලබාදෙන ලෙස අග්‍රාමාත්‍යවරයා මෙම පිරිසට උපදෙස් දී තිබේ. මේ අතර රජයේ කිසිදු ආයතනයකට අලුතින් දේශපාලන පත්වීම් සිදු නොකිරීමට ද තීරණය කර ඇත.

# මෛත්‍රීලා - විමල්ලා ඇමැති ධුර එපා කියති හොඳ දේට සහාය

අනුර බාලසූරිය, චමින්ද සිල්වා

අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රමුඛ ආණ්ඩුවේ ඇමැති ධුර භාර නොගැනීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ ආණ්ඩුවෙන් ඉවත් වී පාර්ලිමේන්තුවේ ස්වාධීන වූ පක්ෂ 10 කණ්ඩායම තීරණය කර ඇත.

නව ආණ්ඩුවේ ඇමැති මණ්ඩලයට එක්වී සහයෝගය ලබාදීමට තම පක්ෂයට ආරාධනා ලැබුණු බව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායක, හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා පැවසීය. ශ්‍රීලනිපය බලාපොරොත්තු වන්නේ සර්ව පාක්ෂික ආණ්ඩුවක් බවත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් රනිල් වික්‍රමසිංහ මහතා අගමැති ලෙස පත් කිරීම මගින් එය ප්‍රතික්ෂේප කර ඇතැයි ද සඳහන් කළේය.

තම කණ්ඩායම ඇමැති ධුර භාර නොගත්ත ද අලුතින් පිහිටුවන ආණ්ඩුව කඩාකප්පල් කිරීමට කටයුතු නොකරන බවත් ඔවුන් රටට යහපත් යෝජනා ඉදිරිපත් කළහොත් ඊට සහාය ලබාදෙන බවත් හිටපු ඇමැති විමල් වීරවංශ මහතා පැවසීය. එමෙන්ම රට අරාජික වීමට ඉඩ නොතබන බවද ඔහු කීවේය.

# ඉන්දියානු වීසා අත්හිටුවූ කතාව බොරුවක්

ඉන්දීය මහකොමසාරිස් කාර්යාලය මගින් වීසා නිකුත් කිරීම අත්හිටුවා ඇතැයි පැතිර යන ප්‍රචාර අසත්‍ය බව ශ්‍රී ලංකාවේ පිහිටි ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කරයි.

පසුගිය දිනවල රටේ පැවති වාතාවරණය මත මහකොමසාරිස් කාර්යාලයේ සේවය කරන පිරිස් වෙත රාජකාරි කටයුතුවලට පැමිණීමට ඇති වූ දුෂ්කරතා නිසා වීසා නිකුත් කිරීමට නොහැකි වූ බව සඳහන් කරයි.

රටේ සාමකාමී වාතාවරණයක් ඇති වූ වහාම නැවත සාමාන්‍ය පරිදි වීසා නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බවද ඉන්දීය මහකොමසාරිස් කාර්යාලය නිකුත් කළ නිවේදනයේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

# මන්ත්‍රී ආරක්ෂාව තර කෙරේ

## 1ට 6කේ ටී. 56 2ක්

හේමන්ත රන්දුණු

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාවට යොදවා ඇති පොලිස් නිලධාරීන්ගේ සංඛ්‍යාව 6 දක්වා ඉහළ නංවා තිබේ.

විශේෂ චක්‍රලේඛයක් අනුව එම පියවර ගෙන ඇති අතර එම 6 දෙනාගේ කණ්ඩායමට උප පොලිස් පරීක්ෂකවරයකු ද ඇතුළත් වේ. එම ආරක්ෂක කණ්ඩායම්වලට ටී. 56 ගිනි අවි දෙක බැගින් නිකුත් කිරීමට ද අවසර දී තිබේ. මීට පෙර නිලධාරීන් 2 - 4 ත් අතර සංඛ්‍යාවක් මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාවට ලබා දී තිබිණි.

# නොපමාව කුසල් රැස්කර ගනිමු

## විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස

'ධර්මයෙහි හැසිරෙන්නා ධර්මය විසින්ම ආරක්ෂා කරනු ඇතැයි' යන උතුම් බුදු වදනට අනුගතව 'නොපමාව කුසල් රැස් කිරීම' මේ උතුම් තෙමඟුල් දිනයෙහි සියලු හදවත් තුළ තිරසාරව සනිටුහන් කරගැනීම ඉතා වැදගත් යැයි විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා නිකුත් කළ වෙසක් දින පණිවුඩයේ සඳහන් කර ඇත. එම පණිවුඩය මෙසේය. සකල ලෝකවාසී බෞද්ධයාගේ සුවිශේෂී ආගමික දිනය වන වෙසක් පුර පසළොස්වක පොහොය දිනය අදට යෙදී තිබේ.

විශ්වයේ පවත්නා පරම සත්‍යය නුවණින් දැක බුදුන් වහන්සේ දේශනා කළ ශ්‍රී සද්ධර්මය දිනෙන් දින සනාථ කරන්නේ උන් වහන්සේගේ ධර්මයෙහි සර්වකාලීන බවයි.

උන්වහන්සේ දේශනා කළ සුවාසූදහසක් ධර්ම ස්ඛන්ධයෙහි සියලුම කොටස් ගම්‍ය කරන්නේ පරම සත්‍ය යි. උතුම් පොහෝ දිනය ශාසනික වශයෙනුත්, ඓතිහාසික වශයෙනුත් අතිශයින්ම වැදගත්ය. බෞද්ධයන් තෙමඟුල සැමරෙන වෙසක් පොහෝ දිනයේදී අතීතයේ සිට ආමිස හා ප්‍රතිපත්ති පූජාවල නිරත වන අතර ආගමික කටයුතු කෙරෙහි නැඹුරුතාවයක් දක්වයි. බලලෝභීත්වය, අවස්ථාවාදීත්වය, ආත්මාර්ථකාමීත්වය වෙනුවට පරාර්ථකාමීත්වය තුළින් ලෝකය අසිරිමත් කිරීමේ පණිවිඩය භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රායෝගිකවම ලොවට හෙළි කළ සේක. ජාති, ආගම්, කුල වැනි සියලු බෙදීම් අර්ථ ශුන්‍ය යැයි දේශනා කළ බුදුරජාණන් වහන්සේ, උස් පහත් බව මිනිය හැකි වන්නේ පුද්ගලයා ජීවත් වන ආකාරය අනුව යැයි දේශනා කළහ. උන් වහන්සේ විසින් අනුදැන වදාළ සුවිශේෂී දහම් කරුණු වර්තමාන ජීවිතවලට ප්‍රායෝගිකවම යොදාගත හැකි බව සත්‍යයයි.

'ධර්මයෙහි හැසිරෙන්නා ධර්මය විසින්ම ආරක්ෂා කරනු ඇතැයි' යන උතුම් බුදු වදනට අනුගතව 'නොපමාව කුසල් රැස් කිරීම' මේ උතුම් තෙමඟුල් දිනයෙහි සියලු හදවත් තුළ තිරසාරව සනිටුහන් කර ගැනීම ඉතා වැදගත්ය.

# රනිල්ගේ ආණ්ඩුවට සජබ සහාය දෙන්නේ නෑ

## - සජබ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර

චමින්ද සිල්වා

අගමැති රනිල් වික්‍රමසිංහ මහතා යටතේ රජයක් පවත්වාගෙන යෑමට සමගි ජනබලවේගය පක්ෂයේ සහයක් ලබාදෙන්නේ නැතැයි සජබ මහ ලේකම් රංජිත් මද්දුමබණ්ඩාර මහතා පැවසීය.

රනිල් වික්‍රමසිංහ මහතා අගමැතිවරයා ලෙස පත් කළ ද පාර්ලිමේන්තුව තුළ බහුතරයක් නැතැයි ද ඊයේ (13 දා) පැවති මාධ්‍ය හමුවකදී රංජිත් මද්දුමබණ්ඩාර මහතා පැවසීය. පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසය ඇති පුද්ගලයා අගමැතිවරයා ලෙස පත්කර ගත යුතු යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන්ව ඇති බවත් ඒ අනුව අගමැතිවරයා ලෙස සජිත් ප්‍රේමදාස මහතාට එම අවස්ථාව ලබාදිය යුතු බවත් ඔහු කීය.

# අගමැති රනිල්ට ලොව වටේනම සුබ පැතුම්

චමින්ද සිල්වා

නව අග්‍රාමාත්‍යවරයා ලෙස දිවුරුම් දුන් රනිල් වික්‍රමසිංහ මහතා වෙත ඇමරිකාව, ඉන්දියාව ඇතුළු රටවල් කිහිපයකින් සහ යුරෝපා සංගමයෙන් සුබ පැතුම් එක්කර තිබේ.

ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපති ජුලී චන්ග් මහත්මිය සිය ට්විටර් ගිණුමේ සටහනක් තබමින් සඳහන් කළේ නව අග්‍රාමාත්‍යවරයා සමග එක්ව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බවයි. රනිල් වික්‍රමසිංහ මහතා අගමැතිවරයා ලෙස පත් කිරීම සහ කඩිනමින් නව රජයක් පිහිටුවීම ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයට විසඳුමක් ලබාගැනීමටත්, ආර්ථික ස්ථාවරත්වයට ඇති පළමු පියවර බවත් ඇය පෙන්වා දී ඇත.

එමෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග අර්ථවත් ප්‍රගතියක් ලබා ගැනීමට සහ සියලු ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතා සපුරාලීමට දීර්ඝකාලීන විසඳුමක් ලබාදීමට රජය දිරිමත් කරන බවද ඇය වැඩිදුරටත් සඳහන් කර ඇත.

මෙරට දේශපාලන ස්ථාවරත්වය අපේක්ෂා කරන බව ශ්‍රී ලංකාවේ ඉන්දීය මහකොමසාරිස් ගෝපාල් බග්ලේ මහතා ට්විටර් පණිවුඩයක් නිකුත් කරමින් සඳහන් කරයි. රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා ලෙස දිවුරුම් දීමෙන් අනතුරුව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදයන්ට අනුකූලව පිහිටුවන ශ්‍රී ලංකා රජය සමග කටයුතු කිරීමට අපේක්ෂා කරන බවත් පවසන ඉන්දීය මහ කොමසාරිස්වරයා ශ්‍රී ලංකාවේ ජනතාව වෙනුවෙන් ඉන්දියාවේ කැපවීම තවදුරටත් අඛණ්ඩව පවතිනු ඇති බවද සඳහන් කරයි.

බ්‍රිතාන්‍ය හා යුරෝපා සංගමය නියෝජනය කරන ප්‍රවීණ දේශපාලනඥයකු වන ශ්‍රී ලාංකික නිරන්ජන් දේවාආදිත්‍ය මහතා ට්විටර් පණිවුඩයක් නිකුත් කරමින් සඳහන් කළේ ශ්‍රී ලංකාව දැන් මුහුණදී සිටින අවුල්සහගත වාතාවරණයෙන් මිදීමට අවශ්‍ය සම්බන්ධතා හා පළපුරුද්ද සහිත එකම ශ්‍රී ලාංකික දේශපාලනඥයා රනිල් වික්‍රමසිංහ මහතා බවයි. ඔහුට ඒ සම්බන්ධයෙන් විශේෂ සේවයක් කළ හැකි බවත්, අවසන් වරට අග්‍රාමාත්‍ය ධුරය දැරූ සමයේ හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා ඔහුගේ දෑත් බැඳ තැබූ බවත් ඒ මහතා සඳහන් කරයි.

# ඩොලරය පහතට

ශ්‍යාම් නුවන් ගනේවත්ත

ඇමෙරිකානු ඩොලරයක් සඳහා වන රුපියල් අගයෙහි සුවිශේෂී ලෙස පහළ යෑමක් පෙරේදා (13 වැනිදා) වාර්තා වූ අතර ඊට හේතු වී ඇත්තේ මහ බැංකුව විසින් වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්ට ලිඛිතව ලබා දී ඇති නව මෙහෙයුම් උපදෙස්ය.

එම ලිපිය මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා විසින් ඉකුත් 12 වැනිදා යවා ඇත.

මේ අනුව විනිමය අනුපාතිකයේ අභ්‍යන්තර අස්ථාවරත්වය කළමනාකරණය කිරීම සඳහා මහ බැංකුව මැදිහත්ව තිබේ.

මේ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල දෛනික විනිමය අනුපාතික සටහනට අනුව පෙරේදා ඇමෙරිකානු ඩොලරයක විකුණුම් මිල රු. 364.98 ක් ලෙසින් සටහන්ව තිබුණු අතර මෙරට බලපත්‍රලාභී වානිජ බැංකු සියල්ලක්ම පාහේ ඒ අනුව යමින් ඩොලරයක විකුණුම් මිල රු. 365 ක් ලෙසින් වාර්තා කර තිබුණි. පසුගිය මාර්තු 09 දා සිට ශ්‍රී ලංකා රුපියලේ අගය පා කිරීමට ගත් තීරණයත් සමග විදෙස් මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල විශාල වශයෙන් අවප්‍රමාණයට ලක්විය. එසේම ඉකුත් බදාදා (11 දා) පැවැති මාධ්‍ය හමුවක දී ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා කියා සිටියේ විනිමය අනුපාතිකයේ අභ්‍යන්තර අස්ථාවරත්වය කළමනාකරණය කිරීම සඳහා මහ බැංකුව මැදිහත් වන බවයි.

# ජූනි මාසයට ඉන්ධන නැවක් ඇණවුම් කර නෑ

චමින්ද සිල්වා

ජූනි මාසයේ මෙරටට කිසිදු ඉන්ධන නැවක් ඇනවුම් කර නොමැති නිසා රටේ ඉන්ධන අර්බුදයක් ඇතිවිය හැකි යැයි තෙල් සංස්ථා අභ්‍යන්තර ආරංචි මාර්ග සඳහන් කරයි.

මෙම මස 16, 17 දිනවල ඉන්දියන් ණය යටතේ ඩීසල් නැව් දෙකක් සහ ඉන්පසු පෙට්‍රල් නැවක් පැමිණීමට නියමිත බවත් එම ආරංචි මාර්ග පැවසීය.

මෙම නැව් පැමිණීමෙන් පසු ඉන්දීය ණය යටතේ මෙරටට ඉන්ධන ලබාදීම අවසන් වන බවත්, ජූනි මාසයේදී ඉන්ධන ලබාගැනීම සම්බන්ධයෙන් තෙල් සංස්ථාවට තවමත් හැකියාවක් නොමැති වී ඇති බවත් එම ආරංචි මාර්ග පැවසීය. මේ වන විට මිලියන 71 ක් ගෙවා ලබා ගැනීමට තිබූ බොරතෙල් නැවක්, පෙට්‍රල් නැවක් සහ දැවිතෙල් නැවක් මෙරටට ළඟා වී දින ගණනාවක් ගත වී ඇතත් ඒවායේ ඉන්ධන ගොඩබෑමට ඩොලර් නොමැතිවීම නිසා හැකියාව නැති වී ඇති බවත් එම ආරංචි මාර්ග වැඩිදුරටත් පැවසීය.

# ප්‍රචණ්ඩක්‍රියා ගැන තොරතුරු දෙන්න දුරකථන අංක 5 ක්

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන්

අරලියගහ මන්දිරය සහ ගාලු මුවදොර ආශ්‍රිත ප්‍රදේශයේදී පසුගියදා ඇතිවූ ප්‍රචණ්ඩකාරී සිද්ධිවලට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා පොලිසිය විසින් දුරකථන අංක කීපයක් මහජනතාව වෙත හඳුන්වා දී තිබේ. එම තොරතුරු 0112-422176, 0112-320145, 0718-592087, 071-8594942, 0718-594901 යන දුරකථන අංකවලට ලබාදෙන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි. පසුගිය 09 වැනිදා සිදුවූ එම සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂණ අරඹා තිබේ. ඒ අනුව එහිදී පහර කෑමට ලක්වූ පිරිසට තුවාල ලැබූ පුද්ගලයන්ට සහ හානි වූ දේපළ සම්බන්ධයෙන් පවතින තොරතුරු පිළිබඳව දන්නා පුද්ගලයන්ට අදාළ දුරකථන අංක ඔස්සේ තොරතුරු ලබාදිය හැකි බව පොලිස් මාධ්‍ය කොට්ඨාසය පවසයි.

1987 වර්ෂයේ ඉන්දීය හමුදාව ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාව



# ශ්‍රී ලංකාවට ආයෙත් ඉන්දීය හමුදා එයිද?

ආරක්ෂාව

කීර්ති වර්ණකුලසූරිය

1987 ජූලි 30 දා ඉන්දීය සාම හමුදාවේ බලකායන් 30ක් මෙරටට පැමිණ පලාලි ගුවන් කඳවුර අත්පත් කරගනු ලැබීය. ජනරාල් හරිකිරාත් සිංගේ මූලිකත්වයෙන් යුත් මෙම ඉන්දීය බලසේනාවන් පලාලි වෙත එනතුරු පලාලි කඳවුරේ අණදෙන නිලධාරියා ඒ බව දැන සිටියේ නැත.

එවකට ඉන්දීය අගමැතිව සිටි රජීව් ගාන්ධි ශ්‍රී ලංකා ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන බියගන්වා 1987 ජූලි 20 දා ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කර පැය 24ක් ගතවීමට පෙර ඉන්දීය සාම හමුදාව මෙරටට ගොඩබැස්සේය.

මේ පසුබිම මැද භාරතීය ජනතා පක්ෂයේ ජ්‍යෙෂ්ඨ නායකයකු වූ සුබ්‍රමනියම් ස්වාමි ඉන්දීය රජයෙන් ඉල්ලීමක් කරමින් වහාම ශ්‍රී ලංකාවට ඉන්දීය හමුදාව යවන ලෙස ඉල්ලා ඇත. ඉන්දීය විරෝධී පාර්ශ්ව රට තුළ අර්බුදයක් ඇති කරනවා. මේ තත්ත්වය ඉන්දියාවේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් යැයි සුබ්‍රමනියම් ස්වාමි තවදුරටත් ප්‍රකාශ කර තිබේ.

ඉන්දීය අගමැති මෝදිගේ හිතවතකු වූ සුබ්‍රමනියම් ස්වාමි කළ මේ බරපතළ ඉල්ලීමට ඉන්දියාව එකඟවේද? මෙයට වසර 35කට පෙර ඉන්දීය සාම හමුදාව මෙරටට පැමිණ ආපසු මෙරටින් ගියේ 1990 මාර්තු 24 වැනිදායි. ඒ වන විට ඉන්දීය හමුදා භටයන් 1100ක් මරුමුවට පත් වී තිබුණි.

මේ පසුබිම මැද ඇමෙරිකාව ඉන්දීය සාගරයේ ආරක්ෂාව උදෙසා යැයි දක්වමින් කුවාඩ් ගිවිසුමට ඉන්දියාවත් ඇතුළත් කරගෙන තිබේ. මෙම තත්ත්වය මත මෙරට ඇති වී තිබෙන අරාජික තත්ත්වය ඉන්දියාවේ ආරක්ෂාවට තර්ජනයක් යැයි කියමින් ඉන්දීය රජය මෙරට තත්ත්වය ගැන දැඩි නිරීක්ෂණයක යෙදී සිටින බව පැහැදිලිය.

එසේම ඉන්දීය රෝ බුද්ධි සේවාවේ මෙරට සහ ඉන්දීය ඔත්තුකරුවන් ශ්‍රී ලංකාවේ සිදුවීම ගැන නිරතුරුවම නවදිල්ලියේ රෝ මූලස්ථානයට තොරතුරු සපයන බව වාර්තා වී ඇත.

සුබ්‍රමනියම් ස්වාමි ඉන්දීය හමුදාව මෙරටට යවන ලෙස ඉල්ලා ඇත්තේ රටේ ව්‍යවස්ථාව ආරක්ෂා කළ යුතු බව දක්වමිනි. එසේම ඔහු හිටපු අගමැති මහින්ද රාජපක්ෂගේ හිතවතෙකි.

මේ තත්ත්වය මැද ඉන්දීය ආරක්ෂක උපදේශක අජිත් ඩෙවොල් ද ශ්‍රී ලංකාවේ අනාරක්ෂිත තත්ත්වයක් ඇති වන්නේද යන්න බලාසිටියි.

ඉන්දීය හමුදාවට මෙරටට පැමිණීමට ඉඩ ලැබෙන්නේ යම්කිසි ලෙසකින් ඉන්දීය අයිතිවාසිකම් සහ ඉන්දීය සමාගම්වලට තර්ජනයක් එල්ල වුවොත් පමණකි. එහෙත් අතීතය සිහිපත් කළ යුතුයි. ඉන්දීය ආරක්ෂක උපදේශක අජිත් ඩෙවොල්ගේ මෙහෙයුමකින් මෙයට පෙර මහින්ද රාජපක්ෂ රජය බිඳ වැටුණි.

එසේම උතුරේ සිටින ද්‍රවිඩ දේශපාලකයන් තිදෙනෙක් ප්‍රධාන පෙළේ රෝ ඔත්තුකරුවන්වේ. ප්‍රභාකරන් විසින් රජීව් ගාන්ධි ඝාතනය කිරීමට සැලසුම් කරන බවට ඉන්දීය සාම හමුදාවේ බුද්ධි ප්‍රධානී කර්නල් හරිහරන්ට තොරතුරු සැපයුවේ ඉන් එක් ඔත්තුකරුවෙකි. මේ රෝ ඔත්ත්තුකරුවන් උඩරට කඳුකරයේද ක්‍රියාත්මක වේ. මෙම පසුබිම යටතේ ඉන්දියාව තම හමුදාව ඇතැම් රටවලට යවා ඇත්තේ ජාතික ආරක්ෂාවට මුවාවෙමිනි. හිටපු ඉන්දීය අගමැතිනි ඉන්දිරාගාන්ධි සීකිම් රට අල්ලා ගැනීමට හමුදාව යැව්වේද ආරක්ෂාවට තර්ජනයක් යැයි කියමිනි. එසේම ඉන්දීය හමුදා සහයෙන් නැගෙනහිර පාකිස්තානය බංගලදේශය විය. මෙවන් තත්ත්වයන් මැද තමිල්නාඩුවේ කොටි හිතවාදින්ද ඉන්දීය හමුදාව ශ්‍රී ලංකාවට යනතුරු බලාසිටී. තමිල්නාඩුවේ වයිකෝ, සීමන් නොල් තිරුමාවලන් වැනි බෙදුම්වාදීන් වන්නි මෙහෙයුම සමයේ ශ්‍රී ලංකාවට ඉන්දීය හමුදාව යවන ලෙස කීපවතාවක්ම ඉන්දීය රජයෙන් ඉල්ලා තිබුණි. මේ අතර ශ්‍රී ලංකාවේ පවතින අභ්‍යන්තර අරගලය ඉන්දියාවේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් නොවේ. එහෙත් ඇමෙරිකාවද අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට බලාසිටී. ජපානයේ නෙක්කි වෙබ් අඩවියේ විමර්ශකයා පැවසුවේ ඇමෙරිකාව සහ ඉන්දියාව එක්ව ශ්‍රී ලංකාවට සහය වී ඒ වෙනුවට ඇමෙරිකානු ඉන්දීය ගිවිසුමට ශ්‍රී ලංකාව කැමැති කර ගැනීමේ අවස්ථාව පැමිණ ඇති බවයි. එසේම ශ්‍රී ලංකාවේ මහා පරිමාණ අර්බුදයක් ඇතිවනතුරු විදේශ රටවල් බලාසිටින බවද පැහැදිලි වේ.

මේ තත්ත්වය මත හිටපු ශ්‍රී ලංකා අගමැති ඉන්දියාවේ රැකවරණ පතා ඇති බවට දැක්වෙන තොරතුරු ඉන්දීය රජය ප්‍රතික්ෂේප කර ඇත. ඊට පෙර ඉන්දියානු ප්‍රාන්තයක් කිරීමට ශ්‍රී ලංකාව එකඟවන්නේ නම් තෙල් ගෑස් ඇතුළු සියලු ආහාර ද්‍රව්‍ය ශ්‍රී ලංකාවට සපයන බවට ඉන්දීය විදේශ ඇමැති ජයිශංකර් කළ බව කියන ප්‍රකාශය ඉන්දීය රජය ඉවත දමනු ලැබීය.

එහෙත් ශ්‍රී ලංකා රජය කැබිනට්ටුවට නොදන්වා ඉන්දීය රජය සමඟ ආරක්ෂක ගිවිසුම් කීපයකට එකඟ වී තිබුණි. මේ ගිවිසුම්වලට අත්සන් කළේ ඇමෙරිකානු පුරවැසියකු වූ මෙරට හිටපු මුදල් ඇමැතිවරයායි.

මේ අතර ශ්‍රී ලංකාව විසින් ඉන්දියාවේ තානාපති ලෙස පත්කළ ඇමෙරිකානු පුරවැසියන් ඉන්දීය අන්තවාදී ආර්. එස්. එස්. සංවිධානයේ නායකයා සමඟ සාකච්ඡාවක නිරත වී ඇත. එම ආර්. එස්. එස්. නායකයා සමඟ සාකච්ඡා කළ මෙරට හිටපු ඇමෙරිකානු තානාපති අතුල් කේශාප් ඇමෙරිකානු රජය තානාපති සේවයෙන් පහ කරනු ලැබීය.

මෙම පසුබිම මැද සුබ්‍රමනියම් ස්වාමිගේ ප්‍රකාශය ගැන මෙරට විරුද්ධ පක්ෂද මෙතෙක් කිසිදු ප්‍රකාශයක් කර නැත. එහෙත් ශ්‍රී ලංකා රජය ඉන්දියාවේ අවශ්‍යතා රැසක් ඉටුකර ඇත. පලාලි ගුවන් තොටුපළ ජාත්‍යන්තර ගුවන් තොටුපළක් ලෙස හඳුන්වා ඊට යාපනය ලෙසද නම් කෙරුණි. මේ පසුබිම 2019 සැප්තැම්බර් 3 වැනි දා ඉන්දීය සාම හමුදාවේ හිටපු මේජර් ජෙනරාල් අශෝක් මෙහෙතා මෙරට ආරක්ෂක සමුළුවට සහභාගි වීමෙන් පසු මාධ්‍ය අමතා ශ්‍රී ලංකා රජය යුද අපරාධ ගැන විමර්ශනයක් කළ යුතු බව පැවසුවේය. එහෙත් 1987 ඔක්තෝම්බර් 21 සහ 22 දෙදින තුළ ඉන්දීය සාම හමුදාව යාපනය රෝහලට කඩාවැදී වෛද්‍යවරු ඇතුළු කාර්ය මණ්ඩලයේ 60කට අධික සංඛ්‍යාවක් ඝාතනය කිරීම ගැන අද වනතුරු ඉන්දීය රජය යුද අපරාධ පරීක්ෂණයක් සිදු කළේ නැත. මේ තත්ත්වය මත ඉන්දීය එන්. ඩී. ටී. වී. රූපවාහිනිය ශ්‍රී ලංකාව අරාජික තත්ත්වයට පත්ව ඇති බවට දන්වා ඇත.

මේ අතර ඉන්දීය රජය පැවසුවේ ශ්‍රී ලංකාවට ඉන්දීය හමුදාව එවීමේ කිසිදු සූදානමක් නැති බවයි. මේ බව මෙරට ඉන්දීය තානාපති ගෝපාල් බග්ලේද සනාථ කර තිබේ. එසේම හමුදාපති ශවේන්ද්‍ර සිල්වා පැවසූවේ ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාවට රටේ තත්ත්වය පාලනය කළ හැකි බවයි.

මේ අතර 1976 මැයි 5 දා ලිබරේෂන් ටයිගර්ස් ඔෆ් ටැමිල් ඊළම් හෙවත් තමිල් ඊළම් විමුක්ති කොටි නැමැති සංවිධානය ආරම්භ විය. වසර 33කට පසු එනම් 2009 මැයි 18 දා මෙම ත්‍රස්ත සංවිධානය පමණක් නොව එහි නායක වේලුපිල්ලේ ප්‍රභාකරන්ද විනාශ කර දැමීමට මෙරට හමුදාවට හැකි විය. පසුගිය මැයි 5 දා ප්‍රභාකරන්ගේ කොටි සංවිධානය සිදු කළ අපරාධ එකිනෙක කොටි වෙබ් අඩවියක් විසින් අනාවරණය කෙරුණි. 1976 අගෝස්තු 2 දා උරුම්පරායිහි ඉන්ධන ගබඩා කළමනාකරු වූ තවරාසා මරා දමනු ලැබීය. අනතුරුව 1977 පෙබරවාරි 14 වැනිදා කරුණානිධි නැමැති පොලිස්භටයා වෙඩි තබා මරා දමනු ලැබීය. 1977 මැයි 18 වැනිදා තවත් පොලිස් භටයන් දෙදෙනකුද ඝාතනය විය. එසේම 1978 ජනවාරි 27 වැනිදා පොතුවිල් ද්‍රවිඩ සංධාන අපේක්ෂක කනගරත්නම් මරා දමනු ලැබීය. ඉන්පසු 1978 අප්‍රේල් 7 වැනිදා මුරුක්කන් මඩු පාරේදී පොලිස් පරීක්ෂක බස්තියන් පිල්ලේ ඇතුළු පොලිස් ඔත්තුකරුවන් සිව්දෙනකුද ඝාතනය කළේය.

1978 මාර්තු 5 වැනිදා තිරුනවේලිහි රජයේ බැංකුවකින් රුපියල් ලක්ෂ 12ක් පැහැර ගත්තේය. අපේ ජනපති ප්‍රභාකරන් ගරිල්ලා ප්‍රහාර මර්දනය කිරීමට තීරණය කරනු ලැබීය. 1982 අගෝස්තු 2 දා නෙල්ලිඅඩි පොලිසියට එල්ල කළ ප්‍රහාරයෙන් භටයන් සිව්දෙනෙක් මරුමුවට පත් විය. 1982 ජූලි 27 චාවාකච්චේරි පොලිසියට එල්ල කළ ප්‍රහාරනයෙන් භටයන් තිදෙනකු මියගිය අතර අවි රැසක් පැහැරගනු ලැබීය. 1983 පෙබරවාරි 18 දා පේදුරුතුඩුව පොලිසියටද ප්‍රහාර එල්ල විණි. එහිදී භටයන් දෙදෙනෙක් මියගියහ. 1983 අප්‍රේල් 23 දා කොටි සංවිධානය යූ. එන්. පී. ආධාරකරුවන් තිදෙනකු මරාදැමුවේ අනිකුත් දමිළ ද්‍රෝහීන්ට අනතුරු අඟවමිනි.

මේ වනවිට ප්‍රභාකරන් සතුව 14 කගෙන් යුත් කණ්ඩායමක් විය. තිරුනාවෙලි පලාලි මාර්ගයේදී හමුදා වාහන පේළියකට එල්ල වූ බෝම්බ ප්‍රහාරයෙන් හමුදා භටයන් 13ක් ඝාතනය විය. අවි ආයුධ රැසක්ද අල්ලා ගනු ලැබීය. මෙහිදී සෙබළුන් 7ක් වෙඩි තබා මැරුවේ ප්‍රභාකරන්ය. තුවාල ලබා සිටි සෙබළුන් 7ක් ප්‍රභාකරන් මැරූ බව කොටි සංවිධානය පිළිගන්නේ වන්නි මෙහෙයුමින් වසර 13කට පසුවය. එසේම ඉන්දියාව කොටි සංවිධානයට සුළු අවි ලබාදීමටද ක්‍රියා කළේය. 1983 පෙබරවාරි 24 වැනිදා කොටි සංවිධානය ශ්‍රී ලංකා හමුදාවට එරෙහිව හමුදා මෙහෙයුම් ආරම්භ කිරීමට ක්‍රියා කළේය. එදා සිට 2009 මැයි 18 දා ප්‍රභාකරන් මරුමුවට පත්වනතුරු යුද්ධයට වැය වූ මුදල රුපියල් බිලියන 30000ක් වේ. 1983 සිට 2009 දක්වා කාලය තුළ ජීවිත 80000ත් 100,000ත් අතර අහිමි විය. මෙරට හමුදා නිලධාරීන් 23790ක්ද ඉන්දීය සාම සාධක භටයන් 1155ක්ද මරුමුවට පත් වූහ. මෙම සමයේදී කොටි සංවිධානය බිම් බෝම්බ ලක්ෂ 16කට අධික සංඛ්‍යාවක් වළදමා තිබුණි.

මේ පසුබිම මැද 2022 මැයි 18 වැනිදාට යෙදෙන කොටි පැරදවීමේ 19 වැනි සංවත්සරය අමතක වී ඇත. මෙයට වසර ගණනකට පෙර කොටි පැරදවීමේ යුද මෙහෙයුම සැලසුම් කළ අවස්ථාවේ එහි තොරතුරුද කොටි බුද්ධි සේවාවට හෙළි වීය. එදා වන්නි මෙහෙයුම නතර කිරීමට උත්සාහ කළ පාර්ශ්ව කළ ප්‍රකාශ මෙසේය.

''ජර්මානු හමුදාව පරාජය වූ අයුරින් ශ්‍රී ලංකා හමුදාව කිලිනොච්චියේදී මුළුමනින්ම වැනසෙනවා- රෝ සංවිධානයේ හිටපු ප්‍රධානී බී. රාමන්

මගේ සොහොයුරා පැරදවිය හැකි හමුදාවක් හෝ ජගතෙක් ලොව නැහැ. ප්‍රභාකරන්ගේ සොහොයුරිය විනෝදනි- මේ ප්‍රශ්නය යුද්ධයෙන් අවසන් කළ නොහැකියි.

හිටපු හමුදා ප්‍රකාශක සරත් මුණසිංහ-

ඊළම් යුද්ධයෙන් හමුදාව වැනසෙනවා- සක්කිරියන්-වීරකේසරි

ප්‍රභාකරන් පැරදවිය නොහැකියි. ඉන්දීය ලේඛිකා ඇනිටා ප්‍රතාප්

ප්‍රභාකරන් පැරදවිය හැකි යැයි සිතීම සිහිනයක්. නෝර්වේ හිටපු අමාත්‍ය එරික් සෝල්හයිම්


එහෙත් වසර දෙකකුත් මාස 10ක් තුළ කොටි සංවිධානය පරාජය කිරීමට ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවට හැකිවිය. වන්නි මෙහෙයුම නිමාවන විට කොටි සංවිධානය සතුව තිබී සොයාගත් අවි ආයුධවල වටිනාකම ඩොලර් තිස්හතර කෝටි හතළිස් දෙළක්ෂයක් හෙවත් මෙරට මුදලින් රුපියල් කෝටි 3500ක් විය. එහෙත් කොටින්ට මෙපමණ වටිනාකමකින් යුත් අවි සැපයුවේ කුමන රටවල්ද යන්න ගැන රජය විමර්ශනයක් සිදු කළේ නැත. මෙම යුද උපාංගවලට අමතර මෙරට ජීවිත දසදහස් ගණනක් වැනසීම සඳහා ටී. එන්. ඒ. සහ සී -4 අධිබලැති පුපුරණ ද්‍රව්‍ය කිලෝ 13,178ක්ද කොටි කඳවුරුවල තිබී හමුවිය. මේ බලගතු පුපුරන ද්‍රව්‍ය නිපදවන්නේ ඇමෙරිකාවයි. එසේම ඇමෙරිකානු හමුදාව භාවිතා කරන එම් 16 ප්‍රහාරක අවි 182ක්ද ජර්මනිය නිපදවන එම් 8-5 හෙවත් හෙත්ලර් ඇන්ඩ් කොච් මැෂින් තුවක්කුද විය. ඊට අමතරව තහනම් අවි වූ තර්මෝ බැරික් අවි 54ක්ද සොයා ගැනුණි. මෙයට අමතරව ලොව විශේෂ බලකායන් භාවිතා කරන සංනිවේදන යන්ත්‍ර රැසක්ද හමුවිය. ඇලින්කෝ, ඇන්රිච්යු, කුගර් ඇල්කොන් මොටරෝලා කෙන්වුඩ් ඇස්ට්‍රෝ සහ සබ්රි යන සංනිවේදන යන්ත්‍රද ඒ අතර විය. මුල්ලිවයික්කාල්හිදී සොයාගත් ලිපිගොනු 481ක් අවි ආයුධ ඇණවුම් කළ රටවල් ගැනද තොරතුරු හෙළි වුවත් රජය එම තොරතුරු වසන් කරනු ලැබීය. එසේම තමත් සිටින ස්ථානය දැන ගැනීමේ ජී. පී. එස්. උපාංග 114ක්ද හමුවුවත් නේරා නැමැති නෝර්වේ රාජ්‍යයේ නිපදවන එම අවි සැපයුවේ කවුදැයි රජය පරීක්ෂා කළේ නැත.

වන්නි මෙහෙයුම ආරම්භවීමෙන් පසු හමුදා කණ්ඩායම් මෙහෙයවන්නේ කවුද සහ ඔවුන්ගේ ඡායාරූප පුවත්පත්වලට හෙළි වූයේ නැත.

එහෙත් යුද්ධය අවසාන වීමට පෙර 2009 පෙබරවාරි 20 දා රජයේ ඉංග්‍රීසි පුවත්පතක් මාවිල්ආරු සිට මුලතිව් දක්වා මාසික අතිරේකයක් පළකර 53-55 57 සහ 58 යන සේනාංකවල ප්‍රධානීන් සමඟ සියලු ඡායාරූප ප්‍රකාශයට පත් කරනු ලැබීය. මෙය මෙරට හමුදා ඉතිහාසයේ සිදුවූ විශාලතම මෝඩ ක්‍රියාවයි. එම තොරතුරු ශ්‍රී ලංකා හමුදාවට යුද අපරාධ චෝදනා එල්ල කිරීමට එක්සත් ජාතීන්ගේ නිලධාරිනී යස්මින් සූකා භාවිතා කළේය. ඉරාකයට එරෙහි ඩෙසර්ට් ස්ටෝර්ම් මෙහෙයුමේදී කිසිදු හමුදා නිලධාරියකුගේ ඡායාරූප ප්‍රකාශයට පත් වූයේ නැත. එහෙත් එකල හමුදාව සමඟ සැරිසැරූ රජයේ ඡායාරූප ශිල්පියෙක් ජයග්‍රාහී කණ්ඩායම් මාසෙන් යුද්ධය අවසාන වීමට පෙර සියලු හමුදා කණ්ඩායම්වල ඡායාරූප ප්‍රකාශයට පත් කිරීමෙන් මහත් විනාශයක් සිදුවිය. මේ රජයේ ඉංග්‍රීසි පුවත්පතක ඡායාරූප ශිල්පියා සමඟ වන්නියේ සැරිසැරූ බෝම්බඩියර් නැමැති වාර්තාකරු ශවේන්ද්‍ර සිල්වාට සහ ජනපති ගෝඨාභය රාජපක්ෂට එරෙහිව ජිනීවා මානව හිමිකම් කවුන්සිලයට කටඋත්තරයක් දී එරට දේශපාලන රැකවරණ ලබා ඇත.

එම කටඋත්තරයේ දක්වා ඇත්තේ කොටි හමුදා නායකයාව මරන ලෙස ගෝඨාභය රාජපක්ෂ පවසන අයුරු තමාට ඇසුන බවයි.

මේ අතර විදේශ රටවල් 7කින් කොටින්ට අවි ආයුධ සහ සංනිවේදන උපකරණ ලැබී තිබුණි. ගුවන් බාධක යම් ආලෝකකරණ උපාංග චෙක් රාජ්‍යයෙන්ද ශ්‍රී ලංකා හමුදාවට නැති රේකිසොන් රේඩාර් උපාංග ඇමෙරිකාවෙන්ද ලබා ගැනීමට කොටි ක්‍රියාකර තිබුණි. 2009 මැයි 18 වැනිදා වනවිට කොටි සංවිධානය සතුව සංනිවේදන උපාංග 2452ක සංඛ්‍යාවක් තිබූ බව තහවුරු විය. එසේම කොටි සතුව තිබූ උණ්ඩ සංඛ්‍යාව මෙලෙස දැක්විය හැකිය. මි. මී.9 පතරොම් 103921 මි. මී. 38 වර්ගයේ පතරොම් 30892, 22 වර්ගයේ පතරොම් 29716 එස්. එම්. ජී. පතරොම් 1108 එම්. 16 පතරොම් 107756 එම්. එස්. බී. පතරොම් 21434 - විහිදුම් පතරොම් 400 නාඳුනන පතරොම් 9324 පිස්තෝල පතරොම් 114006 5.56 වර්ගයේ පතරොම් 652217 5.56 පතරොම් 68475 7.62 පතරොම් 1281607 මි. මී. 54 පතරොම් 214335 12.7 වර්ගයේ පතරොම් 105683 - මි. මී. 23 පතරොම් 11173 ඒ. වී, බිම්බෝම්බ 104973 - ක්ලේමෝ බෝම්බ 5068 සෑම් මිසයිල -16 බෝම්බ කබා 16 ඩෙටනේටර් 246369 පුපුරන ද්‍රව්‍ය ඇතුළත් කබා 10 පුපුරණ ද්‍රව්‍ය සහිත පටි 29.


සුබ්‍රමනියම් ස්වාමි

මේ අතර වන්නි මෙහෙයුම නිමා වීමට පෙර කොටි විශාල සංඛ්‍යාවක් බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ස්විස්ටර්ලන්තය, ඔස්ට්‍රේලියාව, කැනඩාව සහ ජර්මනියටද පැනගියහ. මැනික්පාම් කඳවුරේ රැඳවාසිටි දරුණු කොටිද අයථා මාර්ගවලින් පැනයෑමට ක්‍රියා කළ බව අනාවරණය විය. බ්‍රිතාන්‍යයට පැනගිය එක් කොටි වෛද්‍යවරයෙක් පැවසූවේ තමා බ්‍රිතාන්‍යයෙන් ගෙන්වාගත් මුදල් ලබාදී ශ්‍රී ලංකාවෙන් පලා ආ බවයි.

එසේම ස්විස්ටර්ලන්තයේ පමණක් අපරාධවලට සම්බන්ධ කොටි 206ක් සිටින බව හෙළි විය.

මෙරට හමුදා ප්‍රධානීන්ට එරෙහිව යුද අපරාධ චෝදනා එල්ල කර ඇත්තේ මෙම හිටපු කොටි බව අනාවරණය විය. මේ වන විට හමුදා ප්‍රධානීන් 59කට ජිනීවා මානව හිමිකම් කවුන්සිලය යුද අපරාධ චෝදනා එල්ල කර ඇත. මේ පසුබිම මෙරට හිටපු ඇමෙරිකානු තානාපති රොබට් බ්ලේක් ජනපති මහින්ද රාජපක්ෂ හමුවීමට ගියේය. ජනපතිතුමනි විශාල සංඛ්‍යාවක් කොටුවී සිටිනවා. ඔබගේ අවසරය තිබේ නම් අපට ඔවුන්ව බේරා ගත හැකියි යැයි ඔහු කියා සිටියේය.

රොබට් බ්ලේක් මේ සැරසෙන්නේ ප්‍රභාකරන් සහ කොටි හමුදා නායකයන් ගලවා ගැනීමට බව ජනපති රාජපක්ෂට අවබෝධ විය. ඒ වන විට මුලතිව් අසල ජාත්‍යන්තර මුහුදේ ඇමෙරිකානු ගොඩබිම් යාත්‍රාවල එන්ජින් ක්‍රියාත්මක වී තිබුණි. ජනපති රාජපක්ෂට අවසරය දුන්නා නම් මොහොතක් තුළ එම ගොඩබිම් යාත්‍රා මුලතිව් වෙරළට පැමිණෙනු ඇත. එසේ වූවත් ජනපති රාජපක්ෂ පැවසුවේ ඉන්දියාවද ඒ ගැන තමාගෙන් අසා ඇති බවත් ඔවුන් සමඟ සාකච්ඡා කර දන්වන බවත්ය.

ඇමෙරිකාව සහ නෝර්වේ එක්ව ප්‍රභාකරන් බේරා ගැනීමට මෙහෙයුමක් දියත් කර ඇති බව මේ වන විට රෝ සංවිධානයටද වාර්තා වී තිබුණි. එහෙත් එම මෙහෙයුමට ඉන්දියාව විරෝධය පළ කළේය. කොටි පරාජය වී වසර අටකට පසු එනම් 2017 දී හිටපු ඉන්දීය ආරක්ෂක උපදේශක ශිවශංකර් මෙනන් මේ බව මුල්වරට අනාවරණය කරනු ලැබීය.

ප්‍රභාකරන් ප්‍රමුඛ කොටි හමුදා නායකයන් 260ක් බේරා ගැනීමේ මෙහෙයුමට පෙර හවායිහි ඇමෙරිකානු ශාන්තිකර කලාපීය විධානයේ සිට හමුදා උපදේශකයා රැගත් හර්කියුලිස් ගුවන් යානාවක් ශ්‍රී ලංකාව බලා පිටත්විය. එය කටුනායක ගුවන් තොටුපළ සමීපයට ආසන්න වන අවස්ථාවේ ගුවන් ගමන් පාලක මැදිරියට දැනුම් දෙනු ලැබීය.

එවන් පසුබිමක් මැද ඊට ගොඩබෑමේ අවසරය හිමි වූයේ ඒ වන විට ප්‍රභාකරන් පරාජය වී නොතිබූ නිසාය.

මේ අතර කොළඹ නෝර්වේ තානාපති ටෝරේ ගැම්රස් ප්‍රභාකරන්ව බේරා ගැනීම සඳහා සෑම උත්සාහයක්ම දරනු ලැබීය. එවකට මැලේසියාවේ සිටි කොටි ජාත්‍යන්තර ජාලයේ ප්‍රධානියා වූයේ කේ. පී. හෙවත් කුමාරන් පද්මනාදන්ය. ප්‍රභාකරන් ඇමතූ කේ. පී. ඔහුට අවි බිම තබා යටත්වන ලෙස උපදෙස් දෙනු ලැබුවත් එම ඉල්ලීම ප්‍රතික්ෂේප විය.

වන්නි මෙහෙයුමේ අවසාන සමයේ එවකට හමුදාපති සරත් ෆොන්සේකා සහ ඔහුගේ පවුලේ අය චීනයේ පොලිටෙක්නික් සමාගමේ ඇරයුමක් මත එරට සංචාරයක නිරත විය.

මේ අතර ප්‍රභාකරන් බේරා ගැනීම සඳහා ලොව ප්‍රසිද්ධ පාර්ශ්ව සටන්විරාම ගිවිසුමක් යෝජනා කෙරුණි. දකුණු අප්‍රිකාවේ අගරදගුරු ඩෙස්මන් ටුටූ ඊට මුල්විය.

එහෙත් එම ඉල්ලීම අසාර්ථක විය. එදා වන්නි මෙහෙයුමට මුල් වූයේ ප්‍රභාකරන් විසින් මාවිල්ආරු සොරොව්ව වැසීම නිසාය. ඊට මුල් වූයේ අද කිඹුල් කඳුළු හෙලන හිටපු උතුරු පළාත් සභා මන්ත්‍රී ආනන්දි සසිතරන්ගේ සැමියා වූ එළිලන්ය.

ඩොලර් අරමුදල් මත යැපෙන ජේහාන් පෙරේරා නැමැත්තා මෙහෙයවූ ජාතික සාම මණ්ඩලය මාවිල්ආරු අර්බුදය සම්බන්ධයෙන් කොටි සමඟ සාකච්ඡා කරන ලෙස රජයෙන් කළ ඉල්ලීම ප්‍රතික්ෂේප විය.

මේ පසුබිම මැද කොළඹ වීරකේසරි පුවත්පත ශ්‍රී ලංකා හුමදාව අවතක්සේරුවකට ලක්කරමින් කොටි සතුව බලවත් ශක්තියක් ඇති බවට දක්වමින් පුළුල් ප්‍රචාරයක් ගෙන යනු ලැබීය.

එම පුවත්පතේ සක්කිරියන් නැමැති අන්වර්ත නාමයෙන් ලිපි ලියූ කොටි හිතවාදියා ශ්‍රී ලංකා හමුදාවට කම්පනය හැදෙන බව පවසනු ලැබීය.

හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී
දෙනියාය
මතුගොබ්,
බෙවරලිය එස්ටේට් හි
වටිනා දේපළක් විකිණීමට
ඉඩම 01 - අ15: රූ0: ප0
ගොඩනැගිල්ල - වර්ග අඩි 1,792
ඉඩම 02 - අ10: රූ0: ප0
විමසීම් සඳහා කාර්යාල වේලාවන් තුළ අමතන්න
011 266 1803, 011 266 1816, 011 266 1823,
041 227 3777, 041 227 3776, 041 492 5227
0715 333 471 - (ශයාන්)
or fax: 0112 662 820 - e-mail: recovery@hnb.lk
ඔබේ මිල ගණන් 2022 ජූනි 03 වෙනි දාට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.
අයකිරීම් ප්‍රධානී,
හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී,
අයකිරීම් අංශය, 18 වන මහල, එච්. එන්. බී. ටවර්ස්,
479, ටී.බී.ජයා මාවත, කොළඹ 10.



# ශ්‍රී ලංකා පාපන්දුවට කටාර් දිගු කළ මිත්‍රත්වයේ දෑත

ඩොලර් අර්බුදය හමුවේ රටේ ක්‍රීඩාවටද කණකොකා හඬන්නට පටන් ගත්තේය. උද්ධමනය අහස උසට ගියාදෙන් කියා රුපියල් අච්චු ගැසුවද ඇමරිකා එක්සත් ජනපදයේ ඩොලර් අච්චු ගසන්නට අපට පුළුවන්කමක් නැත. නැති ඩොලර් ඉල්ලා ආයාචනා කිරීමේ සීමාවක් ද ඇත. පණ කෙන්ද ගැට ගසා ගන්නට අවශ්‍ය බෙහෙත් ටිකවත් ගන්නට පුළුවන්කමක් නැති රටක ක්‍රීඩාවක් වෙනුවෙන් ඩොලර් ඉල්ලීම ද යුක්ති සහගත නොවේ. ඒ නිසා ක්‍රීඩාව පැත්තෙන් ඩොලර් වැයවන වැඩ අඩු කරන්නට විණි. ජාත්‍යන්තර තරගාවලි සඳහා ඉදිරිපත් වන ක්‍රීඩකයන් ගණන සීමා කර පදක්කම් ඉලක්ක කළ හැකි ක්‍රීඩකයන්ට පමණක් මින් ඉදිරියට එම තරගාවලි විවෘත කිරීමට බලධාරීන් තීරණය කර ඇත. ඇතැම් ක්‍රීඩාවල සංචිතගත ක්‍රීඩකයන් ගණන ද අඩු කෙරිණි. එසේම පුහුණු සංචිත ද සීමා විය. මේ අතරතුර තවත් බරපතළ පාඩුවක් ක්‍රීඩාව පැත්තෙන් සිදුවිය. එනම් විදෙස් පුහුණුකරුවන් ශ්‍රී ලංකාවට ටටා බායි කියා සිය රට බලා යෑමට තීරණය කිරීමය. මලල ක්‍රීඩාවේ, වොලිබෝල් ක්‍රීඩාවේ, බීච් වොලිබෝල් ක්‍රීඩාවේ මෙන්ම තවත් ක්‍රීඩා රැසක් ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ සේවය කරමින් සිටි විදෙස් පුහුණුකරුවෝ ඩොලර් නැති නිසා ශ්‍රී ලංකාවෙන් නික්ම ගියහ. ඒ අතරින් ප්‍රධාන තැනක් ගත්තේ පාපන්දු පුහුණුකරු ලෙස කටයුතු කරමින් සිටි බොස්නියා ජාතික අමීර් ඇලජික් මහතාය. තව කාලයක් සඳහා ශ්‍රී ලංකා පාපන්දු ක්‍රීඩාව සමඟ රැඳී සිටීමට ගිවිසුම්ගතව සිටි ඇලජික් මහතා රුපියල් වලින් වැටුප් ගන්නට කැමැති වූයේ නැත. රුපියල් ඇලජික් වූ ඇලජික් මහතා ඩොලර්ම ඉල්ලද්දී ඔහුව නතර කරන්නට හැකියාවක් තිබුණේ නැත. ඇලඩින්ගේ පුදුම පහන ගෙනැවිත් ඩොලර් මවා ඒවා ඇලජික්ට දී නතර කරන්නට පුළුවන්කමක් ද නැත. එනිසා ඇලජික් ගියේය. ඇලජික් ගියා කියා ක්‍රීඩාව නතර කරන්නට බැරිය. රුපියල්වලින් වැටුප් ලබන්නට කැමති වන විදෙස් පුහුණුකරුවන් ඇත්තේද නැත. රටේ සිටින දේශීය පුහුණුකරුවන් ද අවශ්‍ය තරමට පුහුණුකාරීත්වයට සුදුසුකම් ලබා නොමැත. ඒ නිසා විදේශීය පුහුණුකරුවෙකු ගෙන්විය යුතුමය. ශ්‍රී ලංකා පාපන්දු ආයතනය ඉදිරිපිට තිබූ එම බරපතළ අභියෝගය ශ්‍රී ලංකා පාපන්දු ආයතනය මේ වන විට ජයගෙන ඇත. එක් විදෙස් පුහුණුකරුවෙක් යනවිට විදෙස් පුහුණුකරුවන් දෙදෙනෙක්ම ගෙන්වා ගැනීමට ශ්‍රී ලංකා පාපන්දු ආයතනය සමත් වී ඇත. ඒ ඩොලර් වියදම් කර නොවේ. තම සබඳකම් මතිනි. ශ්‍රී ලංකා පාපන්දු සභාපති ජස්වර් උමර් මහතා සහ කටාර් රාජ්‍යයේ පාපන්දු බලධාරීන් අතර ඇති මිත්‍ර සබඳකම් මත එරටේ පූර්ණ අනුග්‍රහයෙන් ශ්‍රී ලංකාවට විදේශීය වෘත්තීය පාපන්දු පුහුණුකරුවන් දෙදෙනෙක් ලැබිණි. ඔවුන් නම් එංගලන්ත ජාතික ඇන්ඩෲ මොරිසන් සහ ඔස්ට්‍රේලියානු ජාතික කීත් ස්ටීවන්ස් වේ. කටාර් හි අස්පයර් පාපන්දු ඇකඩමිය ඒ සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කර තිබුණි.



ජස්වර් උමර් මහතා කටාර්හිදී ශ්‍රී ලංකාවේ පාපන්දු ව්‍යාපෘතියට අදාළ සාකච්ඡාවක නිරතව සිටි අයුරු.



ඇන්ඩි මොරිසන්
ප්‍රධාන පුහුණුකරු



කීත් ස්ටීවන්ස්
සහාය පුහුණුකරු


ශ්‍රී ලංකා පාපන්දු කණ්ඩායමේ නව ප්‍රධාන පුහුණුකරු වන ඇන්ඩෲ මොරිසන් 51 හැවිරිදිය. එංගලන්තයේ මැන්චෙස්ටර් සිටි සහ ක්‍රිස්ටල් පැලස් යන පාපන්දු කණ්ඩායම් නියෝජනය කර ඇති මොරිසන් මැන්චෙස්ටර් සිටි කණ්ඩායමේ නායකයා ලෙස ද වරින් වර කටයුතු කර ඇත. යුරෝපා පාපන්දු සම්මේලනයේ ඉහළම බලපත්‍රධාරී පුහුණුකරුවකු වන මොරිසන් මහතා කොනස්කි නොමැඩ්ස් කණ්ඩායම වේල්සයේ අන්තර් සමාජ ලීග් පාපන්දු ශූරතාව ජයග්‍රහණය කරන විට එම කණ්ඩායමේ පුහුණුකරුවා ද වූයේය.

කීත් ස්ටීවන්ස් යනු එංගලන්තයේ සහ ඔස්ට්‍රේලියාවේ ද්විත්ව පුරවැසියෙකි. සුප්‍රසිද්ධ එංගලන්ත පාපන්දු ලීගය දිගුකලක් නියෝජනය කර ඇති ස්ටීවන්ස් මහතා ඔස්ට්‍රේලියානු කාන්තා පාපන්දු ලීගයේ ශූරතාව දිනූ බ්‍රිස්බේන් රෝර් ක්‍රීඩා සමාජයේ හිටපු සහාය පුහුණුකරුවා වේ. මේ අතර ජාතික පාපන්දු කණ්ඩායමේ දැල් රකින්නාගේ පුහුණුකරු ධුරය සඳහාද කටාර් රාජ්‍යයේ අනුග්‍රහය හිමිවීමට නියමිතය. එරට අස්පයර් පාපන්දු ඇකඩමිය මගින් එම පුහුණුකරුවෙකු සඳහාද මේ වන විටත් අයදුම්පත් කැඳවා ඇත. ඒ සඳහා ලැබුණු අයදුම්පත් මේ වන විට සලකා බලමින් සිටින බව පාපන්දු ආරංචි මාර්ග සඳහන් කරයි. ඒ අනුව තව නොබෝ දිනකින් තවත් විදෙස් පුහුණුකරුවෙකුගේ සේවය ශ්‍රී ලංකා පාපන්දු පිලට ලැබීමට නියමිතය. එහි විශේෂත්වය වන්නේ අපේ රටෙන් ඒ සඳහා කිසිදු මුදලක් වැය නොවීමය. ශ්‍රී ලංකා පාපන්දු පිටිය මුහුණ දුන් බරපතළ අර්බුදයකට වත්මන් පාපන්දු බලධාරීන් විසඳුම් ගෙන එන්නේ එසේය. වසරකට නොව වසර තුනකට ය. කටාර් රාජ්‍යය ශ්‍රී ලංකාවේ පාපන්දු ක්‍රීඩාව දියුණු කිරීම සඳහා වසර තුනකට එළඹ ඇති ගිවිසුම මත ශ්‍රී ලංකාවට මෙම අනුග්‍රහයන් හිමි වේ. ඒ අනුව මොරිසන්ගේ සහ ස්ටීවන්ස් ගේ ගිවිසුම් වසර තුනක් තරම් දිගු වේ. ශ්‍රී ලංකා පාපන්දුව ලෝකයේ ඉහළ තැනකට ගෙන ඒම කෙසේ වෙතත් හොඳම කණ්ඩායම් 200 අතරට හෝ ගෙන ඒමට ඔවුන්ට හැකි වනු ඇතැයි පාපන්දු ලෝලීන්ගේ බලාපොරොත්තුවයි.

මේ සමගම ශ්‍රී ලංකා පාපන්දු පිටියේ කවදාවත් දක්නට නොලැබුණු දෙයක් සිදුවුණි. එනම් විදෙස් පුහුණුකරුවන් හතර දෙනකුගේ සේවය එකවර ශ්‍රී ලංකා පාපන්දු පිලට ලැබීමයි. එය එසේ වන්නේ ඒ වනවිටත් බ්‍රසීල ජාතික මාකස් ෆෙරෙයිරා මහතා ශ්‍රී ලංකා පාපන්දු කණ්ඩායමේ ශාරීරික යෝග්‍යතා පුහුණුකරු ලෙස කටයුතු කරමින් සිටීමයි. දැන් ක්‍රීඩකයන්ට අඩුවක් කියන්නට දෙයක් නැත. ඔවුන්ට තිබෙන්නේ මේ සම්පත් වලින් ප්‍රයෝජන ගෙන ශ්‍රී ලංකා පාපන්දුව ඉහළට එසවීමයි. ඒ සඳහා වැඩි කල් නොගොස් හොඳ අවස්ථාවක් ඔවුන්ට හිමිවී ඇත. 2023 වසරේ ආසියානු කුසලාන ට සුදුසුකම් ලබා ගැනීමේ තරගාවලියට සුදුසුකම් ලබා ගැනීමේ තරගාවලිය සඳහා ශ්‍රී ලංකාව ලබන මස සහභාගී වීමට නියමිතය. බොස්නියාවේ අමීර් ඇලජික් නික්ම යෑමෙන් ශ්‍රී ලංකා පාපන්දුවේ හුළං බැස්සා යැයි සිතුවත් එංගලන්තයේ මොරිසන් ශ්‍රී ලංකාවේ පාපන්දුවට ඔක්සිජන් රැගෙන ආවේ යැයි ලෝකයට පෙන්වීමට එය මහඟු අවස්ථාවක් වේ.

මේ අතර ශ්‍රී ලංකා පාපන්දු ක්‍රීඩාව වෙනුවෙන් ජාත්‍යන්තර පාපන්දු සම්මේලනයෙන් ලැබෙන වාර්ෂික මුදල් ප්‍රමාණය වැඩි කරගැනීම සඳහා ද පාපන්දු සභාපති ජස්වර් උමර් මහතා කටයුතු කරමින් සිටී. රටට ඩොලර් අවැසි මොහොතක ක්‍රීඩාවෙන් හෝ එම මුදල් රටට ලැබේ නම් යහපතකි. ඩොලර් අහේනිය මග හරවා ගැනීමට එම මුදල් ද රටට ප්‍රයෝජනවත් වේ.

● කුෂාන් සුබසිංහ




# කොරෝනා හැදුණු ශකීබ්ට පළමු තරගය අහිමි වෙයි



බංග්ලාදේශ ක්‍රිකට් කණ්ඩායමේ සුපිරි තුන් ඉරියව් ක්‍රීඩක ශකීබ් අල් හසන් හට කොරෝනා වෛරසය ආසාදනය වී ඇති බවත්, ඒ අනුව අද ශ්‍රී ලංකාව සමග පැවැත්වෙන පළමු ටෙස්ට් තරගයට ක්‍රීඩා කිරීමේ අවස්ථාව ශකීබ් හට අහිමි වනු ඇති බවත් වාර්තා වේ.

පසුගිය කාලසීමාවේ ඇමරිකාවේ සිටි ශකීබ් ශ්‍රී ලංකාව සමඟ පැවැත්වෙන ටෙස්ට් තරගාවලියට සහභාගී වීමට නැවත බංගලාදේශයට පැමිණි අවස්ථාවේ දී සිදුකරන ලද කොරෝනා පරීක්ෂණයේදී ශකීබ් එම ආසාදිතයකු ලෙස හඳුනාගෙන තිබේ.

බංග්ලාදේශ කණ්ඩායමේ සුපිරි තුන් ඉරියව් ක්‍රීඩකයා මේ අනුව කොවිඩ් නීතිරීතිවලට අනුව හුදෙකලා කර තිබෙන අතර පළමු ටෙස්ට් තරගයට ක්‍රීඩා කිරීමේ අවස්ථාව ඔහුට අහිමි වුවත් දෙවන ටෙස්ට් තරගයට ක්‍රීඩා කිරීමට හැකි වනු ඇති බවත් එරට මාධ්‍ය සඳහන් කරයි. දෙරට අතර දෙවැනි ටෙස්ට් ක්‍රිකට් තරගය ලබන 23 වැනිදා ආරම්භ වේ.

උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2022 මැයි මස 15 වැනිදා ඉරිදා හෝමාගම පිහිටි උපාලි යන්ත්‍රාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

ඉරිදා සංග්‍රහය
2022 මැයි මස 15 වැනිදා ඉරිදා



# බටහිර ඖෂධවලට ගැති නොවූ

# ආදීවාසීන්ගේ වෙද හෙදකම්

## කැලෑ පොජ්ජේ මේ හැම එකකටම ඖෂධ පොජ්ජ තිබෙනවා





දඹාන කොටබකිණිය ගම්මානය රට තුළ තිබෙන තවත් සංවිධිත රාජ්‍යයක් වැනිය. කාලයෙන් කාලයට පැමිණි නේක උවදුරු විපත්වලින් මේ වෙනස් සංස්කෘතික රාජ්‍ය අතීතයේ සිටම රක්ෂා වූයේ ඔවුන්ගේම දැනුම ඔස්සේය. රටේ පවතින නීතිවලට යටත්ව පාරම්පරික වරිග නීති රෙගුලාසිවලට ගරු කරමින් ගෙවන ආදිවාසීන්ගේ එම ජීවන රටාවෙන් මහා සමාජයට ගත හැකි ආදර්ශ බොහෝය. වර්තමාන ආර්ථික කඩා වැටීමේ හමුවේ ආහාර සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන අභියෝග ඔවුන් තම දැනුම් ප්‍රමාණයෙන් කළමනාකරණය කරගෙන ඇත. එහි ඇති විශ්මිත ඉසව්ව වන්නේ නිතර ඇතිවන රෝග පීඩාවන් සඳහා ආදිවාසීන් සතුවන පාරම්පරික වෙද හෙදකම්ය.

බටහිර වෙදකමේ පිහිට අංශු මාත්‍රයක් නොතිබුණු යුගයක එදා මහ වනයේදී ආදිවාසීන් තම වරිගයාගේ නිරෝගී පැවැත්ම ආරක්ෂා කරගත්තේය. රැහේ එකෙකුට වැළඳෙන ඕනෑම රෝගයක් සුව කරගැනීම සඳහා අවැසි ඖෂධ ප්‍රතිකර්ම ඔවුන්ගේ දැනුමෙහි තිබුණේය. එම දැනුම ඔස්සේ භාවිතා කරන ඖෂධ වර්ග දියුණු බටහිර වෛද්‍ය විද්‍යාවේ ප්‍රතිකර්මවලට වඩා වේගවත් සහ ඵලදායී විය. බටහිර ඖෂධ වර්ග වෙළෙඳපොළේ හිඟ වී ඇති මේ කාලයේ ආදිවාසීන්ට එම පාරම්පරික වෙද හෙදකම මිල කළ නොහැකි වටිනාකමක් එකතු කර ඇත. ශ්‍රී ලංකාවේ ජීවත්වන නබුඩ වරිගේ, ඌරු වරිගේ, තලා වරිගේ, උනාපාන වරිගේ, මොරාණ වරිගේ නමැති වරිග හතරකින් යුතු ආදිවාසී ජනයා අදටත් ඔවුන්ගේ එම පාරම්පරික වෙද හෙදකම් භාවිතා කරන්නේය. කොටබකිණිය ගමේදී ඒ දැනුමින් වරිගයා සුවපත් කරන්නේ නායකයෙක් ලෙස මහා සමාජයේ පවා සම්භාවනාවට පත් ආදීවාසී නායක වන්නියැලා ඇත්තෝය.

''ඉස්සර කාල මැච්චේ ඉඳන් ආව වෙදරාලගේ වැඩේ දැන් මන්දො කරන්නෙ මේ ඇත්තො තමයි. ඒ කාල මැච්චෙ හැම එකකටම මේ ඇත්තන්ගෙ ඖෂධ තමයි පාවිච්චි කරල මන්දො කෙරුවේ.'' වරිගේ එකෙකුට ලෙඩක් දුකක් වූ විට වෙදරාළගේ වෙස් ගන්නා ආදිවාසී නායකයා එසේ කියමින් එම විශ්මිත ප්‍රතිකර්ම ක්‍රම ගැන අප සමග කතා දැමුවේය. ආදිවාසී භාෂාවෙන් සිදු වූ එම පැහැදිලි කිරීම කාටත් වටහා ගත හැකි අයුරින් මෙසේය.

මොනම ලෙඩ පොජ්ජක් හැදුණත් මේ ඇත්තො ඉස්සරවෙලාම ''ගල් පේන පොජ්ජ'' මන්දො කරල බලනවා. මේක පේන බැලීමක්. අර සාස්තර බලනවා වගේ එකමක් මේ. එකෙන් බලන්නෙ ඒ ඇත්තන්ට හැදිලා තියෙන්නෙ යක් පොජ්ජල ඇත්තො නිසා ඇතිවුණ එකක්ද. නැත්නම් ඇඟ පොජ්ජෙන් නැත්නම් ශරීරයෙන් ඇතිවුණ ලෙඩක් ද කියල.

''දැන් මේක යක්පොජ්ජල ඇත්තන්නෙ ලෙඩ පොජ්ජක් නම් මේ ඇත්තො මළගිය ඇත්තන්ට යදුම් පොජ්ජ මන්දො කරනවා. එහෙම කොදොයි නම් තමා ඇඟ පොජ්ජෙන් මන්ගච්චන ලෙඩක් නම් ඒ තැනට මේ ඇත්තො ඖෂධ පාවිච්චි කරන්නෙ.'' වන්නියැල ඇත්තො කියන්නේය.

පේන බැලීම, යැදීම, අඩුක්කු තිබීම වැනි අභිචාර විධි එදා සිටම අද දක්වා භාවිතා වන බව ඔහු කියන්නේය. කැලේ බැද්දේ සිටියදී නම් වැඩි හරියක් රැහේ උන්ට හැදෙන්නෙ ශරීරයෙන් හට ගන්නා ලෙඩ රෝග නොව මළගිය ඇත්තන්ගෙන් සහ ප්‍රේතයන්ගෙන් ඇතිවන ලෙඩ රෝග බව ඔවුන්ගේ විශ්වාස කරන්නේය.
ගල යකුන්
මඩු , හැට්ම ශාන්ති කර්මය, බුලත් කහඳ, ඇල්ලැකින්නම් මඩුව, මුක්කාලිය, අඩුක්කු මඩුව සහ කුඹ මඩුව වැනි ශාන්ති කර්ම එම නොපෙනෙන බලවේගවලින් සිදුවන රෝග පීඩාවලට ප්‍රතිකර්මයක් ලෙස ආදිවාසීන් භාවිතා කරන්නේය.


රෝග විනිශ්චය සඳහා පේන ගල ලෙසින් ඔවුන් හඳුන්වන්නේ කිලෝ විස්සක් පමණ බරකින් යුතු ගල් කැබැල්ලක් ය. ආදිවාසීන්ගේ පේන බැලීම යනු එම ගල ලී කැබැල්ලක ගැට ගසා බිම වාඩි වී එය දෙකකුල මත තබා රෝග විනිශ්චය කරන ක්‍රමයකි. එහිදී තමන්ගේ ඥාතියාගේ අසනීප තත්ත්වය ගැන ඔවුන් මළ නෑ යකුන්ට කන්නලව් කරයි. එවිට ගල චලනය වන ආකාරය අනුව එය මළගිය ප්‍රාණකාරයෙක් නිසා සිදු වූවක්ද නැත්නම් ශරීරයෙන් හටගත්තද යන්න විනිශ්චයකට පැමිණෙයි. මෙහි විද්‍යාත්මක පසුබිම ගැන අපට කුමන ප්‍රශ්න තිබුණද ඔවුහු එහි ඇති සත්‍යතාවය දැඩිව විශ්වාස කරති. විද්‍යාත්මක පසුබිම කුමක් වෙතත් අවසාන ප්‍රතිඵලයේදී රෝගියා සුවය ලැබේ නම් එය ප්‍රතිකර්මයක් ලෙස අභියෝග කළ හැකි නොවේ. ලෙඩක් දුකක් හැදුන විට රැහේ වෙද හෙද කම්, කෙම් ක්‍රම ගැන අදටත් විශ්වාස කරන ආදිවාසීන්ගේ මේ අභිචාර විධිවලට අමතරව වටිනා කියන ඖෂධවලින් සිදුකරන ප්‍රතිකර්ම ද ඕනෑ තරම් ඇති බව වන්නියලෑ ඇත්තෝ කීවේය.

''කැලෑ පොජ්ජේ මේ හැම එකකටම ඖෂධ පොජ්ජ තිබෙනවා. උණක් වගේ ලෙඩක් මන්දො වුණොතින් කැලෑ පොජ්ජේ තිබෙනවා බින් නෙල්ලි. එකෙන් කළං දොළහක් අරගෙන තම්බල ගත්තාම උණ පොජ්ජ නැතිවෙනවා. හෙම්බිරිස්සාව වගේ පොඩි ලෙඩක් මන්දෝ වුණොතින් ඒ තැනට තියනවා කැඳ වර්ග. වහතැල්ල වැල් වර්ගය ඒකට හොඳ බෙහෙතක්. එළබටු, යකි නාරං කොළ තම්බල ඒ දුම ඇල්ලීම වගේ ලෙහෙසියෙන් හොයාගන්න පුළුවන් සුළු සුළු බෙහෙත් ආදිවාසීන් අතර තියනවා. හැබැයි බෙහෙත සුළු වුණාට ලොකු වැඩක් එකෙන් කෙරෙනවා. දැන් බඩේ අමාරුවක් අජීර්ණයක් වගේ හැදුණොත් මේ ඇත්තො ගන්නෙ කැලේ පොජ්ජෙ තියෙන දූණු මඩලා රුකත් පොජ්ජ. ඒක ලුණු වතුරෙන් තරමක් උරච්චි කරල කෑමට ගන්නවා. ඒ බඩේ අමාරුවක් වමනයක් වගේ දෙයක් තිබුණ නම් ඒ ඖෂධ පොජ්ජට ගුණයක් ලැබෙනවා. වීර පොත්තක් දෙහි ඇඹුලෙන් උරච්චි කරල කෑමට ගත්තත් ඒකෙන් ගුණ පොජ්ජ මන්දො වෙනවා.''

## වන්නියැලෑ ඇත්තන්ගේ බිරිඳ මිය ගියේ කොරෝනාවලින් කීම බොරුවක්

රැහේ එවුන්ට වෙදකම් කරන නිසා වන්නියලෑ ඇත්තන්ට මේ ඖෂධවල ගුණ ඉර හඳ සේ විශ්වාස බව ඔහු කියන්නේය.

''ඒ කාල මැච්චේ මේ පළාත්වල ආණ්ඩු පොජ්ජේ ඉස්පිරිතාල තිබන්න කොදොයිනෙ. හදිස්සියේ වෙද හූරෙක් ළඟට මංගච්චන්ට කොදෝ වුණොතින් ඒ අත් බෙහෙත් තමා පාවිච්චි කරන්නෙ.''



සැම වරිග පොජ්ජකටම වෙද හූරෙක් ඒ කාලයේ සිටි බව වන්නියලෑ ඇත්තන් කියන්නේය. දරුණු රෝගාබාධ සුවපත් කිරීමට පවා ඔවුන් ළඟ කල්ක ගුලි චූර්ණවලට අයත් ඖෂධ වර්ග තිබී ඇත. වන්නයලෑ ඇත්තන්ගේ ලොකු අප්පිලා ඇත්තෝ එකල ආදිවාසී ජනයා අතර සිටි හොඳ වෙද හූරෙක් බව ඔහු අපට කීවේය. කැඩුම් බිඳුම් වෙදකම් ශාස්තරේ උගත් ආදිවාසී නායකයාගේ මලනුවන් සමග දැන් ආදිවාසී වරිග හතරටම සර්වාංග වෙදකම කරන්නේ වන්නියලෑ ඇත්තන්ය.

ආදිවාසී නායකයාට අනුව පසුගිය සමයේ රට පුරා ව්‍යාප්ත වූ කොරෝනා වසංගත රෝගය අලුත් අමුතු රෝගයක් නොවේ ය. එම වසංගත රෝග ඔවුන් පොදුවේ හඳුන්වන්නේ ''කෝලය'' නැමති නමිනි. ආදිවාසී වෙදකමට අනුව කෝල වර්ග දහ අටකි. කොරෝනා යනුවෙන් බටහිර වෛද්‍යවරුන් නම් තැබූ වසංගතය එම කෝල වර්ගයට ගැනෙන එක් වසංගතයක් පමණකි.

''උණ, හතිය, සෙම වගේ කෝලේ තියෙන රෝග ලක්ෂණ තමා කොරෝනාවලත් තිබච්චෙ. මේ ඇත්තන්ගෙ ගම් පොජ්ජෙත් විසි එකකට කොරෝනා මන්දො වුණා. හැබැයි මේ ඇත්තො ඒකට ඇනව් කලාවේ ( ගත්තෙ) මේ ඇත්තන්ගේ කසාය. සමහර ඇත්තො කාලයක් තිබුණ ලෙඩ පොජ්ජත් එක්ක ඌරනියේ තිබුණ ඉස්පිරිතාලෙට ගියා. හැබැයි ඒ යනකොටත් ඒ ඇත්තන්ට ගුණ පොජ්ජ මන්දො වෙලා තිබුණෙ. හදිස්සියේ වත් මොනව හරි වුණොත් කෝකටත් හොඳයි කියල තමයි දොස්තර හූරලා ඒ ඇත්තන් අරන් ගියේ. හැබැයි අනිත් කණ්ඩායම ම මේ කැලෑ පොජ්ජේ තිබුණ කොළ පොතුවලින් තමයි ගුණ පොජ්ජ මන්දො කරගත්තෙ.'' වන්නියලෑ ඇත්තන් එසේ ස්ථිරසාර ස්වරයෙන් කීවේය. ඒ කතාව හමුවේ මම ඔහුගෙන්,

''නායකතුමාගේ බිරිඳත් කොරෝනා කෝලය නිසා නේද මියැදුණේ? යැයි ඇසූ විට වන්නියලෑ ඇත්තන් කීවේ එය බොරු ප්‍රචාරයක් කියාය.


''ඒතැන නම් බොරු ප්‍රචාරයක් මන්දො කරච්චෙ. මේ ඇත්තන්ගේ නෑනිල ඇත්තන්ට කොරෝනා නෙවේ තිබච්චේ. ඒ ඇත්නන්ට කෝණ පොජ්ජ එකොළහක් වකු ගඩුවක් බද්ධ කරල තිබුණෙ. ඊට පස්සෙ ඒ වකු ගඩුවත් නරක්වෙලා මාස අටක් විතර එකතැන ඉඳන් බෙහෙත් ගත්තෙ. ඒ ඇත්තන්ට ලෙඩ පොජ්ජවල් එකමක් නෙවේ ලෙඩ පොජ්ජවල් විසිපහමක් විතර තිබච්චා. ඒ තැනින් තමයි ඒ ඇත්තො මියබට දැම්මෙ. හැබැයි ඒ කාල මැච්චේ කොරෝනා කතාව වැඩි තැනෙන් තිබච්ච හන්දා කොරෝනාම කියල ප්‍රචාරයක් මන්දො කෙරුවා'' යැයි වන්නියැලෑ ඇත්තන් මේ කතා දැමීමේදී අවසානයේ අපට කීවේය.

බටහිර වෙදකමේ ප්‍රතිකාර ආදිවාසීන්ට මුල් වරට ලැබුණු බව සඳහන් වන්නේ සුදු ජාතිකයන් රට පාලනය කළ අවසන් කාලයේය. සුදු ජාතික වෛද්‍යවරයකු වූ ආර්. එල්. ස්පිට්ල් මැලේරියා වසංගතයට ගොදුරුව සිටි වැදි ජනයාට ප්‍රතිකාර කළ බව ඉතිහාසයේ සඳහන්ය. දැන් ආදීවාසී ජනයාගෙන් වැඩි දෙනෙක් ආණ්ඩුවේ ඉස්පිරිතාලයට යෑමට පුරුදුව සිටින්නේ වකුගඩු රෝග යට ගොදුරු වීම නිසාය.

'' අපේ වරිගේ වැඩිහිටියෝ වැඩි දෙනෙක් දැන් වකුගඩු රෝගයට ගොදුරුවෙලා. ගිරාඳුරුකෝට්ටේ, දෙහිඅත්තකණ්ඩිය, මහියංගණය වගේම සමහර අය පොලොන්නරුව මහ රෝහලට ප්‍රතිකාර ගන්න යනවා. අපි කැලේ හිටියා නම් මේ වගේ කිසිම ලෙඩක් හැදෙන්නෙ නැහැ. කැලෙන් එළියට ආවට පස්සේ අපි ඉල්ලුවා බෙහෙත් ඖෂධ එකතු කරන්න කැලේට යන්න අවසර දෙන්න කියලා.නමුත් ඒ සඳහා අපට අවස්ථාවක් ලැබුණෙත් නැහැ.'' හොඳට සිංහල කතා කරන තලා වරිගයේ ආදිවාසී හූරෙක් අපට එසේ කීවේ වර්තමානයේ ආදීවාසී ජනයාගේ සෞඛ්‍යයට අත්ව ඇති ඉරණම ගැන පහදමින්ය.

බෝවන රෝගවලට සේම බෝ නොවන රෝගවලට ද ආදිවාසීන් සතුව පුදුම හිතෙන පිළියම් තිබිණ. ඒවායින් ඔවුන්ගේ රෝග දුක්ඛ දෝමනස්සයන් පහව ගිය බව කීවේ මේ කතා දැමීමට සම්බන්ධ කරගත් ලොකුබණ්ඩා ඇත්තෝය.

''අපි කැලෑවෙ හිටිය කාලෙ අසනීපයක් වුණේ බොහොම කලාතුරකින්.''



## අපි කැලෑවෙ හිටිය කාලෙ අසනීපයක් වුණේ බොහොම කලාතුරකින්

"මේ ඇත්තන්ගෙ මී මුත්තටත් ඉස්සර ඉඳන් පරම්පරාව කෝණපොජ්ජ (අවුරුදු) තිස් හත්දාහක්ම හිටියෙ කැලේ. අපේ වැදි රැහේ ඇත්තෝ ඒ කාල මැක්කේ (කාලේ) මීපැණි, දඩමස්, කුරක්කන් වගේම බෙහෙත් පොජ්ජ කැවිල්ලෑවා. ඒ නිසා අපේ ඇත්තන්ට අපිට ඉහෙන් බහින ලෙඩක් තිබුණේ නැහැ. මගේ මුත්තා අවුරුදු 116 ක් ජීවත් වුණා. මේ ඇත්තන්ට ලෙඩක් දුකක් හැදුනම මේ ඇත්තන්ගේ දෙයියල ඇත්තන්ට කන්නලව් කරනවා. මේ ඇත්තන්ගේ දෙයියලෑ ඇත්තෝ මේ අයට රැකුම් පොජ්ජ මන්දෝ කරනවා. (ආරක්ෂා කරනවා). ගහකට නැග්ගත්, කන්දකට නැග්ගත්, මේ හැම තැනදීම මේ ඇත්තෝ දෙයියලෑ ඇත්තන් සිහි කරනවා. මේ දෙයියෝ තමයි අපේ රැහේ මියගිය නෑදෑයෝ. සමහර විට මේ අය නෑ යකුන් කියලත් හඳුන්වනවා. මේ ඇත්තෝ කැලෑ පොජ්ජෙන් එළියට ආවට පස්සෙ තමයි මේ රටේ නැති ලෙඩදුක්වලට ගොදුරු වෙන්න පටන්ගත්තේ. මේ ඇත්තන්ල බලෙන් කැලයෙන් එළියට ඇදල දැම්මට පස්සෙයි මේ හැම ලෙඩ දුකක්ම. කැලේ හිටිය කාලේ අපිට සර්පයින්ගෙන් කවදාවත් හිරිහැරයක් උනේ නැහැ. උන්ගෙන් අපිව රැකගන්න යක් ගොල්ල ඉන්නවා. බොට කඳා (අලියා) කවදාවත් අපිට හිරිහැර කරල නැහැ. බොටකඳා අලියා මුලිච්චි උනොත් අපි ඌට මතුරනවා' යැයි කියමින් ලොකුබණ්ඩා ඇත්තෝ කී කතාව අපේ රටේ ආදිවාසී පරම්පරාවට මේ රටේ දේශපාලකයන් ගත් වැරදි තීන්දු තීරණ නිසා අත්වූ ඉරණම ද එක් පැත්තකින් කියාපාන්නේය.

● තිස්ස ගුණතිලක



# සිරිමාවෝ මැතිනියගේ සියරට දේ සිරිසැප දේ 'ආර්ථික' මෙහෙයුම



ජීවන වියදම ලෙස හඳුන්වන්නේ, ගෙදර ආර්ථිකය ය. එය නිරවුල් නොවන තැන පවුලේ කටයුතු සියල්ල අවුල් වියවුල් වන්නේය. මෙය හරිහැටි පාලනය කරන්නට නම් රටේ ආර්ථිකය ඊට සෘජුවම බලපාන්නේය. මේ කාරණය සම්බන්ධයෙන් දුර දිග බලා තීරණ ගත් දේශපාලනඥයින් අතරින් කැපී පෙනෙන චරිතය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ය.

සිරිමාවෝ රත්වත්ත ඩයස් බණ්ඩාරනායක මැතිනිය ලෝකයේ ආණ්ඩුවක ප්‍රධානියා වූ ප්‍රථම කාන්තාවයි. ඇය ශ්‍රී ලංකාවේ තෙවරක් අග්‍රාමාත්‍ය පදවියට පත්වූවාය. ඒ 1960 - 1965, 1970 - 1977 සහ 1994 - 2000 යන කාල වකවානුවලදීය. ඇගේ දෙවන ධුර කාලයේදී දෙවන එලිසබෙත් රැජින ලංකා රජ තනතුරෙන් පහකර රට ජනරජයක් බවට පත්කර රටේ ලංකා නාමය ශ්‍රී ලංකාව ලෙස වෙනස් කෙරිණි.

ඒ වන විට අප රටට අර්ධ නිදහසක් ලැබී තිබුණ ද එය පූර්ණ නිදහසක් බවට පත්ව නිදහස් ජනරජයක් බවට පත් වූයේ ද මේ කාලයේ දීය. බණ්ඩාරනායක මහත්මිය මුල් කරගනිමින් ඇන්. ඇම්., කොල්වින් ඇතුළු වමේ නායකයින් එක්ව සිදු කළේද දේශීය ආර්ථිකය කෘෂිකර්මාන්තයෙන් නඟා සිටුවීමේ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීමය.

ඒ ආකාරයෙන් ආරම්භ වූ ශ්‍රී ලංකා ජනරජයේ නව ගමන රට ඉදිරියට ගෙන යා හැකි මංසන්ධියක්ව තිබුණි. එතෙක් කල් ආනයනය කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර, නව ආණ්ඩුව මේ ප්‍රතිපත්තිය වෙනුවට රටට අවශ්‍ය දේ රට තුළම නිෂ්පාදනය කිරීමටත් දේශීය කර්මාන්ත නිර්මාණය කර ඒ සඳහා අවශ්‍ය රාජ්‍ය සහාය ලබා දීමටත් එවක තිබූ ආණ්ඩුව කටයුතු කළහ. එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පෙර රෙදි පිළි ආනයනය, විවිධ ආහාර ද්‍රව්‍ය ආනයනය ඇතුළු කටයුතු සඳහා විශාල විනිමය ප්‍රමාණයක් රටින් පිට කිරීමට සිදු විය. මේ සඳහා මැතිනිය බියකින් සැකයකින් තොරව තීරණ ගෙන තිබිණි.

වැඩි විනිමයක් රටින් පිට කරනවාට වඩා රට තුළ මුදල් රැක ගැනීමට ඇය සැලසුම් සකස් කර තිබිණි. ඒ තත්ත්වය නිවැරැදි කිරීමට සියරට දේ සියරටම නිපදවීමේ ක්‍රමවේදයකට සමඟි පෙරමුණු ආණ්ඩුව කටයුතු කළේය. ඒ වැඩපිළිවෙළට 1973 පමණ වන විට ආණ්ඩුව වැඩපිළිවෙළක් ආරම්භ කර තිබූ අතර, එම වැඩපිළිවෙළ කුමක් ද එහි ප්‍රතිලාභ රටට ලැබෙන්නේ කෙසේ ද යන්න ගැන ජනතාව දැනුම්වත් කිරීමේ වැඩපිළිවෙළක් නිර්මාණය කිරීමට ආණ්ඩුව සැලසුමක් නිර්මාණය කර නොතිබුණේය.

රාජ්‍ය ප්‍රමුඛතාවය දිය යුත්තේ විවිධ සැපැයුම්කරුවන් හරහා ආනයනය කරනු ලබන භාණ්ඩ ලබා ගැනීමටය. එය මැතිනියගේ ප්‍රතිපත්තිය වී තිබිණි. රජය විශාලම ගැනුම්කරුවා ලෙස දේශීය නිෂ්පාදකයාගේ භාණ්ඩ මිලදී ගැනීමට සහ නිෂ්පාදකයාට වෙළෙඳපොළ නිර්මාණය නොකිරීමෙන් දේශීය ආර්ථිකය ගොඩනැගීමේ පදනම බිඳවැටෙන බව ඇය විශ්වාස කළාය. දේශීය නිෂ්පාදකයාට නැගී සිටීමට හැකිවනුයේ රාජ්‍ය යාන්ත්‍රණය විසින් දායකත්වයක් ලබා දීමෙන් පමණකි.

ඇයගේ පාලන කාලයේ දී ඇය ගත් තීරණ අතර ප්‍රබලම තීරණය වූයේ රටේ ආර්ථිකය දේශීය නිෂ්පාදන මත නගා සිටුවීමය. එකල ජනතාව ආහාර පාන ගත යුතු වූයේ ආණ්ඩුවේ සැලසුමට අනුවය. දින හතෙන් බත් කෑ හැකි වූයේ දින තුනකදි පමණි. සෙසු දිනයන්හි දී, අල බතල, මඤ්ඤොක්කා ආදි දේශීය ආහාර ගැනීමට රටේ ජනතාවට සිදුවිය. එහෙයින්ම සෑම නිවසකම පාහේ දේශීය ආහාර බෝග වගා කරන්නට උනන්දුවක් තිබිණි. ප්‍රදේශයකින් ප්‍රදේශයකට හාල් මිරිස් හෝ වෙනත් භෝග ගෙන යෑම ද තහනම් විය. හාල් පොල්ල මිරිස් පොල්ල නම් පටබැඳුණේ ඒ අනුවය. එය මේ තාක් සිදු වූයේ නම් මේ නැව් රටට එනතුරු දත නියවා බලා සිටින්නට සිදු නොවනු ඇත. තමන්ගේ ප්‍රදේශය ආහාරවලින් ස්වයංපෝෂිත වන්නට තිබිණි.

බණ්ඩාරනායකතුමිය උපත ලද්දේ 1916 අප්‍රේල් 17 වන දින, රත්නපුර ඇල්ලවළ වලව්වේදීය. ඇයට නම් තබන ලද්දේ සිරිමා රත්වත්ත ලෙසය. ඇයගේ මව වූ රොසලින්ඩ් හිල්ඩා මහවලතැන්නේ කුමාරිහාමි ප්‍රකට ආයුර්වේද වෛද්‍යවරියක වූවාය, ඇගේ පියා, බාර්න්ස් රත්වත්ත දේශපාලනයේ යෙදුනේය. ඇගේ මාතෘ පාර්ශ්වයෙන් සීයා වූ මහවලතැන්නේ, බලංගොඩ රටේ මහත්මය ලෙස කටයුතු කළේය. ඇගේ පියාද පසුව එම ධුරයේ කටයුතු කළේය. මහනුවර රාජධානියේ රදල පවුලකට ඇගේ පියා අයත් විය. පිතෘ පාර්ශවයෙන් ඈ සර් ජයතිලක කුඩා රත්වත්ත නෑකම් දැරුවාය. ඔහු ශ්‍රී ලංකාවෙන් නයිට් පදවියක් දැරූ ප්‍රථමයා විය. 1815 මහනුවර ගිවිසුමට අත්සන් තැබූ මාතලේ දිසාවේ ද ඇයට නෑකම් දැරුවේය.

සිරිමා දරුවන් හයක් යුක්ත පවුලේ වැඩිමහලා විය. ඇයට සහෝදරයන් හතරක්, බාර්න්ස්, සීවලී, මැකී හා ක්ලිෆර්ඩ්, ද සහෝදරියක පැට්‍රීෂියා සිටියහ. ඇගේ සහෝදරිය කර්නල් එඩ්වඩ් ජේම්ස් දිවිතොටවෙල සමග විවාහ වූවාය. මුලින්ම ඇගේ සීයාගේ වලව්වේ පවුල විසූ අතර, පසුව, බලංගොඩ ඔවුන්ගේම වලව්වකට ගියහ. කුඩා කලක සිටම, සිරිමාට ඇගේ සීයාගේ විශාල සාහිත්‍යය හා විද්‍යා පොත්පත් එකතුව හැදෑරුවාය. මුලින්ම බලංගොඩ පෙරපාසලක ඉගෙනුම ලත් ඈ පසුව, කෙටිකලට රත්නපුර ෆර්ගසන් උසස් පාසලට යවා, ඉක්බිතිව කොළඹ ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයේ නේවාසික අධ්‍යාපනයට යොමු විය. කතෝලික පාසල් පද්ධතියක අධ්‍යාපනය ලැබුවද, ඇය ජීවිත කාලය පුරාවටම බුද්ධ ධර්මය වැළඳ සිටියාය. සිංහල හා ඉංග්‍රීසි භාෂා දෙකම කතා කළාය.

1940 දී ඇය සොලමන් ඩයස් බණ්ඩාරනායක මහතා සමඟ විවාහපත් විය. සොලමන් ඩයස් බණ්ඩාරනායකගේ අභාවයෙන් පසු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයට පත් ඇය මරණයට පත්වනතුරුම එහි නායකත්වය හෙබවූවාය. 1977 පක්ෂය ලැබූ මැතිවරණ පරාජයත් සමඟම ඊට ටික කලකට පසු එනම් 1980 දී ඇයගේ ප්‍රජා අයිතිය ද අහෝසි කරනු ලැබීය.

ඇගේ පාලන සමයේදී ශ්‍රී ලාංකීය දේශපාලන ඉතිහාසයේ ඉතා තීරණාත්මක සිදුවීම් රැසක් සිදුවිය. සියලු රාජ්‍ය ආයතනයන්හි ප්‍රධාන භාෂාව ලෙස සිංහල භාෂාව නම් කිරීමත් ඒ සමඟම පැන නැගුණ දෙමළ සුළු ජන කොටසේ සාමාජීය අර්බුදය ඉන් එකකි. ලංකා සම සමාජ පක්ෂයන් සමඟ සන්ධානගත වීම, චීනය සහ සෝවියට් රුසියාව අතර සම්බන්ධතා තර කිරීම ද ඒ අතර ප්‍රධාන විය. මේ සියල්ල සමග මැතිනියගේ එකම අපේක්ෂාව වූයේ දේශීයත්වය රැක ගනිමින් රට සංවර්ධනය කිරීමය. නමුත් කූට දේශපාලන බලධරයින් ඊට ඉඩක් තැබුයේ නැත.

එවන් තත්ත්වයක් දැන්වත් හඳුනාගත යුතුය. 1970 සිට 1977 දක්වා ක්‍රියාත්මක කළ වැඩපිළිවෙළෙහි අඩුපාඩු හඳුනාගෙන ඒවා මඟහැර වත්මනට ගැලපෙන ලෙස මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කාලෝචිතය. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නාමයටත් ක්‍රියාකලාපයටත් ගෞරවයක් ලැබෙන්නේ එවිටය.

● සමන්තී වීරසේකර



# සවිය දුරස්වන තැන දිවිය ලදිමි...

ජීවිතය තන අග පිනි බිඳු වැන්න. ඉපදෙන විටම කොතැනක හෝ මරණය ගැන ලියා තිබෙන බව අපි දන්නෙමු. මරණය තීරණය වන්නේ ජීවිතයේ ගලා යෑමත් සමගය. අත්විඳින අත්දකින සියල්ල ජීවිතය යැයි කිව හැකිය.

ඇය නමින් ජූඩි හේවගේ ය. වරාපිටිය කුණ්ඩසාලේ පදිංචි ජූඩි මරණය පරදා ජීවිතය ජයගත් කාන්තාවකි.

වෛද්‍යවරුන් 2014 වසරේ දී පවසා සිටියේ ඇය මාරාන්තික පිළිකා රෝගී තත්ත්වයකට පත්ව ඇති බවයි. ඒ අනුව ඇයගේ කුඩා මොළයේ ගෙඩියක් හටගෙන ඇති බවත් එය පිළිකා තත්ත්වයක් බවත් වෛද්‍යවරු කියා සිටියහ.

එහි වන විට ඇය එක් දරු මවකි. දිගින් දිගටම හිසරදය පැවතීම හේතුවෙන් මම කටයුත්තක් හෝ හරිහැටි කර ගැනීමට නොහැකිව ජූඩි දරුණු පසුබෑමකට ලක් වී සිටියාය.

"දවසින් දවස මගේ හිසේ කැක්කුම වැඩි වෙන්න පටන් ගත්තා. ඇගේ එක පැත්තක අතක් පයක් පණ නැතුව යනවා වගේ මට දැනුනා. ඊට පස්සේ කොළඹ ජාතික රෝහලට ගිහිල්ලා නතර වුණා.

කොළඹ මහ රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ගත්තත් එහිදී වෛද්‍යවරුන් පවසා සිටියේ මොළේ ගෙඩියක් සෑදී ඇති බවයි. එය සැත්කමක් මාර්ගයෙන් ඉවත් කළ යුතු වුවත් ශල්‍යකර්මවලට භාජනය වී රෝහලේ සිටි අනික් රෝගීන් අතපය පනනැතිව කතා කර ගැනීමටවත් නොහැකිව සිටින හැටි දැක්කම මට චකිතයක් ඇති වුණා. ඒ නිසා සැත්කම කිරීමට නොහැකි බව මම වෛද්‍යවරුන්ට කියා සිටියා.

එහෙම කිව්වත් පසුව මට එහිදී සැත්කම් දෙකක් කළා. ඒක මහා වේදනාකාරී අත්දැකීමක්. දන්න නොදන්න කාටවත් එවන් දේකට මූණ දෙන්න සිද්ධ වෙන්න එපා කියලා මම ප්‍රාර්ථනා කරනවා. මගේ ජීවිතය නැති කර දමන ලෙස මම කීප වතාවක්ම වෛද්‍යවරුන්ගෙන් ඉල්ලා සිටියා. නමුත් වෛද්‍යවරුන් සැත්කම් කිරීමට අවශ්‍ය බව පැවැසූ නිසා පවුලේ සියලු දෙනාගේ බලකිරීම මත එම සැත්කම් දෙකද කළා..."

මරණය ඉල්ලමින් හඬා වැටුණු ජූඩි ශල්‍යකර්මයෙන් පසුව මාස හතකට වැඩි කාලයක් මහනුවර රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලැබුවාය. ඒ කාලය තුළ ඇය සිය දියණිය තුරුළට නොගත්තාය. පිළිකාව සඳහා ලබා දෙන රේඩියෝ තෙරපි වෛද්‍ය ප්‍රතිකාරය නිසා එහි කිරණ තම දියනියට බලපෑමක් ඇති කරාවි යැයි යන සිතිවිල්ල නිසාය.

"දුව මගේ පණ වගේ. ඒත් මම දුව ළඟට ගත්තේ නැහැ. ඈත ඉඳන් දුවව බැලුවේ. ඒ කාලය පුරාවටම මට උදව් කළේ වට පිටාවේ උදවිය. මම රෝහලේ ඉඳන් කල්පනා කළේ ගෙදර ගිහින් තනිවම මුදල් උපයන ක්‍රමයක් ගැන. පවුලේ අයටවත් අසල්වැසියන්ටවත් කරදයක් නැතිව ජීවත් වෙන්න මම කල්පනා කළා. අනික මගේ දුවට අඩුපාඩුවක් නැතිව ජීවත් වෙන්න පසුබිමක් තියෙන්න ඕනෑ. මගේ ප්‍රතිකාර විදි නිසා මට ඇවිදීමේ අපහසුතාවයත් ඇතිව තිබුණා. සැරයටිය පාවිච්චි කළා. ඒ විතරක් නෙවෙයි, ඇස් පෙනීම තරමක් දුර්වල වුණා. කතා කිරීමේ අපහසුතාත් ඇතිවෙලා තිබුණා. කාලයත් එක්ක ඒ සියල්ල යථා තත්ත්වයට පත්වනු ඇති බව වෛද්‍යවරුන් කියා සිටියා. ඒ වචනවල විශ්වාසය හිතේ හිරකරගෙන මම අනාගතය හැඩගස්වා ගන්න ක්‍රම ගැන කල්පනා කළා.

2017 දී විතර රටේ කුණු ප්‍රශ්නය ගැන සමාජයේ කතාබහක් ඇතිවෙලා තිබුණා. නිතරම මාධ්‍ය ඔස්සේ මේ ගැන විකාශනය වෙනවා. කසළ කිව්වාම විවිධ වර්ගයේ කසළ තිබෙනවා. ඝණ අපද්‍රව්‍ය ලෙස ඉවත ලන බෝතල් ප්ලාස්ටික් ද්‍රව්‍ය පොත්පත් පත්තර වයර ආදිය මගින් විවිධ නිර්මාණ කළ හැකි බව මට තේරුණා. ඒ හරහා වෙළෙඳපොළක් හදා ගන්න උත්සාහ කළ යුතු බව සිතමින් නිර්මාණ සකස් කළ යුතු අන්දම ගැන වැඩියෙන් අවධානය යොමු කළා. කුමන ව්‍යාපාරයක් ආරම්භ කළත්, මූලිකව මුදල් යෙදවිය යුතු බව අමුතුවෙන් කිව යුතු නැහැනේ. එයින් පවා මිදිලා කටයුතු කළ යුතු අන්දම මම කල්පනා කළා. මුලින්ම මම හිතවතුන්ගේ නිවෙස්වලින් ඉවත දමන ඝන කසළ ද්‍රව්‍ය ගෙන්වා ගත්තා. ඒ කසළ අනුව, මම නිර්මාණ ගැන හිතුවා. අලුත් නිර්මාණ කළා. ඒවා පොළේදී විකිණුවා. මම හිතුවාට වඩා විකුණා ගත හැකි වුණා. පසුව මහනුවර නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කසළ කළමානාකරණ ඒකයේ නිලධාරීන් හමුවී ඔවුන් හට ලැබෙන ඝන අපද්‍රව්‍ය ලබා ගන්නට ක්‍රමයක් හදා ගත්තා. ඉන් පසු මා ලද අත්දැකීම් මත හිතවතියන්ට මගේ දැනීම ලබා දෙන්නට තීරණය කළා. කිහිප දෙනකුටම ඝන අපද්‍රව්‍යවලින් දැකුම්කළු නිර්මාණ කරන්නට මම ඉගැන්නුවා.

ඉන් පසුව මට මහනුවර මහනගර සභාවේ ඝන අපද්‍රව්‍ය කසළ කළමානාකරණ ඒකය මගින් ප්‍රදේශයන් පුරා පවත්වාගෙන යන පුහුණු පාඨමාලාවල්වල සිසු සිසුවියන්ට ඝන අපද්‍රව්‍ය ආශ්‍රිත නිර්මාණ කිරීම පුහුණු කිරීම සඳහා ඇයව තෝරාගත්තා.

මෙරට තුළ ඇති ඝන අපද්‍රව්‍යවලට විසඳුමක් ලෙස එයින් නිර්මාණ කර අලෙවි කිරීම සඳහා සිසු සිසුවියන්ට පාඨමාලාවක් නාගරික යාන්ත්‍රික ඉංජිනේරු නාමල් දිසානායක මහතාගේ සංකල්පයක් මත ආරම්භ වුණා. අද වන විට මහනුවර මහ නගර සභාව මගින් ක්‍රියාත්මක ඝන අපද්‍රව්‍ය නිර්මාණ පාඨමාලාවේ පුහුණු නිලධාරිනියක් ලෙස මම කටයුතු කරනවා.

දැන් මම ස්වාධීනයි. නිදහසේ මගේම කියන කාර්යයක් කරගෙන සතුටින් ඉන්නවා. ඇත්තෙන්ම මම මගේ හැකියාවෙන් ජයග්‍රහණය ලැබුවා.

●සවී



# නොකියවන ගැහැණු සිත

ගැහැණු සිත විනිවිද දැකීම පහසු කටයුත්තක් නොවෙයි. දැඩි සහ ශක්තිමත් බවින් යුත් ගැහැණියකගේ සිතෙහි ජනිත වන සිතිවිලි එළිදැක්වෙන්නේ ඒ ඒ ගැහැණියට ආවේණික වූ චරිතාංග හරහා ය.

ප්‍රාග් ඓතිහාසික සංස්කෘතීන් තුළ කාන්තාව නොයෙකුත් භූමිකා රඟ දැක්වූ අතර වර්තමාන ජන සමාජය තුළ පිරිමින් සමග උරෙනුර ගැටෙමින් ගැහැණු පිරිමි භේදයකින් තොරව එකාවන්ව කටයුතු කිරීමට ඇය ඉදිරිපත්ව සිටී.

පවුල් සංස්ථාවේ පදනම කාන්තාව බව කීවොත් එය සාධාරණ කථිකාවතක් විය හැකියි ස්වාමියාට ආදරණීය බිරිඳක්ද දරුවන්ට ආදරණීය මාතාවක් ද නැදිමයිලන් සහෝදර සහෝදරියන් සඳහා ආදරණීය සොයුරියක් ද වන ඇය සෑම අවස්ථාවකදීම කැපවී කටයුතු කරයි.

තම පවුල් සංස්ථාව තුළ ඉතා යහපත් චරිතයකින් රඟදක්වන කාන්තාව තමන්ට හුරුපුරුදු හිමි අඳුරු තැන් හෝ හිදැස් ඇති තැන් බාහිර සමාජයෙන් සඟවා ගනී. නිහඬ වීම මත සදාකාලිකව වැළලෙන හෝ වළදමන සුසුම් කඳු සිකර පරයා හමා ගොස් යළි ඈ වටා දැවටී ඇති බව සිහි කළ යුතුමය.

හිරුට ද පෙර දවස අරඹන කාන්තාව රෑ නින්දට යන්නේ ඇයට අවැසි මොහොතක නොව නින්දෙන් මිදෙන්නට බැරි තැනය. ගතට නොලැබෙන විවේකය හමුවේ විඩාබර වන සිරුරෙන් සහ විඩාබර වන සිතිවිලි සමගින් නැවතත් නැවුම් දිනයක අසීමිත කැපවීමක් සමග වෙහෙස වෙයි. මේ ඇය සතු ඇයට හිමි පරිසරය ය..

තම තමන්ට හිමි වූ පවුල් සංස්ථාව තුළ ස්වාමියාත් දරුවන්ගේත් කටයුතු වෙනුවෙන් අපමණ වෙහෙසක් ගන්නා කාන්තා භූමිකාව තමන්ගෙන් තමන්ට විය යුතු යුතුකමක් වගකීමක් ඇද්දැයි සොයා නොබලයි. එයින් තමන්ගේම කය සිත විඩාබර කර ගනියි.

සියලු වගකීම් යුතුකම් හිසමත දරාගනිමින් ඇයට ආවේණික වූ පිළිවෙතක් අනුව සියල්ල සිදුවෙද්දී ඇයගේ සිත කියවන්නට කිසිවකුත් ඉදිරිපත් නොවේ. සියල්ලෝම සිතන්නේ ඇය ඉතා ශක්තිමත් සියල්ල දරාගත හැකි සතුටින් වෙසෙන අයකු බවය.

වරද ඇත්තේ එතැනය. කාන්තාවකගේ අවශ්‍යතා වුවමනා ආශා අන් කිසිවකුත් හරිහැටි නොකියවයි. දින මාස වසර ගෙවමින් වෙහෙසෙන ඇයට එහි විඩාබර බව දැනෙන්නේ වේදනාවක් පසුතැවීමක් හෝ කලකිරීමක් සමගය. නොසිතෙන පරිද්දෙන් සියල්ල කනපිට පෙරළෙන්නේ මෙතැන දීය. පන මෙන් සුරකිව රැකබලා ගන්නා ළබැඳියන් ගේ සිත් රිදවීම් ගැටුම් ඇතිවීම් වළක්වාලිය නොහැකි වන්නේය.

එහි අවසන වන්නේ ලැබෙද්දී සිත රූපවාහිනියට හෝ සමාජ මාධ්‍ය ජලා සමග බැඳීමෙනි. එතැනින්ද නොනැවතී තමන් වෙත ලබැඳි අදහස් හා බැඳෙන්නේය.

මේතාක් දුර නොගොස් ඇයට කළ හැකි බොහෝ දෑ ඇත තමන් ගැන තමන්ගේ උනන්දුව වැඩි කර ගැනීමට කටයුතු කිරීමය. අන්අය වෙනුවෙන් කැපවීම හොඳය. නමුත් ඒ අතරවාරයේ තමන් පිළිබඳව විමසිලිමත්ව තමන්ගේ වුවමනා එපාකම් පිළිබඳව යෙහෙන් සිතන්න. ගීතයක රස විඳින්න. කෙටි චිත්‍රපටයක් හෝ නිදහසේ බලන්න රසවිඳින්න. යහළුවන් සමග කතාබහ කරන්නට හෝ ඇවිද යන්නට කාලය වෙන් කරන්න. නිදහස අත්විඳින්න. ලස්සනට අඳින්න. පිරිසිදුව සිටින්න. සිත නිවෙන සිතිවිලි පමණක් සිත්හි රඳවා ගන්න. තරහ වෛරය කෝපය පසුතැවිල්ල තමන් වෙත පැමිණෙන විටම ඉවතට ඇද දමන්න. සියල්ල කරුණාබර සිතින් විඳගන්න. අන් කවරකු වුවද තමන්ගේ සිතේ ඇති දෑ තේරුම් නොගතත්තද ඒ ගැන තැකීමක් නොකරන්න.

කාන්තාවනි... ඔබට සැනසිල්ලේ කාලය ගත කළ හැකිය. අත්විඳ බලන්න. සතුටින් ඉන්න...!



●යෙනිතා හේවා

# ගේ දොර ඉඩකඩම් ඉටුපිට

දිවයින ඉරිද සංග්‍රහය — ලුහුඬු දැන්වීම්

## මනාලයෝ

ගොවිකුල වයස අවුරුදු 43කි. මා සීනි කම්හලේ සේවයේ නියුතුය. මා සොයනුයේ වයස 40ට අඩු රූමත් යුවතියකි. කුල භේද අනවශ්‍යයි. බදුල්ල දිස්ත්‍රික්කය විශේෂයි.

ම/15/1273

## මනාලයෝ

උඩරට බොදු ගොවි 65 5' 5 එතරම් වයස නොපෙනෙන නීතියෙන් වෙන්වූ (පැමිණිලිකරු) නිවසක්, කාර් එකක් හිමි මා සොයනුයේ ගේදොර ඉවුම් පිහුම් වැඩකටයුතු මනාව දත් ළමයින් නැති වැන්දඹු දික්කසාද යුවතියකටයි. සියලු විස්තර පළමු ලිපියෙන් දුරකථන අංකය සමග තමාම ලියන්න.

ම/15/5977

## මනාලයෝ

බස්නාහිර බොදු ගොවි වයස 27 උස. 5' 5'' මිථුන සුදු චංචල සහ නිශ්චල දේපළ හිමි පරිගණක ඉංජිනේරු ගැලපෙන සහකාරියක මව සොයයි. දුඃකඃ 011 2700838

ම/15/1130

පොලොන්නරුව දිඹුලාගල බොදු ගොවි 1988 උපන් උස 5' 6'' පොලිස් විශේෂ කාර්ය බළකායේ සේවයේ නියුතු නිවසක් හිමි වැඩිමහල් පුතුට සුදුසු සහකාරියක් මව සොයයි. සහෝදරියන් දෙදෙනා විවාහකයි. බාල සහෝදරයා අවිවාහකයි. ඊමේල් : chandaragedara@gmail.com

ම/15/1274

## මනාලයෝ

මාගේ වයස 43 යි. සීනි සමාගමේ සේවය නියුතු මා බලාපොරොත්තු වන්නේ අවු. 40ට වඩා අඩු නැගණියකි. දරුවන් සිටින අය නොලියන්න.

ම/15/1276




## මනාලියෝ

1998 පානදුර බෞද්ධ රජයේ කළමනාකරණ සහකාර ප්‍රසන්න පෙනුමැති දියණියට සහකරුවකු දෙමාපියන් සොයයි. දායාද සහිතයි.

ම/15/1275

බස්නාහිර පළාත සිංහල බෞද්ධ ගොවි වයස 38 වෘශ්චික උස 5'5'' උසස් පෙළ සමත් බාහිර උපාධි ලත් භාෂා තුනක දැනුම මානව සම්පත්, විධායක නිලධාරිනි තමාගේම නිවසක් හිමි. සුදුසු මනාලයකු මව සොයයි. T.P. 011-2700479

ම/15/1131





දිවයින | Sunday Island | දිවයින | The Island | නවලිය | සුජය | විදුසර

**දැන්වීම් සඳහා විමසන්න**

011-2434190
011-2449287
011-2497533

උපාලි නිව්ස්පේපර්ස් ප්‍රයිවට් ලිමිටඩ්




## දිවයින The Island ඔබගේ දැන්වීම් ඔබ ප්‍රදේශයේ අප නියෝජිත වෙත බාරදෙන්න

| සීදූව | පමුණුගම | බටුවත්ත | ජා ඇල | මිගමුව | මාලබේ |
|---|---|---|---|---|---|
| චන්ද්‍රසිරි වීරුම්<br>මුකලංගමුව<br>2257205 | ජන්ෂන් හාඩ්වෙයාර්<br>(රාලහාමිගෙ කඩේ)<br>4868977 | රේණුකා ග්‍රොසරීස්<br>දම්ටියපළ පාර<br>2959718 | දාස සහෝදරයෝ<br>186 , මිගමු පාර, ජා ඇල<br>0112237395 | උදාර නියෝජිත<br>බස්නැවතුම්පළ පිටුපස.<br>IDM අසල<br>0727804355.031 2231958 | හිමකර ග්‍රොසරි<br>බස්නැවතුම්පළ<br>2560097 |
| **වේයන්ගොඩ** | **මාකොල** | **මිරිගම** | **රන්පොකුණගම** | **දෙම්පෙ** | **වේවැල්දෙණිය** |
| සෝමගිරි පොත්හල<br>0332290386 | සිත්තර එන්ටර්ප්‍රයිසස්<br>274 මාකොළ උතුර<br>2962129 | ගමගේ පොත්හල<br>51, කෙලින් වීදිය<br>0332273859 | නාමල් ස්ටෝර්ස්<br>0332280167 | ජනසිරි ප්‍රින්ටර්ස්<br>2409685 | ශ්‍රී ලාල් ස්ටෝර්ස්<br>033 2285667 |







# උත්තරීතර මනුෂ්‍යයකු උපන් මොහොත



උතුම් වෙසක් පුන් පෝ දින අදට යෙදී තිබේ. උතුම් යැයි කියන්නේ උතුම් මනුෂ්‍යයකු බිහි වූ දිනය නිසාය. මනුෂ්‍යයකු උතුම් වන්නේ මිනිසකු ලෙස ඉපිද, ළඟා කර ගත හැකි උතුම්ම තත්ත්වයට ළඟා වූ නිසාය. ඒ බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේ ඉපිද දැන් වසර දෙදහස් පන්සිය හැටපහක් ගතවී තිබේ.

තමන් මනුෂ්‍යයකු යැයි පැවසූ එකම ආගමික ශාස්තෘවරයාණෝ බුදුන් වහන්සේය. නොපෙනෙන දෙවියකු නිර්මාණය කළේ යැයි පිළිගනු ලබන ආගමික නායකයන් අතර උන්වහන්සේ පැවසුවේ තමන් දෙවියකු හෝ වෙනත් අමනුෂ්‍යයකු නොව උත්තරීතර මනුෂ්‍යයකු බවය.

බුදුන් වහන්සේ මෙන්ම වෙනත් බොහෝ අය ද උපන් වේලාවන් නොව, ඉපදීමට නියමිත වේලාවන් ඊට බොහෝ කලකට පෙර ඉන්දියාවේ නාඩි ශාස්ත්‍රයට අයත් ග්‍රන්ථවල ලියා තිබේ. මේ අනුව උන්වහන්සේගේ උපත ''කලියුග වර්ෂ 2478 වෙසක් පුන් පෝ දින ලත් ඉරිදා දිනක උදයාදී එකොළොස් පැය විනාඩි හතරට විසා නැකතින් කටක ලග්නයෙන් සිංහ නවාංශකයෙන්'' සිදුවන බව කෞමාර නාඩි වාක්‍යවල සඳහන් වේ.

සම්බුද්ධ කේන්ද්‍රය

නාඩි ශාස්ත්‍රයට අයත් පත්ඉරු කියවා බලා මෙම සම්බුද්ධ කේන්ද්‍රය 'බුද්ධ චරිතය' ග්‍රන්ථය මගින් එළිදැක්වීමේ ගෞරවය අතිපූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රෙය හිමිපාණන්ට හිමි වේ.

කේන්ද්‍ර සටහනක් යනු කර්ම සටහනකි. පෙර ආත්මවල කරන ලද කුසලාකුසල කර්ම, මෙම ආත්මයේ පලදෙන ආකාරය ජන්ම පත්‍රය මගින් පෙන්වයි. මේ හැර ග්‍රහයකු විසින් සුබ හෝ අසුබ පල දෙනවා නොවේ. සිදුහත් බෝසතුන්ගේ පෙර කර්ම මෙම ජන්ම පත්‍රය පෙන්වා දෙයි. ජ්‍යොතිෂයේ සත්‍යතාවය වටහා ගැනීමට මෙයම සාක්ෂියකි. ජ්‍යොතිෂය ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ට මෙයම පාඩමකි.

මෙහි රවි එකොළොස්වැන්නේ රාශි වශයෙන් ඇතත් භාව වශයෙන් පසළොස්වක පෝය යෙදෙන බව සැලකිය යුතුය. කේන්ද්‍රයක ගුරු පළමු භාවයේ බලවත්ව පිහිටීම පිළිබඳව භාව ප්‍රකාශය නම් ග්‍රන්ථයේ මෙසේ සඳහන් වේ.

''හේ ආත්මීය ගුණ සමූහය කරනකොට ගෙන සියලු ලෝ වැසියන්ගේ ගුරු බවට පැමිණේ. සුවපත් වූ යහපත් ශරීර කාන්තිය ඇත්තෙක් වේ.''

මෙම කේන්ද්‍රයේ කුජ උච්ච බලයෙන් යුක්තය. රුචක නම් වූ මහා පුරුෂ යෝගය වන මේ නිසා නිර්භීත බව, නොපසුබට උත්සාහය, ධෛර්යය හා ජයග්‍රහණ ලැබීමේ වාසනාව පෙන්වයි. දුෂ්කර ක්‍රියාවේ යෙදුණු සය වසර ගැන සලකන විට මෙය ප්‍රත්‍යක්ෂ වේ. සාමාන්‍ය මිනිසුන්ගේ ධෛර්යය ඉක්මනින් හීන වන බැවිනි. උන්වහන්සේ සම්මා සම්බුද්ධ තත්ත්වයට පත්වූයේ එබැවිනි. සිකුරු උච්ච බලයෙන් යුක්තව පුණ්‍යස්ථානගත වී තිබේ. සිකුරු සැපට අධිපති වේ. නමුත් පුණ්‍යස්ථානයේ නිසා සැප සම්පත්වල නොඇලුන ද, රමණීය ආරාම ඇතුළු පහසු වාසස්ථාන හිමි විය. 'භගවා' නමින් දැක්වෙන භාග්‍යය, වාසනාව අයත් බුදු ගුණය එයයි. ප්‍රධානතම ග්‍රහයා වන රවි බලවත් වීමෙන් සියලු පූජාවන්ට සුදුසු වූ යන බුදු ගුණය වන ''අරහං'' ගුණය සංකේතවත් කෙරේ. මෙවැනි ග්‍රහ බල සහිතව කෙනකු උපන්නොත් පත්වන තත්ත්වය ගැන ද ජ්‍යොතිෂ ග්‍රන්ථවල සඳහන් වේ. මෙම ශාස්ත්‍රයේ මෝක්ෂ යෝග කාණ්ඩයේ දැක්වෙන මෙම වගන්තියෙන් එය මනාව පැහැදිලි කරයි. ''කටක ලග්නය වී එහි බ්‍රහස්පති ද බලවත් ග්‍රහයන් තුන් දෙනෙක් හෝ හතර දෙනෙක් කේන්ද්‍රගත වීම ද හේතුකොට ගෙන උපන් මිනිස් තෙම මෝක්ෂයට පැමිණෙන්නේය.'' මෙය පරම සත්‍ය වූ බව අපි දනිමු.

බුදුවරයකු පහළ වන්නේ කල්ප ගණනකිනි. එමෙන්ම මෙම ජන්ම පත්‍රයේ පිහිටන ආකාරයට ග්‍රහ පිහිටීම් ද කල්ප ගණනකින් පමණක් උදා වේ.

ජ්‍යොතිර්වේදීන් ද සාමාන්‍ය ජනතාව ද සැලකිලිමත් වන අයහපත් කාලයක් නම් සෙනසුරු ඒරාෂ්ටක අපලය උදාවන කාලසීමාවයි. බෝසතාණන් වහන්සේගේ ජන්ම පත්‍රයේ සඳු හතරවැන්නේත්, ශනි අටවැන්නේත් පිහිටා තිබේ. මේ අනුව ප්‍රථම ජන්ම ඒරාෂ්ටක අපලය වයස 16-23 අතර පැවතිය යුතුය. මේ කාලයේ තම නෑදෑයන්ට දුනු ශිල්ප ආදිය පෙන්වා අප්‍රසාදය දුරු කිරීමට සිදු විය. එහෙත් ශනි උච්ච රාශිය නිසා තම බලය වැඩි විය. වයස අවුරුදු 40 දී පමණ ලග්නයෙන් දොළහේ ශනි ගමන් කරන විට සුද්ධෝදන රජතුමාගේ අභාවය සිදුවිය. ඊට පෙර අටවැන්නේ සිටි ශනි නැවත වරක් අටවැන්නට ගමන් කරන්නේ අවුරුදු විසිනවය වන විටය. ඒ දුෂ්කර ක්‍රියාව ආරම්භ වූ සමයයි. උන්වහන්සේ විසා නැකතින් ඉපදුණු බැවින් ගුරු දශාව තුළ ඉපදී ඇති අතර ඉන්පසුව උදාවන ශනි මහ දශාව හා ඒරාෂ්ටක අපලය එකට යෙදී තිබේ. අතිශයින් දුක් සහිත කාලයක් වූ එය නිමවා බුධ දශාව ආරම්භ වනවිට බුද්ධත්වයට පත් විය. උපතේදී ගුරු සිටියේ ලග්නයේය. වසර දොළහකට වරක් රාශි චක්‍රය පසු කරයි. එනම් වසර 35 වනවිට ගුරු ග්‍රහයා ගෝචර ගමනින් නැවත වරක් ලග්නයේ ගමන් කරන කාලය වන්නට ඇත.

ශනි රාශි චක්‍රයේ ගමන වසර තිහකට ආසන්න කාලයකදී නිම කරයි. මේ නිසා වයස 60 දී ශනි අටවැන්නේය. 9, 10, 11, 12, 1, 2, 3 යන රාශි හරහා ගමන් කිරීම වසර 18-20 පමණ ගතවන අතර මේ අනුව වයස අවුරුදු අසූව වනවිට සෙනසුරු ග්‍රහයා සඳු මතින් ගමන් කරන ජන්ම ඒරාෂ්ටක අපල කාලය උදාවී තිබේ. සම්බුද්ධ පරිනිර්වාණය සිදුවන්නේ එවිටය. උත්තරීතර මනුෂ්‍යයකු ලෙසම නිමාවට පත් කරන ජීවිතය අවසන් වන්නේ ද වෙසක් පුර පසළොස්වක පෝය දිනකය.

සෙනසුරු ඒරාෂ්ටක අපලය නිසා උන්වහන්සේ පිරිනිවන් වැඩියා නොවේ. දුෂ්කර ක්‍රියා කළේ ද සෙනසුරු නිසා නොවේ. බුදු වූයේ ගුරු නිසා නොවේ. කෝටි ගණන් වටිනා ජේතවනාරාමය වැනි ආරාම ලැබූයේ සිකුරු බලවත්වීම නිසා ද නොවේ. ඒ සියල්ලක්ම කර්ම විපාක වේ. ග්‍රහයින්, කර්ම පෙන්වාදී ඇත. බුදුන් වහන්සේගේ සුවිශේෂ ඉගැන්වීමක් වූයේ කර්ම නියමයයි. සිතා මතා කරන සියලු දේ කර්මයි. ඒවා මතු විපාක දීමට සමත්ය. වැපිරූ දේ අස්වැන්න ලෙස කපා ගත යුතු වේ. කේන්ද්‍රය යනු කර්ම සටහනයි.

ඉතින් කර්මවලට බිය විය යුතුද? කර්ම පිළිගත යුතුද? කර්ම විපාක නිසා දුක් විඳිය යුතුමද? නැත. දුක් දුරු කර සතුට ලබන හැටි ද ඉගැන්වූ ගුරුවරයාණෝ බුදුන් වහන්සේය. ශරීරය හා මනස සහිත තමාගේ රියැදුරා තමාම ය. නියම දිශාවට පැදවීම තමා සතුය.

මේ සඳහා අනුගමනය කළ යුතු කරුණු තුන ද බුදුන් වහන්සේ උගන්වා ඇත. මේ හැර දුක දුරු කර සතුට ලබන ක්‍රමයන් නැත. කුමක්ද ඒ කරුණු තුන?

සියලු පව නොකරන්න (සබ්බ පාපස්ස අකරනං) මේ පළමු පියවර නැතිව ඉදිරියට යා නොහැක. දෙවැනිව කුසල් උපදවන්න (කුසලස්ස උපසම්පදා) තුන්වෙනුව හිත දමනය කළ යුතුය. (සචිත්ත පරියෝ දපනං) මේ බුදුන් වහන්සේලාගේ අනුශාසනයයි.

මේ අනුශාසනයෙන් බැහැරව අනියම් මාර්ගවලින් සතුට සොයන අයට අත්වන ඉරණම ඇස් ඉදිරිපිටම පෙනෙන්නට තිබෙනවා නොවේද?

ඔබ සැමට බුදුසරණයි.

කෑගල්ලේ
සුනිල් කුමාර ගම්ලත්
දු.අංකය - 0771 234 313



# තත්කාලයෙන් රෝග හඳුනාගන්නේ කෙසේ ද?




තත්කාලයෙන් රෝග හඳුනා ගැනීමට උදව් දෙන මෙම ලිපි පෙළින් මීට පෙර මේෂ, වෘෂභ, මිථුන, කටක යන ලග්නවලින් විචාල කළ රෝග හඳුනා ගන්නා හැටි විස්තර කළා. එහිදී රෝගය අඩු වැඩි වන අන්දමද විස්තර කළා. මට තවත් කිව යුතු කරුණක් ඇත. එනම් රෝගයක රෝග ලක්ෂණ නොව දූනට පුද්ගලයා තුළ පවතින අසනීප තත්ත්වය විස්තර කළ යුතුයි.

ජ්‍යොතිෂ්ශාස්ත්‍රඥයකුට රෝගියා දකින්ට නොලැබේ. බොහෝ විට වේලාපත්කඩය ගෙන එන්නේ ඥාතියෙක් විසිනි. ඒ ආවත් රෝගය හෝ රෝගියා පිළිබඳව විස්තර නොකරයි. මන්ද ජ්‍යොතිෂවේදියා දක්ෂදැයි බලා ගන්නටය. මොන ජගතත් ග්‍රහ තත්ත්වය අනුව රෝග ලක්ෂණ විස්තර කරනවා මිස ඊට එහා ගිය දෙයක් නැත. ග්‍රහ පිහිටීම අනුව සියල්ල තීරණය වෙයි. අපි බලමු චර රාශි මොනවාදැයි කියා. මෙම චර රාශි ලෙස හඳුන්වන්නේ මේෂ, කටක, තුලා, මකර යන රාශීන්ය. මෙම ලග්න තුනෙන් එකක් ප්‍රස්තුතකරණයට සහ උදාවූ ලග්නයට අයත් වෙයි නම් එම පුද්ගලයාට පවතින අසනීප තත්ත්වය වෙනස් වෙයි. එම නිසා රෝගී බව කල් අල්ලයි. එමෙන්ම ශරීරයේ යම් යම් කොටස් පණ නැති තත්ත්වයකට ලක්වෙයි. මීට අමතරව කරන බෙහෙත් ද පත්තියම් නොවන බවක් පෙනේ. එම අවස්ථාවේදී පවතින ලග්නයේ ශුභාශුභ පිහිටීම් ඇත්නම් කරන ප්‍රතිකර්මවලින් ශුභ බවක්ද අශුභ ග්‍රහ දෘෂ්ටිවලට ලක්වී නම් අශුභ ඵල දෙන බවත් කරන ශාන්තිකර්ම මෙන්ම බෙහෙත් හේත්වල ගුණ බවක්ද නොපෙනේ. සුභ සඳුගේ දෘෂ්ටියක් ලැබී ඇත්නම් සියලුම දෝෂ භංග වන බවද දක්වේ.

තවද තත්කාල ලග්නයට 7, 8 යන ස්ථානයන්හි ශුභ දෘෂ්ටි සහ ශුභ ග්‍රහයන් වේනම් හා ශුභ ග්‍රහයන් යෝග කාරකව චර රාශිවල සිටීනම් ඉක්මනින් සුවය ලැබෙන බව ප්‍රකාශ කළ යුතුයි. මේ හැර සඳු 3, 6, 10, 11 යන ස්ථානයක සිටීමද රෝගය සුවවීමට කාරණයකි. මෙය සතුටට කාරණයකි. තවද මෙම ස්ථානවල සඳු දුර්වලව පාප දෘෂ්ටි ලැබ සිටීනම් එම රෝගියාගේ රෝගය සුව නොවන බව කිව යුතුය.

සිංහ ලග්නය තත් කාලය වූ අවස්ථාවේදී විශේෂයෙන්ම එම තැනැත්තාගේ නිවස වටපිටාව පෙන්නුම් කරයි. මොනම ආකාරයෙන්වත් එම නිවස පිරිසිදු තැනක් නොවේ. ගේ හිමියන්ගේ නොසැලකිල්ලෙන් බොහෝ කරදරවලට ලක්වේ. මෙම නිවසට භූමියට ප්‍රේත බැල්ම, ප්‍රේත දෝෂ ගැනද, කිව යුතුව ඇත. නිවැසියන් එයින් පීඩා විඳියි. සමහර විට නිවැසියන්ට තත්කාලයෙන් විමසන විටත් ඒ බව නොදැනෙන්නට පුළුවනි. රෝගියාගේ පෙනුම වර්ණය, වෙනස්වේගෙන යන කාලයකි. බලන බැල්මේ පවා වෙනසක් දැකිය හැක. මෙම නිවසේ ආහාර කලින් පිළුණු වන බවත්, ගෙම්බන්, කුඹීන් වැනි සතුන් මෙන්ම අවට භූමියෙන් විවිධාකාරයේ ශබ්ද මෙන්ම වහලෙන් වැලි වැටෙන්නාක් මෙන් දැනෙන්නටත් මීයන්ගේ පොර බැදීම් ද වැඩි වෙන්නටත් පටන් ගනියි. යම් යම් ගඳවල්ද ඇතිවේ. මීට අමතරව කේතු 1, 4, 7, 10 යන ස්ථානයක ඇත්නම් ශනි ඊට සම්බන්ධවී ඇත්නම් එවිටද ප්‍රේත දෝෂයක් බව තවදුරටත් තහවුරු කර ගත හැක. මේ කාලයේ සතුරන්ගෙන් ප්‍රවේශම් වන්න.

කන්‍යා ලග්නය තත් කාලය වූ විට මුලින්ම බුද නැත්පත්වී ඇත්තේ කිනම් රාශියේද යන්න පිළිබඳව බැලිය යුතුයි. මීට අමතරව කන්‍යාව කියන්නේ සයවන ලග්නයයි. විශ්ව කේන්දරයේ මේෂය ලෙස ගත් විට කන්‍යාව බටහිරට නුදුරින් පිහිටා ඇති බැවින් ඉහත කරුණු අනුව සිතාගත හැකි වන්නේය. ලග්නාධිපතියා කේන්දරයේ කවර දිසාවකට හිමිව සිටීදැයි පරීක්ෂා කළ යුතුය. දිශාව පරීක්ෂා කිරීමේදී ලග්නයට පෙර දිශාවන්, දසවැන්න දකුණු දිශාවටත්, සත්වැන්න බටහිර දිශාවටත්, 4 වැන්න උතුරටත් හිමි බව තේරුම් ගන්න. එසේනම් බොහෝවිට ප්‍රශ්නකරු පැමිණි කාරණා වන්නේ ජලයට සම්බන්ධ වූ දෙයක් පිළිබඳව විපරම් කිරීමටය. බුදට ශනි පෙනේනම් කරදිය මිශ්‍ර ජලයකි. බුදට රවිගේ දෘෂ්ටිය ලැබේනම් බොහෝදෙනා පැමිණ ස්නානය කරන තොටුපළක් සම්බන්ධ කරුණකි. බුදට කුජගේ දෘෂ්ටියට ලක්වූයේ නම් මඩ වතුරක් වැනි ස්ථානයකි. නැත්නම් වගුරු බිමකි. බුදට රාහුගේ දෘෂ්ටියට ලක්වූවේනම් එගොඩ මෙගොඩ වන තොටුපළකි. බුදට සඳුගේ දෘෂ්ටියට නම් දිය පාරකි. දොළක් හෝ ඇළක් වැනි යම් ශබ්දයකින් වතුර ගලා බසිනා තැනක් ලෙස දක්විය හැක.

මේ ජලාශ්‍රිත ස්ථාන මොනයම් හෝ කරුණක් නිසා දූෂිත වූ ස්ථාන ලෙස දක්විය හැක. එසේම රෝග ලක්ෂණ වශයෙන් සඳහන් කිරීමේදී යම් යම් ඉන්ද්‍රියයන්ගේ ඉදිමීම වේදනාව සහ නොසන්සුන් බව දක්වේ. මෙම රෝග ලක්ෂණ වරෙක අඩුවී යන අතර තවත් විටක වැඩිවී යන බවත් සඳහන් කළ යුතුයි.

මෙම රෝගාබාධ සුවවන ලෙස දෛවඥයාගෙන් විමසනු ඇති බැවින් චන්ද්‍රයා 3, 6, 8, 12 යන ස්ථානයක ගෝචර ගමනින් හැසිරෙද්දී චන්ද්‍රයාට පෙනෙන ග්‍රහයන් අනුව කාලය නිර්ණය කළ හැක. මෙම කාලය නිර්ණය කිරීමේදී ශනි වර්ෂයක්ද රවිගෙන් අයනයක්ද, බුධගෙන් හා සිකුරුගෙන් පරීක්ෂණයක්ද ගුරුගෙන් මාසයක්ද කුජගෙන් දින ගණනක්ද ගණනය කර පැවසිය යුතුයි. ඉහත සඳහන් යම් ග්‍රහයෙක් අදාළ තත් කාල කේන්දරයේ උච්චවී ගණනය කළ යුත්තේ ශනිට පැයක්ද රවිට එයින් දෙකෙන් කොටසක්ද සිටීනම් බුදට එයින් තුනෙන් කොටසක්ද, යනාදී ලෙසයි. උදාවූ ලග්නයේ ශුභ ග්‍රහයන් 6, 8, 12, ආදී දුෂ්ට ස්ථානයකට ගෝචර වශයෙන් පැමිණෙන දිනය අනුවද විස්තර පැවසිය හැක.

රෝගියා එම රෝගයෙන්ම මියයයිද යන්න පැවසීමට චන්ද්‍රයා සිටින ස්ථානය බලාගතහැකි ක්‍රමයක් ඉදිරිපත්කරගෙන අටවන භාවයටත්, හත්වැන්නටත්, එකොළොස්වැන්නටත් චන්ද්‍රයා පැමිණ සිටියද එවිට දුබල, පව්ටි ග්‍රහයන් පැමිණ සිටියිද එසේ නම් එම හේතුවෙන් රෝගියාට මරණය ගෙන දෙන බව පැවසිය හැක. මෙවැනි අවස්ථාවකදී ප්‍රතිකර්ම කිරීම රෝගියාගේ ඥාතීන් විසින් සිදුකළ යුතුයි.

මීළඟට ප්‍රශ්නකරුවෙක් පැමිණ ප්‍රශ්න නගන වෙලාවට උදාවූ ලග්නය තුලා, වෘශ්චික, ධනු, මකර, කුම්භ, මීන යනාදී ලග්නයකින් එකක්වූ කල එම ලග්නාධිපති, තැන්පත්වී සිටින රාශිය, එම රාශිය එම ග්‍රහයාට ශුභද, අශුභද, මිත්‍ර, හෝ ස්වක්ෂේත්‍ර ද යන්න පිළිබඳව බැලිය යුතුයි. එමෙන්ම ග්‍රහ දෘෂ්ටි ගැනද අවබෝධයක් තිබිය යුතුයි. එසේනම් අපි බලමු යම් අවස්ථාවක මෙම ලග්න උදාවූ කල වා, පිත් සෙම් දෝෂ ඇතිවේ. එම දෝෂ කුපිත වීමෙන් හටගන්නා රෝගවලින් පෙළෙන අයත්, අධ්‍යාපන කටයුතුවලට බාධාගෙන දෙන බවත්, යම් යම් අවස්ථා නිසා විවාහය ප්‍රමාද වන අයත් මෙයට අයත් වෙයි.

බලමු ඉහත ලග්නවලට අයිති ග්‍රහයන් පිළිබඳව. එනම් තුලා ලග්නයේ අධිපති සිකුරු වන අතර වෘශ්චික ලග්නයේ අධිපති කුජ වෙයි. ධනු ලග්නයේ අධිපති ගුරු වන අතර මකර හා කුම්භ ලග්නයේ අධිපති සෙනසුර වෙයි. මීන ලග්නයේ අධිපති ගුරුවෙයි. ඉතිං මෙම ග්‍රහයන් කුපිත වීමෙන් රුධිර පීඩනය, අඩු වැඩි රුධිර පීඩනය, අර්ශස් රෝග මේදය බහුල රෝග සහ උර ප්‍රදේශයේ ඇතිවන රෝගාබාධ ඇතිවේ. කෙසේ හෝ මෙම රෝගාබාධයන්ගෙන් මිදීමට කළ යුතු ප්‍රතිකර්ම ගැන විමසීමක් කරමු. මුලින්ම මේ සම්බන්ධයෙන් යෙදෙන අපලවලට ජීවිතය රැක ගැනීමට පළමුව මරණයට නියම වූ ගවයන් තුන් දෙනෙක් නිදහස් කළ යුතුයි. නැතිනම් ගවයන් නිදහස් කිරීමට උදව් (මුදල් දීම) කළ යුතුයි. සංඝයා වහන්සේලාට සහ බ්‍රාහ්මණ හෝ ශ්‍රමණයන් තුන් දෙනෙකුට අංගසම්පූර්ණ දානයක් දිය යුතුයි. එසේම පලතුරු පූජා, කැවිලි පූජාද තැබිය යුතුයි.

ඉහත සඳහන් අයුරින් මා වෙතට පැමිණෙන අයගේ ජීවිත සහයසේම චිත්ත සහයද එකසේ ලබාදිය යුතුයි. ඉහත වේදනාකාරී ගැටලුවලින් යුතුව කිසියම් පුද්ගලයෙකු අහඹු ලෙස පැමිණිය හැකිය. සිත නොසන්සුන්වී ගෙදර අතහැර යාමට හෝ දිවි නසා ගැනීමට තීරණය කළ හැකිය. එසේම ප්‍රේත දෝෂයකට ලක්වූ අයෙක් හෝ විය හැක. එවැනි අය කෙරේ කරුණාවෙන් දයාවෙන් බැලිය යුතු අතර යම් සහනයක්ද දිය යුතුයි. එම සහනය දුක තුනී වීමට කරුණක් වෙයි.

මීට අමතරව මිනිසාට සෙත් සැලසිය හැකි මන්ත්‍ර විද්‍යාව භූත විද්‍යාව, තන්ත්‍ර විද්‍යා හා හෝමක්‍රම ගැනද පහදා දිය හැකි කරුණු කාරණාවලින් යම් සහනයක් ද සලසා දිය හැක. මෙම සකල කාරණා බිහිවී ඇත්තේ මිනිසාගේ යහපත සඳහාය. එසේ නම් මිනිසා පිළිබඳව දයාවූ කම්පාවෙන් බලා සෙත් ශාන්ති කරන්න.

හොඳින් උදාවූ රාශිය හඳුනාගෙන එම රාශියට අදාළ කරුණු කාරණා පහදාදී ලග්නාධිපති පිළිබඳවද වැටහීමක් ලබාගන්න. විශේෂයෙන්ම ඔබ රැගෙන යන කේන්දර සටහන සමග බුලත් රැගෙන යාමට අමතක නොකරන්න. මන්ද සියලු දේ විසඳීමට බුලත්ද අවශ්‍ය වන බැවිනි.

නාඩි ජ්‍යොතිෂවේදී, වාස්තු විද්‍යා උපදේශිකා
ඉවෝන් දිසානායක
ඉටුමිණ ජ්‍යොතිෂ ආයතනය
(මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසල)
රම්මුතුගල- කඩවත.
දු. අංකයඃ 0715 723 434, 0777 343 437



# ඔබගේ විවාහය ප්‍රමාද ද? අසාර්ථකද? මෙන්න විසඳුම්




කෙසේ නමුත් තමන්ගේ ජන්ම පත්‍රයේ තිබෙන්නේ විවාහයට කවර ලෙස බලපාන ග්‍රහ පිහිටීම්ද යන්න කල්තියා දැන ගැනීම තුළ ඊට අදාළ මහ දශා අන්තර් දශා තුළ නිසි වත්පිළිවෙත් සිදුකර යම් සහනයක් අනිවාර්යයෙන්ම ලබාගත හැක. බොහෝ ජන්ම පත්‍රවල සඳහන් විවාහ ප්‍රමාද කරන ග්‍රහ පිහිටීම් රැසකි. ඒ අතුරින් සුලබව දක්නට ලැබෙන ග්‍රහ පිහිටීම් මෙසේය.

1. ශනි සිකුරු සංයෝගය හෝ දෘෂ්ටිය.
2. ශනි චන්ද්‍ර සංයෝගය හෝ දෘෂ්ටිය
3. ශනි ගුරු සංයෝගය හෝ දෘෂ්ටිය
4. 7 අධිපති සමග ශනි සංයෝග වීම හෝ 7 අධිපතිට ශනි දෘෂ්ටි දීම
5. ශනි 7 වැන්නේ සිටීම හෝ 7 වැන්නට දෘෂ්ටි දීම
6. ගුරු 7 වැන්නේ සිටීම හෝ 7 වැන්නට දෘෂ්ටි දීම
7. ශනිගෙන් 2 වැන්නේ හෝ 12 වැන්නේ සිකුරුවීම
8. සිකුරු ශනිගේ රාශියක වීම
9. සිකුරු හෝ චන්ද්‍රයා හෝ 7 වැන්නාධිපති හෝ නීචය භංග නොවන ලෙස නීච වීම
10. චන්ද්‍ර ලග්නයෙන් කේන්ද්‍රගතව (1, 4, 7, 10) හෝ චන්ද්‍ර ලග්නයෙන් 11 වැන්නේ ශනි පිහිටීම
11. ශනි සිකුරු පරිවර්තනය වී සිටීම
12. කාලසර්පයෝගය පිහිටා තිබීම
13. ශනි 7 අධිපති සමග සංයෝග වීම
14. 7 අධිපති හෝ සිකුරු අස්ථ වීම
15. රවි හා සඳු ශනිට සප්තම වීම
16. 7 අධිපති කුජ 8 වැන්නේ වීම
17. ලග්නයෙන් සිකුරුගෙන් සඳුගෙන් 7 වැන්නේ පාපීන්වීම
18. භෞම දෝෂය, ශනි මංගල දෝෂය පිහිටා තිබීම
19. ශනි ග්‍රහයා උච්ච වීම
20. රවි, රාහු 7 වැන්නේ සිටීම
21. 7 වැන්නේ සර්ව අෂ්ඨක ප්‍රමාණය 20 හෝ ඊට ආසන්නව වැඩි වීම
22. 7 වැන්නාධිපති සිටින රාශියේ සර්ව අෂ්ඨක ප්‍රමාණය අඩුවීම (20-30) අතර වීම
23. විවාහකාරක සිකුරු කුජ වැනි ග්‍රහයන් 7 වැන්නේ ලබා ඇති භින්නාෂ්ඨක ප්‍රමාණය අඩුවීම
24. ලග්නාධිපති සමග රවි 8 වැන්නේ වීම
25. 7 අධිපති 12 වැන්නේ ද රාහු හා සිකුරු ලග්නයේද වීම

ඉහත සඳහන් විවාහ ප්‍රමාද කරන ග්‍රහ පිහිටීම්වලට අතිරේක තවත් විවාහ පමා කරන ග්‍රහ පිහිටීම් රැසකි. එහෙත් ඒ සියල්ල මේ කෙටි ලිපියට කැටි කළ නොහැක. සාමාන්‍යයෙන් විවාහය ගැනත් එය සිදුවන කාලය ගැනත් ජන්ම පත්‍රයක 7 වැන්න පරීක්ෂාවෙන් දැනගත හැක. විවාහයක් සිදුවන කාලය බොහෝ විට 7 වැන්නේ තැන්පත් ග්‍රහයකුගේ මහ දශාවකදී හෝ අතුරු දශාවකදී සිදුවේ. එසේම කේන්ද්‍රයේ සඳු සිටි ස්ථානයෙන් 7 වැන්නේ සිටින ග්‍රහයා කාලයේද බොහෝ විට විවාහය සිදුවේ. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව විවාහය සිදුවන කාල නිර්ණයේදී ගුරු ග්‍රහයාට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. ඒ විවාහය සිදුවන කාලය තුළ ගෝචරයෙන් ගුරු බලවත් විය යුතු බැවිනි. කෙසේ වෙතත් ගුරුගේ මහ දශා අතුරු දශා කාලවල මෙන්ම ගෝචර ගුරු 7 වැන්නට දෘෂ්ටි දෙන විටද බොහෝ විට විවාහය සිදුවේ. එසේම 7 වැන්නාධිපති සිටින ස්ථානය හරහා ගුරු ගෝචර වන විටද විවාහය සිදුවිය හැක. මීට අතිරේකව කුජ සිටින ස්ථානය මතින් ගුරු ගෝචර වන විටද කුජ සිටින ස්ථානයෙන් 7 වැන්නේ ගුරු ගෝචරය වන විටද විවාහ කාරක සිකුරු වැනි ග්‍රහයකුගේ දශාවක් තුළ ද ලග්නයේ 3, 4 සිටින ග්‍රහයන්ගේ දෘෂ්ටිය ගෝචරයෙන් 7 වැන්නට වැටෙන විටද විවාහයක් සිදුවේ යැයි අනුමාන කළ හැක.

විශේෂයෙන් චන්ද්‍ර, කුජ, ගුරු හා සිකුරු විවාහය ඉක්මන් කිරීමට බලපායි. විවාහ ඉක්මන් කරන යෝග ද රැසකි. ඒ අතරින් කිහිපයක් මෙසේය.

1. 7 අධිපති හා සිකුරු සංයෝගය.
2. සිකුරු කේන්ද්‍රගතවී ශනි සිකුරුගෙන් සප්තම වීම
3. කුජගේ රාශියක හෝ නවාංශකයක සිකුරු වීම
4. කුජ හෝ සිකුරු කටක රාශිගතවීම
5. සිකුරුගේ රාශියක හෝ නවාංශකයක කුජ වීම
6. සිකුරු 7 වැන්නේ හෝ 11 වැන්නේ වීම
7. ශනි කුජ දෘෂ්ටිය
8. 2, 11 අධිපතියන් 10 වැන්නේ වීම
9. ලග්නාධිපති 10යේද 2 වැන්නාධිපති 11 හේද වීම

ඉක්මන් විවාහ ඇතැමුන්ට ගැටලුවක් වනවාටත් වඩා විවාහ ප්‍රමාද වීම නම් සැමටම සැබවින්ම ගැටලුවකි. ඊට හේතු කාරණා ක්‍රමයෙන් වියැකී යෑමයි. මෙනිසා විවාහ ප්‍රමාදය මගහරවනු වස් කළ හැකි වත්පිළිවෙත් මෙන්ම ශාන්ති කර්ම ද ග ණනාවකි. ඒවා ඉතා සැකවින් මෙසේය.

1. විවාහයට අදාළ දුර්වල භාව අධිපතීන් රත්න මුදු ප්‍රතිකාරය තුළින් බලවත් කිරීම.
2. තමන්ගේ ඉෂ්ට දේවතාවා හැඳින නිසි පුද පූජා පැවැත්වීම.
3. අශුභ භාව අධිපතීන් උදෙසා ග්‍රහ දාන, ග්‍රහ පූජා, බෝධිපූජා තැබීම විශේෂයෙන් බෝධි පූජා තැබීමේදී අනුරාධපුර ජයශ්‍රී මහා බෝධීන් වහන්සේ, කැලණි, බෙල්ලන්විල, නවගමු, කන්දෙ විහාර, කළුතර බෝධීන් වහන්සේ වැනි මහා බලසම්පන්න බෝධීන් වහන්සේ නමකට විධිමත් ලෙස නිවැරැදිව භක්තිමත්ව බෝධි පූජා පවත්වා විවාහය ඉක්මන් කර දෙන ලෙස ප්‍රාර්ථනය කිරීම.
4. නවගමුවේ පත්තිනි දේවාලයේ වැඩසිටින පත්තිනි මෑණියන්ට විධිමත්ව පූජා පවත්වා බාරහාර වීම.
5. විෂ්ණු දේවාලයකට ගොස් විෂ්ණු දෙවියන්ට විධිමත්ව පූජා පවත්වා බාරහාර වීම
6. දිනපතා පාන්දර තෙරුවන් නැමද විවාහය ඉක්මන් වන ලෙස අධිෂ්ඨාන කිරීම.
7. කතරගම දේවාලයකට ගොස් කතරගම දෙවියන්ට විධිමත්ව පූජා පවත්වා බාරහාර වීම.
8. පුර පසළොස්වක පොහොය දිනක පුර හඳ දෙස පිරිසිදු සිතින් යුතුව විනාඩියක් පමණ බලා සිට විවාහය ඉක්මන් වන ලෙස අධිෂ්ඨාන කිරීම.
9. ඉරිදා දිනක ඉර උදාවන විට ඉර දෙස තුන් වරක් බලා විවාහය ඉක්මන් වන ලෙස අධිෂ්ඨාන කිරීම.
10. සූර්යයා බැස යන වේලාවේ සූර්යයා නොපෙනී යනවාත් සමගම ලේන්සුවේ ගැටයක් ගසා විවාහය ඉක්මන් වන ලෙස අධිෂ්ඨාන කිරීම.
11. විවාහ වන යුවළකට අවශ්‍ය දෑ තමාට හැකි පමණින් මිලට රැගෙන පරිත්‍යාග කිරීම.
12. අඟහරුවාදා හෝ සිකුරාදා දිනක රාහු කාලයේ දුර්ගා මෑණියන්ට දෙහි ලෙලිවල එළඟිතෙල් වත්කොට පහන් 7ක් දින 7ක් දල්වීම මෙය රාත්‍රී කාලයේ සිදුකිරීම වඩා ප්‍රතිඵලදායකය.

*ඉහත විවාහ ප්‍රමාදයට පිළියම් ලෙස සඳහන් කළ වත්පිළිවෙත් තමාට හැකි උපරිමයෙන් භක්තිමත්ව ඉෂ්ට සිද්ධ කර සාර්ථක ප්‍රතිඵල ලබාගන්න. ඔබට ජය සතුට*

ජ්‍යොතිෂවේදී, දේශබන්දු
ආචාර්ය මහේන්ද්‍ර පල්ලෙබැද්ද
පානදුර
දු.අංකය 0774 126 023



# සුව දේ මට සීතල සුළඟ පවා හිමි බුදු වුණු බුද්ධගයාවේ...

## බොදු බැති ගීතයේ මුසල්මානු හඬ පෞරුෂය

### මොහිදීන් බෙග්





ප්‍රසිගිය සියවස මුල් භාගයේ පමණ අප රටට අලුත් මාධ්‍ය මෙවලමක් හඳුන්වාදෙනු ලැබීය. එය නම් කෙරුණේ ග්‍රැමර්ෆෝනය යනුවෙනි. එය සිංහල ගීතයේ ක්‍රම විකාශනය හා සම්බන්ධයෙන් සලකා බැලීමේදී ඓතිහාසික වැදගත් අවස්ථාවක් සනිටුහන් කිරීමට සමත්විය. එතෙක් ජන නාටක හා බැඳුණු ගීතය කේවල නිර්මාණයක් ලෙසින් රසිකයන් අතරට පත්වන්නේ ග්‍රැමර්ෆෝන් තැටි මාර්ගයෙනි. ඒත් සමගම අලුත් ගීත නමින් ඇතිවූ ගී තැටි ප්‍රවණතාවත් සමඟින් නවක ගායක ගායිකාවන්ගේ අලුත් ගීත රැසක් දොරට වැඩීම සිදුවිය. සංගීතය විශ්වීය භාෂාවක් බවත් එයට කිසිම ජාති ආගම් වර්ණ භේදයක් අදාළ නොවන බවත්, එය සියලු මානවයා නිරායාසයෙන් සමගි සම්පන්න කළ හැකි මාධ්‍යයක් යැයි මොනවට පසක් කළ අති විශිෂ්ට සංගීතඥයකුගේ ආගමනය ඒ හරහා සිදුවිය. ඒ අන් කවරෙකු නොව ශ්‍රී ලාංකේය ගීත ක්ෂේත්‍රය දික්විජය කළ මොහිදීන් බෙග් කලාකරුවාය. මේ සංක්ෂිප්ත සටහන ඔහු වෙනුවෙනි.

1918 දෙසැම්බර් 05වැනි දින දකුණු ඉන්දියාවේ සේලම් නගරයේ උපන් කරීම් මොහිදීන් බෙග්, පතාන් නම් වූ ඉන්දීය ගෝත්‍රයට අයත් වූවෙකි. බෙග් යන වචනය පැරණි පර්සියානු බසින් රාජකීයයා යන අරුත නංවන්නකි. ඊට හේතු වන්නේ බෙග්ගේ පිය පාර්ශ්වය ශත වර්ෂ ගණනාවක අතීතයට දිවෙන පැරණි ඉතිහාසයක් ඇති රාජ පාක්ෂික ඉස්ලාම් භක්තික පරම්පරාවකින් පැවත ඒමය. කරීම් බෙග්, මොහිදීන් බෙග්ගේ පියා වූ අතර ඔහු සේලම් නුවර පොලිස් නිලධාරියකු වශයෙන් සේවය කළේය. බීජාන් බී ඔහුගේ මව වූවාය. සේලම් නගරයේ පාසලකින් අධ්‍යාපනය ලැබූ මොහිදීන් බෙග් එම ප්‍රදේශයේම විසූ සංගීත ගුරුවරුන් කිහිපදෙනකු වෙතින් සංගීතය පිළිබඳ ප්‍රාථමික අධ්‍යාපනයක් ලබා ගත්තේය. උර්දු හා කවාලි ගී ගායනයට එකල ඔහු වැඩි කුසලතාවක් දැක්වීය.

**මා ඇත භවේදී මතකද හමු වූවා...**
**ඒ කාලය ආයේ ඔබහට සිහිවේවා...**

මොහිදීන් බෙග් ලංකාවට පැමිණෙන්නේ 1931 වර්ෂයේදීය. එය අප රටට සර්වජන ඡන්ද බලය ලැබුණු වසර ලෙස ඉතිහාසගත වේ. බෙග්ගේ සීයා වූ හලාල්ඩීන් එවක ග්‍රෑන්ඩ්පාස් පොලිසියේද වැඩිමහල් සොහොයුරා වූ අසීස් හාබර් පොලිසියේද සේවය කළහ. බෙග් ලංකාවට පැමිණීමට හේතුපාදක වන්නේ ඔහුගේ සොහොයුරාගේ අකල් මරණයයි.

දකුණු ඉන්දියාවේම උපත ලබා මෙරටට පැමිණ සිටි මොහොමඩ් ගවුස් හමුව මොහිදීන් බෙග් ගේ ගායන දිවියේ අතිශය වැදගත් අවස්ථාවක් විය. කොළඹ පැවැති ප්‍රභූන්ගේ සාජ්ජවලට බෙග්, ගවුස් මාස්ටර් සමග සහභාගි විය. බෙග් සංගීත ක්ෂේත්‍රයට වෘත්තීමය වශයෙන් එළඹෙන්නේ 1932 වර්ෂයේදීය. බෙග්ට කොලොම්බියා තැටි සමාගමේ නිෂ්පාදිත ග්‍රැමර්ෆෝන් තැටිවලට ගීත ගැයීමේ භාග්‍යය උදාවන්නේද එකලය. කේ. කේ. රාජලක්ෂ්මී සමග දශකය මැද භාගයේදී ගැයූ 'කරුණා මුහුදේ නාමු ගිලීලා' බෙග්ගේ මුල්ම ගීතය ලෙස සඳහන් වේ. මේ ගීතය ගායනා කිරීම වෙනුවෙන් බෙග්ට එකල රුපියල් 25ක මුදලක් ලැබුණු බවට සඳහන්ය. ඔහුගේම ඥාතිවරියක වූ සකීනා බෙග් සමග 1947 වර්ෂයේදී බෙග් විවාහ විය. එම විවාහයෙන් ඔවුන්ට දරුවන් 8 දෙනකු ලැබුණු අතර ඉන් 5 දෙනෙක් පුතුන් වූ අතර ඉතිරි තිදෙනා ගැහැනු දරුවන් වූහ.

දෙවැනි සිංහල කතා නාද චිත්‍රපටය ලෙස සැලකෙන අශෝකමාලා චිත්‍රපටයට බෙග් ප්‍රථම වරට ගායනයෙන් මෙන්ම රංගනයෙන්ද සහභාගි විය. බී. ඒ. ඩබ්. ජයමාන්නගේ චිත්‍රපටවල එකල ගීත කෝකිලාවිය වූ රුක්මණී දේවි සමග ගීත ගායනා කිරීමට ලැබීම බෙග්ගේ ජීවිතයේ තවත් සුවිශේෂී අවස්ථාවක් විය. ඔහු ඊට මුලපිරුවේ 'උමතු විශ්වාසය' චිත්‍රපටයෙනි. ඒ සඳහා ඔහුට අවස්ථාවක් ලබාදුන්නේ ප්‍රකට නළුවකු හා ගීත රචකයෙකු වූ හර්බට් එම්. සෙනෙවිරත්නය. එහිදී බෙග් ගැයූ 'සුදට සුදේ සිරිය දිලේ පුන්සඳේ' ගීතය එකල ඉතාමත් ජනප්‍රිය විය. මොහිදීන් බෙග්ට රුක්මණීදේවි සමග ග්‍රැමර්ෆෝන් තැටි සඳහා ගීත ගැයීමේ අවස්ථාවක් නොලැබිණි. ඊට හේතු වූයේ ඔවුන් දෙදෙනාම තරඟකාරී තැටි සමාගම් දෙකකට අයත්ව සිටීමයි. බෙග් කොලොම්බියා තැටි සමාගමටත් රුක්මණී එච්. එම්. බී. තැටි සමාගමටත් වෘත්තීමය වශයෙන් බැඳී සිටියේය. ඉක්බිතිව බෙග් රුක්මණී සුසංයෝගය මුල් කාලීන සිංහල චිත්‍රපට රසකම ජනප්‍රියත්වයට හේතුභූත විය. අයිරාංගනී, මත භේදය, පෙරකදෝරු බෑනා, දෛවයෝගය බෙග් රුක්මණී යුග ගී ගැයූ චිත්‍රපට කිහිපයකි.

**ගිරිහෙල් මුදුනේ මානෙල් නොපිපේ...**
**හිරු නොනැගේ අවර ගිරේ...**

1956 දී බුද්ධ ජයන්ති සැමරුම් අවස්ථාවේදී '2500 බුද්ධ ජයන්තිය බැබළේවා ලංකා' ගීතය ගායනා කිරීමේ භාග්‍යය මොහිදීන් බෙග් එකල උදාකර ගත්තේය. එවකට අගමැතිව සිටි එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි වී සිටි බුද්ධ ජයන්ති උත්සවයේදී බෙග් එම ගීතය ගැයීමෙන් අනතුරුව වැඩසටහන මෙහෙය වූ නිවේදක කරුණාරත්න අබේසේකර අගමැතිවරයා වෙත ගොස් රහසින් යමක් කියන්නට විණි. ඔහු එසේ පවසා සිටියේ මොහිදීන් බෙග් ගායකයාට තවමත් ශ්‍රී ලංකා පුරවැසිභාවය ලබාදී නැති බවය. එය ඇසීමෙන් විස්මයට පත්වූ බණ්ඩාරනායක අගමැතිවරයා ඒ මොහොතේ පටන් බෙග් 1 පන්තියේ පුරවැසිභාවය හිමි ශ්‍රී ලංකා පුරවැසියකු බව ප්‍රකාශ කර සිටියේය. විශේෂයෙන්ම අන්‍ය ආගමිකයකු සිංහල බෞද්ධ ගීත ගායනා කරමින් ඉතාමත් ජනප්‍රියත්වයට පත්වෙමින් තිබීම එකල ජන සමාජය දෙදරුම් කෑමට සමත්වූ කාරණාවක්ම විය.

**සුව දේ මට සීතල සුළඟ පවා**
**හිමි බුදු වුණු බුද්ධගයාවේ**

මේ ගීතය නොඇසෙන වෙසක් පොසොන් උළෙලක්, තොරණක්, පහන් කූඩුවක්, දන්සලක් හෝ වෙනත් බෞද්ධාගමික උත්සවයක් මෙරටට නොමැති තරම්ය. වර්තමානයේ බෞද්ධ ගීත ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් වීම මොහිදීන් බෙග්ගේ බෞද්ධාගමික ගීතවලින් සිදුවූ සුවිශේෂ සේවාවකි. විශේෂයෙන් ඉස්ලාම් බැතිමතකු වූ ඔහු බෞද්ධ ගීත පෝෂණයට දැක්වූ දායකත්වය වෙනුවෙන් සියලු ශ්‍රී ලාංකික පුරවැසියන් බෙග්ට හෘදයාංගම ස්තුතිය පුද කළ යුතුය. එමෙන්ම එකල ඔහු ගුවන් විදුලියේ ගීත ගායනා කරන විට ඔහුට ලැබී තිබූ පැය 1/2ක පමණ ගුවන් කාලය තුළදී ඔහු ගායනා කළ ගීත අතරට බෞද්ධ ගීතයක් හෝ දෙකක් එක් කිරීමට ද අමතක නොකළේය.

මොහිදීන් බෙග් සුජාතා චිත්‍රපටයට ගැයූ නාරිලතා පුෂ්පේ, ප්‍රේම ගඟේ මැණික් වගේ, මායාවකි මේ ලෝකේ වැනි ගීත එකල රසිකයන් මන මෝහනයට පත්කළ ගී නිර්මාණ විය. සුජාතා චිත්‍රපටයේ වාණිජමය සාර්ථකත්වයට ද එම ගීත බෙහෙවින් ඉවහල් විය. අත්‍යන්තයෙන්ම සඳහන් කළහොත් බෙග් නැති සිනමාවක් එකල නොවීය. එකල භාරතයේ ගීත කෝකිලාවිය වූ ලතා මංගේෂ්කාර් සිංහල චිත්‍රපටයකට ගීත ගැයූ එකම ඓතිහාසික අවස්ථාව ලෙස 'සැඩ සුළං' සඳහන් කළ හැකිය. ඇය එහි ගීත දෙකක් ගායනා කළාය.

ඉන් එක් ගීතයකට සහාය ගායකයා වූයේ බෙග්ය. ඒ 'ඉදිරියටා යමු සැවොමා' ගීතයයි. ලතා මංගේෂ්කාර් වැනි ශ්‍රේෂ්ඨ ගායන ශිල්පිනියක් සමග යුග ගීත ගායනා කිරීමට ලැබීම තම සංගීත දිවියේ සදානුස්මරණීය අවස්ථාවක් ලෙස මොහිදීන් බෙග් කවදත් සැලකීය. සිංහල උච්චාරණය පිළිබඳ බරපතළ ගැටලු ඇතත් සිංහල සිනමාවේ ප්‍රථම දශකයේදී දැවැන්ත ගායන පෞර්ෂයන් විදහාලු ගායකයා බවට මොහිදීන් බෙග් පත්විය. තිරයට උචිත මෙන්ම ඕනෑම නළුවකුට සරිලන හඬක් බෙග්ට පිහිටා තිබිණි. විටෙක ඔහු ගාමිණී ෆොන්සේකා වැනි මහා නළුවකුට පවා පසුබිම් ගීත ගායනා කර තිබිණි.

**මොකටද කාසි බාගෙ සොයා තියා**
**යනකොට ගෙනියනවද අනේ ඔයා...**

2500 බුද්ධ ජයන්තිය සැමරීම සඳහා තායිලන්ත රජය විසින් අංගුලිමාල නම් වූ හින්දි චිත්‍රපටය නිර්මාණය කරනු ලැබීය. ඉන්දීය ජාතික සිනමා හා සංගීත අධ්‍යක්ෂවරු දෙපළක් අතින් නිමවූ අංගුලිමාල චිත්‍රපටය සිංහලට දෙබස් කවා ලංකාවේ තිරගත කළ යුතු බවට එකල සිනමාස් සමාගමේ අධිපති වූ කේ. ගුණරත්නම් වෙත යෝජනා ඉදිරිපත් කළේද මොහිදීන් බෙග්ය. එමෙන්ම එම චිත්‍රපටයට ඇතුළත් මන්නාඩේ නමැති ප්‍රකට ඉන්දියානු ගායකයා ගයන 'බුද්ධං සරණං ගච්ඡාමි' ගීතය සිංහලෙන් ගායනා කිරීමේ අවස්ථාව ලැබුණේද බෙග්ටමය. ඔහු ඉන්දියාවට ගොස් විනාඩි 13.5ක් දිවෙන එම ගීතය සාර්ථකව ගායනා කළේය.

**ඔබෙ රාගී මන කැළඹේදෝ...**
**පිවිතුරු හදවත පෑරේදෝ...**

මොහිදීන් බෙග් ගුවන්විදුලි සංස්ථාවේ A ශ්‍රේණියේ විශිෂ්ට ගායකයෙක් විය. ඔහුගේ විශේෂත්වය වූයේ භාෂා හතරකින් පමණ ගීත ගායනා කිරීමය. එමෙන්ම ඔහු ගැයූ ගුවන් විදුලි සරල ගීතද බොහෝය. ඒ අතරින් 'ටිකිරි මැණිකෙ ඇඹුල ගෙනල්ලා' ගීතය බෙහෙවින් ජනප්‍රිය විය. මොහිදීන් බෙග් 'අල්ලපු ගෙදර' චිත්‍රපටයට ගැයූ පියා සලමු ඉගිල්ලී ගීතය වෙනුවෙන් 1966 පැවැති සරසවිය සම්මාන උළෙලේදී හොඳම ගායකයා සඳහා වන සම්මානය දිනා ගත්තේය. එය ඔහු ලද ප්‍රථම සම්මානය විය. එමෙන්ම 1974 පැවැති දීපශිඛා සම්මාන උළෙලේදී වැඩිම චිත්‍රපට සංඛ්‍යාවකට ගීත ගැයූ ගායකයා වශයෙන් දීපශිඛා සම්මානයෙන් පිදුම් ලැබීය. මෙරට පළමු වරට කලාසූරි සම්මානය ප්‍රදානය වූයේ 1982 දීය. එහිදී කලාසූරි සම්මානයෙන් පිදුම් ලද කලාකරුවන් 8 දෙනා අතරට මොහිදීන් බෙග්ද ඇතුළත් විය.

1987 දී එවක පාකිස්තානයේ ජනාධිපතිවරයා වූ සියා උල් හක් රාජ්‍ය චාරිකාවක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේ ඔහු අබියස ගීතයක් ගැයීමට මොහිදීන් බෙග් ඇරයුම් ලැබීය. ඒ අනුව ඔහු නබි නායකයාණන් වර්ණනා කෙරෙන උර්දු ගීතයක් ගායනා කළේය. එම ගීතයෙන් පාකිස්තානු ජනාධිපතිවරයා කෙතරම් ප්‍රමෝදයට පත්වීද යත් බෙග්ට සිය පවුල සමග පාකිස්තානයට පැමිණ එහි පදිංචි වන්නැයි ඇරයුම් කර සිටියහ. කෙදිනක හෝ තමා මියයන්නේද ලාංකිකයකු වශයෙන් මේ පොළවේ බව දැඩි ස්ථාවරයක සිටි නිසා උපේක්ෂා සහගතව එම ඉල්ලීම ඔහු ප්‍රතික්ෂේප කර සිටියේය. එමෙන්ම 1976 දී මෙරට පැවැත්වූ නොබැඳි ජාතීන්ගේ සමුළුවේදී පිළිගැනීමේ ගීතය උර්දු බසින් ගායනා කළේද බෙග්ය. එම ගීතය ඇසූ මිසරයේ අල් අන්වර් සදාත් ලිබියාවේ මොහොමඩ් ගඩාෆි වැනි ජන නායකයන් ඉන් මුසපත් විය. 80 දශකය මුල් භාගයේදී පමණ මෙරට කැසට් සංගීතය ප්‍රචලිත වීමත් සමගම බෙග්ගේ ගීත යළිත් රසිකයන් අතර ජනප්‍රිය වන්නට විය. විශේෂයෙන් ඔහු මුල් යුගයේ චිත්‍රපට සඳහා ගැයූ ගීත ඊළඟ පරම්පරාව අතර ජනගත වී කතිකාවන්නට පටන් ගන්නේ ඉන් පසුවය. එකල වැඩි අලෙවියක් වාර්තා කළේද බෙග්ගේ ගීත ගැසට් පටය.

**අමතක කරලනු පැරැණි කතා...**
**එක්වෙමු ජාතික දියුණ පතා...**

1986 දී රූපවාහිනී සංස්ථාව ඉදිරිපත් කළ විචිත්‍රාංග වැඩසටහනකට එක්වූ බෙග් එහිදී කතාකළේ හැඬු කඳුළිනි. එය බොහෝ දෙනාගේ හදවත් සසල කළ සිදුවීමක් විය. බෙග් ජීවත් වූයේ පර්චස් එකහමාරක පමණ වූ කුඩා නිවසකය. එහි සාමාජිකයෝ 16 දෙනකු පදිංචිව සිටියහ. ඔවුන් ජීවත් කරවීමේ බරපතළ අර්බුදයකට බෙග් එකල මැදිවී සිටියේය. ඒ ඔහු කවදත් යානවාහන මිල මුදල් අපේක්ෂාවෙන් හා වාණිජමය පරමාර්ථයෙන් ගීත ගායනා නොකළ හෙයිනි. ඔහු හඬා වැලපුණේ ඒ දුක කියමිනි.


මොහිදීන් බෙග් ඉතාම ආදර්ශවත් දිවි පෙවෙතක් ගෙන ගිය ගායකයකු විය. ඉස්ලාම් බැතිමතෙකු ලෙස ඔහු ඉතා තදින්ම ආගමික වතාවත්හි නිරත විය. පාන්දර 4.30ට අවදි වූ ඔහු පළමුව කළේ මරදාන සහිරා මුස්ලිම් පල්ලියට ගොස් ශුද්ධ වූ කුරාණයේ පාඨ කීපයක් කියවීමය. ඔහු විවේකී අවස්ථාවල දිනකට පස් වතාවක්ම එම පල්ලියට ගොස් දේව මෙහෙයන්ට සහභාගි විය. මොහිදීන් බෙග් කවදත් මත්පැන්, දුම්වැටි පානයෙන් වැළකී සිටීමට වගබලා ගත්තේය.

මොහිදීන් බෙග් විදේශ ප්‍රසංග කිහිපයකට සහභාගි විය. ඒ අතරින් 1986 පැවැති ලන්ඩන් සංගීත ප්‍රසංගය සුවිශේෂී විය. ඔහු අවසාන වශයෙන් එළිමහන් සංගීත ප්‍රසංගයකට සහභාගි වූයේ වනාතමුල්ලේදීය. ඒ ඔහු මියයෑමට දින දෙක තුනකට ඉහතදීය. 1991 නොවැම්බර් මස 3 වැනි දින අක්ෂි සැත්කමක් සඳහා කොළඹ පෞද්ගලික රෝහලකට ඇතුළත් වන මොහිදීන් බෙග් ඊටපසු දින මියගියේ නිර්වින්දන අවස්ථාවකදීය. රුධිර පීඩනයත් නිර්වින්දනයත් අතර වූ නොගැළපීම නිසා හටගත් සංකූලතාව ඔහුගේ මරණයට හේතුව බව වෛද්‍ය වාර්තාවල දැක්විණි.

මොහිදීන් බෙග් මියගොස් පැය කිහිපයක් ඇතුළත ඔහුගේ දේහය කුප්පියාවත්ත මුස්ලිම් සුසාන භූමියේදී මිහිදන් කෙරිණි. මොහිදීන් බෙග් ගායකයාගෙන් සිංහල සිනමාවේ ගීතයට හා සංගීතයට ඉටුවූ යුගාරක මෙහෙවර අද්විතීයය. එම සේවාව තවමත් මෙරට විචාරකයන්ගේ ඇගයීමට ප්‍රමාණවත් පරිදි ලක් නොවීම කනගාටුවට කරුණකි. අබෞද්ධයකු වශයෙන් සිටිමින් සිංහල බෞද්ධ ගීත සම්ප්‍රදායක් ගොඩනැංවීමට ඔහු ගත් වෑයමද අපගේ සම්භාවනාවට ලක්විය යුත්තකි. එසේම බුදුදහම මේ විශ්වයේ පවතින තාක්කල් මොහිදීන් බෙග්ගේ හඬ සදා නොමැකෙනු ඇත.

**කෝ සැපතා මේ සංසාරේ**
**දුක කෙළවර වේ නිර්වාණේ....**

● තිලිණ ලක්මාල් අභයරාජ
*මූලාශ්‍ර තොරතුරු සැපයීම*
*ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව*





## 43 වන සිග්නිස් උත්තමාචාර සිනමා හා ප්‍රසාංගික ටෙලි නාට්‍ය සම්මාන ප්‍රදානෝත්සවය





සිග්නිස් අන්තර්ජාතික සංව ජාතික සංවිධානයේ ශ්‍රී ලංකා ශාඛාව විසින් 2019/2020 වසර සඳහා පවත්වනු ලැබූ 43 වන උත්තමාචාර සිනමා හා ප්‍රාසාංගික ටෙලි නාට්‍ය සම්මාන ප්‍රදානෝත්සවය බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පසුගියදා කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් රජු රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. ඊට ශ්‍රී ලංකා රත්නපුර සමුළුවේ සභාපති බදුල්ල පදවි රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු හිමිපාණන්ද, කොළඹ සහයක රදගුරු අති උතුම් මැක්ස්වෙල් සිල්වා හිමිපාණන් ද, ගාල්ල පදවි රදගුරු අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ රදගුරු හිමිපාණන් ඇතුළු පූජා ප්‍රසාදීන් වහන්සේලා හා පැවිදි සොයුරියන්ද, ශ්‍රී ලංකාවේ සිනමා හා නාට්‍ය රංගන ශිල්ප ශිල්පීන්ද මේ අවස්ථාවට සහභාගී විය.

මෙහිදී විශේෂ ඇගයීම් සම්මානයක්, ආසියා රදගුරු සම්මෙලනයේ ජනසන්නිවේදන කොමිසමේ සභාපති ලෙස පත් වූ ගාල්ල පදවි එඩෙරාණන්ට හිමි විය. මෙම අවස්ථාව සිග්නිස් අධ්‍යක්ෂක ගරු ලාල් පුෂ්පදේව නි. ම. නි පූජා ප්‍රසාදින් වහන්සේ ඇතුළු කණ්ඩායම විසින් සංවිධානය කරන ලදී.

2020 වසර සඳහා නිර්මාණශීලී වසරේ හොඳම ටෙලිනාට්‍යයට හිමි සම්මානය ''තණමල්විල කොල්ලෙක්'' ටෙලිනාට්‍යයට හිමිවිය. එම ටෙලි ටෙලිනාට්‍ය අධ්‍යක්ෂක රොෂාන් රවින්ද්‍රට නිර්මාණශීලී හොඳම අධ්‍යක්ෂක ස්වර්ණ සම්මානය හිමි විය. ජූරියේ විශේෂ සම්මානය හිමි වුයේ ගිරිදෙවි ටෙලි නාට්‍යය අධ්‍යක්ෂක ඉන්දික ධර්මතිලකටය.

හොඳම නළුවාට හිමි සම්මානය එම ටෙලි නාට්‍යයේම දිප්තගේ භූමිකාව නිරූපණය කළ ධනුක දිල්ශාන්ට හිමි විය. හොඳම නිළිය ගිරිදෙවි ටෙලිනාට්‍යයෙන් හසාගෙ භූමිකාව රඟපෑ ශලනි තාරකාට හිමි විය.

2020 වසරේ නිර්මාණශීලී ප්‍රශස්ත සිනමා නිර්මාණය, සිග්නිස් උත්තමාචාර ස්වර්ණ සම්මානය හිමිවුයේ විසාකේස චන්ද්‍රසේකරම් විසින් අධ්‍යක්ෂණය හා නිෂ්පාදනය කරන ද පාංශු ...(පාංශු) චිත්‍රපටයටය. හොඳම අධ්‍යක්ෂණය ස්වර්ණ සම්මානය හිමිවුයේ පංශු චිත්‍රපටය අධ්‍යක්ෂණය කළ විසාකේස චන්ද්‍රසේකරම්ටය. නිර්මාණහීලී හොඳම නිළිය ජූරියේ විශේෂ සම්මානය දිනාගත්තේ එම චිත්‍රපටයේම මවගේ භූමිකාව නිරූපණය කළ නීටා ප්‍රනාන්දු මහත්මියය. එසේම 2019 ජූරියේ විශේෂ සම්මානය (නිර්මාණශීලි සහාය නිළිය) දිනා ගත්තේ වීරයා ඇවිත් ටෙලි නාට්‍යයේ අන්ධ මවගේ චරිතය නිරූපණය කළ නෙතලි නානායක්කාර. 2019 නිර්මාණශීලී වසරේ හොඳම සිනමා නිර්මාණය ලෙස ''දැකලා පුරුදු කෙනෙක්'' චිත්‍රපටය සම්මාන හිමිකරගත්තේය. එම චිත්‍රපටයේ අධ්‍යක්ෂක මලිත් හැගොඩ සිග්නිස් උත්තමාචාර ස්වර්ණ සම්මානය හිමිකර ගැනීමට සමත් විය.

2019 වසරේ නිර්මාණශීලී සහාය නළුවා විශේෂ ජූරිය සම්මානය ''විෂම භාග'' චිත්‍රපටයේ ගුරුවරයාගේ භූමිකාව නිරූපණය කළ ජැක්සන් ඇන්තනිට හිමිවිය.

● සුජානි ගුරුගේ

දිවයින ඉරිදා සංග්‍රහය
2022 මැයි මස 15 වැනිද ඉරිද



# බුදුදහම හා සාහිත්‍ය කලාවන්ගේ දර්ශනය



බුදුදහමත් ඒ හා බැඳුණු සෞන්දර්ය පිළිබඳ නානාවිධ මතිමතාන්තරත් විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් සාකච්ඡාවට බඳුන් වී ඇත. බුදුදහම හා බැඳී ඇති කලාව පිළිබඳව දීර්ඝ විමසුමක යෙදෙන්නටත් බෞද්ධ කලාව පිළිබඳ වාර්තා කිරීමටත් යම් යම් බෞද්ධ සාධකවලට අනුව විවිධ අදහස් ඉදිරිපත් කිරීමටත් අවකාශ ඇත්තේ ය. ලලිත කලාවන් අතර චිත්‍ර කලාව, මූර්ති කලාව සහ ගෘහ නිර්මාණ කලාවට බුදුදහමින් ලද ආභාෂය පමණක් නොව විවිධ රටවල බෞද්ධ කලාවන් ලෙස ඒවා පෝෂණය ලද බව නොරහසකි. එහෙත් කලාව පිළිබඳ ගැඹුරු දර්ශනය වන්නේ සෞන්දර්ය විද්‍යාවයි. බුදුදහමින් දකින ගැඹුරු ජීවන දර්ශනය හා කලාවේ දර්ශනය එකිනෙකින් ගෙන විමර්ශනය කිරීමේ දී එය වඩාත් තීක්ෂණව කළ යුත්තක් බවට පත්වේ. අපේක්ෂිත අරමුණක් සඳහා ගොනුකළ හැකි පරිදි බුද්ධ දේශනාවන් පිළිබඳ උද්ධෘතයන් මෙන්ම දීර්ඝ බෞද්ධ ඉගැන්වීම් හා සංකල්පනාවන්ගේ භාවිතයට අනුව විවිධ ජනකලාවන් පෝෂණය වී තිබීම අවධාරණය කරගත යුතු ය.

බුදුදහම යනු ජීවිතයේ ඇති නිත්‍ය නොවන අසථිරත්වය දකිමින් එය මනාව අවබෝධ කරගනිමින් කෙළවර නිවන් සුව අවබෝධ කරගැනීම දක්වා වූ ගමන ඉතා සරලව හා ගැඹුරින් ජනී ජනයාට ඉගැන්වෙන ජීවන දර්ශනයකි. ලොව සියලු ද්‍රව්‍ය පදාර්ථ අනිත්‍යය යන කියමන හා ඒ හා බැඳී ඇති ගැඹුරු දර්ශනය මත පදනම් වූවකි. කලාව හා සම්බන්ධව ඇති සෞන්දර්යය තවත් නා නා විධ දෘෂ්ටීන්ගෙන් විමසිය යුතු විද්‍යාවකි.

බෞද්ධාගමික මූලික ඉගැන්වීම්වල දී නිර්වාණය පිළිබඳ ඉගැන්වීම්වලට වඩා මුල්තැනක් ලැබෙන්නේ ඉතා විශිෂ්ට වූ යහපැවැත්මෙන් යුතු ගුණගරුක ජීවිතයක් ගත කිරීම කෙරෙහි ය. එය සාපේක්ෂව ලොව ජීවත් වන අන් සියලු ලෝක සත්වයාට හිතසුව පිණිස වූ එකක්ය. එහි වඩාත් කේන්ද්‍ර වන්නේ මිනිස් සමාජයයි. මිනිසා කෙරෙහි මානුෂීය ලෙස ජීවත් වීමේ ධර්මතා පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මිනිසාගේ ආධ්‍යාත්මික සංවර්ධනය පිළිබඳ අපට සාකච්ඡා කළ හැකිය. කලාව පිළිබඳ දර්ශනයත් සරල බෞද්ධ ඉගැන්වීම්වලට පටහැනි නොවන එකක් බව පැහැදිලි කරගත යුතු ය. බුදුන්වහන්සේ පවා කලාව පිළිබඳ ප්‍රශ්න කිරීම්වලදී හැකිතාක් පිළිතුරු දීමෙන් වැළකී සිටීමට උත්සාහ කළ අවස්ථා බෞද්ධ ඉතිහාසයෙන් අපට හමුවෙයි. එසේ උකටලී වීමට හේතුව ධර්ම ශාස්ත්‍රයන්හි පැවැත්ම කෙරෙහි වැරදි වටහා ගැනීම් හේතුවන නිසා බැවින් යැයි අපට සිතිය හැකිය.

බුදුදහමට අනුව ලෞකික සෞන්දර්යය පිළිබඳව යම් යම් සීමාවන් පැනවුව ද මිනිසාගේ ආධ්‍යාත්මික සෞන්දර්යයට විශාල ඉඩ ප්‍රස්තාවක් විවෘතව ඇති බවක් පෙනෙන්නට තිබේ. බෞද්ධ ඉතිහාසයෙහි සාමනේර වහන්සේලාට බවුන් වැඩීමට රමණීය සෞන්දර්යාත්මක පරිසරය ඉතාම යෝග්‍ය වූ බව ථේර - ථේරී ගාථාවලින් ඉදිරිපත් වන භාවගීතවලින් ප්‍රකට වෙයි. සිදුහත් කුමරුන් බෝසත් අවදියේ සේනානි ගමට වැඩම කළ අවස්ථාවේ **''මේ භූමිභාගය රමණීය ය. වන ලැහැබ ප්‍රසාදජනකය. සුදුවැලි තලා ඇති මහා තොටු ඇති සිත්කළු නදිය ගලා බසින්නීය. හාත්පස ගොදුරු ගම් ද වෙයි. පධන් වීර්යය වඩනු කැමති කුල පුත්‍රයකුට ඒ සඳහා මෙතැන සුදුසුමය''**

මෙබඳු ආධ්‍යාත්මික සුන්දරත්වයට හේතු වූ පාරිසරික සෞන්දර්ය බුදුසමයෙහි බැහැර කර නොමැති බව පෙනේ. ලලිත කලාවන්ගේ ඇසුර නිසා මිනිසා ගේ ආධ්‍යාත්මික පෝෂණය අද්‍යතන සමාජය තුළ පවා බැහැර කළ නොහැකි ය. බොහෝ විට අද බෞද්ධ විහාරාරාම කලාවන්ගේ පෝෂණයට ඉවහල් වූ කේන්ද්‍රස්ථානය බවට පත්ව තිබේ. නමුත් බුදුසමයෙහි ඇතැම් ලෞකිකත්වය නැඹුරු වූ කලාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් සෞන්දර්යය හා ගැටුමක් ඇති බව ද පෙනේ.

මේ පිළිබඳව අද්‍යතන බෞද්ධ ඉගැන්වීම් හා දේනවල දී කටුකුරුන්දේ ඤාණානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ නාට්‍ය හා සිනමා කලාව පිළිබඳ දක්වන අදහස්ද මෙහි දී සිහිපත් කළ යුතු ය. නාට්‍යය, සිනමාව වැනි දෑ ආග්‍රාහන්‍ය කරන ප්‍රේක්ෂකයා ලෞකික වශයෙන් ලොල් බවක් ඇතිකර ගනී. මේ ලොල් බවට හේතු වන්නේ සමාජ යථාවබෝධය නොව එම මාධ්‍ය කලාවන්ගේ ඇති මිථ්‍යාව බව උන්වහන්සේ පවසයි. ඒ අනුව කලා මධ්‍යයන්ගේ ලෞකික සෞන්දර්යයට අද්‍යතන සමාජයේ බෙහෙවින් ඉවහල් වන නාට්‍යය හා සිනමාව උන්වහන්සේ ලෝකෝත්තර ජීවිතය පිළිබඳ ජනයාට පසක්කර ගැනීමට මාධ්‍යය ඉවහල් කරගැනීම ද අපූර්වත්වයකි. වේදිකාවත්, සිනමා තිරයත් ඒදණ්ඩේ ගමන් කරන සුනඛයකුට උන්වහන්සේ සමාන කරයි. බැලුවොත් බලන, බිරුවොත් බුරන අත්‍යන්ත ප්‍රේක්ෂක සම්බන්ධය උන්වහන්සේ ඉන් පැහැදිලි කරයි.

ලෞකික සෞන්දර්ය පිළිබඳ විරෝධතා ආකල්පය පිළිබඳව තාලපුට සූත්‍රයෙහි පැහැදිලිව දක්නට ලැබේ. මෙහි දී තාලපුට ගාමිණී නම් රංගධරයා බොරුවෙනුත් ඇත්තෙනුත් ජනතාව සතුටු කරවන රංගධරයාගේ රංග කාර්යය පිළිබඳව භාග්‍යවත් බුදුන්වහන්සේගෙන් ප්‍රශ්න කළේ ය.

**''ඒ කරුණෙන් කම් නැත. එය තිබේවා. මේ පිළිබඳව මාගෙන් නොවිමසන්න.,** භාග්‍යවතුන්වහන්සේ පිළිතුරු දීම ප්‍රතික්ෂේප කළේ ය. ගාමිණී රංගධරයා දෙවනුවත් තෙවනුවත් ප්‍රශ්න කළ නිසා අකමැත්තෙන් වුව බුදුහු පිළිතුරු දුන්හ.

බැහැර නොකරන ලද රාග, දෝෂ, මෝහ සහිත ජනයා ඉදිරියෙහි රංගනය කිරීමෙන් ඔවුහු තවදුරටත් රාග, දෝෂ, මෝහ සහිත වෙති. නැටුම් ශිල්පියා මත් වූයේ, ප්‍රමාද වූයේ අනුන් ද මත් කරවා කයෙහි බිඳීමෙන් මරණින් පසු පහාස නම් නිරයෙහි උපදින බව වදාළහ.

මෙහිදී සමාජ සංස්කෘතිකමය ලෙස පිළිගැනෙන ලලිත කලාවන් බඳු අංග ගැන විරෝධතාවක් පළ කිරීම බුදුන්වහන්සේ ගේ අභිමතය නොවුණු බව පිළිතුරු දීමෙන් වැළකී සිටීමෙන් පැහැදිලි ය.

ලෝකෝත්තර ධර්මය හා බැඳුණු බෞද්ධ ඉගැන්වීම් හා ලෞකික සෞන්දර්යය ගැටුණ ද ගෘහස්ථ සමාජය තුළ පවත්නා සෞන්දර්ය ආස්වාදනය පිළිබඳ සන්දර්භය තුළ බුදුසමයෙහි විරෝධ ආකල්පයක් හමු නොවන බව ද සත්‍යයකි. පංචසිඛ නම් වීණා වාදකයා ස්වකීය ප්‍රේමවන්තිය සමග භාග්‍යවතුන් වහන්සේ ඉදිරිපිට වීණා වාදනය කරමින් කළ ගීත ගායනය බුදුන්වහන්සේ අගය කළ බවත් කියැවේ. බුදුන්වහන්සේ බෞද්ධ ඉගැන්වීම් හා සංසන්දනාත්මක විග්‍රහයක් පංචසිඛයන්ට වදාළ බව කියැවේ. ආධ්‍යාත්මිකව රසවිඳින සෞන්දර්ය පිළිබඳ බුදුදහමේ විරෝධාකල්පයක් ඉස්මතු වූ තැනක් නොපෙනේ. ලොව පවතින සියලු ද්‍රව්‍ය පදාර්ථයන්ගේ අනිත්‍ය බව වටහා ගනිමින් අත්විඳින රසය උසස් යථාවබෝධයකින් විඳින රසය, බුදුදහමට අනුව එකඟ වූ බව පෙනේ. එය සරලව විග්‍රහ කිරීමේ දී පිපී ඇති සුන්දර පුෂ්පයක අලංකාරය දැකිය හැකි ය. එය වර්ණනා මුඛයෙන් කතා කළ හැකි ය. එහෙත් ඒ පුෂ්පය විකසිත වී ඇත්තේ පරවීම නමැති විනාශ මුඛයට පත්වීමේ අවස්ථාවක් එක් ක්‍රියාවලියක් ලෙස ය. මේ අයුරු සත්‍ය නොවන දහම දකිමින් සුන්දරත්වය යනු කුමක්දැයි යථාර්ථවත් ජීවිතාවබෝධ බුදුසමයෙහි අගය කළ බවක් පෙනේ.

බුදුදහම හා කලාව අතර විරෝධාකල්පයක් ඉස්මතු වීම භාග්‍යවතුන් වහන්සේ බොහෝ තැන්හි ප්‍රතික්ෂේප කළාක් මෙන් ශ්‍රී ලාංකීය ජන කලාවන් ගේ භාවිතය දෙස බලන විට සුවිශේෂී බෞද්ධ මුහුණුවරක් ගන්වමින් දේශීය අනන්‍යතාවක් ඉස්මතු කිරීම ද අගය කළ යුත්තකි.

භාරතීය ලේඛකයා සෞන්දර්යවාදය අනුව යමින් රසාස්වාදනය මතු කළ අතර සිංහල ලේඛකයා එකී රසාස්වාදය උදෙසා බුදුදහමේ ඉගැන්වෙන **''සියලු සංස්කාර ධර්ම අනිත්‍යය''** යන නිත්‍යවාදී නොවන අදහස්, සංකල්ප මිශ්‍ර කරමින් ලෞකික රසාස්වාදනය තුළින්ම ලෝකෝත්තර රසාස්වාදනයක් ඉස්මතු කිරීමට සමත් වූ බව ද අවබෝධ කරගත හැකි ය.

භාරතීය සාහිත්‍යකරණයෙහි කේන්ද්‍ර සාධකය වූ කාව්‍ය රසාස්වාදන රීතියෙහි ගැබ් නොවූ සිංහල ලේඛකයා, සිංහල පාඨකයා ගැඹුරු ජීවිතාවබෝධයක් ඇති කරවන බෞද්ධ මුහුණුවර පාදක කරගනිමින් සාහිත්‍යකරණයේ නියැලුණු ඉව නොරහසකි. පන්සිය පනස් ජාතක කථා මගින් මිනිස් සිතෙහි ස්වභාවය විනිවිද දකිමින් ධර්ම කරුණු මුල්කර ගත් සදූපදේශ සංග්‍රහයක් ලෙස අපට පිළිගැන්වුණු බව පෙනේ. මාර්ටින් වික්‍රමසිංහ ගත්කරු පවා අද්‍යතන සාහිත්‍ය විමර්ශනයේ දී ජාතක කථා සංග්‍රහය විවේක බුද්ධියෙන් කියවන්නකුට උසස් ජීවිත පරිඥානයක් ලබාගත හැකි සනාතන අගයකින් යුත් ග්‍රන්ථයක් ලෙස හඳුන්වා දී තිබේ. සද්ධර්ම රත්නාවලිය බුදුදහමින් ලද පෝෂණය අපූර්ව ලෙස කියාපාන ගද්‍ය කාව්‍යයකි. කාව්‍ය ශාස්ත්‍රානුකූල ධර්මතා මෙන්ම ධර්ම, අර්ථ, කාම, මෝක්ෂ යනු බොදු අපේක්ෂාවන් සාක්ෂාත් කරගැනීමේ අධිෂ්ඨානය සද්ධර්ම රත්නාවලියේ කතුවරයාගේ අරමුණක් බව ද පැහැදිලි ය.

**''පද්‍යයෙන් නම් බුද්ධ චරිතයක්ම විය යුතු ය.''** *(පෙදෙන් බුදු සිරිත)* කාව්‍යාදර්ශයෙහි නොමැති උපදේශ දක්වමින් සිංහල බෞද්ධ ලක්ෂණවලින් බැහැර නොවුණු සියබස්ලකර උක්ත කරුණු සඳහා විශිෂ්ට සාධකයකි. එමෙන්ම සිංහල සාහිත්‍යයේ සංදේශ කාව්‍යකරණයේ දී බෞද්ධ සදූපදේශයන් ඉදිරිපත් කිරීමට කතුවරුන් අමතක නොකළේ ය.

රසය, කාමය, ඇතුළු සියලු පංච කාමයන් නිර්මාණය වී ඇත්තේ ලෝක සත්වයා වෙනුවෙන් මය. එය ආස්වාදනය කිරීම අනිවර්යයෙන්ම සිදුවිය යුතු ය. ඒ ධර්ම න්‍යාය නොව ලෝක න්‍යාය හෙවත් ලෝක ධර්මයයි. ලෝක ධර්මය වනාහි බුද්ධ ධර්මය ඇතුළු සියලු දෑ අතික්‍රමණය කරන නොවෙන සද්ධර්ම න්‍යායයි. එහි වෙනස් නොවන එකම දෙය වන්නේ ද වෙනස්වීමේ ධර්මතාවයි. ගැඹුරින් විග්‍රහ කරන කල නිත්‍ය නොවන බොදු ධර්මතාව මෙමගින් යළි ඉගැන්වෙයි.

ලෝක ධර්මයේ ඇති කාමය, රාගය මුල් වී ඇති ආස්වාදනය කිරීම යහපත් ය. එහෙත් එහි සීමාවන් හැඟවෙන මධ්‍යම ප්‍රතිපදා ධර්මය බුදුදහම ය. මේ යථාර්ථය ලෝවැඩ සඟරා කතුවරයා ඉතා සරල ලෙස කියාදෙයි. එය ගැඹුරු දර්ශනයකි. කලාව පිළිබඳ දර්ශනය වූ සෞන්දර්ය ඒතුළින් වටහා ගැනීමට හැකිනම් භාග්‍යවතුන් ගේ දර්ශනය හා කලාවේ දර්ශනයේ අපූර්ව පැහීමකි.

**''ලිපගිනි මොලවන තෙක්දිය සැලියේ**
**සැපයක් යැයි කකුළුව දිය කෙලියේ''**


**''කරන කලට පව් මීරිය මී සේ**
**විඳින කළට දුක් දැඩි වෙයි ගිනි සේ''**

ලෝවැඩ සඟරා මතු කෙරෙන මේ සදූපදේශයන් කලාවේත්, බෞද්ධ දර්ශනයේත් න්‍යායක් ලෙස විග්‍රහ කළ නොහැකි ද.

බුදුදහමින් පරිබාහිර වූ සාහිත්‍යයක් අපට නැති තරම් ය. පුරාතන සාහිත්‍යය පමණක් නොව සීගිරි කවිය මගින් ද ජනකවිය මගින් ද ඔවුන් ගේ නිර්මානකරණයේ බෞද්ධ දෘෂ්ටිය මනා ව විද්‍යාමාන වන අයුරින් රචනා කිරීම ස්වදේශීය කලා මාධ්‍යයන් ගේ අපූර්වත්වයකි.

ආචාර්ය
**පැට්‍රික් රත්නායක**
*කැලණිය විශ්වවිද්‍යාලයේ සිනමා හා රූපවාහිනී කලාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය*

# ඔහු තාරකාවක් නොවූ නළුවා ය.



සෝමසිරි දෙහිපිටිය

සිනමා නළුවකු වන්නට නම් ආරෝහ පරිණාහ සිරුරක්, හීන් උඩු රැවුලක්, කාල වර්ණ නොවූ ඡවි වර්ණයක්, බොකුටු කොණ්ඩයක් අවශ්‍ය යැයි සැලකුණු යුගයක් මෙරට සිනමා වංශකතාව කියවන කල්හි අපට දැකගන්නට හැකි ය. එහෙත් මේ සුදුසුකම් එකක්වත් නොවූ රඟපෑම ම එකම සුදුසුකම වූ බව සනාථ කළ නළු පරපුරක් අප සතු වූ බව සිංහල චිත්‍රපට ඉතිහාසයේ මුල් අවධියේ සිට අපට සිහිපත් කළ හැකි ය. සිංහල සිනමාවේ මුල් අවධියේ චිත්‍රපට රැසක රඟපෑ එවන් විශිෂ්ට රූපණවේදීන් කිහිප දෙනකුම මගේ මතකයට නැඟේ. ඔවුන් අතර ලැඩී රණසිංහ, වින්සන්ට් වාස්, ඩී. ආර්. නානායක්කාර, ඩොමී ජයවර්ධන, ජෝ අබේවික්‍රම, හියුගෝ ප්‍රනාන්දු, එච්. ඩී. කුලතුංග, පියදාස ගුණසේකර, ඩේවිඩ් ධර්මකීර්ති ආදීහු වෙති. පූර්ව හැත්තෑව දශකයට අයත් මේ නළු නාමාවලිය හැත්තෑව දශකයේ සිට නව මුහුණුවරක් ගන්නේ තාරකා නොවූ නළුවන් කිහිප දෙනකුගේම ආගමනය සමගිනි. ඒ කිහිප දෙනා අතර ඉදිරි පෙළ සිටින්නන් ලෙස මට හැඟෙන නම් අතර සිරිල් වික්‍රමගේ, සෝමසිරි දෙහිපිටිය, රොබින් ප්‍රනාන්දු, ඇලෙක්සැන්ඩර් ප්‍රනාන්දු, විමල් කුමාර ද කොස්තා, යූ. ආරියවිමල්, දයා තෙන්නකෝන්, ජයලත් මනෝරත්න ආදීහු වෙති. ජීවිතයේ නවවන දශකයෙහි සිටින සිරිල් වික්‍රමගේ විශිෂ්ටයා හැරුණු කල අන් සියල්ලන් ජීවන රඟ මඬලින් සමුගෙන ගොසිනි. සෝමසිරි දෙහිපිටිය අප හැර ගොස් හතළිස් වසරක් සපිරුණේ පසුගිය විසිහත් වැනිදාය. නිසැක වශයෙන්ම දෙහිපිටියගේ නම අකල්හි ජීවන රඟ මඬලින් සමුගත් කලාකරු නාමාවලියට එක්වන බව දනිමි. අඩ සියවසක් ජීවත් වන්නට වාසනාව නොලද කලාකරු නාමාවලියෙහි සිටින මහගමසේකර, ධම්ම ජාගොඩ, විජය කුමාරණතුංග ආදීන් අතරට සෝමසිරි දෙහිපිටිය එක්වන්නේ හතළිස් නවවන වියෙහි දී ඔහු අපගෙන් සමුගත් බැවිනි. ඔහු මෙන්ම මෙලෙස අකල් හි සමුගත් විශිෂ්ටයන් අද අප අතර සිටියා නම් මෙරට කලාවෙහි පෝෂණයට ඔවුන්ගෙන් කෙතරම් විශාල දායකත්වයක් ලැබෙන්නට තිබුණේ ද යන්න සිතාගන්නට නොහැකි ය. තතු එසේ වූවත් සෝමසිරි දෙහිපිටිය නම් වූ විශිෂ්ට රංගධරයා මියගොස් දශක හතරක් ගතවන තුරුත් ඔහුගේ සම්ප්‍රදානය පිළිබඳ ස්මරණයක් නොවීම ඇදහිය නොහැකි මුත් සත්‍යය එය බව කිව යුතු ය. ජාතික චිත්‍රපට සංස්ථාව ප්‍රමුඛ කිසිදු සිනමා රසික විචාරක සංසදයකට අමතකව ගිය සෝමසිරි දෙහිපිටිය නම් වූ අපූර්ව රංගධරයා, සහෘදයා හා ළෙන්ගතු මිතුරා පිළිබඳ අනුස්මරණයකට අප කැඳවූ දමිත් සිරිලාල් හා නයනාංජලී දෙහිපිටිය නම් පුතු හා දියණියට අපගේ ප්‍රණාමය හිමිවන්නේ ඔවුන් විසින් ස්මරණය කරනු ලැබූයේ ඔවුන්ගේ පියා පමණක් නොව මෙරට සිංහල සිනමාවේ අපූර්ව රංගන කුසලතා ප්‍රකට කළ විශිෂ්ටයකු වීම නිසා ය.

සෝමසිරි දෙහිපිටිය සිනමාවට අවතීර්ණ වන්නට පෙර වේදිකා රංගනයෙන් රඟපෑමට අත්පොත් තබන්නේ ය. එදවස වේදිකා නාට්‍යයේ විශිෂ්ටයන් වූ එදිරිවීර සරච්චන්ද්‍ර, දයානන්ද ගුණවර්ධන, පී. වැලිකල මහගමසේකර හා නීල් ශ්‍රී විජේසිංහ ආදීන්ගේ නාට්‍ය රැසක රංගනයෙන් දායක වන්නේ ය. ඒ අතර සරච්චන්ද්‍රගේ පබාවතී, එලොව ගිහිං මෙලොව ආවා, මහගම සේකරගේ කුණ්ඩලකේශී, දයානන්ද ගුණවර්ධනගේ ඉබි කට්ට, පී. වැලිකලගේ මැටි කරත්තය, රත්නාවලී වැනි නිර්මාණ වෙසෙසි කොට දැක්විය හැකි ය. වේදිකාවේ රංගනයට විශිෂ්ට නාට්‍යවේදීන්ගේ ගුරුහරුකම් ලැබුවා සේම සිනමා රංගනයට ද සෝමසිරි දෙහිපිටිය වාසනාවන්ත වන්නේ විශිෂ්ට චිත්‍රපට අධ්‍යක්ෂවරුන් රැසකගේම නිර්මාණ සඳහා දායක වන්නට ලැබීම නිසා ය. ඔහුගේ ප්‍රථම රංගනය මහාචාර්ය සිරි ගුණසිංහගේ විශිෂ්ටතම සිනමාකරණය වූ සත් සමුදුර වීම දෙහිපිටියගේ සිනමා රංගන චාරිකාවෙහි හැරවුම් ලක්ෂ්‍ය වූවා නිසැක ය. ඩී. බී. නිහාල්සිංහ, වසන්ත ඔබේසේකර ආදීන් හා සිනමා රංගනයේ මුල් අකුරු කියවූ ඔහු 1967 සිට 1984 දක්වා රඟපෑ චිත්‍රපට හැට හතර අධ්‍යක්ෂණය කළෝ සිනමාවේ දැවන්තයන් ය. ඔවුන් අතර වසන්ත ඔබේසේකර, ධර්මසේන පතිරාජ, තිස්ස අබේසේකර, ඩී. බී. නිහාල්සිංහ, ගාමිණී ෆොන්සේකා, මහගම සේකර, සුනිල් ආරියරත්න, ටයිටස් තොටවත්ත, එච්. ඩී. ප්‍රේමරත්න, සුගතපාල සෙනරත් යාපා, සුමිත්‍රා පීරිස් හා තවත් ප්‍රකට අධ්‍යක්ෂවරු වූහ. මේ සිනමා භූමිකා අතර සෝමසිරි දෙහිපිටියගේ රංගන ප්‍රතිභාව ප්‍රේක්ෂක මතකයෙහි සදා රැඳ වූ භූමිකා රැසකි. සත්සමුදුරෙහි පීටර්, තුංමංහංදියෙහි ජේම්ස්, අහස්ගව්වෙහි සෝමේ, සිහසුනෙහි කිරිගෝරිස්, භාර ලක්ෂයෙහි ලෑතර බාස්, වල්මත්වූවෝ හි සෝමදාස, දියමන්තිහි ගුණේ, සරුංගලේහි ජයසේකර, කරුමක්කාරයෝහි මුදලාලි, සිරිබෝ අයියාහි බන්දුලහාමි වැනි චරිත සෝමසිරි දෙහිපිටිය ප්‍රතිනිර්මාණය කළේ රඟපානවා යන පූර්ව කල්පනාවකින් මිදී එම චරිත තුළට පිවිස සැබෑම රංගනයට පිවිසීමෙනි. ආංගික, වාචික හා සාත්වික අභිනය මනාව භාවිත කරමින් රඟපෑමට ලද කුමන චරිතයක් වුව සජීවීව රඟපෑමෙහි දුලබ ප්‍රතිභාව දෙහිපිටිය සතුව පැවති බව විචාරක මතය යි. ඔහුටම අනන්‍ය වූ හඬ පෞරුෂයක් දෙහිපිටිය සතුව තිබිණ. සිරිබෝ අයියාහි සිරිබෝ හාමිගේ සමීප සගයා ලෙස ප්‍රතිනිර්මාණය කළ බන්දුලහාමිගේ රංගනය උදෙසා 1980 ජනාධිපති සිනමා සම්මාන උලෙළේ දී හොඳම සහාය නළුවාට හිමි සම්මානය හිමි කරගන්නේ ඔහුගේ නිසඟ රංගන කුසලතාව නිසාම ය.

ජාතික චිත්‍රපට සංස්ථා තරංගිණී ශාලාවේ පසුගිය 23 වැනිදා අප සහභාගි වූ සෝමසිරි දෙහිපිටිය හතළිස්වන ගුණසමරුව හා සිනමා දැක්මට සහභාගි වූ ශාලාව පිරි ප්‍රේක්ෂාගාරය පැවසූයේ සෝමසිරි දෙහිපිටිය යනු තාරකාවකට වඩා ජනප්‍රසාදය දිනූ මිතුරු සමාගමයක් සතු වූ සොඳුරු මිනිසකු බව ය. නිසැක වශයෙන්ම ප්‍රතිභාන්විත රූපණවේදියකු බව ය. සරල හා චාම් ගුණසමරු උළෙළක් වූ සැඳෑවෙහි එකම මතක කතාබහ මගින් සෝමසිරි දෙහිපිටියගේ රංගන ජීවිතයේ අතිශය සොඳුරු මතක කරා අප කැඳවාගෙන යන ලද්දේ ඔහු සමීප මිතුරු ප්‍රවීණ රංගනවේදී ඩබ්ලිව්. ජයසිරි ය. කෙටි එහෙත් ඉතාමත් ආකර්ෂණීය වූ අතීතස්මරණ මතක කිහිපයක් පමණක් ගෙන හැර පාමින් ජයසිරි විසින් දෙහිපිටිය නම් රූපණවේදියාගේ රංගන දිවි මග මිහිරි හා සොඳුරු සිදුවීම් සමග ප්‍රේක්ෂාගාරය අපූරුවට සම්බන්ධ කරගන්නා ලද්දේ ය. සෝමසිරිගේ පළමු රූගත කිරීමට අයත් වූ ඉතා කෙටි වාක්‍ය ඛණ්ඩයක් අධ්‍යක්ෂ සිරි ගුණසිංහට හා කැමරා අධ්‍යක්ෂ නිහාල්සිංහට අවශ්‍ය පරිදි ඔහු ලවා කියවා ගැනීමට දිගු වෙහෙසක් දරන්නට වූ බව ජයසිරි මතක් කළේ ය. දෙහිපිටියට දෙබස් අමතක වීම පිළිබඳ අවස්ථාවක් ජයසිරි සිහිපත් කළේ ඔහු රිදී නිම්නය සහාය අධ්‍යක්ෂ ලෙස සරසවි චිත්‍රාගාරයේ හඬ කැවීමකට සහභාගි වූ අවස්ථවක් සිහිපත් කරමිනි. රූගත කිරීමවල දී දෙහිපිටියට දෙබස් අමතකවීම හෝ පැටලීම නිතර සිදුවන බවට අපූරු අවස්ථාවක් ඔහු වෙනුවෙන් පළ කොට තිබූ සමරුවෙහි සඳහන් ව තිබිණ. සිදුවීම මෙසේ ය. අධ්‍යක්ෂ ටයිටස් සෝමෙට මෙසේ උපදෙස් දෙයි. 'සෝමෙ මෙතන තියෙන්නෙ ''අර සාගරය මැද තියෙන දූපතට යමු'' කියන දෙබසයි. ටයිටස් රඟපාන අයුරු හා දෙබස කියා දුන්නේ ය. ''හරි ගමු'' ටයිටස් විධානය දෙයි. සෝමේ මෙසේ කීවේය. ''දියණිය අපි අර දූපත මැද තියෙන සාගරයට යමු'' ටයිටස් රැවුල කසමින් 'පුදුමයි' කියා බලා සිටියේ ය. නැවතත් සෝමසිරි කීවේ ඒ දෙබසම ය. ''යකෝ දූපත මැද කොහෙද සාගරයක් තියෙන්නෙ? සාගරය මැද දූපතක් මිසක්'' සෝමසිරිට ද සිනා ගිය බව එහි සඳහන්ව තිබිණ. සෝමසිරි දෙහිපිටිය යනු මිත්‍ර සමාගම ප්‍රිය කළ ක්‍රිකට් ලෝලියකු ද බව අමතක කළ නොහේ. බ්ලූම්ෆීල්ඩ් ක්‍රීඩා සමාජයේ නිත්‍ය සාමාජිකයකු වූ ඔහු ක්‍රිකට් තරග නැරඹීමට මෙන්ම ක්‍රිකට් ක්‍රීඩකයන්ට ද ආදරය කළේ ය. බන්දුල වර්ණපුර ඔහුගේ ප්‍රියතම ක්‍රීඩකයා ය. බ්ලූමෆීල්ඩ් ක්‍රිකට් ක්‍රීඩා සමාජයේ සගයන් වූ ජයන්ත සෙනෙවිරත්න, ගාමිණී හප්පාවන තම ක්‍රිකට් ලෝලී නළු සගයාට උපහාර පුදන්නට තරංගණියට පැමිණ සිටිනු දුටිමි. දෙහිපිටිය රඟ පෑ සිනමා දැක්ම දුටු කල්හි හැඟුණේ ඔහු නම් කිනම් ආශ්චර්යමත් නළුවකු ද යන්නයි. සිරිබෝ අයියා හි ජෝ සමග, සරුංගලේහි ගාමිණී සමග බඹරු ඇවිත් හි ජෝ සමග ඔහු පෑ රංගන විලාස කෙසේ අමතක කරම් ද? සෝමසිරි දෙහිපිටිය යනු සිංහල සිනමාවට අකල්හි අහිමිව ගිය චරිතාංග නළුවා ය.

● **බුද්ධදාස ගලප්පත්ති**
bgalaps@gmail.com

# කවි මිහිර

## පීන සහ ක්ෂුද්‍ර

ලක්මාලී හේවාවසම්

පෙම්වතියන් දෙදෙනකු ය දෙපසක
එකියක පීන පයෝධර ඇත්තී ය
අනෙකිය ක්ෂුද්‍ර පයෝධර ඇත්තී ය

අඬවන් ය ඇස් පළමුවැන්නිය
නිල්වන් ය ඇස් දෙවැන්නිය
ළා රත් ය ලවනත දෙවැන්නිය
දිදුලයි රතදර පීන පයෝධර ඇත්තිය

කොඳුරන්නීය සියුමැලි වදන්
පිරිමදින්නීය සිතුවිලි සෙමෙන්
ඒ දෙවැන්නිය
ක්ෂුද්‍ර පයෝධර ඇත්තිය
මුමුණන්නීය සවනත තොල් තබා
පළමුවැන්නිය
රාගනිශ්‍රිත සුසුම් නැහැපුඩුවල පුරවන්නිය..

තෝරා ගන්නේ ද කෙලෙසින්
උස් පහත්වන ළය ඉල්ලන්නේ ම
පළමුවැන්නිය
ඒ යටින් ඇති හදවත කියන්නේ
තෝරා ගන්නැයි දෙවැන්නිය

පළමුවැන්නිය ළය පළා බලම් ද
දෙවැන්නිය ළයට කන තබා බලම් ද

පළමුවැන්නිය
පළමුවැන්නිය....!
ඈ සළු මැත් කර දෙන්නිය !!
දෙවැන්නිය
ඈත සිට මඳ සිනා නගන්නිය...

පීන පයෝධර විනිවිදිමි
දැවෙන ගිනි පමණක් දකිමි
ක්ෂුද්‍ර පයෝධර මැද හිස තබමි
මා වෙනුවෙන් ම ගැහෙන හඬ අසමි

දෙවැන්නිය තෝරාගනිමි
දැවෙන්නිය හැර නිවන්නිය
අසල සිත තබමි

හැඟුම් මුහුළස ලිහුණි නම් කාව්‍ය සංග්‍රහයේ හිමිකාරිය ලක්මාලි හේවාවසම් ය. ඈ දිගු කලක් තම කාව්‍ය නිර්මාණ පුවත්පත් කවි පිටු අතරින් අප වෙත සමීප කොට තිබූ කිවිදියක බැවින් ඈ ආධුනික කිවිකාරියක ලෙස හැඳින්වීමෙන් වළකිමි. පුවත්පත් කවිපිටු අතරින් එළියට පැමිණෙන ලක්මාලි, තම කුළුඳුල් කාව්‍ය සංග්‍රහය හැඟුම් මුහුළස ලිහුණි නමින් පාඨකයන් අතට පුදන්නී ය. ඇගේ වෙනත් කෘති අතර පරිවර්තන ග්‍රන්ථ නාමාවලියක් හමු වුවද ඒවා මොනවාදැයි සඳහනක් නොමැත. එබැවින් ඇගේ පළමු කවි ව්‍යායාමයෙන් උපුටා ගත් ඉහත කවිය, කාව්‍ය නිර්මාණය සඳහා අනුභූතීන් තෝරා ගැනීමෙහි ලා ඈ දක්වන සුවිශේෂ දක්ෂතාවට නිදසුන් කොට ගත හැකි එක් නිර්මාණයක් ලෙස හඳුන්වමි.

පීන සහ ක්ෂුද්‍ර යන විශේෂණ දෙපදයක් තෝරාහන්නා කිවිදිය ඇගේ කවියට නිමිති වූ අත්දැකීම කථකයකුගේ දෘෂ්ටියෙන් ඉදිරිපත් කරන්නී ය. පීන යනු සම්පූර්ණ හෙවත් පිරුණු යන අරුත දනවන පදයකි. ක්ෂුද්‍ර යනු කුඩා යන අරුත දනවන වදනකි. පීන යන්නෙහි සෘජු විරුද්ධාර්ථය නොවන බවයි මගේ හැඟීම. කෙසේ වෙතත් කිවිදිය මෙම විශේෂණ ද්වය මුල් කරගත් කාන්තා සිරුරේ සුන්දර වස්තුවක් පිළිබඳ පිරිමි සිතක පැන නැගුණු ප්‍රශ්නයක් අප හමුවට ගෙන එන්නී ය. කවීන් ප්‍රමුඛ බොහෝ නිර්මාණකරුවන් විසින් ස්ත්‍රී වර්ණනයෙහි දී මහත් අභිරුචියෙන් වර්ණනා කරනු ලබන්නා වූ ගැහැනු සිරුරේ සුන්දරතම වස්තුවක් වූ පියයුරු හෙවත් පයෝධර පිළිබඳ ගැටලුවක් කවියෙහි නිමිත්ත සේ පෙනේ. පීන පයෝධර පිළිබඳ අප අසා ඇතත් ක්ෂුද්‍ර පයෝධර පිළිබඳ නම් අසන්නට නොලැබේ. එහෙත් කිවිදිය ක්ෂුද්‍ර යන විශේෂණය මෙහිදී භාවිත කොට ඇත්තේ පීන පයෝධර යන්නට විරුද්ධාර්ථ නංවන විශේෂණයක් ලෙස හා කථකයා ගේ හැඟුම් මෙම විශේෂණ ද්වයෙන් යුතු ස්ත්‍රීන් දෙදෙනකු අතරින් එකියක තෝරාගැනීමේදී මුහුණ පාන ගැටලුවක් නිර්මාණය කිරීමේ අරමුණෙනි. චිරන්තන කවියේ සිට ජනකවිය දක්වා ද නවීන කවිය දක්වා ද ස්ත්‍රී වර්ණනයෙහි දී කාන්තා සිරුරෙහි අඟපසඟ අතර, දෑස, ලවනත, දෙකොපුල, නිතඹ, වරලස, දෙකලවා ඇතුළු මසැසට හසුවන වස්තූන් නෙක උපමා මගින් වර්ණනා කොට ඇති අයුරු අප දැක ඇත. පීන පයෝධර ගැන උවම් කොට දැක්වූ වස්තූන් හි ඖචිත්‍යය පිළිබඳ කෙතරම් කතාබහ අපි දනිමු ද? සීගිරි කවියෙහි, සංදේශ කාව්‍යයෙහි හා ජනකවීන් ගේ කවියෙහි අතිශය රමණීය පියයුරු වර්ණනා හමු වේ. ජපන් බැලුම් යුවළක් බඳු පයෝධර මෙන් ම තිසර තන පිළිබඳව ද අපි අසා ඇත්තෙමු. එහෙත් කිසිදු අවස්ථාවක ඊට ප්‍රතිවිරුද්ධ කුඩා පියයුරක් ගැන කවි සමයෙහි ලියැවී කියැවී තිබේද? කිවිදියගේ අත්දැකීමෙහි අපූර්වත්වය වන්නේ ද එයයි.

දෙපසක සිටිනා පෙම්වතියන් දෙදෙනෙකි. කථකයාට ඉන් එකියක තෝරාගැනීමට සිදු වී ඇත. ඔහු මේ ස්ත්‍රීන් දෙදෙනා ගේ චරිත ස්වභාව හඳුන්වා දීමට ඔවුන්ගේ පියයුරු සංකේතාර්ථකොට ගනී. එකියක පීන පයෝධර ඇත්තියකි. අනෙකා ක්ෂුද්‍ර පයෝධර ඇත්තිය යි. පීන පයෝධර ඇත්තිය රාගාධික එකියකි. කිවිදිය මනා සංයමයකින් එම ස්ත්‍රිය ප්‍රතිනිර්මාණය කරන්නී ය.

අඬවන් ය ඇස් පළමු වැන්නිය
දිදුලයි රතදර පීන පයෝධර ඇත්තිය
රාගනිශ්‍රිත සුසුම් නැහැ පුඩුවල පුරන්නිය
පළමුවැන්නිය සළු මැත් කර දෙන්නිය
පීන පයෝධර විනිවිදිමි
දැවෙන ගිනි පමණක් දකිමි

ඉහත බාහිර හා අභ්‍යන්තර ලකුණු සතු පුන් පියයුරු ඇත්තිය කථකයාගේ හදට ළං නොවන්නී ය. දෙවැන්නියගේ, එනම් ක්ෂුද්‍ර පියයුරු ඇත්තියගේ කතාබහ, ඇගේ මුදු ස්වරය, ඇගේ මඳ සිනහව කථකයා සිත් ගනී. කිවිදිය ක්ෂුද්‍ර වූ පියයුරු ඇත්තිය වර්ණනා කරන්නී ක්ෂුද්‍ර පියයුරු හැර ඇගේ රූ සොබාව මෙන් ම සිරුරෙහි අනෙක් ලක්ෂණ ද පිළිබඳ මුදු ගුණයක්, පහන් හැඟීමක් අප සිත්හි දැනවෙන අයුරිනි.

නිල්වන් ය ඇස් දෙවැන්නිය
ළා රත් ය ලවනත දෙවැන්නිය
කොඳුරන්නීය සියුමැලි වදන්
පිරිමදින්නීය සිතුවිලි සෙමෙන්
ඒ දෙවැන්නිය
දෙවැන්නිය ළයට කන තබා බලම් ද
දෙවැන්නිය
ඈත සිට මඳ සිනා නගන්නිය

කථකයාගේ උඩු සිත හා යටි සිත අතර සංකීර්ණ මනෝභාව අතර සටනකි. පළමුවැන්නිය හඳුනා ගැනීමට ඈ ළය පලා බැලිය යුතුද? පළමුවැන්නිය සළු මැත් කොට ඔහු ඈ වෙතට කැඳවන්නී ය. ඇගේ පුන් පියයුරු අතරේ කථකයා දකින්නේ දැවෙන ගිනි ය. ඔහුගේ යටි සිත කියන්නේ දෙවැන්නිය තෝරාගන්නා ලෙස ය. අවසන ඔහු යටි හිත හැඟීම්වලට අවනත වෙයි. ඔහුට අවශ්‍යවන්නේ පයෝධර අතරින් දවන්නියක නොව, ඔහු වෙනුවෙන් ගැහෙන හඬින් යුතුව, ඔහු සිත නිවන්නියකි.

දෙවැන්නිය තෝරා ගනිමි
දැවෙන්නිය හැර නිවන්නිය
අසල සිත තබමි

පියයුරු ලක්ෂණ වර්ණනයෙහි දී පළමුවැන්නිය හා දෙවැන්නියගේ බාහිර අඟ පසඟ ලක්ෂණ ඔස්සේ ඔවුන් දෙදෙනාගේ ගති සොබා හැසිරීම් විලාස කීමට කිවිදිය විසින් භාවිත කොට ඇති කාව්‍යමය භාෂාව, නිර්මාණය කරනු ලබන සංකල්ප රූප ප්‍රබල ය.

පීන පයෝධර විනිවිදිමි
දැවෙන ගිනි පමණක් දකිමි
ක්ෂුද්‍ර පයෝධර මැද හිස තබමි
මා වෙනුවෙන් ම ගැහෙන හඬ අසමි

මා වෙනුවෙන් ම ගැහෙන හඬ අසමි යන්න මතු කෙරෙන ධ්වනිතාර්ථය අර්ථ පූර්ණය. විරල අත්දැකීමක් කවියට විෂය කරගැනීම මෙන් ම එතුළින් පුද්ගල චිත්ත ස්වභාව විවරණයකට එක් වූ කිවිදියගේ ව්‍යායාමය සාර්ථක වී ඇත්තේ ඇගේ භාෂා මහිමය ද නිසා ය.

• බුද්ධදාස ගලප්පත්ති
bgalaps@gmail.com

## බුදු පුත් රහල් තෙරුන්ගේ උදානය

ඈත කප් සුවහසක් අතීතේ ලොව දිලුණ
පදුම බුදුරදු වෙතින් නියත විවරණ රැගෙන
කප් කෙළක් බවයන්හි දෙව් බඹුන් දන හැඳින
සසර අවසන මිනිස් ලොවට දෙනයන හැරිණ

හවත් ගෝතම නමින් විහිදුවන බුදු කිරණ
සිදුහතුන් හට දාව පුතා වන පින පිරුණ
බිම්බාව කුස ඉපිද දුක ඇසල සඳ පහන
දායාද ලෙස ලදිමි රන් සළුව සිල් රැඳුන

කසාවත දරුවද ළපටි සුරතල් වියේ
මුලු වැදී නොසිටියෙමි කිසිවෙකුට මම බියේ
වරදකරු වෙලා බුදු පියාණන් ඉදිරියේ
ලැබූ අවවාද පොදි ගොඩ ගැසී ඈත ළයේ

දැහැන් ගත වී නිබඳ දහම් පිළිවෙත් පුරා
කෙලෙස් දල බිඳ දුටිමි රහත් මග ලොව්තුරා
පහන් සිළු දල්වමින් සිල්වතුන් සිත් පුරා
සසුන් කෙත සරු කළෙමි සෙනෙහසින් තැන් දරා

බුදු පියාණන් වෙතින් අනුව මව් විදානය
ලදිමි මමත් පැතූ ලෙස මට උරුම නිධානය
ලැබුණි සිසු කැමි තෙරණු නමැති පදානය
රහස් මහ තෙරනු මම මේ මගේ උදානය

රාජ්‍ය කලා භූෂණ
• ප්‍රේමසිරි කාරියවසම්

## සඳපාන

*(වෙසක් පෝදා මුතියංගන විහාරයේ දී දකුණතින් මන්ද මානසික දියණියක ද, වමතින් වියපත් මෑණියන් ද වත්තම් කරගෙන යන කාන්තාවක දිටිමි.)*

අවර ගිරට පරවුණු හිරු හැමදාම
පවර තිරිඳුනි නෙතු මඟ ඇරුණේ කෝම
කවර කලක පව් පලදෙන්නේ මේම
නුවර පැහැර ගත් දේ වෙනවද බෝම

අන්ධකාර රැයකට සුදු සඳපාන
බැස්ස පැලී පොළොව හිමිහිට අතගාන
බොරට හැරෙන නෙතු පතුලෙහි ඉපදෙමින
පිපුන හස මලකි කඳුළක් පුපුරාන

මෙරක් බර පුළුන් පොද සේ දැනුනාද?
තිඹොල් දිඹුල් තුඩගෙහි මල් පිපුණාද?
පාරමිතා අනු පෙරුමන් පිරුවාද?
රහත් මෙහෙණියක වන්නට පැතුවාද?

දෙපා බිම තබන්නට මිරිවැඩි ඉල්ලා
දෑත, දෙකන ගෙලෙහිද සැරසිලි එල්ලා
සුවඳ සඳුන් නෙක අඟපසගෙහි ගල්වා
සටන් කළෙමි හෙවනැලි ගන්නට අල්ලා

මලින මිලින කසළින් පිරි ලෝකයක
කළල නොතැවරී සුපිපුණු සියපතක
නුඹේ දිරිය ළඟ මහසල් කුලගෙයක
උපන් නමුත් මා පෙත්තකි පරමලක

• පද්මිණී ශ්‍රියාලතා

## කඳු මුදුනක බුදු හිමි

හදේ මවා ගත යුතු බුදු හිමියන්ගේ රුව
සිමෙන්තියෙන් සවි කරලා උස් කඳු මුදුනක
පන්සාලිස් වසරක් හිමියනි ඔබ දෙසූ බණ
ඈත්වෙලා දුර ඈතට අපටත් නොදැනිම

සිරි දෙපතුලට පිරී යන්න මල්සරසන අත
තරඟවදී පිංපුරවා ලොවට පෙනෙන්නට
තුන්සිය හැටපස් දවසෙම නොමඟට යන සිත
මොහොතක් සැනසී සිල් අරගන්න හිතනවද

යසස යදින යාදිනි තොළ තොළඟ රඳනු මිස
බවුන් වඩන කෙලෙස් නසන අය නම් අල්පය
රන්වැට පට තිරපට වට කරගත් ගුණ කඳ
ඈත්වෙලා වගෙයි හිතෙන් අපටත් නොදැනිම

• රුවන් වටවල

## ඉවසීම

ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය
යන එම මතය සිතකට ගෙන දෙයි එඩිය
එනමුදු ඉවසීම තව කෙනෙකුගෙ මඩිය
තර කරගනු පිණිස සැකසෙන ඉඩ වැඩිය

• සමරවීර හෙට්ටිආරච්චි

## වෙසක් පැතුම්

සිතට නැගී සුව සහනය අපමණ
දසත නැගේවා ලොව්තුරු බුදු බණ
අසන දකින දේ සතුටින් නිතියෙන
සියලු සතුන් ලොව සුවපත් වේවා

අඳුර නිවී ආලෝකය ගෙන එන
සොඳුරු සිහිනයේ මල් පල හටගෙන
ගව් සිය දහසින් ඈතින් ඈතට
පව් මල දුරුවේවා සැම සිත තුළ

පුද පෙත් ලැබ මිනිසුන් සඳහා වන
හද හද යාවී මෙත් මුදිතා ගුණ
නිසසල බව නිබඳව පවතීවා
ඇස කන හුදු රසයට නොනැමේවා

• පොඩිරතන අඟමලේ

## වෙසක් අදියි

පෙරුම් පුරා දිගු කල
බුදු බව ලැබූ සුනිමල
නිදුකාණනි දසබල
සැනසෙමි ඔබෙ පාමුල

පතුරා හැර මෙත් ගඟ
සුව කොට හැම සත් වග
පෙන්වූ හරි මොක් මග
වඳිමි සුගත පා යුග

සමන් ගිර සිරි පතුල සිඹිමින්
වෙසක් සඳ රැස් එයි ගලා
සැලෙන මහ බෝ පත් වලින්
ලොව්තුරු මිහිර විහිදෙයි අමා

මිනිස් හදවත් තුළින් පව් මල
ධූරි භූතව සේදි සේදී
පිළුණු වී ගිය කුරිරු සිතුවිලි
මේ උතුම් දින සුවඳ වේවා !

මැවෙයි බුදු හිමි පහන් දැල්ලේ
හමයි දෙසූ බණ සුළං රැල්ලේ
ගලයි බුදු රැස් කොත් කැරැල්ලේ
දිවෙයි සිත නිවණට ඇසිල්ලේ

• සුමනදාස යටිගල

## යළි වඩිනු මැන බුදු හිමියනේ

වෙසක් සඳ නැගී ගුවනට ආවාට
ඇසක් නිදි නැතිව පාවඩ පැවාට
රසක් මවා සදහම් ගුණ කීවාට
පසක් වේද අද සිරිලක ජනයාට

බල ලෝබයෙන් තණ්හාවෙන් කුහක කමෙන්
හැල හැප්පිලි වෙමින් පීඩා දනට දෙමින්
කැලඹුන සිතින් සත් දහමට නිගා දෙමින්
කළ යුතු නොකළ යුතු දෑ නැත සිතක ලමින්

අසරණකමේ ගැඹුරුම පතුළට කිමිද
තිසරණ ගුණද නොතකන තරමට පිහිද
සමරණ තෙමගුලක අසිරිය ගැන නොමද
වපුරණ සත් බවක් දැක ගන්නට කොහිද

සම්බුදු පියාණනි දෙව්රම් වෙහෙර බිමේ
ගම්බිර දහම් දෙසුසේ අද සිහල බිමේ
නිම් නැති ආපදාවන් දැක මෙතිනි ළැමේ
කම් පල දෙසන ලෙස එනුමැන නියම සමේ

නතු කොට සිත් සතන්වල චතුසත් දහම
පහදා මග නොමග යා යුතු තැන හරිම
හෙළදීපය නගා හිඳුවාලන කදිම
මනුසත් දහම වදහල මැන හිමි සඳුම

ඇස් ඉස්මස් පුදා අවසන් නියාවෙනි
පස්මහ බැලුම් තව කුමකට ස්වාමිනි
හිස් මිනිසුනට දී සදහම් ඔවා මිණි
අස් කරලනු මැනව තණ්හා මහා ගිනි

• ප්‍රේමා රාජකරුණා

## වෙනස

පිල් කළඹ
ඇස් පිපුන
පිනවලා හැම දෙනෙත
රඟනවා මයුර රජ
පරදවා සෙබඩියක

තිත් ඉහිනු
මල් ඇඳුනු
කොහා හැම බක් මහක
ගයනවා ගී දෙපද
පරදවා කෙවිලියක

බැඳ මාල
ගෙල තාල
පියඹලා තටු විහිද
සිටිනවා ගිරා තෙම
පරදවා ගිරවියක

ඇඳ රුවට
පිනයි නෙත
සොඳුරුතම මිනිස් ලිය
සමවෙලා දෙව්ලියක
පරදවයි පුරුෂ තෙම


• මනෝරි ගමගේ

## ඊයේ, අද සහ හෙට..

බටහිරින්
තද සුළං
බෙංගාල
බොක්කෙන්
පීඩන අවපාත

• ගාමිණී දළුවත්ත

## කාලය පැමිණ ඇත



අහස පොළොවම දෙදරවා
වැටෙන විට මේ මහා වර්ෂාව
මවිත විය යුතු නොවේ ඔබ
මේ වැසි වසින්නට
නියමිතව තිබූ කාලයයි

පරඬලා තණ පත් යට
නිද්‍රාවේ ගැලි
සැඟව සිටි වියළි බිජුවට
ස්නේහයෙන් තෙත බත්ව
විලිරුදා නගා
එක් සැනින් පුපුරන්නට
නියමිතව තිබූ කාලයයි

පස් කැටිති එකිනෙක
සිඟිති හිසින් ඔසවා
දහසක් ළදලු පත්
මේ මුඩු බිම පුරා
සෙනෙහස බෙදන්නට
නියමිතව තිබූ කාලයයි

• ජගත් ජේ. එදිරිසිංහ

# කවි මුතු

සංස්කරණය - රුවන් ජයවර්ධන

## මඟ හළ ලේ



පාවෙන මල් යහනාවක ජීවිතයක් නොමැති පුතේ
වෙන එළිවෙන තරමට ජීවිතයක් නොලද පුතේ
යාවෙන අඳුරට - පානට තෙල් බිඳුවක් නොලද පුතේ
රාවණ හෙළ ලේ හැලුණිද මහපාරක සිහළ පුතේ

කනු බොනු නැති - ගනු දෙනු නැති
අවුරුදු නැති - කොවිලිඳු නැති
මැසිවිලි ඇති - කඳුළැලි වැසි
දරු සා ගිනි - ඉවසනු බැරි

කර මත ගොඩ ගැහුණු රාසි
දුක් දොම්නස් හරිනු නෑසි
නොවුවත් එය නුඹට ලේසි
යුතුකම හදවතින් නැරි

ඔසොවාගෙන බර තුවක්කු
මාර සෙනඟ නොව පරක්කු
ඉස්තරම්ම පතුරම් ගෙන
පුතු යන මඟ අටව ගත්තු

පාවෙන මල් යහනාවක ජීවිතයක් නොමැති පුතේ
රෑවෙන එළිවෙන තරමට ජීවිතයක් නොලද පුතේ
යාවෙන අඳුරට - පානට තෙල් බිඳුවක් නොලද පුතේ
රාවණ හෙළ ලේ හැලුණිද මහපාරක සිහළ පුතේ

• කාශ්‍යප සත්‍යප්‍රිය ද සිල්වා

## දුර හිඳින් පුන් සරා සඳ නුඹ

සතර බිතු මැද වැද
සැපැති මල් යහනත
බමන පංකා යට
හුදු ප්‍රහර්ෂය විඳ
ක්ෂයව යැයි නම් පෙම

නෙතට නෙත නොගැටීම
ගතින් බෝ දුරකම
ඉමු මෙහෙම භවයෙම
වැළඳ හද දිනූ පෙම

නොතේරෙන අහසක්
රැයක නෙතු නළවයි
අයිති නැති සුවඳක්
නොහිමි සුව ගෙනදෙයි

පය ගැටුණු සඳ බිම
හරිම රළු පරළුයි
දුර ඈත දුටු සඳ
හරි මුදුයි සොඳුරුයි

අතට දුර මල් පොකුරු පිපීයන්
ඉහට උඩ වලාකුළු පිරීයන්
දුරක පුන් සරා සඳ දිලීයන්
හිතට ළංවෙලා නුඹ රැඳීයන්

• චූලා දමයන්ති හේමමාලා

## රස්නය

වැඩි මගේම
හොඳටම තිවෙන
වෙලාවලුත් තියෙනවා
තේ එක

• එන්. ඩබ්. පී. ලාල්

